329 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 329 - இல. 12
Volume 329 - No. 12

2026 සැප්තැම්බර් 25 වන සිකුරාදා
2026 செப்ரெம்பர் 25, வெள்ளிக்கிழமை
Friday, 25th September, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2232-2274]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

උතුරු සහ නැඟෙනහිර පළාත්වල රජයේ ආයතනවල කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම [තීරුව 2274]

උතුරු සහ නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනයන්හි පවතින මූල්‍ය, යටිතල පහසුකම් සහ පරිපාලනමය ගැටලු [තීරුව 2277]

**වරප්‍රසාද යෝජනා:**

2026.09.06 දින "දිනමිණ" ෆේස්බුක් පිටුවේ පළ කරන ලද වීඩියෝව [තීරුව 2280]

**විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 2281-2446]

**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 2447-2458]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 2459-2480]


# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2232-2274]

**தனி அறிவித்தல் மூல வினா:**

வடக்கு, கிழக்கு மாகாணங்களில் அரச நிறுவனங்களிலுள்ள ஆளணி வெற்றிடங்களை நிரப்புதல் [ப: 2274]

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள உள்ளூராட்சி மன்றங்களில் நிலவும் நிதி, உட்கட்டமைப்பு மற்றும் நிருவாகச் சிக்கல்கள் [ப: 2277]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

06.09.2026 அன்று 'தினமின' முகநூல் பக்கத்தில் வெளியிடப்பட்ட காணொளி [ப: 2280]

**அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 2281-2446]

**நீதித்துறை (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 2447-2458]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 2459-2480]


# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Cols. 2232-2274]

QUESTION BY PRIVATE NOTICE:

Filling of Staff Vacancies in Government Institutions in Northern and Eastern Provinces [Col. 2274]

Financial, Infrastructure and Administrative Issues of Local Authorities in Northern and Eastern Provinces [Col. 2277]

PRIVILEGE:

Video Posted on “Dinamina” Facebook Page on 06.09.2026 [Col. 2280]

TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL:

Read a Second, and the Third time, and passed as amended [Cols. 2281-2446]

JUDICATURE (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed [Cols. 2447-2458]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 2459-2480]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 සැප්තැම්බර් 25වන සිකුරාදා*
*2026 செப்ரெம்பர் 25, வெள்ளிக்கிழமை*
*Friday, 25th September, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக் குழுக் கூட்டமும்
### MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 සැප්තැම්බර් 25 සිකුරාදා, එනම් අද දින අපර භාග 2.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් කාරක සභා කාමර අංක 02හි දී පැවැත්වීමට නියමිත බැවින් අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලුම සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම්දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the State Printing Corporation for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- Order made by the Minister of Finance, Planning and Economic Development having considered the recommendations of the Colombo Port City Economic Commission and following the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 relating to Primary Business of Strategic Importance and published in Gazette Extraordinary No. 2483/17 of 10th April, 2026;

- Orders made by the Minister of Finance, Planning and Economic Development having considered the recommendations of the Colombo Port City Economic Commission and following the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 relating to Secondary Business of Strategic Importance and published consecutively in 68 Gazette Extraordinary Nos. from 2483/18 to 2483/85 of 10th April, 2026;

- Orders made by the Minister of Finance, Planning and Economic Development having considered the recommendations of the Colombo Port City Economic Commission and following the approval of the Cabinet of Ministers under Section 53 of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021 relating to Primary Business of Strategic Importance and published in Gazette Extraordinary Nos. 2488/03 and 2488/04 of 11th May, 2026; and

The written confirmation issued under the signature of the Colombo Port City Economic Commission, certifying that the aforementioned Orders comply with the provisions of Part IX of this Act. - [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, පාලටුව, මාලිම්බඩ, බටර්ෆ්ලයි ගාර්ඩ්න් යන ලිපිනයෙහි පදිංචි එම්.එච්. සිසිර කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ගලේවෙල, බඹරගස්වැව, කටුපොත, අංක 401 යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. කුලතුංග අධිකාරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, දෙමන්හන්දිය, ඉඹුල්ගස්වාඩියවත්ත, අංක 57/බී යන ලිපිනයෙහි පදිංචි රංජිත් වික්‍රමලාල් කුලසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කොත්මලේ, මල්හැව, අංක බී 77 යන ලිපිනයෙහි පදිංචි පී.ජී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පොල්පිතිගම, තල්පත්වැව යන ලිපිනයෙහි පදිංචි ජේ.එච්. ගාමිණී විජේවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ලංකා සතොස ආයතනය: 2015 සිට සහල් ආනයනය
### லங்கா சதொச நிறுவனம்: 2015 முதல் அரிசி இறக்குமதி
### LANKA SATHOSA LIMITED: RICE IMPORTS SINCE 2015

31/2024

**1.ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සහල් හිඟයක් මතු වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවස්ථාවලදී සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සහල් ආනයනය කළ අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී ආනයනය කළ සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එලෙස ආනයනය කරන ලද සහල්, සතොස ආයතනය මඟින් වෙනත් පුද්ගලයන්ට සහ වෙළෙන්දන්ට නීති විරෝධී ලෙස අළෙවි කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கையில் அரிசித் தட்டுப்பாடு ஏற்பட்ட சந்தர்ப்பங்கள் எத்தனை என்பதையும்;

(ii) மேற்படி சந்தர்ப்பங்களின்போது வரையறுக்கப் பட்ட லங்கா சதொச நிறுவனம் அரிசியை இறக்குமதி செய்த சந்தர்ப்பங்களின் எண்ணிக்கை மற்றும் மேற்படி ஒவ்வொரு சந்தர்ப்பத்திலும் இறக்குமதி செய்யப்பட்ட அரிசியின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) அவ்வாறு இறக்குமதி செய்யப்பட்ட அரிசி, சதொச நிறுவனத்தினூடாக வேறு நபர்களுக்கும் வியாபாரிகளுக்கும் சட்டத்துக்கு முரணான வகையில் விற்பனை செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the number of occasions on which rice shortages have arisen in Sri Lanka from 2015 to date;

(ii) the number of occasions on which the Lanka Sathosa Limited imported rice during such periods and the quantity of rice imported on each such occasion, separately;

(iii) whether rice thus imported has been unlawfully sold by Lanka Sathosa Limited to other individuals and traders; and

(iv) if so, the measures that will be taken in that regard?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අවස්ථා 5කදී, එනම් 2015, 2017, 2018, 2021 සහ 2022 වර්ෂවල ශ්‍රී ලංකාව තුළ සහල් හිඟ මතු වී ඇත. විස්තර ඇමුණුම මඟින් පහත දක්වා ඇත.

**Import Quantities of Rice - From 2015 to July 2026**

| Year | Import Quantity (MT '000) | Remark |
|---|---|---|
| 2026 - July | 169 | Shortage of Keeri Samba |
| 2025 | 184 | Shortage of Keeri Samba |
| 2024 | 130 | Shortage of Keeri Samba |
| 2023 | 25 | - |
| 2022 | 783 | Shortage of rice |
| 2021 | 147 | Shortage of rice |
| 2020 | 16 | - |
| 2019 | 24 | - |
| 2018 | 249 | Shortage of rice |
| 2017 | 748 | Shortage of rice |
| 2016 | 30 | - |
| 2015 | 286 | Shortage of rice |

Sources: Central Bank of Sri Lanka, Sri Lanka Customs

(ii) ඉහත අවස්ථා පිළිබඳව සලකා බැලීමේදී, 2015 වර්ෂය තුළ පමණක් ලංකා සතොස ආයතනය විසින් සහල් මෙට්‍රික් ටොන් 168,440ක ප්‍රමාණයක් ආනයනය කර ඇත.

(iii) ලංකා සතොස ආයතනය හරහා වෙනත් පුද්ගලයින්ට හා වෙළෙඳුන්ට නීති විරෝධී ලෙස සහල් අලෙවි කළ බවට තොරතුරු ලංකා සතොස ආයතනය සතුව නොමැති බව දන්වා සිටිමි.

(iv) නැත.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ සතොස ආයතනය ගැන විතරයි. විශේෂයෙන්ම ඇමතිතුමා යටතේ සතොස ආයතනයට අනුබද්ධව තව ආයතන ගණනාවක් තිබෙනවා. සතොසට direct සහල් ආනයනය කරන්නේ නැහැ. 2015 වසරේ ඉඳලාම සහල් ආනයනය කිරීම පිළිබඳ තොරතුරු මා ළඟ තිබෙනවා. සහල් ආනයන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා රටට පොරොන්දුවක් දුන්නා, 2024 තමයි අවසාන වශයෙන් සහල් ආනයනය කරන අවුරුද්ද කියලා. නමුත්, දැන් ඇමතිතුමා ඒක වෙනස් කරගෙන තිබෙනවා කියලා පෙනෙනවා.

ඊයේ පෙරේදා මාධ්‍ය හමුවකදී ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා මම දැක්කා, කීරි සම්බා සහල් පමණක් ආනයනය කරනවා කියලා. නමුත්, කීරි සම්බාවලට මුවාවෙලා වෙනත් වර්ගවල සහල් වර්ගත් ආනයනය කර තිබෙනවා කියන එකට මා ළඟ විස්තර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම වැරදියි නම් ඔබතුමා වැරදියි කියන්න, නිවැරදි කරන්න. ඔබතුමා 2024 අවුරුද්දේ සහල් මෙට්‍රික් ටොන් 131,000ක් ආනයනය කර තිබෙනවා. ඒ, මේ රටට සහල් ආනයනය කරන අවසාන අවුරුද්ද කියලා ඔබතුමා කිව්වා, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි. ඔබතුමා එහෙම කියලා 2023දී මෙට්‍රික් ටොන් 30,000ක් වූ සහල් ආනයනය, 2024දී මෙට්‍රික් ටොන් 131,000ක් කරනවා. ඔබතුමා සහල් ආනයනය නවත්වනවා කිව්වාට පස්සේ 2025 අවුරුද්දේත් සහල් මෙට්‍රික් ටොන් 180,000ක් ආනයනය කරනවා. එලෙස සහල් ආනයනයේදී කීරි සම්බා වෙනුවට ආදේශක සහල් ගෙනැල්ලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 64,000යි. එතකොට ගරු ඇමතිතුමනි, ඒ මෙට්‍රික් ටොන් 180,000 ඇතුළේ තිබෙන අනික් සහල් වර්ග අපේ රටේ නිෂ්පාදනය කළ හැකි සහල් වර්ගයි. මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, තවදුරටත් මේ රටට සහල් ආනයනය කිරීම හරහා බලාපොරොත්තු වන්නේ කුමක්ද කියලා. ඉතිහාසයේ එහෙම වුණා. යම් යම් ජාවාරම්කාරයෝ සල්ලි එකතු කර ගන්න මෙවැනි දේ කළා. සමහර ඇමතිවරුනුත් එහි කොටස්කාරයෝ වෙලා හිටියා. ඉතින් මේක නතර කර ගන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කිහිපයක් ඇහුවා. 2015දීත් අපේ රටට සහල් ආනයනය කරලා තිබෙනවා. නමුත් 2024, 2025 වසර දෙකේදීම අපි සහල් ආනයනය කරලා තිබෙන්නේ සහල් හිඟයක් ඇති වෙච්ච නිසායි. අපේ රටේ සහල් හිඟයක් ඇති වෙච්ච නිසා විශේෂයෙන් 2024 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවලදී සහ 2025 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස දක්වා අපි සහල් ආනයනය කළා. ඒ නිසා තමයි මේ සහල් ආනයනය පිළිබඳ විස්තරයේදී 2025දී විශේෂයෙන් මෙට්‍රික් ටොන් 184,000ක් තිබෙන්නේ. ඒ කාලයේදී අපේ රටේ සහල් නිෂ්පාදනයේ අඩුවක් තිබුණා. ඒ අඩුව පිරවීම සඳහා අපි සහල් ආනයනය කළා.

ගරු මන්ත්‍රීතුමනි, වෙනදා සහල් ගේන්න පර්මිට් දීලා තිබෙනවා. හැබැයි, අපේ රජය ඇතුළේ සහල් ගේන්න කාටවත් පර්මිට් දුන්නේ නැහැ. අපි සහල් ආනයනය සඳහා තිබෙන සීමාව

[ගරු වසන්ත සමරසිංහ මහතා]

නිදහස් කරලා නිශ්චිත කාලයක් තුළ ඕනෑම කෙනෙකුට බදු යටතේ සහල් ගේන්න පුළුවන් වන විධියට ඉඩ දුන්නා. ඒ අනුව, කිලෝවකට රුපියල් 65ක බද්දක් යටතේ සහල් ආනයනය කරන්න ඉඩ දුන්නා. මේ යටතේ සහල් වර්ග 4ක්, 5ක්ම ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ස්වර්ණ නාඩු එනවා, කීරි පොන්නි එනවා, GR 11 වර්ගය එනවා. ඒ තොරතුරු තමයි 2025 අවුරුද්දට අදාළව සහල් ආනයනයේදී තිබෙන්නේ. මොකද, සහල් හිඟයක් රට තුළ තිබුණා. ඒ හිඟයට අවශ්‍ය සහල් ප්‍රමාණය ආනයනය කිරීම සඳහා අපි තීරණයක් ගත්තා. ඒ තීරණය අනුව ගෙනාපු සහල් තමයි තිබෙන්නේ.

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අසනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර නම් ගැළපෙන්නේ නැහැ. ඒ වුණත් කමක් නැහැ, අපට ප්‍රශ්නයක්ද කියලා අහන්න එපා. මේක රටට ප්‍රශ්නයක්, මේ ජන වරමටම ප්‍රශ්නයක්. ඔබතුමන්ලා සහල් ආනයනය කිරීම තුළ ඇති වෙලා තිබෙන අර්බුදය තමයි දේශීය ගොවියා කබලෙන් ළිපට වැටීම. ඒ බව පිළිගන්න වෙනවා. ඒක නැහැයි කියන්න බැහැ. මොකද, ඔබතුමන්ලා ඒවා නොදැන නොවෙයි නේ, මේ දේවල් කළේ. අවුරුදු 76ක් තිස්සේ සහල් ආනයනය කිරීම තුළ සිදුවෙච්ච මාෆියාව ගැන ඔබතුමන්ලා කථා කළා වාගේම ඒ ආනයනය තුළ අපේ ගොවියාට ඇති වන ප්‍රශ්නය පිළිබඳවත් කථා කළා. අද තිබෙන ප්‍රශ්නය මේකයි. සහල් අතිරික්තයක් තිබෙන බව කිව්වාට සහල් මිල අඩු වෙලා නැහැ නේ. සහල් මිලත් අඩුවෙන්න එපායැ, ගරු ඇමතිතුමා. සහල් මිල අඩු නොවුණා වාගේම ගොවියාගේ වී මිල වැඩිවෙලාත් නැහැ. ඒකට වෙළෙඳ ඇමතිවරයා හැටියට ඔබතුමාගේ මැදිහත්වීමක් තිබෙන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. ආනයනය කිරීම නිසා සහල් අතිරික්තයක් තිබෙනවා කියන කාරණය උජාරුවට කෙසේ කිව්වත්, ඒක වලංගු වන්නේ නැහැ, ඔබේ එදා නියෝජනය අනුව. ඒ නිසා ඔබතුමන්ලා කවදාද සහල්වලට සාධාරණ මිලක් පාරිභෝගිකයාට දෙන්නේ? එදා ඔබ කියපු කාරණයයි මම මේ අහන්නේ. අමතක වෙලාද දන්නේ නැහැ නේ. සහල් මිල අඩු කරලා, වී මිල වැඩි කරලා සහනදායි ක්‍රමවේදයක් අනුව ගොවියාත්, පාරිභෝගිකයාත් රැකගන්නා වැඩ පිළිවෙළක් පිළිබඳව ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු දෙවැනි අතුරු ප්‍රශ්නයට විශේෂයෙන් උත්තරයක් දෙන්න ඕනෑ. මොකද, 2015න් පසුව අපේ රටේ වී නිෂ්පාදනයේ මෙට්‍රික් ටොන් මිලියන 5 ඉක්ම වූ අඛණ්ඩ අවුරුදු දෙක තමයි 2025 සහ 2026 කියන්නේ. මේ අවුරුද්දේ මේ වනකොට අපි සහල් මෙට්‍රික් ටොන් මිලියන 5.29ක් පමණ නිෂ්පාදනය කර තිබෙනවා. අපේ රටේ රතු කැකුළු සහ සුදු කැකුළු, නාඩු, කීරි සම්බා සහ සම්බා කියන සහල් වර්ග හතර පරිභෝජනය කරනවා. හැබැයි, අපේ අවශ්‍යතාව අනුව කීරි සම්බා නිෂ්පාදනයේ අඩුවක් තිබෙනවා. කීරි සම්බා නිෂ්පාදනයේ අඩුව නිසා වෙළෙඳ පොළ තුළ කීරි සම්බා මිල වේගයෙන් ඉහළ ගියා. අනෙක් පැත්තෙන්, අතිරික්ත සහල් නිෂ්පාදනයක් තිබෙනවා. අපට වී අතිරික්තයක් තිබෙනවා. ඒ අතිරික්තය නිසා වෙළෙඳ පොළ තුළ සහල් සැපයුමේ වැඩිවීමක් තිබෙනවා.

අපි ලංකා සතොස ආයතනයට සහල් සඳහා වෙච්ච ටෙන්ඩරය තිබෙනවා. ඒ ටෙන්ඩරයට අනුව අපට සහල් මිල ගණන් ඇවිත් තිබෙනවා. ඒ අනුව, රතු කැකුළු සහල් කිලෝවක මිල රුපියල් 183.25යි. සුදු කැකුළු කිලෝවක මිල රුපියල් 184යි. මේ විධියට ගත්තාම රුපියල් 220ට විකුණන කැකුළු සහල් කිලෝව අපි රුපියල් 200ට අඩුවෙන් විකුණනවා. රුපියල් 230ට තිබෙන නාඩු කිලෝව අපි රුපියල් 210ට විකුණනවා. ගරු කථානායකතුමනි, වෙළෙඳ පොළ තුළ සහල් අතිරික්තයක් තිබෙන එක පාලනය කරන්න අපි එක පැත්තකින් සහල් මිල ස්ථාවර කරන්න ඕනෑ. එහෙම නම් වී මිල ස්ථාවර කරන්න ඕනෑ. වී මිල ස්ථාවර කිරීම සඳහා රජය ප්‍රතිපත්තිමය ලෙස තීරණයක් අරගෙන ඉතිහාසයේ කවදාවත් නොකරපු දෙයක් කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව, රට පුරා සිටින මෝල් හිමියන් 600කට වැඩි ප්‍රමාණයකට රුපියල් ලක්ෂ 250 ගණනේ දීලා තිබෙනවා - මාස 8ක් පොලී නැතිව - රුපියල් 120ට වී ගන්න. ඒ සඳහා මේ වන විට රුපියල් මිලියන 4,700ක් දීලා තිබෙනවා. ඒ වාගේම,- *[බාධා කිරීමක්]* කොයි කාලයේද කළේ? පොලිය නැතිව කොයි කාලයේද සල්ලි දුන්නේ? *[බාධා කිරීමක්]* පොලිය නැතිව කොයි කාලයේද සල්ලි දුන්නේ? එක දවසක් කියන්න. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, දුන්නා, දුන්නා කියන ඒවා දීලා තිබෙන්න එපායැ. දීපුවා තවමත් එකතු කර ගන්නවා. අර "හිරු" ද මොකක්ද කියන කට්ටියකට වී ගන්න සල්ලි දීලා, මේ වෙනකොට ආහාර දෙපාර්තමේන්තුවට විතරක් රුපියල් මිලියන 400ක් ගන්න තිබෙනවා, මේගොල්ලන් වී මෝල්වලට 2015-2019 කාලයේ දීපු සල්ලිවල. පොඩි ගණන් නොවෙයි තිබෙන්නේ. ඒ ගැන ඕනෑ නම් කියන්නම්.

ඒ විතරක් නොවෙයි, වී අලෙවි මණ්ඩලයට යල කන්නය සඳහා රුපියල් මිලියන 8,500ක් දුන්නා. මහ කන්නයට රුපියල් මිලියන 10,000ක් දුන්නා. ඒ අනුව කන්න දෙකට රුපියල් මිලියන 18,500ක් දුන්නා. ඒ නිසා වී අලෙවි මණ්ඩලය වී ගන්නවා. වී මෝල් හිමියන් වී ගන්නවා. ඒ අනුව රුපියල් 120ට වී කිලෝවක් මිලදී ගැනීම සඳහා වැඩ පිළිවෙළක් හදලා, ඉතිහාසයේ කවදාවත් නොකරපු වැඩක් කරලා, සියයට 6, 7, 8 පොලියට රුපියල් මිලියන 4,700ක් මේ වෙනකොට මෝල් හිමියන් 600කට වැඩි ප්‍රමාණයකට අපි දීලා තිබෙනවා.

වෙළෙඳ පොළ තුළ රජය සියයට සියයක් වී මිලදී ගන්නේ නැහැ. එම නිසා ඒ වී මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී වී මිල පාලනය කරන්න අවශ්‍ය කරන, වී මිල සහතික මිලකට ගෙනෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ හරහා මේ වනකොට මෝල්හිමියන් කිලෝව රුපියල් 120 ගණනේ වී මිලදී ගන්නවා. වී අලෙවි මණ්ඩලය මේ අවුරුද්දට විතරක් මෙට්‍රික් ටොන් 120,000ක් අරගෙන තිබෙනවා. ඒ මිලදී ගැනීම හරහා වෙළෙඳ පොළේ අමු වී සඳහා තිබුණු රුපියල් 70ක, 80ක මිල රුපියල් 95, 100 අතරට ඇවිල්ලා තිබෙනවා. වේළුණු වී කිලෝව රුපියල් 120ට ගැනීමට අපි කටයුතු කරනවා. තවත් යම් ප්‍රමාණයක් ප්‍රශ්න තිබෙන බව මම කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මොකද, තවදුරටත් වී මිලදී ගැනීම සඳහා යන්ත්‍රණය ශක්තිමත් කරන්න, වී වෙළෙඳ පොළ සහතික කරන්න වැඩ පිළිවෙළක් වුවමනායි. ඒකට ගත හැකි ක්‍රියාමාර්ග ලෙස තමයි, පොලී නැතුව ව්‍යාපාරිකයන්ට ණය දීලා වී ගන්න

වැඩ පිළිවෙළක් හැදුවේ. මේ යල කන්නයේ විතරයි ඉතිහාසයේ පළමුවැනි වතාවට ඒක ක්‍රියාත්මක කළේ. ඒ හරහාත් යම් උත්තරයක් අපි හොයලා තිබෙනවා. තවදුරටත් මේකට උත්තරයක් හොයන්න අපි මැදිහත් වෙනවා. මොකද, වී වෙළෙඳ පොළෙන් අඩුම ගණනේ සියයට 15ක්වත් ආණ්ඩුවට මිලදී ගන්න පුළුවන් නම් වී මිල ස්ථාවර කරන්න පුළුවන්. අපි මේ වෙනකොට සියයට 7කට ආසන්න ප්‍රමාණයක් මිලදී ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා.

## උපයන විට ගෙවීමේ බද්ද: විස්තර
## உழைக்கும்போதே செலுத்தும் வரி: விபரம்
## PAYE TAX: DETAILS

142/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උපයන විට ගෙවීමේ බද්ද (PAYE Tax) හඳුන්වා දුන් දිනය කවරේද;

(ii) එම බද්ද ක්‍රියාත්මක වන ක්‍රමවේදය කවරේද;

(iii) වර්ෂ 2022 සිට 2025 දක්වා එම බද්ද මඟින් රජයට ලැබුණු ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම බද්ද හේතුවෙන් මෙරට වෘත්තීයවේදීන් අපහසුතාවකට පත්ව ඇති බව පිළිගන්නේද;

(v) එම බද්ද සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உழைக்கும்போதே செலுத்தும் வரி (PAYE Tax) அறிமுகப்படுத்தப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி வரி நடைமுறைப்படுத்தப்படும் முறை யாது என்பதையும்;

(iii) மேற்படி வரியின்மூலம் 2022ஆம் ஆண்டு தொடக்கம் 2025ஆம் ஆண்டு வரை, அரசாங்கம் பெற்றுக்கொண்ட வருமானம் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி வரியின் காரணமாக இந்நாட்டிலுள்ள தொழில் வல்லுநர்கள் அசௌகரியங்களுக்கு உள்ளாகியுள்ளனர் என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(v) மேற்படி வரியைத் திருத்துவதற்காக மேற்கொள் ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the date on which the PAYE Tax was introduced;

(ii) the methodology by which the aforesaid tax is implemented;

(iii) the amount of revenue that the Government received from the aforesaid tax from 2022 to 2025, separately in respect of each year;

(iv) whether he accepts that the professionals in this country have been inconvenienced due to the aforesaid tax; and

(v) the measures that will be taken to revise the aforesaid tax?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සේවකයින්ගේ වේතන හා වැටුප්වලින් සේවායෝජකයින් විසින් ආදායම් බදු අඩු කිරීමේ ක්‍රමයක් ශ්‍රී ලංකාවේ 1932 ආදායම් බදු ආඥාපනත යටතේ පැවති අතර, එය අනිවාර්ය ක්‍රමයක් නොවීය. 1969 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මඟින් මූලාශ්‍රයේදීම බදු අයකර ගැනීම අනිවාර්ය කරන ලදී. කෙසේ වෙතත්, විධිමත් හා ක්‍රමානුකූල "Pay-As-You-Earn - PAYE" බදු ක්‍රමය නිල වශයෙන් 1971 වර්ෂයේදී ක්‍රියාත්මක විය.

(ii) සේවායෝජකයින් විසින් නීතියෙන් නියම කර ඇති බදු නිදහස් සීමාව ඉක්මවන මාසික රැකියා ආදායම මත අනුක්‍රමික බදු මුදලක් සෘජුවම අඩු කරනු ලබයි. එසේ අඩු කරන ලද බදු මුදල් ඊළඟ මාසයේ 15වන දිනට හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සේවායෝජකයා විසින් ප්‍රේෂණය කළ යුතුය. බදු මුදල ගණනය කිරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - CGIR - විසින් ප්‍රකාශයට පත් කරන ලද බදු වගුව - Tax Table එක - භාවිත කරනු ලැබේ.

(iii)

| වර්ෂය | **PAYE** බදු ආදායම (රුපියල් මිලියන) |
|---|---|
| 2022 | 25,546 |
| 2023 | 144,955 |
| 2024 | 197,572 |
| 2025 | 201,120 |
| මුළු එකතුව | **569,193** |

[ගරු නිශාන්ත ජයවීර මහතා]

(iv) මෙම බදු වගකීම වෘත්තිකයන්ට පමණක් සීමා නොවේ. දේශීය ආදායම් පනත යටතේ මාසිකව රුපියල් 150,000 ඉක්මවන ආදායමක් උපයන සියලු සේවකයින් මූලාශ්‍රයේදී අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්දට - Advance Personal Income Tax, APIT එකට - යටත් වේ. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් ආදායම් ලබන පුද්ගලයින්ගේ බදු අය කළ හැකි ආදායම නීතියෙන් නියම කර ඇති සීමාව ඉක්මවන්නේ නම් එම පුද්ගලයින්ද පුද්ගලික ආදායම් බද්දට යටත් වේ.

(v) රජයේ මූල්‍ය අවශ්‍යතා සහ ආර්ථික තත්ත්වයන් මත PAYE වාර්ෂික බදු නිදහස් සීමාව විවිධ අවස්ථාවලදී සංශෝධනය කර ඇත. 2019 දක්වා රුපියල් 1,200,000ක් වූ එය 2020දී රුපියල් 3,000,000 දක්වා වැඩි කරන ලදී. නැවතත් 2022/2023 තක්සේරු වර්ෂයේදී රුපියල් 1,200,000 දක්වා අඩු කරන ලද එය 2025දී රුපියල් 1,800,000 දක්වා වැඩි කරන ලදී. අනාගතයේදී PAYE බදු නිදහස් සීමාව සහ බදු අනුපාතවල වෙනස්කම් සිදු කරන්නේ නම් එය රජයේ ආදායම් මත පදනම් වූ මූල්‍ය ඒකාග්‍රතා - fiscal consolidation - ක්‍රියාවලියේ ප්‍රගතිය සැලකිල්ලට ගනිමින් තීරණය කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් අවසාන පිළිතුර තමයි ඉතා වැදගත් වන්නේ. මොකද, ඔබේ ජන වරමේදී උපයන විට ගෙවීමේ බද්ද - PAYE Tax එක - සම්බන්ධයෙන් දුන් ඡන්ද පොරොන්දුවක් තිබෙනවා. එවකට තිබුණු රජය නිසා පෞද්ගලික අංශයේ සේවකයන්ට කෙසේ වෙතත් රාජ්‍ය අංශයේ සේවකයන්ට බරපතළ ප්‍රශ්නයක් තිබුණා. එහිදී තමයි තමුන්නාන්සේලා කිව්වේ, "අපි බලයට ආවාට පසුව මේක ලක්ෂ දෙකේ සීමාවට ගෙනියනවා. එතකොට උගතුන්ගේ, වියතුන්ගේ වැටුපට අය කළ අසීමිත බද්ද නිසා වෙච්ච මානසික පීඩනය වාගේම සේවා ආතතිය වාගේ කාරණා සියල්ල නැති කරන්න පුළුවන්" කියලා. ඒ විධියට තමයි ඔබතුමන්ලා එදා වේදිකාවලදී කිව්වේ. හැබැයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා ඔය කියන කාරණා සහ නීතිය එදා දැන නොගෙන ඉන්න විධියක් නැහැ නේ.

නීත්‍යානුකූලව කරන ක්‍රමවේදය පිළිබඳ පිළිතුර ඔබතුමා මගේ ප්‍රශ්නයේ (v) කොටසට ලබා දුන්නා. හැබැයි, ඒක නොදැන ඉන්න විධියක් නැහැ. තමුන්නාන්සේලා වුණත් මේ අය කර ගැනීම කරන්නේ මේ කියන ආකාරයට විවිධ අවස්ථාවලදී උච්චාවචන වෙන වෙලාවට රජයට ලැබෙන ආදායම මත මේක ලබා ගත යුතුයි කියන කාරණය දැනගෙනයි. ඒ බව දැන දැනත් එදා ඔබතුමන්ලා අර විධියට කිව්වාද, එහෙම නැත්නම් මෙහිදී ඔබතුමන්ලා ඡන්දය ලබා ගැනීම වෙනුවෙන් එම කාරණය කිව්වාද කියන එකත් අපට හැඟෙනවා. ඔබතුමන්ලා ප්‍රකාශ කළ කාරණය ඉටු නොවුණු නිසායි අපට එහෙම හිතෙන්නේ. බදු නිදහස් සීමාව ලක්ෂ දෙක දක්වා ගෙන එනවාය කියන කාරණය ප්‍රකාශ කළේ බොරුවටද කියන කාරණය සමාජය තුළ දැන් මතුව තිබෙනවා. එබැවින්, මෙම කාරණා දෙකෙන් කොයි කාරණයද ඔබතුමන්ලා හරියටම කරන්නේ? මොකද, දැන් දැනුවත් වෙන්න එපායැ. අපේ චෝදනාව තමයි, ඔබතුමන්ලා බොරු කිව්වාය කියන කාරණය. ලක්ෂ දෙකට ගියේ නැහැ නේ. එම සීමාව ලක්ෂ දෙකට අරගෙන යනවාද, අරගෙන යන්න පුළුවන්ද, අරගෙන ගිහිල්ලා ඔබතුමන්ලා ලබා දුන් පොරොන්දු ඉටු කරනවාද, එහෙමත් නැත්නම් මෙම රජය පවතින නීති හා රෙගුලාසි අනුව ඉදිරියට කටයුතු කරනවාද යන්න පිළිබඳව මේ සභාව දැනුවත් කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, පැහැදිලිවම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිසිදු අසත්‍ය ප්‍රතිපත්තියක් ඇතුළත් කරලා නැහැ. අප විසින් ප්‍රකාශ කළ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරනවා. කෙසේ වෙතත්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කරලා නැහැ, අපි බලයට පත්වූ පළමු අවුරුද්දේම බදු නිදහස් සීමාව ලක්ෂ දෙක දක්වා ගෙන එනවාය කියලා. නමුත්, අපි ඇවිල්ලා ඉදිරිපත් කළ පළමු අය වැයෙන්ම මාසයකට රුපියල් ලක්ෂයක් වන විධියට වාර්ෂිකව රුපියල් ලක්ෂ 12ක්ව පැවති බදු නිදහස් සීමාව, මාසයකට රුපියල් එක්ලක්ෂ පනස්දහස සහ වාර්ෂිකව රුපියල් ලක්ෂ 18 දක්වා වශයෙන් ඉහළ නැංවීමට කටයුතු කළා.

එමෙන්ම, පෙර පැවති බදු ක්‍රමය යටතේ බදු නිදහස් සීමාව ඉක්මවා එන පළමු රුපියල් ලක්ෂ 5 සඳහා සියයට 6ක බදු අනුපාතයක් අය කරනු ලැබුවා. නමුත්, අපි බලයට පත්වීමෙන් අනතුරුව රුපියල් ලක්ෂ 18ක බදු නිදහස් සීමාව ලබාදෙන ගමන්, එම සීමාව ඉක්මවා එන පළමු රුපියල් ලක්ෂ 10 සඳහා සියයට 6ක බදු අනුපාතයක් අය කිරීම වශයෙන් සහනයක් ලබාදුන්නා. ඒ අනුව, මේ වන විට මෙම සහනය ලබා දී තිබෙනවා. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම් ශක්තිමත් කර ගැනීමත් සමඟ අප විසින් ලබා දුන් පොරොන්දුව ඉටු නොකර ඉන්නේ නැහැ. පැහැදිලිවම එම පොරොන්දුව ඉටු කරනවා. මේ වන විට ගරු ජනාධිපතිතුමා විවිධ පාර්ශ්ව සමඟ සාකච්ඡා පවත්වා, එම කටයුතු සිදු කරන්නේ කුමන ආකාරයෙන්ද යන්න පිළිබඳව අවශ්‍ය තීන්දු තීරණ ගනිමින් ඉන්නවා. කොහොමත් අපි රජයක් විධියට පැහැදිලිවම, ඔබ කිව්වත් නැතත් මේ බදු අනුපාත තවදුරටත් අඩු කරන මධ්‍යකාලීන ප්‍රතිපත්තියක තමයි ඉන්නේ. හැබැයි, අපට ඒක අඩු කරන්න වෙන්නේ අපේ බදු පදනම පුළුල් කර ගැනීම සහ බදු අනුකූලතාව ඉහළ නංවා ගැනීම ඇතුළේ. ඒකට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග රජය විධියට අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, 2025 අවුරුද්දේ අපේ ආදායම් රැස්කිරීමේ යන්ත්‍රණය ඉතාම ශක්තිමත් වීම ඇතුළේ මොනවාද කළේ කියලා. රජයක් විධියට, "දිට්වා" සුළි කුණාටුව වෙනුවෙන් විපතට පත් වූ ජනතාවට, ව්‍යවසායකයන්ට යටිතල පහසුකම් ඇතුළු ඒ සියල්ල ගොඩනඟන්න පිටින් ණය ගන්නේ නැතිව, රුපියල් බිලියන පන්සියයක් මුදාහරින්න අපි සමත් වුණා. ඒත් එක්කම, මැද පෙරදිග යුද්ධය හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන්, ව්‍යාපාර වෙනුවෙන් රුපියල් බිලියන සියයක් මුදා හරින්න සමත් වුණේ බදු ආදායම් රැස්කිරීම වඩාත් හොඳින් සිදුවන හින්දා. ඒ වාගේම අපි මෑතකදී තීන්දු තීරණ ගත්තා, අධිවේගී මාර්ග තුනක් ඉදිකිරීමට අවශ්‍ය මුදල් අපේ දේශීය මුදලින් යොමු කරන්න. ඊට අමතරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නව ගොඩනැගිල්ලක්, බදු ගෙවන්නන්ට වඩාත් හොඳ පරිශ්‍රයක් රජයේ මුදලින් ඉදිකරන්න රුපියල් බිලියන 32ක් වෙන් කළා.

ළඟදී ලබාදුන් මෙට්‍රෝ බස් සේවාව වාගේ තවත් එවැනි විශාල ප්‍රතිලාභ රැසක් ලබාදීමට සමත් වෙන්නේ බදු ආදායම් රැස්කිරීමේ වඩාත් හොඳ යන්ත්‍රණයක් තිබෙන නිසා. මේ යන්ත්‍රණය ඇතුළේ බදු ආදායම වඩා හොඳින් රැස් කර ගන්නා ගමන්ම, ඉදිරියේදී රජයක් විධියට අපේ මධ්‍යකාලීන ප්‍රතිපත්තිය වෙන්නේ මේ වැඩි බදු අනුපාත අඩු කිරීම සහ අපි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දාලා තිබෙන සෑම පොරොන්දුවක්ම පැහැදිලිව ඉෂ්ට කිරීමයි. ඒ වෙනුවෙන්

අවශ්‍ය කටයුතු සහ තීන්දු තීරණ මේ වෙනකොට රජය විධියට, මුදල් අමාත්‍යාංශය විධියට සහ ජනාධිපතිතුමා විධියට ගනිමින් සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගමේ කථාවක් තිබෙනවා නේ, "නංගී පෙන්නලා අක්කා දුන්නා වාගේ" කියලා. මේ ආණ්ඩුවට කියන්න තිබෙන්නේත් ඒකමයි. හරිනි ඇමතිතුමිය පෙන්නලා රට කනවා වාගේ වැඩක් තමයි මේ වෙන්නේ.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "අපි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොහේවත් බදු ගැන ලිඛිතව සඳහන් කරලා නැහැ" කියලා. දැනුත් ඔබතුමා අසත්‍යයක් නේ කිව්වේ. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔහොම අසත්‍ය කියන්න එපා කියලා. 57වන පිටුවේ තිබෙනවා, රුපියල් ලක්ෂ එකහමාර, ලක්ෂ දෙක කරනවා කියලා. ඒක කියවන්න කියලා මම ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* ඒක, ඔබතුමා කියපු එකට උත්තරය.

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු කථානායකතුමනි, රටක ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ රජයේ බදු ආදායමයි. බදු අය කිරීම, එක එක රාජ්‍යයන් ගන්නා ප්‍රතිපත්ති අනුව වෙනස් වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අරගෙන තිබෙන ප්‍රතිපත්තිය හරිද, වැරැදිද කියලා ජනතාව තීන්දු කරයි. නමුත් මම ඔබතුමාගෙන් කාරණයක් අහන්න කැමැතියි. මේ වෙලාවේ පාසල් දරුවෝත් විශාල ප්‍රමාණයක් පාර්ලිමේන්තු ගැලරියේ ඉන්නවා. ඔබතුමන්ලා මේ රටේ පාසල් දරුවන් වෙනුවෙන් සුවිශේෂී ප්‍රකාශයක් කළා. ඒක පාසල් දරුවන් වාගේම මේ රටේ සමස්ත ජනතාව ඉතා ආදරයෙන් වැළඳ ගත්තු කාරණාවක්. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට භාවිත කරන පාසල් උපකරණ සඳහා පනවා තිබෙන සියයට 18ක විශාල VAT එක අඩු කරන බවට, ආසන්න වශයෙන් පහෙන් එකක් අඩු කරන බවට, ඒ කියන්නේ රුපියල් 100ක කොපි පොතක් රුපියල් 80ට දෙන බවට ප්‍රකාශයක් කළා. එය මේ රටේ සියලු ජනතාව ඉතාම ආදරයෙන් වැළඳ ගත්තා. "අපි බලයට ආපු ගමන් ඒක කරනවා" කිව්වා. හැබැයි, දැන් ආණ්ඩුව ඇවිත් අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. මේ රටේ පාසල් දරුවන් රවට්ටලා තිබෙනවා. රුපියල් ලක්ෂ එකහමාරේ තිබුණු PAYE Tax අය කිරීමේ සීමාව රුපියල් ලක්ෂ දෙක කරනවා කිව්වා. කියපු එක ඔබතුමා නැහැ කිව්වා. නමුත් ඒක දැන් ඔප්පු වුණා. මේ කාරණාවත් බොරුවක්ද, මේක කරන්න ආණ්ඩුවට බැරිද කියන එක මා අහන්න කැමතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, එය ප්‍රතිපත්ති ප්‍රකාශයේ නැහැ කියලා අපි කිව්වේ නැහැ. ඒක එහි තිබෙනවා. ඒක ඉටු කරන්න අවශ්‍ය කටයුතු අපි ඉදිරියේදී කරනවා. ඉදිරියේදී අපි රුපියල් ලක්ෂ 2 දක්වා වන බදු නිදහස් සීමාව අනිවාර්යයෙන්ම ලබා දෙනවා. ඒත් එක්කම, අපි පාසල් දරුවන්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දීලා තිබෙනවා. VAT එකට සහනයක් විධියටයි ඒ රුපියල් 6,000ක දීමනාව ලබා දීලා තිබෙන්නේ. ඒක තමයි ඒකෙන් කරලා තිබෙන්නේ. පළමුවැනි වතාවටයි එවැන්නක් කරලා තිබෙන්නේ. ඒක ඔබතුමන්ලා දන්නේ නැතුව ඇති.

ඉදිරියේදී අපි ඔය බදු ආදායම් රැස් කිරීමේ යන්ත්‍රණය ශක්තිමත් කරලා මේ රටේ ජනතාවට ඒ ප්‍රතිලාභ ලබා දෙනවා. අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ VAT අනුපාතය අඩු කිරීමයි. මා අර කලිනුත් පැහැදිලිව කිව්වා වාගේ, අපි හිතනවා අපේ VAT අනුපාතය වැඩියි කියලා. ඒක අඩු කරන්න ඕනෑ. මොකද, රටේ ජනතාව විශාල ප්‍රමාණයක් ඒකෙන් පීඩා විඳිනවා. ඒක අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය. අපි එතැනට යන ගමනක තමයි ඉන්නේ. එතැනට යන්න අවශ්‍ය සියලු කටයුතු අපි කරලා තිබෙනවා.

සහන දෙන්න අවශ්‍ය ප්‍රජාවන්ට වුවමනා සහන දෙන්න අවශ්‍ය කටයුතු ඉදිරියේදී අපි අනිවාර්යයෙන්ම කරනවා. ඔබතුමන්ලා ඒ දිහා බලාගෙන ඉන්න. මොකද, අපි කට වචනයට නොවෙයි, ඉලක්කම්වලින් අපේ ජයග්‍රහණ පැහැදිලිව පෙන්වා තිබෙනවා, අය වැය තුළ. මේ වාගේ දේවල් ඔබතුමන්ලාට කවදාවත් කරන්න බැරි වුණා නේ. දැන් ඔබතුමන්ලා මේ ගැන කොච්චර කිව්වත්, ඔබතුමන්ලාට මේ ජයග්‍රහණ ලබා ගන්න බැරි වුණා නේ. අය වැයකින් ඉදිරිපත් කරපු ආදායම ඉක්මවා ගිය ආදායමක් ලබා ගන්න ඔබතුමන්ලාට හැකි වුණේ නැහැ නේ. ඉතිහාසයේ පළමුවැනි වතාවට අපි ඒක කරලා පෙන්නුවා නේ. මේ කටයුතු එක්ක බදු ආදායම රැස් කිරීමේ යන්ත්‍රණය ශක්තිමත් කරලා අපේ රටේ ජනතාවට සහන ලබා දෙන්න අපි ඉදිරියේදී කටයුතු කරනවා. අපි ඒකට අවශ්‍ය තීන්දු තීරණ ගන්නවා, නීතිමය පසුබිම සකස් කරනවා. කවුරුත් දන්නවා නේ, මෙච්චර කාලයක් පැවැති ඔබතුමන්ලාගේ බදු ක්‍රමයේ තිබිච්ච සංකීර්ණතා ඉවත් කරන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන අපි මේ පාර්ලිමේන්තුවේ සම්මත කළ බව. බදු ක්‍රමය සරල කරන්න, ඒ සඳහා නවීන තාක්ෂණය යොදා ගන්න අවශ්‍ය කටයුතු අපි රජය විධියට, මුදල් අමාත්‍යාංශය විධියට මැදිහත් වෙලා ඉතාම කඩිනමින් කරනවා. ඒවායේ ප්‍රතිඵල ඉදිරියේදී ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන් වෙයි. මොකද, ජනතාවට වුණත් ජනාධිපති අරමුදල හරහා ප්‍රතිලාභ ලැබෙනවා. අන්න ඒ වාගේ ප්‍රතිලාභ ලබා දෙන ගමන්ම අප ඊළඟට කරන දේ ඉදිරියේදී ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන් වෙයි.

අද මේ ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ විශ්වාසය වැඩි වෙලා තිබෙනවා. මොකද, මේ බදු ආදායම් රැස් කිරීමේ යන්ත්‍රණය තුළ ඒ ප්‍රතිලාභ විවිධ ආකාරයෙන්, විවිධ සේවා විධියට ජනතාව වෙත ගලාගෙන යනවා. එය දැන් හැමෝටම ඇස් පනා පිට පෙනෙනවා. මෙන්න මේ ප්‍රතිඵලත් එක්ක බදු ගෙවන ජනතාවගේ විශ්වාසයත් වැඩි වෙලා තිබෙනවා; බදු ගෙවන ජනතාව වැඩියෙන් බදු ගෙවන්න පෙලඹිලා ඉන්නවා. මේ සියලු කාරණා කැටි කොට ගෙන අපි ඉදිරියේදී අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ බදු සම්බන්ධයෙන් දක්වා තිබෙන සියලු පොරොන්දු අනිවාර්යයෙන් ඉෂ්ට කරන්න කටයුතු කරන බව තමයි මට කියන්න තිබෙන්නේ.

## වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව: විස්තර
சிறுநீரக நோயாளர்களுக்கு வழங்கப்படும் கொடுப்பனவு: விபரம்
ALLOWANCE PROVIDED TO KIDNEY PATIENTS: DETAILS

686/2025

**3. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

(අ) (i) වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව ලබා ගන්නා පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වන විට එම රෝගීන්ට ලැබෙන දීමනාව කොපමණද;

(iii) එම දීමනාව ලබා ගැනීම සඳහා දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iv) එම පිරිස සඳහා දීමනාව ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறுநீரக நோயாளர்களுக்கு வழங்கப்படும் கொடுப்பனவைப் பெறும் குடும்பங்களின் எண்ணிக்கை, ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) தற்போது மேற்படி நோயாளிகளுக்குக் கிடைக்கும் கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கொடுப்பனவைப் பெற்றுக்கொள்வதற் காக தற்போது காத்திருப்போர் பட்டியலில் இருப்பவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி நபர்களுக்கான கொடுப்பனவை வழங்குவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House the -

(i) number of families receiving the allowance provided to kidney patients in each Divisional Secretary's Division, separately;

(ii) amount of the allowance provided to patients as of now;

(iii) number of individuals currently on the waiting list to receive the said allowance; and

(iv) measures that will be taken to provide the allowance to those individuals?

(b) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පුද්ගල සංඛ්‍යාව ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

ගරු මන්ත්‍රීතුමනි, නිශ්චිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තොරතුරු දැන ගැනීමට ඔබතුමාට අවශ්‍ය නම් මගෙන් අහන්න. මේ වෙලාවේ මට ඒ විස්තර කියන්න පුළුවන්.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**

(மாண்புமிகு ரோஹண பண்டார)

(The Hon. Rohana Bandara)

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැන විතරක් කියන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)

(The Hon. (Dr.) Upali Pannilage)

සමස්තයක් වශයෙන් මේ වන කොට 53,604දෙනෙකුට වකුගඩු දීමනාව ලබා දෙනවා.

<u>දිස්ත්‍රික් මට්ටමින් පුද්ගල සංඛ්‍යාව පහත පරිදි වේ.</u>

| වකුගඩු රෝගී දීමනාලාභීන් සඳහා රු.10,000ක ජීවනාධාර දීමනාව ලබා දීම | | |
|---|---|---|
| අනු අංකය | 2026 අගෝස්තු මාසය සඳහා වකුගඩු දීමනා ගෙවීමට හඳුනාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
| | දිස්ත්‍රික්කය | සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් |
| 1 | කොළඹ | 1,610 |
| 2 | ගම්පහ | 1,940 |
| 3 | කළුතර | 1,608 |
| 4 | මහනුවර | 1,901 |
| 5 | මාතලේ | 3,062 |
| 6 | නුවරඑළිය | 696 |
| 7 | ගාල්ල | 1,434 |
| 8 | මාතර | 1,052 |
| 9 | හම්බන්තොට | 1,370 |
| 10 | යාපනය | 458 |
| 11 | මන්නාරම | 288 |
| 12 | වව්නියාව | 2,683 |
| 13 | මුලතිව් | 1,028 |
| 14 | කිලිනොච්චිය | 301 |
| 15 | මඩකලපුව | 469 |
| 16 | අම්පාර | 2,130 |
| 17 | ත්‍රිකුණාමලය | 1,278 |
| 18 | කුරුණෑගල | 5,845 |
| 19 | පුත්තලම | 1,959 |
| 20 | අනුරාධපුරය | 8,184 |
| 21 | පොළොන්නරුව | 5,536 |
| 22 | බදුල්ල | 3,183 |
| 23 | මොනරාගල | 2,127 |
| 24 | රත්නපුර | 2,445 |
| 25 | කෑගල්ල | 1,017 |
| එකතුව | | 53,604 |

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මෙම තොරතුරු පවුල් සංඛ්‍යාව වශයෙන් නොව පුද්ගලයන් වශයෙන් සඳහන් කර තිබෙනවා.

(ii) එක් අයෙකු සඳහා දැනට මාසිකව ලබා දෙන දීමනාව රුපියල් 10,000යි.

(iii) වකුගඩු දීමනාව ලබා දීම සඳහා දැනට පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන යන්නේ නැහැ. ලැබෙන සුදුසුකම් සහිත ඉල්ලීම් ගෙවීම් සඳහා මාසිකව ඉදිරිපත් කරනු ලබන නිසා පොරොත්තු ලේඛනයක් නඩත්තු කරන්නේ නැහැ. ඉල්ලුම් කරන අයගේ සුදුසුකම් අනුව දිගටම එම දීමනාව ලබා දීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව පිළිබඳව ඔබතුමා සඳහන් කළා. හැබැයි, අපි හැමෝම දන්නවා, වකුගඩු රෝගියෙක් බවට හඳුනා ගත්ත දවසේ ඉඳලා ඒ ආධාරය ලබා දීමේ ක්‍රමවේදයක් අපේ රටේ ක්‍රියාත්මක වුණු බව. ඒක ඒ අයට ලොකු හයියක් වුණා. වකුගඩු රෝගීන් ඒ පිළිබඳව දැනුවත් වුණා. ඒ වාගේම රජයෙන් යම්කිසි දීමනාවක් ලැබෙනකොට ඔවුන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා, රෝගය පාලනය කරගැනීම වෙනුවෙන් ඔවුන්ගේ අවධානය යොමු කළා. හැබැයි, අද වනකොට වකුගඩුවල ක්‍රියාකාරිත්වය සියයට 30 දක්වා පහත වැටුණාම තමයි ඔබතුමන්ලා ආධාර ලබා දීම කරන්නේ. ඒ අනුව විශාල පිරිසකට ඒ ආධාරය ලබා දීම ඔබතුමන්ලා වළක්වා තිබෙනවා. මේ නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ වාගේම අලුතෙන් වකුගඩු රෝගීන් සොයා ගැනීම සඳහා ජාතික වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ ඒකකයෙන් පරීක්ෂණ කරගෙන ගියා. දැන් ඒක නතර කරලා තිබෙනවා. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන මට්ටමෙන් පරීක්ෂණ කරගෙන ගියා. සියයට 50ටත් අඩු ප්‍රමාණයට දැන් ඒ පරීක්ෂණ නතර වෙලා තිබෙනවා. වකුගඩු රෝගීන් වාර්තා වීම පිළිබඳව අපේ රටේ ලොකු භීතිකාවක් තිබුණා. ඉස්සර අපේ රටේ පිළිකා රෝගයට එහා ගිය බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබුණා වකුගඩු රෝගය. අපි ඒ ගැන අවධානය යොමු කරලා, ලොකු සටනක් දීලා, ඒ සම්බන්ධයෙන් සැහෙන ජයග්‍රහණයක් ලබා ගත්තා. ඒ වාගේම RO filters ලබා දුන්නා. දැන් ඒ RO filters ලබා දීමට රජය පැත්තෙන් මුදල් වෙන් කරලාත් නැහැ. ඒවා නඩත්තු කරන්න මුදල් ලබා දීමේ කටයුතු සිද්ධ වෙන්නේත් නැහැ. ඒ නිසා නැවත මේ රටේ වකුගඩු රෝගීන් වර්ධනය වීමේ ලොකු අවදානමක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා නව රජයක් විධියට, ලොකු පොරොන්දු කන්දරාවක් දීලා බලයට ආපු කණ්ඩායමක් විධියට ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්න කටයුතු කරනවාද?

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ විෂයයට අයිති නොවුණත්, මේ කාරණයත් මම කියන්න ඕනෑ. වකුගඩු රෝගීන්ට ලේ වර්ධනය වෙන්න ලබා දෙන ඉන්ජෙක්ෂන් එක සමහර රෝහල්වල නැහැ. සරලම කාරණ ගත්තොත්, පිරිටන් පෙත්තක් පවා නැති වෙච්ච අවස්ථා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙනුත් ඒ කාරණය බලපානවා. වකුගඩු රෝගීන් පිළිබඳ ප්‍රශ්නය සම්පූර්ණ වශයෙන් ගත්තාම අදාළ වෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයට නිසා මේ කියන කාරණා ඉදිරියේදී තවදුරටත් මේ විධියට වර්ධනය නොවෙන්න නම් පසුගිය කාල සීමාව පුරාවට කරගෙන ආපු කටයුතු වර්ධනය කළ යුතුයි. එක පැත්තකින්, filters භාවිතය හරහා වකුගඩු රෝගීන් ඇතිවීම වැළැක්වීම සිද්ධ වනවා. මේ රෝගය පිළිබඳව දැනගත්ත, හඳුනා ගත්ත කාලයේදීම එය පාලනය කරලා, මෙය යටපත් කරගෙන පවුලක් විනාශ වන එක නතර කරගන්න කටයුතු කරනවාද, නැත්නම් තවදුරටත් ඔබතුමන්ලා ගෙනියන මේ ජාතික ප්‍රතිපත්තියත් එක්ක වකුගඩුවත් එක්ක ඇඹිරිලා විනාශ වෙලා යන තැනටම රටේ ජනතාව පත් කරනවාද කියන කාරණය තමයි මට අහන්න වෙන්නේ.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එතුමා අහන ප්‍රශ්නයේ යම් කොටසක් අදාළ වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට. එතුමා සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඒ පිළිබඳව විමසීමක් කළොත් සෞඛ්‍ය ඇමතිතුමා ඊට පිළිතුරු ලබා දේවි.

විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන කොටස ගත්තොත්, අපි වකුගඩු රෝගාබාධවලින් පෙළෙන අයට ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළ කිසිම ආකාරයකින් සීමා කරලා නැහැ. උදාහරණයක් විධියට ගත්තොත්, 2015 අවුරුද්දේ 17,000කට තමයි රුපියල් 3,000 ගණනේ ලබා දුන්නේ. අපි බලයට එනකොට 2024 අවුරුද්දේ 41,000කට තමයි මේ ආධාර ලබා දුන්නේ. රුපියල් 5,000 ගණනේ තමයි වකුගඩු රෝගීන්ට මුලින් ලබා දුන්නේ. අපි මේ වනකොට වකුගඩු රෝගීන් 53,604දෙනෙකුට එම දීමනාව ලබා දෙනවා. වකුගඩු රෝගීන්ට ලබා දෙන මාසික දීමනාවත් රුපියල් 10,000 දක්වා අපි වැඩි කරලා තිබෙනවා. මේ අයගෙන් බහුතරයක්ම රුපියල් 10,000 හෝ රුපියල් 17,500 අස්වැසුම ප්‍රතිලාභ දීමනා ලබන අය. ඊට අමතරව තමයි වකුගඩු රෝගීන්ට මේ දීමනාවත් ලබා දෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, කලින් එක දීමනාවක් ලබා දුන්නා නම්, ඒ කියන්නේ අස්වැසුම ප්‍රතිලාභ දීමනාව, නැත්නම් සමෘද්ධි සහනාධාරය දුන්නා නම් වෙනත් ආධාරයක් දෙන්නේ නැහැ කියන එක ඔබතුමා දන්නවා. නමුත් දැන් අස්වැසුම ප්‍රතිලාභ දීමනාව ලැබුණත්, අමතර දීමනාවක් විධියට ඔවුන්ට මේ දීමනාවත් අපි ලබා දෙනවා. ඒ නිසා අපි මේ දීමනාව ලබා දෙන ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණයේ යම් සත්‍යයක් තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිර්දේශ කරලා තිබෙනවා, eGFR අගය සියයට 30ට වඩා අඩු අයට දැනට වකුගඩු රෝගීන්ට ලබා දෙන ආධාර ලබා දීම සුදුසුයි කියලා. ඒ නිර්දේශය මත තමයි දැනට මේක ක්‍රියාත්මක වන්නේ. කලින් තිබුණා, කිසියම් පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන යමින් මේ දීමනාව ලබා දීමේ ක්‍රමයක්. නමුත් එහෙම නැතුව වකුගඩු රෝගීන් සම්බන්ධයෙන් ලැබෙන සියලු අයදුම්පත් සඳහා ඒ රුපියල් 10,000ක දීමනාව අපි නියමිත නිර්දේශ මත ලබා දෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අපේ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රකාශයෙන් කියැවුණා, 53,000කට ආසන්න වකුගඩු රෝගීන් ප්‍රමාණයකට මේ දීමනාව ලබා දෙන බව. ඒ වාගේම අපි දන්නවා, ඔබතුමන්ලා වකුගඩු රෝගීන්ට එම දීමනාව විතරක් නොවෙයි, අස්වැසුම ප්‍රතිලාභ දීමනාවත් ලබා දෙනවා කියලා. ඊයේ පෙරේදා මට මතක විධියට මස්කෙළිය, නෝර්වුඩ් ප්‍රදේශයේ අස්වැසුම ප්‍රතිලාභ මුදල් හොරකම් කරලා එහෙම නැත්නම් වෙනත් අයගේ ගිණුම්වලට ඒ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මුදල් දමාගෙන වංචාවක් වෙලා තිබෙනවා අපි දැක්කා. ඒ වාගේ අවස්ථා කිහිපයක් පසුගිය කාලයේදී අපි දැක්කා. ඒ වාගේම, මේ වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාවත් සුදුසු පුද්ගලයාට හම්බ වෙනවාද, ඒ මුදල හරි දෙයට යෙදවෙනවාද කියන එක ගැන බරපතළ ප්‍රශ්න සමාජයේ තිබෙනවා. මේක අස්වැසුම ප්‍රතිලාභ දීමනාවටත් අදාළයි, වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාවටත් අදාළයි. පසුගිය කාලයේදී ඔබතුමන්ලා කිව්වා, මේවා සම්බන්ධව යම්කිසි ඩිජිටල් ක්‍රමවේදයක් හඳුන්වා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ගැන.

ගරු ඇමතිතුමනි, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය හරහා ලබා දෙන අස්වැසුම ප්‍රතිලාභ දීමනා වෙන්න පුළුවන්, වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව වෙන්න පුළුවන්, වෙනත් පාසල් උපකරණ වෙන්න පුළුවන්. ඒවා ලබා දීමේදී මීට වඩා නිවැරදි ක්‍රමවේදයක් භාවිත කිරීම සඳහා ඔබතුමා යම්කිසි වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එතුමා කියන කාරණයේ යම් සත්‍යතාවක් තිබෙනවා. අස්වැසුම ප්‍රතිලාභ දීමනා විතරක් නොවෙයි, මහජන ආධාර විතරක් නොවෙයි, මේ රටේ මහජනතාවගේ ධනය විශාල වශයෙන් වංචා කරපු, සොරකම් කරපු ඉතිහාසයක් අපේ රටේ තිබෙනවා. ඒ පිළිබඳව විමර්ශන සිද්ධ වෙනවා.

එතුමා අහපු නිශ්චිත කාරණය සම්බන්ධයෙන් ගත්තොත්, අස්වැසුම ප්‍රතිලාභ දීමනාව සහ අනෙකුත් ආධාර අවභාවිත කිරීම පිළිබඳව විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයකම මේ වෙනකොට විමර්ශන ආරම්භ කරලා තිබෙනවා. ඒ විමර්ශන අනුව අපි ඒ පිළිබඳව නීතිමය කටයුතු කරන්න මේ වනකොට කටයුතු කරමින් ඉන්නවා. එම නිසා ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට අපි කිසිම ආකාරයකින් පසුබට වෙන්නේ නැහැ.

අනෙක් කාරණය මේකයි. මේ ආධාර නැවැත්වීමට කිසිම ආකාරයකින් අපි කටයුතු කරන්නේ නැහැ. මම කලිනුත් කිව්වා වාගේ, දිගින් දිගටම ලබා දෙන ආධාර ප්‍රමාණාත්මක වශයෙනුත් අපි වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම මුදලේ වටිනාකමත් අපි වැඩි කරලා තිබෙනවා. ඒ නිසා දිගින් දිගටම අපේ බලාපොරොත්තුව තමයි, ඒ ආධාර ලැබිය යුතු අයට ආධාර ලබා දීම. එතුමා මතු කරපු ප්‍රශ්නය ගත්තොත්, ආධාර ලබා දීම සඳහා දැනටමත් ඩිජිටල් ක්‍රමවේදයක් තමයි අපි අනුගමනය කරන්නේ. දත්ත පද්ධතියක් මඟින් තමයි අපි මේ ප්‍රතිලාභීන් තෝරා ගන්නේ. විශේෂයෙන්ම වකුගඩු සහ ආබාධ සහිත පුද්ගලයින්ට අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම සඳහා අපි දැනට පාවිච්චි කරන ඩිජිටල් වේදිකාවට දත්ත එකතු කිරීම සිදු කරනවා. විශේෂයෙන්ම වකුගඩු රෝගීන්ට දෙන ආධාර සම්බන්ධයෙන් ගත්තොත් අපිට ඒ සඳහා වෛද්‍ය වාර්තා අවශ්‍ය වෙනවා. ඒ වෛද්‍ය වාර්තාත් කලින් තිබුණේ ඇත්තටම මැනුවල් ක්‍රමයට. දැන් අපි ඒවා ඩිජිටල් ක්‍රමයට හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම සමාජ සේවා නිලධාරින්ගේ නිර්දේශය යනාදිය අපි මේ වනකොට ඩිජිටල් දත්ත පද්ධතියක් හරහා ලබාගෙන කාර්යක්ෂම ලෙස මෙම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියකට අවතීර්ණ වෙලා තිබෙනවා.

## වනාන්තර සහ රක්ෂිත ලෙස ගැසට් කරන ලද හෝ නම් කරන ලද ඉඩම්: මඩකලපුව දිස්ත්‍රික්කය
வனங்களாக மற்றும் வன ஒதுக்கங்களாக வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டுள்ள அல்லது பிரகடனப்படுத்தப்பட்டுள்ள காணிகள்: மட்டக்களப்பு மாவட்டம்
LANDS GAZETTED OR DESIGNATED AS FORESTS AND RESERVES: BATTICALOA DISTRICT

1807/2026

**4. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ -

(i) වනාන්තර ලෙස ගැසට් කළ;

(ii) රක්ෂිත බවට පත් කිරීමට යෝජිත;

(iii) රක්ෂිත ලෙස නම් කිරීමට යෝජනා කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අනුමත කරන ලද;

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කිරීමට යෝජිත;

(v) මේ දක්වා ප්‍රදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද;

ඉඩම් ප්‍රමාණය, ඒවා අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරි කොට්ඨාස සහ ගම්මාන කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරානෙක්කල් ගොවි සංවිධානයට අයත් අක්කර 560ක පමණ ඉඩම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් OMG/PR/02-POLYGON අංකය යටතේ රක්ෂිතයක් ලෙස නම් කිරීමට යෝජනා කර තිබේද;

(ii) එම ඉඩම 1979 වර්ෂයේ සිට වගා කටයුතු සඳහා භාවිත කර, 1983 වර්ෂයේ සිට වාර්ෂික ඉඩම් බලපත්‍ර ලබා දී තිබේද;

(iii) එසේ නම්, අංක 2008/04 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව එම ඉඩම නැවත ගොවීන්ට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மட்டக்களப்பு மாவட்டத்தில் வனப் பாதுகாப்புத் திணைக்களத்தின்கீழ் -

(i) வனங்களாக வர்த்தமானியில் பிரசுரிக்கப் பட்டுள்ள;

(ii) வன ஒதுக்கங்களாகப் பிரகடனப்படுத்துவதற்கு உத்தேசித்துள்ள;

(iii) வன ஒதுக்கங்களாகப் பிரகடனப்படுத்துவதற்கு முன்மொழியப்பட்டு பிரதேச செயலாளர் அலுவலகங்களினால் அங்கீகரிக்கப்பட்டுள்ள;

(iv) பிரதேச செயலாளர் அலுவலகங்களுக்கு விடுவிப் பதற்கு உத்தேசித்துள்ள;

(v) இதுவரையில் பிரதேச செயலாளர் அலுவலகங்களுக்கு விடுவிக்கப்பட்டுள்ள;

காணிகளின் அளவு, அவை அமைந்துள்ள பிரதேச செயலாளர் பிரிவுகள், கிராம அலுவலர் பிரிவுகள் மற்றும் கிராமங்கள் என்பன யாவை என்பதை வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மட்டக்களப்பு மாவட்டத்தின், ஏறாவூர்ப்பற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள வீரானைக்கல் விவசாய அமைப்புக்குச் சொந்தமான சுமார் 560 ஏக்கர் காணியை, OMG/PR/02-POLYGON என்ற இலக்கத்தின்கீழ் வன ஒதுக்கமாகப் பிரகடனப் படுத்துவதற்கு வனப் பாதுகாப்புத் திணைக்களம் முன்மொழிந்துள்ளதா என்பதையும்;

(ii) மேற்படி காணி 1979ஆம் ஆண்டு முதல் பயிர்ச் செய்கைக்காகப் பயன்படுத்தப்பட்டு, 1983ஆம் ஆண்டு முதல் அதற்கு வருடாந்த காணி அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், 2008/04ஆம் இலக்க சுற்றுநிருபத்தின் ஏற்பாடுகளுக்கமைவாக, மேற்படி காணியை விவசாயிகளுக்கு மீள வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House, separately, the extent of land under the Department of Forest Conservation in the Batticaloa District, along with the Divisional Secretary's Divisions, Grama Niladhari Divisions and villages to which they belong -

(i) that has been gazetted as forests;

(ii) that has been proposed for designation as reserves;

(iii) that has been proposed for designation as reserves and has been approved by Divisional Secretariats;

(iv) that has been proposed to be released to Divisional Secretariats; and

(v) that has been released to Divisional Secretariats to date?

(b) Will he also inform this House -

(i) whether the Department of Forest Conservation has proposed to designate the land extending to approximately 560 acres belonging to the "Veeranaikkal Farmers' Organization" in the Eravur Pattu Divisional Secretary's Division of the Batticaloa District as a reserve under code OMG/PR/02-POLYGON;

(ii) whether the said land has been used for cultivation activities since 1979, and annual land permits have been issued for it since 1983; and

(iii) if so, whether action will be taken to return the said land to the farmers in terms of the provisions of Circular No. 2008/04?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) හෙක්ටෙයාර 94,532.32කි. මේ තුළ වනාන්තර 28ක් තිබෙනවා. විස්තර ඇමුණුම 01 මඟින් පහත දක්වා ඇත.

ඇමුණුම 01

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මඩකලපුව දිස්ත්‍රික්කයේ රක්ෂිත වනාන්තර

| අනු අංකය | දිස්ත්‍රික්කය/ දිස්ත්‍රික්ක | වනාන්තරයේ නම | ප්‍රමාණය (හෙක්.) | ගැසට් අංකය | ගැසට් කළ දිනය |
|---|---|---|---|---|---|
| 1 | මඩකලපුව | නුවරගල | 26,055.00 | 7719 | 28.06.1929 |
| 2 | මඩකලපුව | කෝරළේ | 7,564.62 | 7682 | 04.01.1929 |
| 3 | මඩකලපුව | පලෛ | 744.69 | 7682 | 04.01.1929 |
| 4 | මඩකලපුව | වාකනේරි | 2,583.00 | 1820/28 | 26.07.2013 |
| 5 | මඩකලපුව | තොප්පිගල | 25,256.00 | 1820/28 | 26.07.2013 |
| 6 | මඩකලපුව | උන්නිචෛ | 7,334.00 | 1820/28 | 26.07.2013 |
| 7 | මඩකලපුව | පනිච්චන්කර්නි | 9,303.00 | 1820/28 | 26.07.2013 |
| 8 | මඩකලපුව | කදිරවෙලි | 7,738.00 | 1818/4 | 08.07.2013 |
| 9 | මඩකලපුව | වරාදිතාවෝලෛ | 3,443.00 | 1821/34 | 01.08.2013 |
| 10 | මඩකලපුව | කිතුල්වැව | 1,780.00 | 1821/34 | 01.08.2013 |
| 11 | මඩකලපුව | රූකම්වැව | 1,366.00 | 1821/34 | 01.08.2013 |
| 12 | මඩකලපුව | කන්නන්කුඩා කඩොලාන | 150.20 | 2150/25 | 20.11.2019 |
| 13 | මඩකලපුව | කොක්කඩිචෝලෛ කඩොලාන | 177.82 | 2150/25 | 20.11.2019 |
| 14 | මඩකලපුව | පූලියන්තිව් කඩොලාන | 60.88 | 2150/25 | 20.11.2019 |
| 15 | මඩකලපුව | කායන්කර්නි කඩොලාන | 609.43 | 2150/25 | 20.11.2019 |
| 16 | මඩකලපුව | කට්ටමුරිච්චි කඩොලාන | 22.64 | 2150/25 | 20.11.2019 |
| 17 | මඩකලපුව | කන්ඩිලාඩිවාකරේ කඩොලාන | 27.24 | 2150/25 | 20.11.2019 |
| 18 | මඩකලපුව | පනිච්චන්කර්නි කඩොලාන | 8.13 | 2150/25 | 20.11.2019 |
| 19 | මඩකලපුව | පන්කුඩාවෙලි කඩොලාන | 73.26 | 2150/25 | 20.11.2019 |
| 20 | මඩකලපුව | ඔඩ්ඩමාවඩි කඩොලාන | 19.57 | 2150/25 | 20.11.2019 |
| 21 | මඩකලපුව | ඔඩ්ඩමාවඩි 1 කඩොලාන | 19.53 | 2150/25 | 20.11.2019 |
| 22 | මඩකලපුව | අරුකාර්ඩිකුඩා කඩොලාන | 5.93 | 2145/31 | 16.10.2019 |
| 23 | මඩකලපුව | මන්මුනායි කඩොලාන | 54.55 | 2145/31 | 16.10.2019 |
| 24 | මඩකලපුව | කරවෙඩ්ඩි කඩොලාන | 17.51 | 2145/31 | 16.10.2019 |
| 25 | මඩකලපුව | මන්කිකාද්දූ කඩොලාන | 21.19 | 2145/31 | 16.10.2019 |
| 26 | මඩකලපුව | විලවෙඩ්ඩුවාන් | 8.69 | 2145/31 | 16.10.2019 |
| 27 | මඩකලපුව | ඊච්චන්තිව් කඩොලාන | 73.90 | 2150/25 | 20.11.2019 |
| 28 | මඩකලපුව | පෙරියතිව් කඩොලාන | 14.53 | 2150/25 | 20.11.2019 |
| එකතුව (හෙක්.) | | | 94,532.32 | | |

(ii) හෙක්ටෙයාර 18,011.78කි. විස්තර ඇමුණුම් 02 හා 03හි දැක්වේ.

(iii) හෙක්ටෙයාර 18,011.78කි. මේ ගැන සමාලෝචනය කරමින් තිබෙනවා. මේක අවසානාත්මක එක නොවෙයි. විස්තර ඇමුණුම් 02*හා 03*හි දැක්වේ.

(iv) හෙක්ටෙයාර 110,94.21කි. මේ ප්‍රමාණයත් අවසානාත්මක එක නොවෙයි. එයත් සමාලෝචනය කරමින් පවතිනවා. විස්තර ඇමුණුම 04*හි දැක්වේ.

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

(v) හෙක්ටෙයාර 846.68කි. විස්තර ඇමුණුම 05හි දැක්වේ.

ගරු කථානායකතුමනි, කෙටියෙන් කිව්වොත්, කිරාන්/කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හෙක්ටෙයාර 19.2ක්, කෝරලේපත්තු වාලච්චේන උතුර වහරෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හෙක්ටෙයාර 47.8ක්, මන්මුනෙයි බටහිර වව්නතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හෙක්ටෙයාර 70.8ක්, MN South-West Paddippalai ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හෙක්ටෙයාර 708.88ක් ලෙස හෙක්ටෙයාර 846.68ක ප්‍රමාණයක් නිදහස් කරන්න වෙන් කර තිබෙනවා.

(ආ) (i) ඔව්.

(ii) එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වාර්ෂික බලපත්‍ර නිකුත් කර ඇති බවට අදාළව කිසිදු ලේඛනයක් අපට තවම හොයා ගන්න බැරි වෙලා තිබෙනවා.

(iii) මෙම කොටස වන ප්‍රදේශයක්, වනඅලි වාසස්ථානයක් සහ තණ බිම් ලෙස දක්නට ඇති බැවින් ගොවීන්ගේ වගා කටයුතු සඳහා සුදුසු නොමැති බව තමයි අපේ අදහස.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, දීර්ඝ ලේඛන බැවින් ඇමුණුම් 02, 03, 04 සහ 05 **සභාගත*** කරමි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, தற்பொழுது Department of Forest Conservation உடைய கட்டுப்பாட்டில் இருக்கின்ற காணிகளின் விடுவிப்பு சம்பந்தமாக எமது கட்சியினுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ கதிரவேலு சண்முகம் குகதாசன் அவர்கள் கடந்த மாதம் மாண்புமிகு பிரதம அமைச்சரிடம் கேள்வி கேட்டபோது, ஒரு மாத காலப்பகுதிக்குள்ளே இந்தக் காணி விடுவிப்பு சம்பந்தமான முடிவுகள் கிடைக்குமெனக் கூறியிருந்தார். இப்பொழுது, ஒரு மாதம் ஆகுவதற்கு இன்னும் 10 நாட்கள்தான் இருக்கின்றன.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்திலுள்ள மயிலத்தமடு-மாதவனை மேய்ச்சல்தரை சம்பந்தமாக நேற்றைய தினம் காலையில் நடைபெற்ற கலந்துரையாடலின்போது, Department of Forest Conservationஇன் கீழுள்ள காணிகளை விடுவிப்பதற்கு அத்திணைக்களம் இணக்கப்பாடு தெரிவிக்கவில்லை. இது பற்றி உங்களுக்கும் தெரியும். மகாவலி அதிகாரசபையுடன் சேர்ந்து அந்தக் காணிகளை விடுக்க முடியாது என்பதுபோலவே அத்திணைக்களத்தின் நிலைப்பாடு இருந்தது. மட்டக்களப்பு மாவட்டத்தின் மேற்குறித்த பிரதேசத்தில் மேய்ச்சல்தரைக்குக் காணிகளை விடுவிப்பது சம்பந்தமாக, நீங்கள் இறுதியாகக் குறிப்பிட்ட 'வீரானைக்கல்' விவசாய அமைப்பினுடைய காணி விடுவிப்பு சம்பந்தமாக, மட்டக்களப்பு மாவட்டத்தில் ஏறாவூர்ப்பற்று பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலே கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஞானமுத்து ஸ்ரீநேசன் அவர்கள் குறித்த காணி உரிமையாளர் சார்பில் கோரிக்கை விடுத்தபோது, பண்ணையாளர்கள் தங்களுக்கும் அதிலே சில காணிகள் தேவையெனச் சொன்னார்கள். ஆனால், இன்று நீங்கள் உங்களுடைய பதிலில், அதை forestஆக வர்த்தமானிமூலம் அறிவிப்பதற்கான நடவடிக்கை எடுக்கப் படுவதாகச் சொல்கின்றீர்கள். நீங்களே சொல்கிறீர்கள், "அதில் புல் இருக்கின்றது; மேய்ச்சல்தரை காணிபோலத் தெரிகின்றது. அதனால் அது விவசாயத்துக்குப் பொருத்தமில்லை" என்று.

கௌரவ அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில், அங்கு Department of Forest Conservationஇன் செயற்பாடுகள் ஏற்றுக்கொள்ள முடியாத நிலையிலே இருக்கின்றன. மன்முனைப் பற்று - பட்டிப்பளை பிரதேசத்தில் 700 ஹெக்டெயார் காணியை விடுவிக்கப் போவதாக நீங்கள் சொல்கிறீர்கள். அந்த 700 ஹெக்டெயார் காணியில் கிட்டத்தட்ட 1,500 ஏக்கர் காணியை - Department of Forest Conservationஇன் காணியை - பெரும்பான்மை சமூகத்தைச் சேர்ந்த 45 - 50 பேர் அபகரித்து வைத்திருக் கின்றார்கள். இப்பொழுது Department of Forest Conservation அதை விடுவித்து, அந்த மக்களுக்கே வழங்கும்படி பட்டிப்பளை பிரதேச செயலாளருக்குச் சொல்லி இருக்கின்றது.

வவுனியாவில் கிவுல் ஓயா திட்டத்துக்கு Department of Forest Conservation 12,000 ஏக்கர் காணியை விடுவிக்கத் தயார்! கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்குப் பக்கத்தில் இருக்கின்ற சகோதரருக்கு இது பற்றி தெரியும். இப்படியான நிலையில், மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற மக்கள் பயன்படுத்துகின்ற காணியை விடுவிப்பது சம்பந்தமாக உங்களுடைய நிலைப்பாடு என்ன? அந்த மக்களுடைய காணிகளை விடுவிப்பதற்கு வேகமாக வேறு ஏதும் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஆட்சிக்கு வந்து 2 வருடங்கள் ஆகிவிட்டன. இன்னும் 3 ஆண்டுகள்தான் எஞ்சியிருக்கின்றன. அதற்குள் இதனைச் செய்து முடிக்கலாமா? நேற்றைய தினம் நடைபெற்ற அந்தக் கூட்டத்தில் நீங்களும் இருந்தீர்கள். Conservator General of Forests உடைய செயற்பாடுகளைப் பார்த்தால் காணி விடுவிக்கப்படுமென நீங்கள் நம்புகின்றீர்களா?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඉඩම් ප්‍රශ්නය සම්බන්ධයෙන් රජයක් හැටියට අපි මැදිහත් වෙලා තිබෙනවා. උතුර, නැඟෙනහිර පළාත් දෙකේ එක් එක් දිස්ත්‍රික්කවල තිබෙන තත්ත්වය සහ නිදහස් කර ගන්න ඕනෑ කරන ඉඩම් සම්බන්ධයෙන් ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම් දක්වා යෝජනා ඉදිරිපත් කරලා ඒවා සලකා බැලීම සඳහා කැබිනට් අනුකමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවේ කටයුතු සිදු කෙරෙමින් තිබෙනවා. එහි කටයුතු දැන් අවසන් අදියරට පැමිණ තිබෙන්නේ. ඒ නිසා තමයි සමහර සංඛ්‍යාලේඛන අවසානාත්මක සංඛ්‍යාලේඛන නොවෙයි කියලා කියන්නේ. ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ඒ ප්‍රදේශවල ජනතාවටත් අවස්ථාව තිබුණා, මේ සම්බන්ධව ඔබට තිබෙන යෝජනා ඒ කමිටුවට ඉදිරිපත් කරන්න. ඒ යෝජනා සලකා බලා අවසන් වාර්තාව ඉක්මනින්ම ලබා දෙනවා. ඒ වාර්තාව ලබා දීමේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ප්‍රමාදයක් තිබෙන බව අපි පිළිගන්නවා. නමුත්, ඒ ප්‍රමාදය ඇති වුණේ ඒ කමිටුවේ තිබෙන අඩුපාඩුවක් නිසාම නොවෙයි, තොරතුරු ලබා දීමේදී සහ ඒවා තහවුරු කිරීමේදී සිදු වෙච්ච ප්‍රමාදයන් ඇතුළු ගැටලු රාශියක් නිසායි. නමුත්, දැන් ඒ අවසානාත්මක වාර්තාව සැකසෙමින් තිබෙනවා. ඉතා කෙටි කාලයක් තුළ - බොහෝ විට ඉදිරි මාසය තුළ - ඒ වාර්තාව එළි දක්වන්න පුළුවන් වෙයි.

ඒ අවස්ථාවේදී ඉදිරිපත් වෙච්ච තොරතුරු සහ දත්ත අනුව, ඉල්ලීම් අනුව ඒ වාර්තාව ඉදිරිපත් කරලා, ඒ අනුව අපට තව ඉඩම් ප්‍රමාණයක් නිදහස් කරන්න පුළුවන් වෙයි. නමුත් අපි දන්නවා, ඒ වාර්තාව තුළ වන සංරක්ෂණ ඉඩම්, වනජීවී ඉඩම් සම්බන්ධයෙනුත් සලකා බැලෙන බව. ඒ වාර්තාවෙනුත් මේ දිස්ත්‍රික්කවල තිබෙන ඉඩම් ප්‍රශ්න මුළුමනින්ම විසඳෙන එකක් නැහැ. හැබැයි අපට පුළුවන්, අවස්ථාව තිබෙනවා, මොනවා හරි නිශ්චිත ඉඩම් ගැටලු තිබෙනවා නම් ඒවාත් වෙන වෙනම සලකා බලා පිළිතුරු සොයන්න. අපි සූදානම්, මේ ගැටලුවලට විසඳුම් ලබා දෙන්න. මේ රජය ඒ වෙනුවෙන් තමයි කටයුතු කරන්නේ. අපි ඒ සඳහා තමයි විශේෂ කැබිනට් අනුකමිටුවක් පත් කරලා ඒ වෙනුවෙන් මැදිහත් වන්නේ. නමුත්, අපි මේක පිළිවෙළට කර ගන්න ඕනෑ; ගැටලු අවම වන විධියට කර ගන්න ඕනෑ. ඒ සඳහායි යම් කාලයක් ගත්තේ, ගරු මන්ත්‍රීතුමනි. මම විශ්වාස කරනවා, අපට ඉදිරියේදී මේ ගැටලු විසඳා ගන්න පුළුවන් වෙයි කියලා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகை தந்தபோது நடைபெற்ற கூட்டத்திலும் இந்த விடயம் சம்பந்தமாகச் சில விடயங்களைச் சொல்லியிருந்தீர்கள். உங்களுடைய செயற்பாடுகளில் எங்களுக்குத் திருப்தி இருக்கின்றது. தொலைபேசி அழைப்பு மூலம் உங்களுடன் தொடர்பை ஏற்படுத்தி, எங்களுடைய மக்களின் பிரச்சினைகளைக் கதைக்கக்கூடியதாக இருக்கின்றது. நேற்றைய தினம் நடைபெற்ற கூட்டத்தில் முன்வைக்கப்பட்ட அந்தப் பிரச்சினையை நீங்கள் தீர்த்து வைப்பதற்கு முயற்சித்தீர்கள். உங்களுக்குக்கீழ் வேலை செய்கின்ற அதிகாரிகள் நாட்டின் சனாதிபதி அவர்கள் சொன்ன விடயத்தையே 5 மாதங்களாக நடைமுறைக்குக் கொண்டுவரவில்லை என்றால், எங்களுடைய பக்கத்தில் இருந்து சந்தேகம் வருவதையிட்டு நீங்கள் கவலைப்படக் கூடாது. நாங்கள் சந்தேகப்படத்தான் வேண்டும். ஏனெனில், இப்பொழுது எங்களுடைய நிலைமை அவ்வாறுதான் இருக்கின்றது. Department of Forest Conservation உடன் சம்பந்தப்பட்ட விடயம் தொடர்பில் காலம் வேண்டுமெனச் சொல்கிறீர்கள். சரி. நாங்கள் இன்னும் கொஞ்சக் காலம் தருகிறோம்.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சின்கீழ் வரும் இன்னுமொரு திணைக்களம்தான் வன சீவராசிகள் பாதுகாப்புத் திணைக்களம். நீங்கள் குறிப்பிட்ட இந்தக் காணி விடுவிப்பு தொடர்பான விடயத்தில் திவுலானை என்ற பிரதேசமும் இருக்கின்றது. தற்பொழுது, இந்தப் பிரதேசம் forest reserve ஆகத்தான் இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் நடைபெற்ற விவசாயம் தொடர்பான ஆரம்பக் கூட்டத்தில், திவுலானை என்ற பிரதேசத்துக்குத்தான் அந்தக் கால்நடைகளை மேய்ச்சலுக் காகக் கொண்டுபோகச் சொல்லிச் சொன்னார்கள். கால்நடைகளை திவுலானைக்குக் கொண்டுபோனால், அங்கிருக்கின்ற அதிகாரிகள் பண்ணையாளர்களுக்கு எதிராக வழக்குத் தாக்கல் செய்கிறார்கள். இந்தப் பிரதேசத்தில் யானைப் பிரச்சினையும் இருக்கின்றது. அதனால்தான் பண்ணையாளர்களை அங்கு அனுமதிக்க முடியாதெனச் சொல்கிறார்கள். நீங்கள் புதிய திட்டத்தின்கீழ் elephant control unit என்ற ஒன்றை உருவாக்கி இருக்கிறீர்கள். நாங்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு 7 elephant control unitsஐக் கோரியிருந்தோம். உங்களுடைய அமைச்சின்கீழ் 5 elephant control units அனுமதிக்கப்பட்டு இருக்கின்றது. போரதீவுப் பற்று, கிரான் பிரதேசங்கள் விடப்பட்டு இருக்கின்றன. போரதீவுப்பற்றில்தான் யானைப் பிரச்சினை அதிகமாக இருக்கின்றது. திவுலானை என்ற forestஇனுடைய -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கிழக்கு மாகாணத்தில் தமிழ் பிரதேசங்கள் புறக்கணிக் கப்படுகின்றதா? என்ற சந்தேகம் இருக்கின்றது. ஏனென்றால், அம்பாறை மாவட்டத்தில் ஏற்கெனவே 14 wildlife range offices இருக்கும்பொழுது, புதிதாக 9 காரியாலயங்களைக் கொடுக்கின்றீர்கள். அதேபோல, மட்டக்களப்பு மாவட்டத்தில் ஏற்கெனவே 3 wildlife range offices இருக்கும்போது, 7க்கு கோரிக்கை விடுக்கப்பட்ட நிலையில் 5ஐக் கொடுத்திருக் கிறீர்கள். அதேபோல, கிழக்கு மாகாணத்துக்கு 33 motorbikes வந்திருக்கிறது. அதிலே 8ஐ நீங்கள் அம்பாறைக்குக் கொடுத்திருக்கிறீர்கள். Motorbikes வழங்குவதிலும் பாரபட்சம் காட்டுகின்றது, Department of Wildlife Conservation.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඊයේ සාකච්ඡාවේදීත් අපි අවසන් තීරණයට ආවේ මෙහෙමයි. කැබිනට් මණ්ඩලයෙන් පත් කරපු අනුකමිටුවේ අවසන් වාර්තාව එනකම් අපි පොඩ්ඩක් ඉඳිමු. ඒ වාර්තාව ආවාට පස්සේ ඒ ගැන අධ්‍යයනය කළාම කිසියම් ඉඩම් ගැටලු ප්‍රමාණයක් විසඳෙනවා. ඊට පසුවත් තව ගැටලු ඉතිරි වේවි. ඒ වාර්තාවෙන් පසුව ඒ ගැටලු වෙන වෙනම හඳුනාගෙන අපි සාකච්ඡා කරමු කියලා තමයි අපි තීරණයකට ආවේ. මොනවා හරි වනජීවී ඒකක, වාහන, ඒ වෙන් කිරීම් සම්බන්ධයෙන් අපි තක්සේරුවකට ආවේ ඒ ප්‍රදේශවල තිබෙන වනඅලි ගැටලුව, ප්‍රදේශයේ විශාලත්වය ආදී කරුණු සලකා බලලා. එහෙම නැතුව කිසිම ප්‍රදේශයකට, ජනතාවකට අසාධාරණයක් කිරීමේ අදහසින් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, කෙටියෙන් පිළිතුරු දෙන්න. මේ ප්‍රශ්නයට විතරක්ම දැන් විනාඩි 13ක් අරගෙන තිබෙනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යම් ගැටලු ඉදිරිපත් කරනවා නම් අපට ඒවා පිළිබඳව සලකා බලා ඒ තැන්වලට අදාළ විසඳුම් ලබා දෙන්න පුළුවන්. ඒ නිසා අපි අසාධාරණයක් කිරීමේ අදහසින් නොවෙයි එහෙම වෙන් කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -2107/2026- (2), ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය.

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රදානය කර ඇති හෝ බදු දී ඇති LRC ඉඩම්: බණ්ඩාරගම, මිල්ලනිය සහ හොරණ ප්‍රා.ලේ. කොට්ඨාස

## வழங்கப்பட்ட அல்லது குத்தகைக்கு விடப்பட்ட LRC காணிகள்: பண்டாரகம, மில்லெனிய மற்றும் ஹொரணை பிரதேச செயலாளர் பிரிவுகள்

## LRC LANDS GRANTED OR LEASED: BANDARAGAMA, MILLANIYA AND HORANA DS DIVISIONS

2135/2026

**6. ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஓஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) බණ්ඩාරගම, මිල්ලනිය සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වලින් මේ වනවිට ප්‍රදානය කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනයක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අනවසරයෙන් අත්පත් කරගෙන හෝ භාවිත කරනු ලබන කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ -

(i) බදු පදනම මත ලබා දී ඇති කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වාර්ෂිකව අය කරනු ලබන බදු මුදල;

(ii) බදු ගිවිසුම් පවතින නමුත් බදු මුදල් අයකර නොගන්නා ඉඩම් ප්‍රමාණය;

(iii) බදු ලබා දීම සඳහා පවතින නිරවුල් ඉඩම් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டாரகம, மில்லெனிய மற்றும் ஹொரணை பிரதேச செயலாளர் பிரிவுகளில் காணப்படும் காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குரிய காணி களின் அளவு யாது என்பதையும்;

(ii) மேற்படி காணிகளுள் தற்போது வரை வழங்கப் பட்டுள்ள காணிகளின் அளவு யாது என்பதையும்;

(iii) காணிபெறுநர்களின் பெயர்ப்பட்டியல் ஒன்றை வழங்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஆணைக்குழுவுக்குரிய காணிகளுள் சட்டவிரோத மாகக் கைப்பற்றப்பட்ட அல்லது பயன்படுத் தப்பட்டு வரும் காணிகள் இனங்காணப்பட் டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அக்காணிகளின் அளவு யாது என்ப தையும்;

(iii) அது தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும்;

(i) குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ள ஆணைக்குழுவுக்குரிய காணிகளின் அளவு மற்றும் அதற்காக வருடாந்தம் அறவிடப்படும் குத்தகைக் கட்டணம்;

(ii) குத்தகை ஒப்பந்தம் காணப்படுகின்றபோதும் குத்தகைக் கட்டணம் அறவிடப்படாத காணி களின் அளவு;

(iii) குத்தகைக்கு வழங்கக்கூடிய பிணக்கற்ற காணிகளின் அளவு;

வெவ்வேறாக யாது என்பதை மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land that belongs to the Land Reform Commission within the Divisional Secretary's Divisions of Bandaragama, Millaniya and Horana;

(ii) out of the said lands, the extent of land that has been granted so far; and

(iii) whether a list of the names of the beneficiaries of such lands will be provided?

(b) Will he also inform this House -

(i) whether lands belonging to the Commission which have been encroached upon or unlawfully utilized have been identified;

(ii) if so, the extent of such lands; and

(iii) the actions that have been taken in that regard?

(c) Will he further inform this House, separately, in respect of each of the aforesaid Divisional Secretary's Divisions of the extent of -

(i) land leased out, of the lands belonging to the Commission, and the annual lease rental charged therefor;

(ii) land for which lease agreements exist but lease rent is not being collected; and

(iii) unencumbered land available for lease?

(d) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) බණ්ඩාරගම, මිල්ලනිය සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වී ඇති ඉඩම් ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 25,981 රූඩ් 3 පර්චස් 26කි. එම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවටත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ නීතිමය බැඳීම් වශයෙන් නිදහස් කිරීමටත් හා රජයේ කාර්යාලයන් සඳහා ඉඩම් ලබා දීමටත් කටයුතු කර ඇත.

(ii) අක්කර 1,039 රූඩ් 3 පර්චස් 39කි.

(iii) ඔව්. ලේඛන ඇමුණුම 01 ලෙස දක්වා ඇත. ඇමුණුම 01 **සභාගත*** කරමි.

(ආ) (i) ඔව්.

(ii) අනවසර නියමානුකූල කිරීමට අදාළව හඳුනා ගත් ඉඩම් අක්කර 130කට වැඩි ප්‍රමාණයක් මැනුම් කර අවසන් කර ඇත. ඉතිරි ඉඩම් ප්‍රමාණය මැනුම් කරමින් පවතී.

(iii) වර්තමානයේ පවතින 2024/3 චක්‍රලේඛයට හා 2026.06.11 දින පැවති අංක 13352 කොමිෂන් සභා තීරණය පරිදි අනවසර නියමානුකූල කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) (i) ඇමුණුම 02 මඟින් පහත දක්වා ඇත.

ඇමුණුම 02

**හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බදු පදනම මත ලබා දී ඇති කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් අය කරනු ලබන වාර්ෂික බදු මුදල**

| අනු අංකය | ඉඩමේ නම | ආයතනය/ පුද්ගලයාගේ නම | ප්‍රමාණය | | | වාර්ෂික බදු මුදල | බදු ගිවිසුම් අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | අක් | රූ | පර් | | |
| 1 | රෙමුණ වත්ත | ටයිමෙක්ස් ගාමන්ට් පුද් සමාගම | 3 | 1 | 27.2 | 1,112,400.00 | 1692 |
| 2 | වවුළුගල වත්ත | අම්රිතා ඇපරල් පුද් සමාගම | 4 | 2 | 20.3 | 2,997,000.00 | 3482 |
| 3 | පර්ත් වත්ත | රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය | 1 | 3 | 25 | 1,667,628.00 | - |
| 4 | පර්ත් වත්ත | බ්‍රිටිෂ් බ්‍රිලියන් පුද් සමාගම | 1 | 0 | 0 | 2,991,600.00 | - |
| 5 | පර්ත් වත්ත | රත්න විමල් අළුත්ගේ | 0 | 0 | 30 | 399,600.00 | 247 |
| | හැගල්ල වත්ත | එම්.එච්.සුමනදාස | 3 | 0 | 0 | 86,400.00 | - |
| 7 | යහලකැලේ වත්ත/පත්තිල් | මොබිටෙල් පුද් සමාගම | 0 | 0 | 20 | 756,000.00 | - |
| | කන්ද | | 14 | 1 | 3 | | |

**මිල්ලණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බදු පදනම මත ලබා දී ඇති කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් අය කරනු ලබන වාර්ෂික බදු මුදල**

| අනු අංකය | ඉඩමේ නම | ආයතනය/ පුද්ගලයාගේ නම | ප්‍රමාණය | | | වාර්ෂික බදු මුදල | බදු ගිවිසුම් අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | අක් | රූ | පර් | | |
| 1 | මිල්ලනිය වත්ත | ඩ්‍රීම් කොස්මැටික් | 3 | 2 | 36.7 | 386,727.00 | 4259 |
| 2 | හැගල්ල වත්ත | ඩී ගුණසේන | 3 | 0 | 0 | 84,000.00 | 13952 |
| 3 | හැගල්ල වත්ත | කේ.එස් මහේන්ද්‍ර | 4 | 3 | 35 | 133,440.00 | - |
| 4 | හැගල්ල වත්ත | එන්.බී ආරියරත්න | 4 | 0 | 0 | 230,400.00 | - |
| 5 | හැගල්ල වත්ත | ඩී.ජේ.දසනායක | 5 | 0 | 0 | 120,000.00 | - |
| | | | 20 | 2 | 31.7 | | |

(ii) අක්කර 3යි.

(iii) අක්කර 40ක පමණ ඉඩම් ප්‍රමාණයක් ක්ෂේත්‍රයේ නිදහස්ව ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු කථානායකතුමනි, රට තුළ ඩිජිටල්කරණ ක්‍රියාවලිය ඉතාම සාර්ථකව කරගෙන යන මොහොතක ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවත් එම ක්‍රියාවලියේ නිරත වෙලා තිබෙනවාද? විශේෂයෙන්ම 1972දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් පවරා ගැනීමේදී වට මැනුමකින් නිශ්චිත කරගෙන නොවෙයි ඒවා පවරාගෙන තිබුණේ. ඒ නිසා අදටත්, තිබෙන ඉඩම් ප්‍රමාණය කොපමණද කියලා database එකක් නැහැ. ඒ නිසා වට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

මැනුමකින් ඉඩම් ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙනද digitalizationවලට යොමු වෙන්නේ කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමිය පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් අහපු කාරණය මම හිතන විධියට මේ වනකොට ඉතාම වැදගත් ප්‍රශ්නයක් වාගේම සමාජයේ වැඩි අවධානයක් යොමු වෙලා තිබෙන ප්‍රශ්නයක්. අපි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවත් - LRC එකත් - එක්ක දැනට ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කරමින් යනවා. ඒ වාගේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් වැඩ පිළිවෙළක් හදලා සමහර ආයතනත් එක්ක දැනට එය ක්‍රියාත්මක කරමින් යනවා. LRC එකේ ඉඩම් සම්බන්ධ කාරණය පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දිගටම අහන ප්‍රශ්නයක්. මේක සංකීර්ණ වෙන්නත් බලපාපු එක කාරණයක් තමයි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ආරම්භක මොහොතේ සිටම මේ ඉඩම් පවරා ගැනීමේ කටයුතු කිසිදු මැනීම් කටයුත්තකින් තොරව සිදු කර තිබීම. එය විධිමත්ව සිදු වෙච්ච ක්‍රියාවලියක් නොවෙයි. පැවරීමේදීත් මේ තත්ත්වයම පැන නැඟී තිබෙනවා. ඒ නිසා ඉඩම් ගැටලු සංකීර්ණ වෙලා තිබෙනවා. අපි දැන් මේ ප්‍රශ්න විසඳීම සඳහා අලුතෙන් ඉඩම් මැනුම් කරලා ඩිජිටල් පද්ධතියට ඒවා ඇතුළත් කිරීමේ කටයුතු ආරම්භ කරන්න LRC එක සමහත්, ඊට සම්බන්ධ ආයතන එක්කත් කටයුතු කරමින් සිටින මොහොතක තමයි ඔබතුමිය මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒ නිසා කඩිනමින් අපට පුළුවන් වෙයි, LRC එක සතු ඉඩම් වට මැනුම් කරලා ඩිජිටල්කරණයේදී යොමු කරගන්න. එතකොට මේ තිබෙන ගැටලු අවම කරගන්න අපට පුළුවන්.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය පාලන සමයේදී අපි දැක්කා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් අත්තනෝමතික විධියට, ඒ පාලන තන්ත්‍රයන්ගේ බල චූවමනාවට තමන්ගේ ඥාතීන්ට, හිතෛෂීන්ට සහ පාක්ෂිකයන්ට ආදි වශයෙන් බෙදා දීම් සිදු කර තිබුණු ආකාරය. එසේ ලබා ගත් ඉඩම්, ඒ ලබා ගත්ත අරමුණෙන් යුතුව භාවිතයට නොගන්නේ නම් එම ඉඩම් නැවත පවරාගෙන ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවන්න කටයුතු කරනවාද? මේ වනවිට තරුණයන්ට සහ කාන්තාවන්ට ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රජා ශක්ති කමිටු තුළින් රුපියල් මිලියන 25ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ප්‍රදේශ ආශ්‍රිතව ඉඩම් සම්බන්ධව හිඟයක් පවතින නිසා අයථා විධියට අත්පත් කරගත්ත, අරමුණ ඉෂ්ට නොවන ඉඩම් නැවත පවරාගෙන ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ වැඩ පිළිවෙළ සඳහා ලබා දීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කටයුතු කරන්නේද?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමියගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ගත්තාම, එයත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු දේපළවලට පමණක් අදාළව තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. ප්‍රාදේශීය ලේකම් සතුව තිබෙන රජයේ ඉඩම්වලට, මහවැලි අධිකාරිය සතුව තිබෙන ඉඩම්වලට, LRC එක සතුව තිබෙන ඉඩම්වලට ආදී වශයෙන් විවිධ ආයතනගතව තිබෙන ඉඩම්වලට ඉතිහාසයේ අත්වෙච්ච ඉරණම තමයි ප්‍රශ්නයක් විධියට මේ එන්නේ. මේ රජයේ ඉඩම්වල අවුරුදු 30, 40, 50 නේවාසිකව ඉන්න පුරවැසි කණ්ඩායමක් ඉන්නවා. ඉඩම් ප්‍රතිසංස්කරණ පනත, ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත යන අණපනත්වල තිබෙන ප්‍රතිපාදන අනුව ඉඩම් ලබා දිය යුතු පුරවැසියන්ට විධිමත් ඉඩම් කච්චේරියක් හරහා, විධිමත් ක්‍රමවේදයක් හරහා ඉඩම් බෙදා හැර කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා.

දැනට අපි බලපත්‍ර, දීමනාපත්‍ර, හිමිකම් ඔප්පු ලබා දෙමින් තිබෙනවා. විශේෂයෙන් LRC ඉඩම් කෘෂිකාර්මික පදනමින් තමයි ආරම්භයේ සිටම බෙදා හැර කිරීම් කරලා තිබෙන්නේ. ඒ පදනමින් තොරව අනීතිකව දැනට පවත්වා ගෙන යන ඉඩම් සම්බන්ධයෙන් සොයා බලන්න අපි විධිමත් පරීක්ෂණයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව අපි සමහර දිස්ත්‍රික්කවල අයට දැනුම්දීම් කරලා තිබෙනවා. විශේෂයෙන් මහවැලි අධිකාරිය වාගේ ආයතනවලට අයිති බෙදා හැර කරපු ඉඩම් අදාළ සංවර්ධන අරමුණින් බාහිරව වෙනත් ව්‍යාපෘති සඳහා යොදවා තිබෙන අවස්ථාවල අපි දැනුම්දීම් කරලා තිබෙනවා, අදාළ සංවර්ධන අරමුණත් එක්ක ඒ ඉඩම් සංවර්ධනය කරන්න මැදිහත් වෙන්න කියලා. ඒ වාගේම සංවර්ධනය නොකළ මහා පරිමාණයේ ඉඩම් අත්පත් කර ගැනීම් තිබෙනවා. ඒ සියල්ල නැවත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසන්න ආයතන දැනුවත් කරලා තිබෙනවා, නිලධාරීන් දැනුවත් කරලා තිබෙනවා. සමහර අවස්ථාවල එවැනි ක්‍රියාමාර්ග අරගෙනත් තිබෙනවා. අපි දැන් LRC එක සම්බන්ධයෙනුත් එවැනි ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඉන්නවා.

මම හිතන විධියට, මේ අනීතිකව බෙදා හැර කරපු ඉඩම් නියමානුකූල කිරීමේදී පැන නැඟුණු ප්‍රශ්න විසඳා ගන්න LRC එක අධිකරණයේ නඩු 1,500කට ආසන්න ප්‍රමාණයක් පවරා තිබෙනවා. ඒ නිසා මේ ක්‍රියාවලිය සංකීර්ණයි. නමුත්, අපි මේ පාලන කාලය ඇතුළත ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්න ඕනෑ. ඒ නිසා නේවාසිකව දැනට පදිංචි වෙලා ඉන්න ජනතාවට අවශ්‍ය කරන බලපත්‍ර, දීමනා පත්‍ර, හිමිකම දෙන්න වැඩ පිළිවෙළ හදනවා. දැනට බලපත්‍ර, දීමනා පත්‍ර බෙදා දෙමින් තිබෙනවා. ඒ වාගේම අනීතිකව අත්පත් කරගෙන තිබෙන ඉඩම් සම්බන්ධයෙනුත් LRC එක විධියට උපරිම නීතිය ක්‍රියාත්මක කරන්නත් අපි කටයුතු කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දවසකත් මේ වාගේ ප්‍රශ්නයක් ඇහුවා. පුත්තලම වාගේ දිස්ත්‍රික්කවල අක්කර සිය ගණන් ව්‍යාපෘති සඳහා යොදවලා තිබෙනවා. හැබැයි, රජයට රුපියලකවත් බද්දක් ගෙවන්නේ නැහැ. ඒවාට දේශපාලනඥයින් සම්බන්ධ වෙලා තිබෙනවා, සමහර වෙලාවට ඒවා නිලධාරින්ගේ උදවු ඇතිව සිදු වන දේවල්. මේ විධියට, දිස්ත්‍රික්ක ගණනාවක රජයට බදු ගෙවන්නේ නැතුව ව්‍යාපෘති කරන LRC එකේ ඉඩම් තිබෙනවා. අපි තීන්දුවක් අරගෙන තිබෙනවා; සාකච්ඡා කර තිබෙනවා; ඒ වාගේම නිලධාරින් දැනුවත් කර තිබෙනවා, ඒ ඉඩම්වලටත්, ඒ ව්‍යාපෘතිවලටත් නිසි බදු අය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරන්න. එසේ බදු නොගෙවනවා නම්, ඒවාටත් අදාළව නීතිය ක්‍රියාත්මක කරන්න අපි කොමිෂන් සභාව විධියට තීන්දු කරලා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමියට අවසාන වශයෙන් පිළිතුරක් හැටියට දෙන්නේ, ජනතාවට අසාධාරණයක් නොවෙන්න මේ සියල්ල නියමානුකූල කිරීම සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා කියන එකයි.

මේ විධියට අනීතිකව, යම් යම් හිතවතුන් දේශපාලන බලය පාවිච්චි කරලා අල්ලා ගෙන තිබෙන ඉඩම්, බලහත්කාරයෙන් අල්ලා ගෙන තිබෙන ඉඩම්, අපි නැවත LRC එකට පවරා ගන්නවා. අලුත් ව්‍යවසායකයින් විධියට ගොඩනැඟෙන්න කැමැති තරුණ තරුණියන් - තරුණ පරම්පරාව - ඉන්නවා. ඔවුන්ට වගා කර ගන්න, ව්‍යාපාරයක් කර ගන්න අවස්ථාව නැහැ. ඒ වාගේම අලුත් කුටුම්භයක් හැදුණාට පස්සේ, විවාහක කණ්ඩායමකට

නිවසක් හදා ගන්න පර්චස් 10ක් නැති රටක්, මේ. අන්න ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඉඩම් ලබා ගැනීම සඳහා සුදුසුකම් තිබෙන අයට ඉඩම් දෙන්න, අපි වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. ඒ වාගේම අපි මේ මාසය පුරාවටත් ඉඩම් සඳහා දීමනා පත්‍ර, බලපත්‍ර ලබා දෙන්න කටයුතු සකස් කර තිබෙනවා. විශේෂයෙන්ම 29වැනි දා සහ 30වැනි දා ජනාධිපතිතුමාගේ පදවිප්‍රාප්තියත් සම්බන්ධ කරලා, මේ මාසය පුරා දිස්ත්‍රික්ක ගණනාවක ඔබතුමිය යෝජනා කරනවා වාගේ කණ්ඩායම්වලට අදාළ දීමනා පත්‍ර, බලපත්‍ර දෙන්න අපි වැඩ පිළිවෙළ හදලා තිබෙනවා.

## 2000 වසරේ සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් පවරා දෙන ලද ඉඩම්: ගාල්ල දිස්ත්‍රික්කය

## 2000ஆம் ஆண்டு முதல் காணிச் சீர்த்திருத்த ஆணைக்குழுவால் வழங்கப்பட்ட காணிகள்: காலி மாவட்டம்

## LANDS ALIENATED BY LAND REFORM COMMISSION SINCE 2000: GALLE DISTRICT

2137/2026

**7. ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, 2000 වර්ෂයේ සිට මේ දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබාදුන් ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාරවලින් කොපමණද;

(ii) ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉඩම් ප්‍රදානය කිරීමේදී අනුගමනය කර ඇති කොන්දේසි කවරේද;

(iv) එම කොන්දේසි උල්ලංඝනය කළ ඉඩම්ලාභීන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2000ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை காணிச் சீர்த்திருத்த ஆணைக்குழுவால் காலி மாவட்டத்தில் வழங்கப்பட்ட காணிகளின் அளவு ஹெக்டயார்களில் எவ்வளவு என்பதையும்;

(ii) பிரதேச செயலாளர் பிரிவு வாரியாக, மேற்படி காணிகளின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(iii) காணிகளை வழங்கும்போது பின்பற்றிய நிபந் தனைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி நிபந்தனைகளை மீறிய காணி பெறுநர்கள் தொடர்பாக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the total extent of land, in hectares, given by the Land Reform Commission in the Galle District from the year 2000 to date;

(ii) separately, a breakdown of the extent of land as per Divisional Secretary's Division;

(iii) the conditions followed in providing lands; and

(iv) the actions taken against the land recipients who violated the aforesaid conditions?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පදිංචිය හෝ භුක්තිය සඳහා සින්නක්කරව ලබා දුන් ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 556.57කි.

(ii) අදාළ පැවරීම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලේඛනගත කොට නොමැත.

ඇත්තටම LRC එක මේ ඉඩම් බෙදා හැර කරද්දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ සම්බන්ධීකරණ කමිටුවක අනුමැතියකින් තොරව තමයි ඉතිහාසය පුරා ඒ කටයුතු කරලා තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තොරතුරු එක්රැස් කර ගන්න ඒ අය කටයුතු කරලා නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හිටපු නිලධාරින්ට, දේශපාලන අධිකාරියට අදහසක් තිබිලත් නැහැ මේ ඉඩම් බෙදා හැර කරන්නේ කුමන ආකාරයෙන්ද කියලා. දැන් තමයි අපි සම්බන්ධීකරණ කමිටුවලට කැඳවලා මේ ක්‍රියාවලිය විධිමත් කරමින් යන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නොවෙයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් තමයි ඔවුන් තොරතුරු එක්රැස් කරලා තිබෙන්නේ.

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බෙදා හැර කිරීමේදී පනතේ 44 වන වගන්තිය සමඟ කියවෙන 22 වන වගන්තියේ ප්‍රතිපාදන හා 24(2) වගන්තියට අනුගතව සින්නක්කර පවරාදීම සිදු කරයි. පවරාදීමේදී වර්තමානයේ ක්‍රියාත්මක 2024/03 හා (සංශෝධිත 2)හි නියමයන් අනුගමනය කර කොමිෂන් සභා අනුමැතිය හා විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය යටතේ විකිණීමෙන් පවරා දෙනු ලබයි.

(iv) එසේ වාර්තා වන සිද්ධීන් සම්බන්ධයෙන් කොමිෂන් සභා උපදෙස් මත කටයුතු කරයි.

(ආ) අදාළ නොවේ.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, උත්තරය ලබාදීම සම්බන්ධයෙන්. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු නිශාන්ත පෙරේරා මහතා]

ඔබතුමා සඳහන් කළ පරිදි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හෝ අමාත්‍යාංශයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් මේ තොරතුරු නැහැ. ගරු අමාත්‍යතුමනි, ඉතිහාසය පුරාම ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඩම්, - කලින් ප්‍රශ්නය හා සමානම ප්‍රශ්නයක් මේකත් - දේශපාලන හිතවතුන්ට ලබා දීලා තිබෙනවා. සමහර ඒවා තෑගි විධියට දීලාත් තිබෙනවා. 1972දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඉඩම් පවරා දීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නියමිත මැනුම් කටයුතු කරලා නොවෙයි ඉඩම් පවරා දීලා තිබෙන්නේ. ඒක එක කාරණයක්.

අනෙක් පැත්තෙන්, ඒ දීපු සමහර ඉඩම් ඒගොල්ලන් තවමත් භුක්ති විඳිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, උදාහරණයක් වශයෙන් කිව්වොත්, කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අගනකැටිය ග්‍රාම නිලධාරි වසමේ highway එකට ආසන්නයේ විශාල වාණිජමය වටිනාකමක් සහිත අක්කර 400කට ආසන්න ප්‍රමාණයක ඉඩමක් තිබෙනවා. එම ඉඩම ඉතිහාසයේදී තෑග්ගක් විධියට දීලා තිබෙනවා කියන අදහස තමයි එම ප්‍රදේශයේ ජනතාව අතර තිබෙන්නේ. 1988-89 කාලයේ මේ ඉඩමේ වධකාගාරයක් පවත්වා ගෙන ගියා. එහෙම පවත්වා ගෙන ගිය මේ ඉඩම දැන් රනිල් ද සිල්වා කියන වෛද්‍යවරයා භුක්ති විඳිනවා කියන අදහස තමයි මිනිස්සුන්ට තිබෙන්නේ. ඒ ඉඩමට කාටවත් එන්න දෙන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නිලධාරින් මේකට සම්බන්ධ ද කියලා අපිට සැකයක් තිබෙනවා. දැන් මේ ඉඩම කැබලි කර විකුණන තැනටම ගිහින් තිබෙනවා. අපි බොහොම අමාරුවෙන් තමයි ප්‍රදේශයේ ජනතාවත් එක්ක එකතු වෙලා එම කටයුත්ත නතර කරගෙන තිබෙන්නේ.

අනෙක් එක තමයි, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා තිබෙන නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අයත් ඉඩම. එම ඉඩම ඇස් රෝහලක් ඉදිකිරීම සඳහා දුන්නා කියලා තමයි කියන්නේ. දැන් ඒ ඉඩමත් කැබලි කර විකුණන්න හදනවා. ඒකත් අපි බොහොම අමාරුවෙන් නතර කරගෙන ඉන්නේ. ඊළඟට, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉගල්කන්ද කියන වතුයාය -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මම කෙටියෙන් කියන්නම්, ගරු කථානායකතුමනි.

එම ඉඩම දීලා තිබෙනවා, බෙට්න්ස් කියන ආයතනයට. අවුරුදු 30ක විතර කාලයක් තිස්සේ මේ ඉඩම අතහැර දමා තිබෙන්නේ. ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එකත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමනි, නීත්‍යනුකූලව මේ ඉඩම් බැහැර කර තිබෙනවාද කියන කාරණය පිළිබඳව සොයා බැලීමක් කර, සංවර්ධන අරමුණුවලින් බාහිරව යම් යම් ක්‍රියාමාර්ග, ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවාද කියාත් සොයා බලා ඒ සම්බන්ධව ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග ටික ගන්න අපි කටයුතු කරන්නම්.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයට කලින් ඉදිරිපත් කළ ප්‍රශ්නයේ තිබෙන්නේත් මෙවැනිම ගැටලු. ගම්පහ දිස්ත්‍රික්කයේත් ඔය ගැටලුවම තිබෙනවා. LRC ඉඩම් යම් යම් ව්‍යාපෘති හරහා පුද්ගලයන්ට පවරා දීලා පසුව එම ඉඩම් කැබලි කරන, වෙන්දේසි කරන සමාගම්වලට දීලා බිලියන ගණන් උපයපු අවස්ථා තිබෙනවා. ඒ වාගේම 2015-2019 කාලයේදී සමහර ස්වාමීන් වහන්සේලාට ඉඩම් ලබා දී තිබෙනවා. ඒ අනුව ගම්පහ ප්‍රදේශයේ අක්කර 40ක පමණ ප්‍රමාණයක් දීලා තිබෙනවා, කිසිදු ව්‍යාපෘතියක් ඉදිරිපත් කරන්නේ නැතුව. දිගින් දිගටම මෙවැනි කටයුතු සිදුවී තිබෙනවා, දිස්ත්‍රික්ක ගණනාවක් තුළ. ඒ පිළිබඳව සොයා බලන්න අපි දැනටම නිලධාරින් යොදවා දිස්ත්‍රික්කවල වෙන වෙනම වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා. ඒ අනුව අපි කඩිනමින් මැදිහත් වී ගාල්ල දිස්ත්‍රික්කය තුළ පවතින ගැටලු සම්බන්ධවත් සොයා බලා, ඒ සම්බන්ධව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග මොනවාද කියාත් සොයා බලා LRC එක දැනුවත් කරන්නත් බලාපොරොත්තු වෙනවා.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රධාන වශයෙන් ගැටලු තිබෙන ඉඩම් කිහිපයක් තිබෙනවා. මා කලින් සඳහන් කළ කරන්දෙනිය ඉඩම සහ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට අයත් ඉඩම ගත්තොත්, මේවා දැන් කැබලි කර විකුණන තත්ත්වයටම ගිහින් තිබෙනවා. එම නිසා, මේ සම්බන්ධව ගන්නා කඩිනම් ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමනි, එම ඉඩම් බැහැර කර ඇති ආකාරය, ඒ කියන්නේ ඒවා සින්නක්කරව ලබා දී තිබේද යන්න පිළිබඳව යම් අධ්‍යයනයක් සිදු කරන්න ඕනෑ. ඒ ආකාරයට විධිමත් අධ්‍යයනයක් සිදු කර, එම ඉඩම් බැහැර කිරීමට හැකියාවක් තිබේද, නැද්ද යන්න සොයා බලා අපි ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්නම්.

ඒ වාගේම, ඔවුන් වෙත පවරා දීමක් සිදු කර නොමැති නම්, LRC එකට අයත් ඉඩමක් අල්ලාගෙන අනීතිකව භුක්ති විඳින අවස්ථාවක් නම්, ඒ සම්බන්ධයෙන් අපට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. සති කිහිපයක් ඇතුළත ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, යම් නීත්‍යනුකූල රාමුවක් යටතේ ඔවුන් වෙත එම ඉඩම් පවරා දී තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද යන්න LRC එකත් එක්ක සාකච්ඡා කරලා තීරණය කරන්නම්. ඒ සඳහා පොඩි කාලයක් ගත විය හැකියි. ගරු මන්ත්‍රීතුමනි, ඊට අදාළව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ඔබතුමාව පසුව දැනුවත් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2270/2026- (1), ගරු රුවන් මාපලගම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## සමාජ ආරක්ෂණ මණ්ඩලය: දායක විශ්‍රාම වැටුප් ක්‍රම

සமூகப் பாதுகாப்புச் சபை: பங்களிப்பு ஓய்வூதியத் திட்டம்

SOCIAL SECURITY BOARD: CONTRIBUTORY PENSION SCHEMES

2277/2026

**9. ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) එම මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන දායක විශ්‍රාම වැටුප් ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iii) එම විශ්‍රාම වැටුප් ක්‍රම කවරේද;

(iv) එම එක් එක් විශ්‍රාම වැටුප් ක්‍රම සඳහා මේ දක්වා දායක වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එලෙස දායකවී ඇති පුද්ගලයන් අතරින් මේ වනවිට විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமூகப் பாதுகாப்புச் சபையை நிறுவுவதன் நோக்கங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படிச் சபையால் நடைமுறைப்படுத்தப்படும் பங்களிப்பு ஓய்வூதியத் திட்டங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி ஓய்வூதியத் திட்டங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு ஓய்வூதியத் திட்டத்துக்கும் இதுவரை பங்களிப்புச் செய்துள்ள நபர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) அவ்வாறு பங்களிப்புச் செய்த நபர்களுள், தற்போது ஓய்வூதியம் பெறுகின்ற நபர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) the objectives of establishing the Social Security Board;

(ii) the number of contributory pension schemes implemented by the said Board;

(iii) the names of the said pension schemes;

(iv) the number of persons who have contributed to each of the said pension schemes up to now; and

(v) out of the persons who have contributed to each of the aforesaid pension schemes as mentioned above, the number of persons who are currently receiving pensions?

(b) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1999 අංක 33 දරන පනතින් සංශෝධනයට ලක්වූ 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අරමුණ, ධීවර හා කෘෂිකර්ම නොවන අංශවල ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුපක් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ එම යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම වේ.

(ii) ප්‍රධාන වශයෙන් දැනට යෝජනා ක්‍රම 2ක් ක්‍රියාත්මක වෙනවා. මීට කලින් යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක වුවත්, 2012 වර්ෂයේදී ඒවා අත්හිටුවා තිබෙනවා.

(iii) ප්‍රධාන විශ්‍රාම වැටුප් ක්‍රම දෙකකි.

1. "සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

වයස අවුරුදු 18-59 අතර තැනැත්තන් සඳහා ක්‍රියාත්මක වන අතර, අවිධිමත් අංශයේ සේවයේ නියුතු රාජ්‍ය විශ්‍රාම වැටුපක් නොලබන සියලු ප්‍රජාව වෙත ක්‍රියාත්මක කරනු ලබනවා. ඒ වාගේම, විශේෂ ඉලක්කගත කණ්ඩායම් වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතා අනුව පහත සඳහන් විශ්‍රාම වැටුප් ක්‍රම තුන "සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ අපි හඳුන්වා දී තිබෙනවා.

- කලාකරු විශ්‍රාම වැටුප - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව කලාකරුවන් උදෙසා තමයි මෙහි කටයුතු සිද්ධ වෙන්නේ.
- නාවිකයා විශ්‍රාම වැටුප - නාවික ලේකම් කාර්යාලය හා ඒකාබද්ධව වෙළෙඳ නාවිකයන් වෙනුවෙන් සිදු කරනු ලබනවා.
- විගමනික ශ්‍රමික විශ්‍රාම වැටුප - විදේශ සේවාව නියුක්ති කාර්යාංශය හා ඒකාබද්ධව විදේශගත වන ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනවා.

2. "ආරක්සාව" පූර්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

වයස අවුරුදු 17 දක්වා වන දරුවන් වෙනුවෙන් හඳුන්වා දී ඇති පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයකි. මේ යටතේ දෙමව්පිය/ භාරකරුවන්ගේ භාරකාරත්වය යටතේ දරුවන් සාමාජික කරන්න පුළුවන්. වයස අවුරුදු 18 වන විට ගිණුම කල් පිරෙනවා. කල් පිරුණු ගිණුමේ ශේෂය පදනම් කරගෙන "සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට එකවර මුදල් ගෙවූ දායකයෙකු ලෙස අන්තර්ග්‍රහණය කරනවා.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

(iv) "සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා මේ වන කොට සාමාජික සංඛ්‍යාව 106,532ක් දායක වෙලා තිබෙනවා. ඒ වාගේම "ආරස්සාව" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සාමාජික සංඛ්‍යාව 551,549යි. සම්පූර්ණ ගණන 658,081යි.

(v) 2026 ජූලි මාසය වන විට විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයන් සංඛ්‍යාව 37,474යි. 2026 ජූලි මාසය සඳහා රුපියල් 39,000,5000.00ක් - දළ වශයෙන් මිලියන තිස්නවයක් - ඒ අයගේ විශ්‍රාම වැටුප් වෙනුවෙන් ගෙවා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අප මීට ප්‍රථම අහලා තිබුණේ, දායක විශ්‍රාම වැටුප් ලබන වෙනත් විවිධ ක්ෂේත්‍රවල අය රුපියල් 5,000ක්, 6,000ක්, 10,000ක් වාගේ ඉතාම අඩු විශ්‍රාම වැටුපක් ලබන බවකුයි. ඒ කාරණාත් එක්ක ගත්තාම මට අහන්න තිබෙන්නේ, විවිධ ක්ෂේත්‍රවල ඉන්න අය මේ විශ්‍රාම වැටුප් ක්‍රමයට පහසුවෙන් දායක කර ගන්න රජය පැත්තෙන් ඔබතුමා ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලායි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය හරි. මීට කලින් සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමවල ප්‍රධාන වශයෙන්ම රුපියල් පන්දහස, දසදහස වැනි මුදලක් තමයි ලැබුණේ. රුපියල් දසදහස තමයි විශ්‍රාම වැටුපක් විධියට උපරිම වශයෙන් ලබා ගන්න හැකියාව ලැබුණේ. නමුත් අපි පසුගිය වර්ෂ දෙකේදී මේ ක්‍රමය වෙනස් කරලා, ඒ පුද්ගලයාගේ හැකියාව අනුව, තමන්ගේ දායකත්ව මුදල අනුව තමන් කැමැති ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හැකියාව උදා කර තිබෙනවා. උදාහරණයක් විධියට, රුපියල් පනස්දහස, ලක්ෂය ආදි වශයෙන් විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හැකි වන පරිදි අපි එම ක්‍රමවේදය සකස් කර තිබෙනවා. 2025 වර්ෂය වන විටත් මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වන අයට අදාළව manual ක්‍රමවේදයක් යටතේ තමයි ඒ කටයුත්ත සිදු වුණේ.

අපි පසුගිය වර්ෂයක පමණ කාලය තුළ ඩිජිටල් පද්ධතියක් හඳුන්වා දීලා, 2026 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විශ්‍රාම වැටුප් ක්‍රම සඳහා දායකයන් බඳවා ගැනීම සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය වූ කළමනාකරණ තොරතුරු පද්ධතියක් හරහා සිද්ධ කරනවා. ඒ වාගේම තමයි, ඩිජිටල් වේදිකාවට පිවිසිලා මේ සඳහා දායක වන ඕනෑම කෙනෙකුට තමන්ගේ දායක මුදල, ඒ වාගේම තමන් ඉදිරියට ගෙවිය යුතු ප්‍රමාණය, තමන්ට අවුරුදු 60 සම්පූර්ණ වුණාට පසුව ලබාගත හැකි විශ්‍රාම වැටුප තමන්ටම බලා ගැනීමට හැකි පසුබිමත් අපි සකස් කර තිබෙනවා. මා කලින් කිව්වා වාගේ, රුපියල් පන්දහස, දසදහස වාගේ තිබුණු විශ්‍රාම වැටුප් මුදල් ප්‍රමාණයත් අපි මේ වනකොට වැඩි කර තිබෙනවා. ඊට අමතරව විශේෂයෙන්ම වර්තමාන සමාජයේ විවිධ ශ්‍රම කණ්ඩායම් පිළිබඳව අවධානය යොමු කරලා, විශේෂ වෘත්තීය කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කරලා, ඒ සඳහා අපි ග්‍රාම නිලධාරින්, සමෘද්ධි සංවර්ධන නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින්, ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරින්, සමාජ ආරක්ෂණ නිලධාරින් සහ සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බලයලත් නිලධාරින් මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් හා දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් ඩිජිටල් ක්‍රමවේදය ඔස්සේ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට පුද්ගලයන් බඳවා ගැනීමේ කටයුතු 2026 මාර්තු මාසයේ සිට ආරම්භ කර තිබෙනවා.

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)

ගරු කථානායකතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තරය ලබා දීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැනට ලංකාවේ විශ්‍රාම වැටුප් හිමිකම සහිතව රාජ්‍ය සේවයේ නියැළෙන අය ලක්ෂ 14ක් විතර ඉන්නවා. ඔවුන් විශ්‍රාම ගිය පසු ලැබෙන විශ්‍රාම වැටුපෙන් ඔවුන්ගේ ජීවත්වීම සඳහා සහනයක් ලැබෙනවා. හැබැයි, රාජ්‍ය සේවයේ නොවන අයට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමේදී රජයට ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඔබතුමාගේ දැක්ම සහ රජයේ ප්‍රතිපත්ති මාලාවත් එක්ක මේ වන විට යම් පියවරක් තබලා මේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමය සාර්ථක තැනකට ගෙනැල්ලා තිබෙනවා කියලා. නිශ්චිතවම මෙන්න මේ කියන රාජ්‍ය සේවයේ නොවන අයට විශ්‍රාම වැටුපක් හඳුන්වා දීමේදී ඉටු කළ යුතු වගකීම ඉෂ්ට කරන්න මේ වන විට බලාපොරොත්තු වන්නේ කොහොමද කියන එක මට දැනගන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා එම ප්‍රශ්නය ඇසීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. එතුමා කිව්වා වාගේ අපේ රටේ විශ්‍රාම දිවියට එළැඹෙන අයට - විධිමත් අංශයේ සහ අවිධිමත් අංශයේ අයට - විශ්‍රාම වැටුප් ක්‍රමයක අවශ්‍යතාව අපි විශේෂයෙන්ම පිළිගන්නවා. ඒ නිසාම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් අපි සඳහන් කර තිබෙනවා, සියලු පුරවැසියන්ට ප්‍රීතිමත් විශ්‍රාම දිවියක් ගත කිරීම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙනවා කියලා. ගරු කථානායකතුමනි, අපේ රටේ ශ්‍රම බලකාය දළ වශයෙන් මිලියන 8.5ක් පමණ වනවා කියලා ඔබතුමා දන්නවා. මේකෙන් දළ වශයෙන් මිලියන 2ක් විතර පෞද්ගලික අංශයේ සේවය කරනවා. ඒ අයට යම්කිසි ආකාරයකින් සේවක අර්ථසාධක අරමුදල හරහා, එහෙම නැත්නම් සේවක භාරකාර අරමුදල හරහා ඒ අයගේ විශ්‍රාම දිවිය වෙනුවෙන් යම් දායකත්වයක් ලබා ගන්න, යම් මුදලක් ඉතිරි කර ගන්න හැකියාවක් ලැබෙනවා.

මේ වනකොට රාජ්‍ය සේවයේ මිලියන 1.3ක් විතර ඉන්නවා. ඊට අමතරව මේ වනකොට විශ්‍රාම වැටුප් ලබන අය ලක්ෂ 7කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයගේත් විශ්‍රාම දිවිය යම්කිසි ආකාරයකට ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කර ගන්න පුළුවන්. ඒ වාගේම තවත් මිලියන 5කට ආසන්න ප්‍රමාණයක් අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියා කරනවා. ඒ අය ගොවීන් වෙන්න පුළුවන්, ධීවරයන් වෙන්න පුළුවන්, කුලී වැඩ කරන අය වෙන්න පුළුවන්, මේසන් වැඩ කරන අය වෙන්න පුළුවන්, වඩු වැඩ කරන අය වෙන්න පුළුවන්, app-based ක්ෂේත්‍රයේ වැඩ කරන අය වෙන්නත් පුළුවන්. ඒ අයටත් තමන්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම තමයි අපේ රජයේ ප්‍රතිපත්තිය. ඒ අනුව තමයි අප මේ වසර දෙක තුළ කටයුතු කළේ. අපි ඉදිරියටත් ඒ කටයුතු කරගෙන යනවා. මේ වනකොට අපේ

රජයේ කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා, දැනට තිබෙන විශ්‍රාම වැටුප් ක්‍රම ඒකාබද්ධ කරලා තනි විශ්‍රාම වැටුප් ක්‍රමයක්. දැනට ගොවීන් සඳහා වෙනම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම, ධීවරයන් සඳහාත් වෙනම විශ්‍රාම වැටුප් ක්‍රමයක් තිබෙනවා. මේ දෙකේ කාලාන්තරයක් තිස්සේ ඉතා සුළු මුදලක් තමයි තිබුණේ. ඒ නිසා ජනතාව අතර ඒ පිළිබඳව තිබෙන විශ්වාසය අඩු වෙලා තිබෙනවා. ඒ අයගේ විශ්වාසය තවදුරටත් තහවුරු කරලා, වයස අවුරුදු 60 සම්පූර්ණ වෙලා විශ්‍රාම යනකොට ඒ අයගේ ජීවිතය කළමනාකරණය කර ගැනීමට හැකි වන ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් ලබා දීම වෙනුවෙන් මේ විශ්‍රාම වැටුප් ක්‍රම ඔක්කෝම ඒකාබද්ධ කරලා තනි විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම සඳහා වන යෝජනාව කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා. ඒ පිළිබඳව පවතින පනත් වෙනස් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු කරලා තිබෙනවා. ඒ හරහා අපේ රටේ අවිධිමත් ක්ෂේත්‍රයේ ඉන්න මිලියන 5කට අධික සියලු ජනතාවට, විශ්‍රාම දිවියට එනකොට විශ්‍රාම වැටුපක් හඳුන්වා දීමේ කටයුතු අපි මේ වනකොට ආරම්භ කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

## මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක: ප්‍රමාණවත් ගිනි නිවීම් සේවා පහසුකම් නොමැති වීම

### மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்டங்கள்: போதுமானளவு தீயணைப்பு சேவை வசதிகள் இன்மை

### MANNAR AND MULLAITIVU DISTRICTS: INADEQUACY OF FIRE SERVICE FACILITIES

2285/2026

**10.** ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල -
- (i) ප්‍රමාණවත් ගිනි නිවීම් සේවා පහසුකම් නොමැති බව දන්නේද;
- (ii) මේ වන විට ක්‍රියාත්මක ගිනි නිවීම් මධ්‍යස්ථාන සහ ගිනි නිවන රථවාහන සංඛ්‍යාව කොපමණද;
- (iii) ගිනි ගැනීම්වලදී ක්ෂණික සහාය සැපයීම සඳහා ගත වන සාමාන්‍ය කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම දිස්ත්‍රික්කවල -
- (i) ගිනි නිවීම් සේවා සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;
- (ii) පසුගිය වර්ෂ 3 තුළ ගිනි නිවීම් සේවා සංවර්ධනය සඳහා වෙන් කරන ලද සහ වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;
- (iii) ගිනි නිවන භටයින්ට නවීන ආරක්ෂණ උපකරණ සහ විශේෂ මුදා ගැනීමේ පුහුණුව ලබා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) එම දිස්ත්‍රික්කවල -
- (i) සියලු පහසුකම්වලින් සමන්විත නවීන ගිනි නිවීම් මධ්‍යස්ථාන පිහිටුවීමට කටයුතු කරන්නේද;
- (ii) නව ගිනි නිවන වාහන සහ ජල බවුසර් ලබා දීමට අපේක්ෂිත දිනය කවරේද;
- (iii) ගිනි නිවීම් සේවා සංවර්ධනය සඳහා කඩිනම් සැලසුම් නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் -
- (i) போதுமான தீயணைப்பு சேவை வசதிகள் இல்லை என்பதை அவர் அறிவாரா;
- (ii) தற்பொழுது செயற்பாட்டிலுள்ள தீயணைப்பு நிலையங்கள் மற்றும் தீயணைப்பு வாகனங் களின் எண்ணிக்கை யாது;
- (iii) தீ விபத்துகளின்போது உடனடி உதவி வழங்குவதற்கு எடுக்கும் சராசரி நேரம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) அந்த மாவட்டங்களில் -
- (i) தீயணைப்புச் சேவைகளுக்காக அங்கீகரிக்கப் பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கையும், நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கையும் யாது;
- (ii) கடந்த 03 ஆண்டுகளில் தீயணைப்புச் சேவை மேம்பாட்டுக்காக ஒதுக்கீடு செய்யப்பட்டுள்ள மற்றும் செலவிடப்பட்டுள்ள நிதித் தொகை வெவ்வேறாக யாது;
- (iii) தீயணைப்பு வீரர்களுக்கு நவீன பாதுகாப்பு உபகரணங்கள் மற்றும் விசேட மீட்புப் பயிற்சி வழங்கப்பட்டுள்ளதா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி மாவட்டங்களில் -
- (i) சகல வசதிகளையும் கொண்ட நவீன தீயணைப்பு நிலையங்களை அமைக்க நடவடிக்கை எடுப்பாரா;
- (ii) புதிய தீயணைப்பு வாகனங்கள் மற்றும் நீர் தாங்கிகளை வழங்குவதற்கு எதிர்பார்க்கப்படும் திகதி யாது;
- (iii) தீயணைப்பு சேவை மேம்பாட்டுக்கான துரிதத் திட்டங்கள் இல்லையெனில், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House in respect of the Mannar and Mullaitivu Districts -
- (i) whether he is aware that fire service facilities are inadequate;
- (ii) the number of fire stations and fire engines currently operational; and
- (iii) the average response time to provide immediate assistance in the event of a fire?

(b) Will he also inform this House in respect of the said districts -
- (i) the approved cadre for the fire services and the number of vacancies existing;

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

(ii) separately, the amount of money allocated and spent for the development of the fire service during the last three years; and

(iii) whether the firefighters have been provided with modern safety equipment and specialized rescue training?

(c) Will he further inform this House in respect of the said districts -

(i) whether steps will be taken to establish modern fire stations equipped with all facilities;

(ii) the expected date for the provision of new fire engines and water bowsers; and

(iii) the reasons, if there are no immediate plans for the development of fire services?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government**)**

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මන්නාරම දිස්ත්‍රික්කයේ ගිනි නිවීමේ මධ්‍යස්ථාන නොමැති අතර මන්නාරම නගර සභාව සතුව ජල ටැංකියක් රහිත එක් ගිනි නිවීමේ රථයක් පවතී. මුලතිව් දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවල ගිනි නිවන රථ හෝ ගිනි නිවීම් මධ්‍යස්ථාන නොමැත.

(iii) අදාළ දැනුම් දීම ලැබී මිනිත්තු 10ක් ඇතුළත මන්නාරම නගර සභාවේ ගිනි නිවන රථය අදාළ කාර්යය සඳහා යොදවනු ලැබේ.

(ආ) (i) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල ගිනි නිවීම් සේවා මධ්‍යස්ථාන නොපවතින හෙයින් අනුමත සේවක සංඛ්‍යාවක් නොමැත.

(ii) මන්නාරම නගර සභාව විසින් ගිනි නිවන රථ නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුදල:

2024 වර්ෂය - රු. 150,000.00

2025 වර්ෂය - රු. 150,000.00

2026 වර්ෂය - රු. 150,000.00

මන්නාරම නගර සභාව විසින් ගිනි නිවන රථ රියදුරන් සඳහා නිත්‍ය වැටුපට අමතරව පොරොත්තු රාජකාරි සඳහා, අතිකාල දීමනා සඳහා වෙන් කරන ලද මුදල:

2024, 2025 සහ 2026 වර්ෂ සඳහා - රු. 2,000,000.00

(iii) මන්නාරම නගර සභාව විසින් ගිනි නිවන රථ සඳහා අනුයුක්ත කර ඇති රියදුරන් සහ සේවකයන් සඳහා මන්නාරම නගර සභාව සතු අරමුදල්වලින් ආරක්ෂක උපකරණ මිලදී ගෙන ලබා දී ඇති අතර, යාපනය මහ නගර සභාව විසින් අවශ්‍ය මූලික පුහුණුව ලබා දී ඇත.

(ඇ) (i) ඔව්.

ගිනි නිවීම් සේවා කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 181.50ක ව්‍යාපෘති යෝජනාවක් උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති අතර මන්නාරම නගර සභාව, මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව සහ යාපනය දිස්ත්‍රික්කයේ පේදුරුතුඩුව නගර සභාව සඳහා ගිනි නිවීම් ඒකක පිහිටුවීමට එක් පළාත් පාලන ආයතනයක් සඳහා රුපියල් මිලියන 60.5 බැගින් ලැබෙන සේ එම ව්‍යාපෘති යෝජනාව මඟින් ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇත.

එම ව්‍යාපෘති යෝජනාවේ පළමු අදියර මන්නාරම නගර සභාවේ මූල්‍ය ප්‍රතිපාදනවලින් ද, ඉතිරි ක්‍රියාකාරකම් පළාත් සභා මූල්‍ය ප්‍රතිපාදනවලින් ද ඉදිරි මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී.

(ii) ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අරමුදල් වෙන් කිරීම මත පදනම්ව තීරණය කරනු ලැබේ.

(iii) ගිනි නිවීම් සේවා මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා සහ කාර්යය මණ්ඩලය පවත්වා ගැනීම සඳහා ඉදිරි වසරේ සිට ක්‍රියාත්මක වීමට කඩිනම් සැලසුම් සකස් කර ඇති අතර එම උපකරණ හා යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීමට වැය වන අධික පිරිවැය හේතුවෙන් ප්‍රතිපාදන සපයා ගැනීමේ දුෂ්කරතාව මත පසුගිය වසරවල එම අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වී ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ அமைச்சர் அவர்களே, எதிர்வரும் நிதியாண்டில் இந்த இரண்டு மாவட்டங்களுக்குமான தீயணைப்புப் பிரிவை அமைத்துத் தருவதாக நீங்கள் கூறினீர்கள். நன்றி! இருந்தபோதிலும், நேற்று முன்தினம் மன்னாரில் பனைத் தொகுதி பற்றியெரிந்தபோது, அங்கு சென்று தீயை அணைப்பதற்கான முயற்சியை மேற்கொண்ட மன்னார் நகர சபையிடம் இருக்கும் நீர்த்தாங்கியின் கொள்ளளவு - capacity - குறைவாக இருந்த காரணத்தால், அத்தீயை முழுமையாக அணைக்க முடியவில்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். வவுனியாவிலிருந்து மன்னாருக்கு தீயணைப்புப் பிரிவினர் வருவதாக இருந்தால், கிட்டத்தட்ட 19 கிலோமீற்றர் தூரம் பயணிக்க வேண்டும். அதேபோல், வவுனியாவிலிருந்து முல்லைத்தீவுக்குப் போவதாக இருந்தால், சுமார் 100 கிலோமீற்றர் தூரம் பயணிக்க வேண்டும். அதற்கிடையில் அங்கு எல்லாம் எரிந்து முடிந்துவிடும். உதாரணத்துக்கு, கடந்த காலத்தில் மன்னார் நகர் பகுதியிலுள்ள Singer outlet தீ பற்றியபோது, தீயணைப்புப் பிரிவினர் வவுனியாவிலிருந்து வருவதற்குள் அந்தக் கடை முற்றாக எரிந்து சாம்பலாகிவிட்டது.

கடைத் தொகுதியில் தீ பற்று ஏற்பட்டுவிட்டால், மன்னார் நகர சபையிடம் உள்ள தீயணைப்பு வாகனத்திலுள்ள நீர்தாங்கியின் கொள்ளளவு போதாமை காரணமாக, வவுனியாவில் இருந்துதான் தீயணைப்புப் பிரிவினரை அழைக்க வேண்டும். எனவே, அடுத்த வருட வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின்மூலம் மன்னார், முல்லைத்தீவு மாவட்டங்களுக்கான தீயணைப்புப் பிரிவை அமைப்பதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය ඉතාම නිවැරදියි. ඒ ප්‍රදේශවල හදිසියේ ඇතිවන ගිනිගැනීම් වැළැක්වීම සඳහා පසුගිය කාලය මුළුල්ලේම ප්‍රමාණවත් පියවර අරගෙන නැහැ. "උතුරු වසන්තය" වාගේ කතන්දර කිව්වාට, ඒ උතුරු වසන්තයෙන් උතුරට අඩු තරමේ හදිසි ගින්නක් පාලනය කර ගැනීමටවත් අවශ්‍ය පහසුකම් සපයා නැහැ. මේ වෙනකොටත් අපි ඒ කටයුතු සඳහා අවශ්‍ය මූලික පියවර අරගෙන තිබෙනවා. ඉතාම කඩිනමින් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම කරනවා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிகக் கேள்வியை கௌரவ (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம் அவர்கள் கேட்பார்.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ அமைச்சர் அவர்களே, கௌரவ அமிர்தநாதன் அடைக்கலநாதன் அவர்கள் கூறியதுபோல, இந்த விடயத்தில் முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களுக்கு முன்னுரிமை வழங்கப்பட வேண்டும். வவுனியா மாநகர சபையில் இருக்கின்ற தீயணைப்புப் பிரிவு மிகவும் பழமையானது. அங்கு 11 பேருக்கான ஆளணி இருந்தாலும், இன்றுவரை அது நிரப்பப்படவில்லை. இது மாகாண சபைக்கு உட்பட்ட விடயம். தற்போது மாகாண சபை இயங்காத காரணத்தால், ஆளுநர் ஊடாக நீங்கள் இதை நேரடியாகப் பரிபாலனம் செய்வதால் உங்களிடம் இந்தக் கேள்வியைக் கேட்கின்றேன். அங்குள்ள ஆளணி வெற்றிடங்களை எப்போது நிரப்பக்கூடிய சந்தர்ப்பம் ஏற்படும்? எதிர்வருகின்ற 2027ஆம் ஆண்டுக்கான பாதீட்டின்மூலம் வவுனியா மாநகர சபைக்கு மேலுமொரு தீயணைப்பு வாகனத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். ஏனென்றால், தற்போது வவுனியாவிலுள்ள தீயணைப்புப் பிரிவினர் 3 மாவட்டங்களுக்குச் சேவைகளை வழங்கி வருகின்றார்கள். இப்போது வவுனியா மாநகர சபையில் சாதாரணமாக வேலைசெய்கின்ற பணியாட்களும் தீயணைப்புப் பிரிவில் இருக்கின்றார்கள். அவர்கள் பயிற்சி பெறாதவர்கள். அப்பிரிவில் 11 பேர் வேலை செய்கின்றபோதிலும், 3 பேர்தான் பயிற்சி பெற்றிருக்கிறார்கள். ஏனையவர்களுக்குத் தேவையான பயிற்சியை வழங்குவதற்கு ஏற்பாடு செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කළ කාරණයත් නිවැරදියි. ඇත්තටම බොහෝ පළාත් පාලන ආයතනවල ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති තත්ත්වයක් තිබෙනවා. රජය හැටියට අපි මේ වෙනකොට අලුතෙන් බඳවා ගැනීම් ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉතාම කඩිනමින් මේ සේවක හිඟය පියවන්න අපට පුළුවන්කමක් ලැබෙයි කියලා. ඒ වාගේම ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබා දීලා නැද්ද කියන කාරණය හරියටම පැහැදිලි නැහැ. ආරම්භයේදී ඔවුන්ට යම් පුහුණුවක් ලබා දීලා තිබෙනවා. නමුත් මම හිතනවා, වරින් වර පුහුණුවක් ලබාදීම සඳහා කටයුතු කිරීම අවශ්‍යයි කියලා. ඒ නිසා ඉදිරියේදී, විශේෂයෙන්ම ගිනි නිවීමේ කටයුතුවල නිරත වන සේවකයන්ට අවුරුද්දකට සැරයක්වත් විශේෂ පුහුණුවක් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න අපේක්ෂා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 8 -2270/2026- (1), ගරු රුවන් මාපලගම මහතා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### උතුරු සහ නැඟෙනහිර පළාත්වල රජයේ ආයතනවල කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම
### வடக்கு, கிழக்கு மாகாணங்களில் அரச நிறுவனங்களிலுள்ள ஆளணி வெற்றிடங்களை நிரப்புதல்
### FILLING OF STAFF VACANCIES IN GOVERNMENT INSTITUTIONS IN NORTHERN AND EASTERN PROVINCES

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித் ததற்கு நன்றி!

மக்களின் வாழ்க்கையில் பரிமாற்றங்களை மேற் கொள்வதில் அரச அதிகாரிகளின் சேவை அளப்பரியது. அவர்கள் அனைவருக்கும் எனது பாராட்டுக்களையும் மனமார்ந்த நன்றிகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

கடந்த கால யுத்தத்தால் பாதிப்புற்று இன்றுவரை அதிலிருந்து மீளாமல் பின்தங்கிய நிலையிலுள்ள வட மாகாண, கிழக்கு மாகாண எல்லையோடு இருக்கும் மாவட்டங்களின் மாவட்டச் செயலகங்கள், பிரதேச செயலகங்கள், மத்திய அரசின் பல அமைச்சுக்களின் திணைக்களங்கள், அதிகார சபைகளின் மாவட்ட, பிரதேச மட்ட அலுவலகங்களின் அதிகாரிகள் மற்றும் உத்தியோகத்தர் நியமனங்களில் ஏற்றத்தாழ்வு காணப்படுகின்றது. இந்நிலையைச் சீர்செய்வது மிகவும் அவசியமாகும். கிழக்கு மாகாணத்தின் இரண்டாவது வர்த்தக நகரமாக விளங்குவது கல்முனை ஆகும். உள்நாட்டுப் போரால் பாதிக்கப்பட்ட இப்பிரதேசம் இன்னமும் அதிலிருந்து மீளாத நிலையில், இப்பிரதேச நிருவாக நடவடிக்கைகளுடன் தொடர்புடைய பல முக்கியமான பதவிகளுக்குத் தற்காலிக அல்லது பதில் கடமை அடிப்படையிலான ஆளணியே காணப்படுகின்றது. இந்நிலையில், இம்மக்கள் அடிப்படை நிருவாக, உட்கட்டமைப்பு, பொருளாதாரத் தேவைகள் மற்றும் வாய்ப்புகள் தொடர்பில் பல்வேறு சவால்களை எதிர்நோக்கி வருகின்றனர். இவை அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டு வரப்பட்டு, தீர்வு காணப்படவேண்டியது அவசியமாகும். அந்த அடிப்படையில், பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்:

1. வவுனியா, முல்லைத்தீவு, மன்னார், கிளிநொச்சி, அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, புத்தளம், அநுராதபுரம், பொலன்னறுவை, பதுளை, மொனராகலை மாவட்டங்களின் மாவட்ட செயலகங்கள், பிரதேச செயலகங்களில் காணப்படும் மத்திய அரசின் கீழுள்ள அமைச்சுக்களின் திணைக் களங்கள், அதிகாரசபைகள், அலுவலகங்களில் காணப்படும் ஆளணி வெற்றிடங்களை மாவட்ட ரீதியாக தரவு வடிவில் வழங்க முடியுமா?

2. சில மாவட்டங்களில் அனுமதிக்கப்பட்ட ஆளணியை விட மேலதிகமான ஆளணி காணப்படுவது ஏன்? பதவி வாரியாக விபரங்களைத் தரவும்?

3. மேலதிக ஆளணி காணப்படும் மாவட்டங்களிலிருந்து வெற்றிடம் நிலவும் மாவட்டங்களுக்குப் பொருத்த மான இடமாற்றங்களை மேற்கொள்வதன் மூலமும், புதிய நியமனங்கள் ஊடாகவும் இவ் வெற்றிடங்களை நிரப்புவதற்கான செயன்முறை எந்தக் கட்டத்தில் உள்ளது?

   விரைவாக இந்த ஆளணி வெற்றிடங்களை நிரப்புவதன்மூலம் மக்கள் சேவைகளைப் பெறுவதில் காணப்படுகின்ற ஏற்றத்தாழ்வுகளைச் சீர்செய்து, மக்கள் தாமதமின்றிச் சேவைகளைப் பெற்றுக் கொள்வதற்காக எடுக்கப்பட்ட அல்லது எடுக்கப் படவுள்ள பொருத்தமான நடவடிக்கைகளை இச்சபைக்கு அறிவிப்பீர்களா?

4. கல்முனையானது, அம்பாறை மாவட்டத்தில் மக்கள் செறிந்து வாழும் ஒரு பிரதான நகரமாகும். எனினும், கல்முனை பிரதேச செயலகத்தில் கடந்த ஒன்றரை வருடங்களாக பிரதேச செயலாளர் நிரந்தரமாக நியமிக்கப்படாத நிலையில், பதில் கடமைக்காக நியமிக்கப்பட்ட ஒருவரே இன்றுவரை கடமையாற்றி வருகின்றார். மேலும், மேலதிக மாவட்ட பதிவாளர், கிராம உத்தியோகத்தர் போன்ற முக்கிய பதவிகளில் பதில் கடமைபுரிபவர்கள் இருப்பதாலும், பதவிக்குரிய உத்தியோகத்தர் இல்லாமையாலும் மக்கள் பல அசௌகரியங்களுக்கு உள்ளாகின்றனர். மக்கள் தாமதமின்றி சேவைகளைப் பெற்றுக்கொள்வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை? மேலும் உரிய நியமனங்களை எவ்வளவு நாட் களுக்குள் பூர்த்தி செய்யலாம்?

5. நகர அபிவிருத்தி மற்றும் மேம்பாட்டுப் பணிகளுக்கு உள்ளூராட்சி மன்றங்களின் சிறப்பான செயற்பாடு இன்றியமையாததாகும். ஆனால், கல்முனை மாநகர சபையானது, கல்முனை பொது நூலகக் கட்டிடத்தில் பாரிய நெருக்கடிகளுக்கு மத்தியில் இயங்கி வருகின்றது. இதனால் பொதுமக்கள் மற்றும் மாணவர் களின் கல்வி, ஏனைய அறிவார்ந்த செயற்பாடுகளில் பாரிய பின்னடைவு ஏற்பட்டுள்ளது. எனவே, விரைவாக கல்முனை மாநகர சபைக்குரிய நவீன கட்டிடத்தொகுதியை நிறுவி, மக்களுக்குரிய சிறப்பான சேவைகளை வழங்க முடியுமா?

6. கல்முனை மாநகர சபையின் ஆணையாளர், செயலாளர், பொறியியலாளர், வருமான மேற்பார்வை யாளர், 'மெகானிக்', தொழில்நுட்ப உத்தியோகத்தர் போன்ற முக்கிய பதவிகள் வெற்றிடமாகவும், பதில் கடமை அடிப்படையிலும், இன்னும் பல ஆளணிகள் நிரப்பப்படாத உத்தியோகத்தர்களுக்குரிய தேவைப் பாடுகளுடனும் உள்ளதென்பதை அறிவீர்களா? இந்நியமனங்கள் எப்போது மேற்கொள்ளப்படும்?

7. மாநகர சபைக்குச் சொந்தமான விலங்கறுமனை இல்லாததால், இதை தனியார் இடத்தில் மேற் கொண்டு வருவதால், அதற்கு ஏற்படும் அனைத்துச் செலவுகளையும் ஈடுசெய்ய நுகர்வோர் அதிக விலை செலுத்துகின்றனர். அத்துடன், இவ்விடயம்மூலம் மாநகர சபைக்கு வரவேண்டிய பெருந்தொகையான மாதாந்த வருமானமும் இல்லாமல் போகின்றது. மேலும், மாநகர சபைக்குச் சொந்தமான பொதுச் சந்தை இடிந்துவிழும் அபாயத்திலுள்ளது. இவ் விடயங்கள் பற்றி அறிவீர்களா? ஆமெனில், இவற் றுக்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் பற்றிய முழுமையான அறிக்கை ஒன்றை இச் சபைக்குச் சமர்ப்பிக்க முடியுமா?

கௌரவ அமைச்சர் அவர்களே, இங்கு கூறியதைப்போல, வட மாகாணத்திலுள்ள சில மாவட்டங்களில் காணப்படும் ஆளணிப் பற்றாக்குறையானது ஏனைய மாவட்டங்களைவிடக் கூடுதலாக இருக்கின்றது. வளங்களைச் சமமாகப் பகிர்ந்து, அம்மாவட்ட மக்களும் நன்மையுறும் விதத்தில் இதனை விரைவாகச் சீர்செய்து தருமாறு இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேபோல, கல்முனைப் பகுதியிலுள்ள மேற்கூறிய பிரச்சினைகளுக்குரிய தீர்வுகளையும் கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவாரென நான் எதிர்பார்க் கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා කියපු කාරණය නිවැරදියි. මේ සියලු ආයතනවල සේවක හිඟයක් පවතිනවා, 2020න් පස්සේ සේවකයින් බඳවාගෙන නැති නිසා. එතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේදී සම්පූර්ණ විස්තර ලබා දිය යුතු බැවින්, ඒ සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

## II

## උතුරු සහ නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනයන්හි පවතින මූල්‍ය, යටිතල පහසුකම් සහ පරිපාලනමය ගැටලු
வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள உள்ளூராட்சி மன்றங்களில் நிலவும் நிதி, உட்கட்டமைப்பு மற்றும் நிருவாகச் சிக்கல்கள்
FINANCIAL, INFRASTRUCTURE AND ADMINISTRATIVE ISSUES OF LOCAL AUTHORITIES IN NORTHERN AND EASTERN PROVINCES

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

The local authorities are not merely institutions for garbage collection and for providing basic services. MCs, UCs and Pradeshiya Sabhas are elected democratic institutions with regulatory and by-law-making responsibilities. Yet, their powers and revenue mechanisms remain inadequately updated, while many councils face serious financial and infrastructure constraints.

Hon. Minister, my Question is as follows:

1. How many MCs, UCs and Pradeshiya Sabhas function in the North and the East and which party or group administers each?

2. What percentage of salaries must councils finance from their own revenue, what increases are proposed up to 2029 and is that an IMF requirement?

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த விடயமானது IMFஇன் தேவைப்பாடெனக் கூறப்படுகின்றது. அதாவது, ஆரம்பத்தில் பிரதேச சபை ஊழியர்களுக்கான சம்பளத்தில் 20 சதவீதத்தையும், பின்னர் 40 சதவீதத்தையும் என அதிகரித்து, 2029ஆம் ஆண்டாகும்போது முழுச் சம்பளத்தையும் பிரதேச சபையின் வருமானத்திலிருந்து செலுத்த வேண்டுமெனக் கூறப்படுகின்றது. இது IMFஇன் நிபந்தனை என்று சொல்கின்றார்கள். ஆனால், இது IMFஇன் நிபந்தனை அல்ல என்பதை நான் அறிகின்றேன். இப்படியே செல்லுமாக இருந்தால், உள்ளூராட்சி மன்றங்கள் இயங்க முடியாத நிலை ஏற்படும். ஏனெனில், அவற்றுக்குப் போதுமான வருமானம் இல்லை.

3. What amount and percentage of Central and provincial development allocations reached each province, each district and local authority in the North and the East in 2025 and 2026?

4. What vehicles and machinery were provided to each council over five years, by which source and the value?

5. What rates, taxes, rents, licence fees, permit charges and fines were assessable and collected by each council in 2025-2026, what percentage remains outstanding and what State legal assistance exists against major defaulters?

6. What are the minimum and maximum rates, licence fees, permit charges, street-vending and market fees, fines and other charges the MCs, UCs and Pradeshiya Sabhas may impose and when was each last revised? What is the highest fine available to each category and what amendments are proposed to modernize and periodically update these amounts?

ගරු කථානායකතුමනි, මේ වනකොට ප්‍රාදේශීය සභාවලින් සහ නගර සභාවලින් rate licence එකක් දෙනවා නම් ඒකට රුපියල් 5,000ක්, රුපියල් 6,000ක් වාගේ තමයි ගත හැකි වන්නේ, පනත අනුව. සාමාන්‍යයෙන් දඩයක් ගහනවා නම් රුපියල්, 100යි, රුපියල් 150යි, රුපියල් 500යි. දඩ ගහලාත් මිනිස්සු ඒ වැරදි ටික කරගෙන යනවා. මේක update වෙන්න ඕනෑ කාරණාවක්, ගරු කථානායකතුමනි. නමුත් අවුරුදු ගණනාවක් තිස්සේ update වෙලා නැහැ, ප්‍රාදේශීය සභා සහ නගර සභාවල තිබෙන fines ඇතුළු ඒ දේවල්.

7. Are councils assessing properties, collecting rates or issuing licences beyond gazetted boundaries, and how will that be prevented?

கௌரவ சபாநாயகர் அவர்களே, நான் இந்தக் கேள்வியை எழுப்புவதற்குக் காரணம் இருக்கிறது. கடந்த இரண்டு நாட்களாக Kattankudy Urban Council, மட்டக்களப்பு மாநகர சபைக்கு உட்பட்ட மஞ்சந்தொடுவாய் வட்டாரத்தில் assessmentஐ மேற்கொண்டு, சோலை வரியை அறவீடு செய்கின்றது. இது இனங்களுக்கு இடையில் முரண்பாடு ஏற்படக்கூடிய நிலைக்குப் போகலாம். ஏனென்றால், மட்டக்களப்பு மாநகர சபையின் எல்லைக்குள் இருக்கின்ற ஒரு வட்டாரத்தில், அந்த வட்டார உறுப்பினருக்குத் தெரியாமல், அயல் நகர சபையால் வரி அறவீடு செய்யப்படுகின்றது. இது தடுக்கப்பட வேண்டிய விடயமாகும்.

8. How many by-laws have MCs, UCs and Pradeshiya Sabhas enacted or updated in 10 years and how many remain pending? What procedures apply, separately, to each for making, approving and gazetting by-laws, including the Governor's role without elected provincial councils, and what reforms are proposed?

Hon. Speaker, for a municipal council to pass a by-law, there has to be a provincial council functioning. We have not had a provincial council functioning since 2017. So, any of the by-laws created by municipal councils since 2018 have not been approved. The Pradeshiya Sabhas have created so many by-laws, to which the Governor has to give consent. So, the by-laws are not in place. ප්‍රාදේශීය සභාවක් කියන්නේ කුණු ගන්න ආයතනයක් විතරක් නොවෙයි, නීති සම්පාදනය කරන ආයතනයක්. ඒකට අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය විසින් ලබා දෙන්න ඕනෑ.

9. How much LLDF financing has each Northern and Eastern Provincial Councils received over five years and will revenue-generating financing expand?

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු කථානායකතුමනි, සභාවේ ආදායම වැඩි කර ගන්න මේ LLDF loan system එක යටතේ විශාල projects රාශියකට proposals දීලාත් මේ වනකොට ඒවාට approvals ලැබිලා නැහැ. ඉතින්, මේක කඩිනම් කරන්න ඕනෑ කාරණයක්.

10. Which areas are proposed to be upgraded to UCs or MCs, and what is their status?

கௌரவ சபாநாயகர் அவர்களே, UCஐ MCஆகத் தரமுயத்த வேண்டும், MCஐ மாநகர சபையாகத் தரமுயர்த்த வேண்டுமென எத்தனையோ கோரிக்கைகள் இருக்கின்றன. எனினும், இந்த விடயங்கள் நீண்ட காலமாக இழுபறி நிலையில் இருக்கின்றன. எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசங்களிலுள்ள இவ்விடயம் சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்கள் கரிசனை செலுத்த வேண்டும்.

11. What circular governs participation of Mayors, Chairmen and their deputies in District and Divisional Coordinating Committees, and will both be included?

12. What legal basis permits Prajashakthi structures to identify and prioritize local government projects, and will elected councils be guaranteed against being bypassed?

13. Will reforms strengthen the legislative, regulatory, financial and administrative autonomy of elected local authorities?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now you have completed raising your Question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Please give me one more minute, Sir.

கௌரவ சபாநாயகர் அவர்களே, நான் இந்தக் கேள்விகளைக் கேட்டதன் நோக்கம் என்னவென்றால், எங்களுடைய மாவட்ட, பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களில் உள்ளூராட்சி மன்றத் தலைவர்களுக்கு அங்கீகாரம் வழங்கப்பட வேண்டும் என்பதுதான். 'பிரஜா சக்தி' குழு உறுப்பினர், மக்களால் தெரிவு செய்யப்பட்ட உறுப்பினருடைய கடமையைச் செய்ய முடியாது.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 7.00 දක්වා ද විය යුතු ය. අ.භා. 7.00ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

### 2026.09.06 දින "දිනමිණ" ෆේස්බුක් පිටුවේ පළ කරන ලද වීඩියෝව
06.09.2026 அன்று 'தினமின' முகநூல் பக்கத்தில் வெளியிடப்பட்ட காணொளி
VIDEO POSTED ON "DINAMINA" FACEBOOK PAGE ON 06.09.2026

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී.වී. චානක මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 සැප්තැම්බර් 09 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 01 සහ 02, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳ කල් තබන ලද විවාදය සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳ කල් තබන ලද විවාදය තවදුරටත් පැවැත්වීම.

# විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත
# அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்
# TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී*

*ඊට අදාළ ප්‍රශ්නය* ***[සැප්තැම්බර් 24]***

*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය"* ***[ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [செப்ரெம்பர் 24]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [24th September]*

*"That the Bill be now read a Second time".- [The Hon. Harshana Nanayakkara]*

*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. Leader of the Opposition to start the Debate. You have 15 minutes.

[පූ.භා. 11.13]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ඔබතුමා කථාව අතරමැද යන්නේ නැහැ නේ. ඔක්කෝම අහගෙන ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ කථාව අහන්න මම ඉන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ප්‍රධාන උපමාවක්; කථා පුවතක් ආශ්‍රිතව මගේ කථාව ආරම්භ කරන්න මම කැමැතියි. Hans Christian Andersen විසින් 1837දී රචිත "The Emperor's New Clothes" - අහස් සළුව ඇඳගත් අධිරාජ්‍යයා - කියන කථාවෙන් යම්කිසි කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වනවා. මම හිතනවා, ඇත්තවශයෙන්ම මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරනකොට ඒක වටිනවා කියලා.

ඒ කථාවෙන් කියැවෙන්නේ වංචනිකයන් දෙදෙනෙකුගේ ක්‍රියාකලාපයන් තුළ පොඩ්ඩක් ඔළුව ඉදිමිච්ච, උද්ධච්ච රජතුමෙක් රැවටුණා කියන එකයි. ඒ වංචනිකයන් දෙදෙනා ඒ රජතුමාට පෙන්වා දුන්නා, බොහොම ලස්සන, අදෘශ්‍යමාන ඇඳුමක් තිබෙනවා කියලා. ඒක ඒ රජතුමාට අන්දවන එකත් ඔවුන් කළා. හැබැයි, ඇත්තවශයෙන්ම ඇඳුමක් නැහැ. අවසානයේදී මොකක්ද සිද්ධ වුණේ? ඒ වංචනිකයන් දෙදෙනාගේ ඒ රැවටිලිකාර ක්‍රියාවට ඒ රජතුමා රැවටුණා. ඇත්තවශයෙන්ම ඇඳුමක් ඇන්දෙව්වා කියලා කිව්වාට ඇඳුම් මොනවත් නැහැ. හැබැයි, ඒ රජතුමා ළඟ හිටපු පරිවාර කොට්ඨාස, ඇමතිවරු, සහයෝගය දෙන කණ්ඩායම් ඒ ගැන වැඩිය කථා කරන්න ගියේ නැහැ, රජතුමාට තිබෙන භයට, වහල්භාවයට. ඒගොල්ලනුත් කිව්වා, නැහැ, නැහැ, බොහොම ලස්සනයි කියලා. හැබැයි, ඉතින් ඇඳුම් නැහැ. අවසානයේ ඒ රජතුමා ඇඳුම නැතුව මහ පාරට ගිහිල්ලා පෙරහැරේ යනකොට පුංචි දරුවෙක් තමයි කිව්වේ, "අන්න, රජතුමා ඇඳුමක් නැතුව යන්නේ. ඇඳුමක් නැතුව යන්නේ" කියලා.

එතකොට, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා ප්‍රජාතන්ත්‍රවාදයට හානියක් සිද්ධ වෙන්නේ නැහැ, මේක රටට හොඳයි, ජනතාවට හොඳයි - ලක්ෂ 220ට හොඳයි - ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත වෙනවා කියලා කොච්චර කිව්වත්, අර අධිරාජ්‍යයා ඇඳ ගත් අහස් සළුව වාගේ අන්දවන්න හැදුවත් ඒකේ සත්‍යතාව තමයි ඒකේ නිරුවත්භාවය. ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධී, ඒ වාගේම රටේ ජනතාවගේ ආත්ම ගරුත්වයත් කෙලෙසන, මානව අයිතිය, මූලික අයිතිය උල්ලංඝනය කරන්න හදන ඉතාම පැහැදිලි උත්සාහයක්. මේ රටේ බලය පාවිච්චි කරමින්, ජනතාව මේ රටේ වහලුන් හැටියට සලකලා තමන්ගේ ආධිපත්‍යයට - තමන් යටතට - ගන්න ක්‍රියාවක් කරන්න හදනවා. ඉතින්, මේක "නිරුවත්, නිරුවත්" කියලා අපි කොච්චර කිව්වත්, "නැහැ, නැහැ, නිරුවත් නැහැ. අපි හොඳ ඇඳුමක් ඇඳගෙන ඉන්නේ" කියන එක මේ රජතුමා ප්‍රමුඛ, මේ අමාත්‍ය කණ්ඩායම ප්‍රමුඛ, ඒ සගයින් කොට්ඨාසය ප්‍රමුඛව කියාගෙන යනවා. ඇත්තවශයෙන්ම මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සැබෑ අර්ථය අර නිරුවත්ව හිටපු රජතුමා වාගේ තමයි. මේක ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙළක් කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මගේ අදහස් ඉදිරිපත් කිරීම දැන් ආරම්භ කරන්නම්. මෑත කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගණනාවක් ආවා. ඒවා තමයි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඇයි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවේ? දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවේ විධායක බලතල අඩු කරන්න. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කළේ? අඩු කරපු විධායක බලතල ආපහු විධායකය ගත්තා. ඊට පස්සේ ආවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කළේ? ආපහු විධායක බලතල අඩු කළා. ඊට පස්සේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කළේ? හැටනව ලක්ෂයක ඡන්දයෙන් පත් වුණු ජනාධිපතිවරයා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විධායකයේ අඩු කරපු බලතල ආපහු ගත්තා. ඊට පස්සේ මොකක්ද වුණේ? රට බංකොලොත් වුණා, රට විනාශ මුඛය කරා ගියා. ඊට පස්සේ ආවා, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කළේ? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විධායකයට ගත්ත බලතල ආපහු අඩු කළා. එහෙම තමයි කළේ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

උදාහරණයක් වශයෙන් ගත්තොත්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ගෙනාවා, Parliamentary Council කියලා එකක්. ඒක නිකම් rubber-stamping body එකක්. මමත් ඒකේ හිටියා. ඒකෙන් කළේ නිකම් rubber stamp කරන එක විතරයි. ඒක විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වෙනස් වුණා. ඒ නිසා තමයි විධායකයට ඕනෑ ඕනෑ විදියට,- උදාහරණයක් ගත්තොත්, ස්වාධීන කොමිෂන් සභාවලට අධිකරණ ක්ෂේත්‍රයේ උපරිමාධිකරණ විනිසුරුවන් තමන්ට හිතුමතේට පත් කරන්න බැහැ, Constitutional Council - CC - එකේ අනුමැතිය ඕනෑ. අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ඛේදවාචකය මොකක්ද? දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන සංශෝධන ඔක්කොටම අත් උස්සපු කට්ටිය මේ රටේ දේශපාලන ක්ෂේත්‍රය තුළ ඉන්නවා. මේ රටේ ජනතාව ඒ අයට ඡන්දය දීලාත් තිබෙනවා. මෙන්න, ඛේදවාචකය.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කරන්නේ? විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කරන්නේත් අධිකරණයේ ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සුනුවිසුනු කරලා, 1748දී Montesquieu විසින් රචනා කළ "The Spirit of Law" කියන පොතේ සඳහන් වන බලය බෙදීමේ සංකල්පය - separation of powers principle එක - සහමුලින්ම කුඩුපට්ටම් කිරීමයි. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය වෙලා තිබෙන්නේ බලය බෙදීම සහ සංවරණ සහ තුලනවලිනුයි, checks and balancesවලිනුයි. අර දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව අත උස්සපු කට්ටියත් ඉන්නවා. ඒ වාගේම, විවිධ යෝජනා අනුව නිවැරදි ස්ථාවරයේ ඉඳගෙන, නිවැරදි ආකාරයට පක්ෂ වුණු, විරුද්ධ වුණු අයත් ඉන්නවා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරලා, විධායකයේ බලතල අඩු කරලා, යහපත් රාජ්‍ය පාලනය ශක්තිමත් කිරීමේ මහා වැඩ පිළිවෙළට ශක්තිය ලබා දෙන්න.

දැන් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කෙරෙන්නෙත්, රටේ ලක්ෂ 220ක් වන ජනතාව තුළ අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය පලුදු කරලා, ගරු විනිසුරුවරුන් කෙරෙහි තිබෙන ගෞරවය නැත්තටම නැති කරලා, කෙලෙසලා, මේ රටේ අධිකරණය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බවට පත් කිරීමයි. එයයි, මේ සිද්ධ වෙන්නේ.

අද විවිධ අය මහ ලොකුවට කථා කරනවා, අධිකරණයේ ස්වාධීනත්වය සහ අධිකරණය සුරක්ෂා කරන්න ඕනෑය කියන කාරණය ගැන. හැබැයි මතක තබා ගන්න, ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමියක් වන ශිරානි බණ්ඩාරනායක මැතිනියට එදා කරපු දේ. ඒ අය, ඒ අයගේ හෘදය සාක්ෂියට එකඟව ඒ ගැන ප්‍රශ්න කරන්න ඕනෑ. එදා අග්‍ර විනිශ්චයකාරතුමියව පන්නලා අද එනවා අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්න. ඒ අයට ඒකට සදාචාරාත්මක අයිතියක් තිබෙනවා ද? තවත් කොටසක් ඉන්නවා, එදා ශිරානි බණ්ඩාරනායක මැතිනිය වෙනුවෙන් පෙනී ඉඳලා, ඊට පසුව යම් සිදුවීමකදී එක්තරා ආකාරයකට කටයුතු කරන්න උත්සාහ කරපු. පසුගිය කාලයේ පළාත් පාලන මැතිවරණය පවත්වන්න, භාණ්ඩාගාරයේ ලේකම්ට ඒ වෙන් කරපු මුදල් ටික නිකුත් කරන්නය කියලා අධිකරණ තීන්දුවක් දුන්නා මතකද? අධිකරණය එහෙම තීන්දුවක් දෙනකොට එම තීන්දු තීරණ දුන්නු අධිකරණයේ ගරු විනිසුරුවරුන් පාර්ලිමේන්තුවේ පවතින කාරක සභාවක් හමුවට ගෙන එන්න ඕනෑය කියලා ලජ්ජා නැතුව, වස්ත්‍රයක් ඇඳගෙන මේ සභාවට ඇවිල්ලා ප්‍රකාශ කළා. ඉතින්, මේ දෙකම පිළිබඳව රටේ ලක්ෂ 220ක් වන ජනතාව හිතන්න ඕනෑ වෙලාවක්, මේක. අපි ඒ දෙකේදීම අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී ඉඳලා, අද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳව අපි කථා කරන්නේ කොන්ද කෙළින් තියාගෙනයි.

තමන්ට ඕනෑ වනකොට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සන්න, තමන්ට වාසි ලැබෙනකොට දහඅටවන ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සන්න, ආයේ තමන්ට ඕනෑ වනකොට දහනව වන ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සන්න, ආයේ වාසි ලැබෙනකොට විසිවන ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සන්න, ආයේ තමන්ට ඕනෑ වනකොට විසිඑක්වන ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සන්න, ආයේ තමන්ගේ තැන රැක ගන්න විසි දෙවන ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සන්න සමහරු කටයුතු කරනවා. කරුණාකරලා අර ඇඳුමක් ඇඳගෙනය කියලා රජතුමාව රවට්ටපු උපමාව අරගෙන, ඔබ පරක්කු නැහැ, දැන්වත් ජනාධිපතිතුමාට කියන්න මෙය ඉල්ලා අස් කර ගන්න කියලා. මේක ඉල්ලා අස් කර ගන්න.

අපි පැහැදිලිව කියන්න කැමැතියි, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරනවා, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය විනාශ කරනවා, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ මුඛය කරා ගෙන යනවා, නීතියේ අධිපත්‍යය කනත්තට ගෙන යනවා කියලා.

ගරු අග්‍රාමාත්‍යතුමිය අපේ වචන භාවිතය පිළිබඳව එතුමියගේ අදහස් පළ කළා. ඔව්, සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වනවා. අපි නැවතත් ප්‍රකාශ කරනවා, විනාශ වනවා නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය සමූල ඝාතනයට ලක්වනවා කියලා. ඔබ ජනවරමක් ලබා ගත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න. "පොහොසත් රටක් - ලස්සන - ජීවිතයක්" කියන ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 194වන පිටුව පොඩ්ඩක් කියවලා බලන්නකෝ, මොකක්ද කියා තිබෙන්නේ කියලා. ඒකේ කියන්නේ නැහැ, විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉහළ දමනවා කියලා. "ජනාධිපති ක්‍රමය වෙනස් කරනවා. රටටත්, ජනතාවටත් වග කියන අලුත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරනවා" කියන එක තමයි එහි කියන්නේ. එම නිසා මෙම පියවර තුළින් ඔබ කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂා කරනවා වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, ප්‍රජාතන්ත්‍රවාදයත් ඝාතනය කරන ඝාතකයෝ කොට්ඨාසයක් බවට පත් වෙලා, අපේ රටේ උතුම්, නිදහස්, නිවහල්, ස්වාධීන අධිකරණය ම්ලේච්ඡ ක්‍රියාදාමයක් තුළ, ව්‍යවස්ථාමය කුමන්ත්‍රණයක් හරහා විනාශ කිරීමට කටයුතු කිරීමයි. එය නිර්ලජ්ජිත ක්‍රියාවක්, ඉතාම පහත් ක්‍රියාවක් බව ප්‍රකාශ කරමින්, මම මතක් කර දෙන්න කැමැතියි ජෝන් ලොක් කියන දාර්ශනිකයා නීතියේ අධිපත්‍යය ගැන කළ ප්‍රකාශයක්. එතුමා කියනවා, "නීතිය කෙළවර වන තැන ඒකාධිපතිවාදය ආරම්භ වෙයි" කියලා.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන කථා කරනකොට අපේ අධිකරණ අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා

ඉස්සෙල්ලාම කියපු දේ මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි. මා ළඟ හැන්සාඩ් වාර්තා තිබෙනවා. එතුමා මට කිව්වා, "You are making presumptions" කියලා. "ඔබ නැති දෙයක් ගැන යම්කිසි නිගමනයකට එළඹීලා තිබෙනවා" කියලා, 2026 ජුනි 11වැනි දා මේ කාරණාව පිළිබඳව ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනකොට, විශ්‍රාම වයස දීර්ඝ කිරීම ගැන කථා කරනකොට එතුමා කිව්වා. එහෙම දෙයක් නැහැ කියලා, එතුමා කිව්වා. හැබැයි, දින කිහිපයයි ගත වුණේ. ජුනි 23වැනි දා පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමා ඒ කියපු දේ ආපහු හරවනවා. ආපහු කියනවා, "නැහැ. නැහැ. මෙහෙම සාකච්ඡාවක් තිබෙනවා. මෙහෙම දෙයක් තිබෙනවා" කියලා.

මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, අපේ ගරු හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමිය කළ ප්‍රකාශයක්. එතුමිය කථා කරනවා කළු අතීතයක් ගැන. මම එතුමියට මේ කාරණය කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition, you have two minutes remaining.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I will take a bit more time, Sir.

අතීතයේ කෙසේ වෙතත්, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ කළු වර්තමානයක් නිර්මාණය වෙලායි තිබෙන්නේ. කළු වර්තමානයක් තුළ ඔබතුමිය "මරු පහරක් එල්ල වෙනවා" කියන කාරණාව විවේචනය කළා. ඔබතුමියත් විපක්ෂය කියන එක සමූහයක් හැටියට ගණන් ගන්නවා. මම හිතන විධියට ඒක වැරදියි. මොකද, ඔබතුමියත් විපක්ෂයේ හිටපු කාල වකවානු තිබෙනවා.

ඒ වාගේම ඔබතුමිය ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා ගැන යම් සඳහන් කිරීමක් කළා. ජී.එල්. පීරිස් මැතිතුමා ඒ තීන්දු තීරණ ගන්නකොට අපි එතුමාගේ ආණ්ඩුවේ සාමාජිකයෝ විධියට හිටියේ නැහැ. ඒක කරුණාකරලා ඔබතුමිය හොඳින් අවබෝධ කර ගන්න කියා මා කියන්න කැමැතියි.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, මේ වැඩ පිළිවෙළ පිළිබඳව කිසිසේත්ම හරි අධ්‍යයනයක් කරලා නැහැ කියන එක. අධ්‍යයනයක් කළා නම් කළේ ADB funding මත 2023දී. පිටු 500ක අංග සම්පූර්ණ වාර්තාවක් තිබෙනවා. මේ එකකවත් කියන්නේ නැහැ, විශ්‍රාම වයස දීර්ඝ කිරීම අධිකරණයේ උද්ගත වී තිබෙන ගැටලුවලට විසඳුමක් කියලා; කිසිසේත්ම එහෙම සඳහනක් නැහැ.

මගේ කථාව අවසන් කිරීමට කලින් මම තව කාරණයක් කියන්න ඕනෑ. මම කවදාවත් අධිකරණ තීන්දු විවේචනයට ලක් කරන්නට මේ පාර්ලිමේන්තු වරප්‍රසාද හරහා කටයුතු කරපු කෙනෙකුත් නොවෙයි, කරන්න බලාපොරොත්තු වෙන්නේත් නැහැ. හැබැයි, තමන්ගේ වර්තමානය හෝ අනාගතය පිළිබඳව තීන්දු තීරණ ගන්නකොට - ඒකට Latinවලින් කියනවා, *nemo judex in causa sua* කියා - අපි දන්නවා, doctrine of necessity මත අධිකරණයට ඒ තීන්දු තීරණ ගැනීමේ අයිතිය තිබෙන බව. හැබැයි, මේ තීන්දුව ගන්නකොට full Bench එකක් ක්‍රියාත්මක කරන්නට තිබුණා. ඒ විතරක් නොවෙයි, අඩුම තරමේ මේ වාගේ වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අධිකරණයේ නීති මඩුල්ලේ සංයුතිය තීන්දු කරනකොට ජ්‍යෙෂ්ඨත්වය - seniority - අනුව ඒ තීන්දු තීරණ ගන්නට තිබුණා. ඒ වාගේම *audi alteram partem* කියන ප්‍රතිපත්තිය තුළ, හැම වෙලාවේම තීන්දුවක් ගන්නකොට අනෙක් පැත්තටත් සවන් දෙන්නට ඕනෑ; you must listen to the other side also. අධිකරණ ක්‍රියාදාමයන් ඉදිරිපත් කරපු සමහර කණ්ඩායම්වලට සවන් දීමක් තිබුණේ නැහැ කියන කාරණාව ගැන චෝදනාවක් තිබෙනවා.

ඒ වාගේම *stare decisis* කියන ප්‍රතිපත්තිය තුළ, පූර්වාදර්ශය අනුගමනය කිරීමේ වගකීම මේ රජයට තිබෙනවා. මම මතක් කරන්න කැමැතියි, Inland Revenue (Amendment) Bill, උපාලි අබේරත්න එරෙහි ජගත් ඩයස්, Industrial Disputes (Special Provisions) Bill පිළිබඳ තීන්දු ගැන. ඒ අනුව ගත්තාමත් ගරු මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා, බුවනෙක අලුවිහාරේ යන ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල බොහොම පැහැදිලිව කිව්වා, විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස වෙනස් කරනකොට අනිවාර්යයෙන්ම Referendum එකකට යන්න ඕනෑ කියලා. ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරනකොට කියනවා, අනිවාර්යයෙන්ම Referendum එකකට යන්න ඕනෑ කියලා. එතකොට, විසිවන සංශෝධනයට Referendum එකකට යන්න ඕනෑ, විසි දෙවන සංශෝධනයට එහෙම අවශ්‍ය නැහැ කියන එකද කියන්නේ? එහෙම කොහොමද වෙන්නේ? තමන්ට ඕනෑ ඕනෑ විධියට ඒ ක්‍රියාවලිය වෙනස් කිරීම අතිශයින්ම බරපතළ කාරණාවක් කියන එක මම කියනවා.

ඒ වාගේම මම කනගාටු වනවා, ශ්‍රී ලංකා නීතිඥ සංගමය පිළිබඳව මේ සභාවේ ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් කළ ප්‍රකාශය ගැන. එතුමා කිව්වා, මේ නීතිඥ සංගමයේ සභාපතිතුමාට බස්නාහිර පළාත් සභාවේ සජබ මහ ඇමති අපේක්ෂකකම දෙන්න පොරොන්දු වෙලා, ඒකයි එතුමා විරුද්ධ වුණේ කියලා. ඒක ඉතාම නරක ප්‍රකාශයක්; වැරදි - සාවද්‍ය - ප්‍රකාශයක්; අසත්‍ය ප්‍රකාශයක්. මම මේ මුළු සභාවෙන්ම කාරණයක් අහන්න කැමැතියි. මේකට විරුද්ධ වුණේ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විතරක් නොවෙයි නේ. කොළඹ මහාධිකරණ නීතිඥ සංගමයත් මේකට විරුද්ධ වුණා. ඒ අයත් සජබයේ ද? පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමයත් විරුද්ධ වුණා. ඒකත් සජබයේ ද? බදුල්ල නීතිඥ සංගමයේ ප්‍රකාශය බලන්න. ඒකත් සජබයේ ද?

LAWASIA ප්‍රකාශය, දෙපාරක් මේ සම්බන්ධයෙන් නිවේදන නිකුත් කර තිබෙනවා. ඒකත් සජබ ද? ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමය 65ට 0ක් ලෙස කිව්වා, එපා කියලා. ඒකත් සජබ ද? ගම්පහ නීතිඥ සංගමය; ඒකත් සජබ ද? Colombo Law Society එකේ statement එක; ඒකත් සජබ ද? ප්‍රංශ ජාතික නීතිඥ මණ්ඩලය; ඒකත් සජබ ද? අපි ඒගොල්ලන්ටත් මහ ඇමතිකම පොරොන්දු වෙලා තිබෙනවාද? IAJ statement එක, ඒ වාගේම UN එකේ Special Rapporteur on the Independence of Judges and Lawyers, ඒවාත් සජබ ද? GMOA එක; ඒකත් සජබ ද? *[බාධා කිරීම්]* සජබ ද? ආ, බොහොම ස්තුතියි. ඒකත් සජබ. හරි, හරි. *[බාධා කිරීම්]* කවුරුන්ද තවදුරටත් අන්දන්න හදන්නේ? කවුරුන්ද රවට්ටන්න හදන්නේ? *[බාධා කිරීම්]* තවත් එකක්, the Report on the Visit of the President of the Commonwealth Lawyers Association. Commonwealth Lawyers Association එකේ ප්‍රධානියාත් සජබද කියා මම අහන්න කැමැතියි. *[බාධා කිරීම්]* මම පිළිගන්නවා, ඊයේ උද්ඝෝෂණයට ආපු අය නම් සජබ සහ සජබ සන්ධානයේ අයයි කියලා. මම ඒක පිළිගන්නවා. *[බාධා කිරීම්]* අපේ සභානායකතුමා- *[බාධා කිරීම්]* ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කලබල වෙන්න එපා. ඔබතුමාගේ වෙලාවේ ඔබතුමා උත්තර දෙන්න. ඔච්චර කලබල වෙන්න එපා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මම අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා,- *[බාධා කිරීමක්]* මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, කලබල වෙන්නේ මොකද? කලබල වෙන්න එපා. *[බාධා කිරීමක්]* ඔබතුමා ගුරුවරුන්ට ලබා දෙනවා කියපු අර වැටුප් වර්ධකය ලබා දෙන්න. *[බාධා කිරීමක්]* ගුරුවරුන් පෙළපාළියේ ගෙනාවා නේද? ඉතුරු තුනෙන් දෙකත් දෙන්න, තුනෙන් එකට විතරක් සීමා කරන්නේ නැතුව. මේ රටේ තිබෙන්නේ one-party State එකක්, එක පක්ෂයක් රට පාලනය කරන ආඥාදායක ඒකාධිපති වැඩ පිළිවෙළක් බව මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. මේක පටන් ගත්තේ යෞවන සමාජවලට, ඒ නිලවරණවලට අත ගැසීමෙන්. ඉතින් මේ හදන්නේ අධිකරණය ඇතුළු මුළු රටේම ආධිපත්‍යය පැලවත්තට යට කරන්නයි. ගරු කථානායකතුමනි, ඒබ්‍රහම් ලින්කන් මැතිතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වදනකින් මගේ කථාව අවසන් කරනවා. මතක තබා ගන්න, එතුමා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ප්‍රකාශ කරනවා, "ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යන පාලනයක් විය යුතුයි" කියලා. ඔබේ පාලනය පැලවත්තේ පක්ෂග්‍රාහී JVP එකේ අරමුණු ඉෂ්ට සිද්ධ කරන්නට ක්‍රියාත්මක වන පාලනයක් නොවිය යුතුයි කියන එක මා ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Bimal Rathnayake. You have 20 minutes.

[පූ.භා. 11.34]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මේ ඉතාම වැදගත් අවස්ථාවේදී අපි කැමැතියි, මේ ව්‍යවස්ථා සංශෝධනය ගැනත් මෙහි අරමුණු ගැනත් කරුණු කිහිපයක් කියන්න. මුලින්ම මම කියන්න කැමැතියි, අධිරාජ්‍යයෙකුගේ ඇඳුම් උදාහරණයක් ලෙස ගෙන විපක්ෂ නායකතුමා කියපු කථාව ගැන. ගරු කථානායකතුමනි, ඇත්තටම එතැන වෙන්නේ මේකයි. ඒ දරුවා, එහෙම නැත්නම් ඒ සමාජය කථා කරනවා ඒ රජාගේ වැරැද්ද ගැන. ඒකෙන් සමාජයට අවබෝධයක් ලැබෙනවා. ඒ කථාවේ තිබෙන සාරය ඒකයි. හැබැයි, ඒ වාගේම සමහර සමාජ තිබෙනවා ඒවා ගැන කථා නොකරන. මම මේ කියන්නේ, philosopher කෙනෙකු ද වෙච්ච Ursula K. Le Guin කියන ලේඛිකාව ලියා තිබෙන පුංචි කථාවක්. Omelas කියලා නගරයක් තිබෙනවා. එය මතුපිටින් ඉතාම හොඳ නගරයක්. හැබැයි, ඒ නගරයේ සමෘද්ධිය වෙනුවෙන් කුඩා දරුවෙක් පොළොව යට සදාකාලිකව දුක් විඳින්න ඕනෑ. ඒ දරුවා මත තමයි නගරයේ සමෘද්ධිය රඳා පවතින්නේ. මුළු රටම ඒක දන්නවා. හැබැයි, කවුරුවත් ඒ දරුවා ගැන කථා කරන්නේ නැහැ.

අපි මොකක්ද මේ කරලා තිබෙන්නේ? විපක්ෂ නායකතුමා කියපු කථාවේ වාගේම සමහර අයට පුළුවන් දැක්කේ නැහැ වාගේ ඉන්න. සමහර අයට පුළුවන් මේ රටේ මුළු සමාජයම මහා පරිමාණයෙන් විනාශ වෙද්දී, රට බංකොලොත් වෙද්දී දැක්කේ නැහැ වාගේ ඉන්න. විපක්ෂ නායකතුමාත්, අපිත් සඳහන් කළා, පසුගිය ආණ්ඩු කරපු කට්ටිය අන්ත දූෂිතයන් විධියට මේ රට පාලනය කළේ කොහොමද කියලා. ඔබතුමන්ලා ආරාධනා කළේත් නැහැ ඒගොල්ලන්ට, ඔබතුමන්ලාගේ උද්ඝෝෂණයට. ඔබතුමා කිව්වා "සල්ලිත් නැහැ, ඡන්දත් නැහැ" කියලා ඡන්ද කල් දාපු මර්දනකාරි, දුර්දාන්ත පාලකයෝ ගැන. හරිද? අන්න ඒ විනාශය ඇතුළේ අධිකරණය විතරක් ඉතිරි වුණා කියලා, මේ මඩ වළේ අධිකරණය විතරක් නෙලුම් මලක් වාගේ ඉතිරි වුණා කියලා කවුරු හරි හිතනවා නම්, ඒක එහෙම නැහැ. ඒ නිසා තමයි bad smell එකක් දැනෙනවා කිව්වාට පස්සේ ගරු ජනාධිපතිතුමා අර වෘත්තික සංවිධානයෙන් ඇහුවේ, අධිකරණය හොඳ සුවඳවත්ද කියලා. රාජපක්ෂලාගේ, වික්‍රමසිංහලාගේ ඒ දුර්දාන්ත යුගය තුළ සහ ඊට කලින් ඉඳලාම අධිකරණය ඉතාම පැහැදිලි විනාශයකට ලක් වුණා. ඒක නොදැක්කා වාගේ ඉන්න පුළුවන්. අර Omelas කියන නගරයේ මිනිස්සු - උඩ ඉන්න elitesලා - අවුලක් නැහැ වාගේ ඉන්නේ දුප්පත් කුඩා දරුවෙක් එම නගරය වෙනුවෙන් දුක් විඳින නිසා.

අපි මොකක්ද මේ සංශෝධනයෙන් කරලා තිබෙන්නේ? අධ්‍යාපනය, සෞඛ්‍යය, නීතියේ පාලනය ඇතුළු මේ හැම දෙයකම ප්‍රතිසංස්කරණ සිදු කරන කොට අපි පෙන්වා දී තිබෙනවා, අධිකරණයේ නීතිය පසිඳලීමේ ක්‍රියාවලියත් මීට වඩා සාධාරණ, යුක්ති සහගත වෙන්න ඕනෑ කියලා. ඒවා නොදැක්කා වාගේ ඉන්න පුළුවන්. ඒක තමයි මා ඒ කියපු story එකේත් වෙන්නේ. ඔය කියන සමහර ජාත්‍යන්තර සංවිධාන, එනම් මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව යම් යම් දේවල් කියපු ජාත්‍යන්තර සංවිධාන දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන එක වචනයක්වත් කියලා නැහැ. මම ඒ තරම් දුරට යන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, මගේ කථාවට එන්න ඕනෑ නිසා. අපි කරලා තිබෙන දේ තමයි මේ රටේ හැම පැත්තකම ප්‍රතිසංස්කරණය කිරීම. අපේ ආණ්ඩුවට අවුරුදු දෙකයි. අපේ අරමුණ මොකක්ද? ගරු කථානායකතුමනි, අපේ අරමුණ තමයි රට පරිවර්තනයක් කරා ගෙන යෑම. අපි බිඳ වැටිච්ච රට, හැම ක්ෂේත්‍රයක්ම අවුරුදු දෙකක් ඇතුළත ස්ථාවරභාවයට ගෙනැල්ලා තිබෙනවා. දැන් අප ඉන්නේ, ප්‍රතිසංස්කරණ අවධියේ. අපි ඒක පරිවර්තනයක් කරා ගෙන යනවා. ඒක තමයි අපේ ගමන. ඒක හරි පැහැදිලියි. ඒකට අධිකරණයත් අදාළයි; නීති ක්ෂේත්‍රය අදාළයි. ඒක තමයි මේ කරන්නේ. ඒ නිසා අප කරලා තිබෙන්නේ, මිනිසුන්ට අයිති නැති castle එකක් විධියට තියාගෙන ඉන්න, මිනිසුන්ට අයිති නැති fortress එකක් විධියට තියාගෙන ඉන්න, එක social status එකක් අවුරුදු 200ක්, 250ක් තිස්සේ නඩත්තු කරගෙන ඉන්න, නඩුවලින් වැඩි ප්‍රමාණයක් ගන්නා නීතිඥයන් හතරක් පහක් අතේ සමහර විට රඳා තිබෙන, ලොකු මිනිහෙක් ආවාම ඔහුට විතරක් ඇප හම්බ වෙන සංස්කෘතිය වෙනස් කිරීමයි. අන්න ඒ ප්‍රතිසංස්කරණය සිදු කිරීම තමයි අපේ මූලික අරමුණ. මම ඒක මුලින්ම කියන්න කැමැතියි. මම ඉතාම ඉක්මනින් එන්නම්, ඊළඟ කාරණයට.

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුවේ ගමන් මග ඇතුළේ මේ සංශෝධනය අපට කිසිසේත් අවශ්‍ය නැහැ, ආණ්ඩුව පවත්වා ගෙන යන්න. මේ බලය 2029 දක්වා පවත්වා ගෙන යන්නත්- *[බාධා කිරීමක්]* ඒක තමයි ඔබතුමාට තේරෙන්නේ නැති දේ. අහගෙන ඉන්නකෝ. ගරු කථානායකතුමනි, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපට අවශ්‍ය නැහැ අපේ ආණ්ඩු බලය පවත්වා ගෙන යන්න. මුළු රටේම ජනතාව ජනාධිපතිතුමාට, පාර්ලිමේන්තුවට, ප්‍රාදේශීය සභාවට බලය දීලා තිබෙනවා. අපට කිසිසේත්ම- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මම හිතනවා බාධා නොකර හිටියොත් හොඳයි කියලා. අපට ඒ ගැන කථා කරන්න පුළුවන් නේ. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැහැ කියලා අපේ ආණ්ඩුවට බලය පවත්වා ගෙන

යැමේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම 2029දී අපි election එකට ගියාම බලමු, ජනතාව මොනවාද කරන්නේ කියලා. ඒ ගැන කාගේවත් ලොකු ටෝක් ඕනෑ නැහැ. අපි අපේ රටේ ආර්ථිකයේ, යහපාලනයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ හැම පැත්තක්ම ගොඩ නඟාගෙන යනවා. අපට අධිකරණය හරි, නීතිය හරි නවලා, එහෙම නැත්නම් අධිකරණය හරි, නීතිය හරි විනාශ කරලා ඒකාධිපතිත්වයට ගෙන ඒමේ කිසිම අවශ්‍යතාවක් නැහැ, අපේ බලය පවත්වාගෙන යන්න. ජේ.ආර්. ජයවර්ධනගේ ඉඳලා මේ රටේ හැම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්ම වාගේ කරලා තිබෙන්නේ, එක්කෝ සිටින පාලකයාගේ ධුර කාලය වැඩි කර ගන්නයි; එහෙම නැත්නම්, පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කර ගන්නයි. ඒවාට තමයි මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හැම එකක්ම වාගේ ගෙනැල්ලා තිබෙන්නේ. හැබැයි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ගේන්නේ, පාර්ලිමේන්තු කාලය දීර්ඝ කරන්නත් නොවෙයි, ජනාධිපතිතුමාගේ ධුර කාලය දීර්ඝ කරන්නත් නොවෙයි, එතුමා එම ධුරයේ සිටින වාර ගණන දීර්ඝ කරන්නත් නොවෙයි. මේක තනිකරම අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණය සඳහා වූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්. ඒ නිසා තමයි ඔබතුමන්ලා විශාල ඝෝෂාවක් නැඟුවාට ඔබතුමන්ලාගේ body language එකෙන්වත් මේක එච්චර serious දෙයක් විධියට දැනෙන්නේ නැත්තේ. ඒ නිසා තමයි ඔබතුමන්ලාගේ පාක්ෂිකයන් උද්ඝෝෂණය කරන්න ආවාට මේ රටේ මහජනතාව තුළින් එහෙම උනන්දුවක් නැත්තේ.

මම ඊයේ රාත්‍රියේ ගියා රූපවාහිනී විවාදයකට. එය, ප්‍රධාන නාළිකාවක්. අඩු ගාණේ මේ කාරණය ගැන ඇහුවේවත් නැහැ. මම interval එකේදී ඇහුවා, ඇයි මේ ගැන අහන්නේ නැත්තේ කියලා. ඒගොල්ලන්ගේ හැම ප්‍රාදේශීය මාධ්‍යවේදියෙක්ම කියන්නේ මේ ගැන සමාජයේ කිසිම උනන්දුවක් නැහැ කියලාලු. ඒකයි ඒගොල්ලන් කියන්නේ. ඉතින් මිනිසුන්ට තේරෙනවා, මේ කරන්න හදන්නේ මොකක්ද කියලා. මේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන ආණ්ඩුවමයි. මේ, "ආරෝග්‍යා" සුවතා මධ්‍යස්ථාන හදන ආණ්ඩුවමයි. මේ, අස්වැසුම ප්‍රතිලාභ වැඩි කරපු ආණ්ඩුවමයි. මේ, ජනතාවගේ පඩි වැඩි කරන ආණ්ඩුවමයි. මේ ආණ්ඩුවම තමයි අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යා යුතු කාලය දීර්ඝ කර ගන්නත් මේ කථා කරන්නේ. ජනතාව මේ ඔක්කොම එකට අරගෙනයි බලන්නේ. ඒ නිසා ජනතාවට කිසිම සැකයක් නැහැ, අධිකරණ ක්ෂේත්‍රයට මේ ප්‍රතිසංස්කරණය කරන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන අරමුණෙන්ම තමයි කියන එක ගැන. ඒ ගැන මම මුලිනුත් කියපු නිසා නැවත කියන්න කාලය ගන්න කැමැති නැහැ.

ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි මෙහි ඉතිහාසය ගැන. අපේ මන්ත්‍රීතුමන්ලාත් ඒ ගැන කියන්න ඇති. පාර්ලිමේන්තුවේ පුස්තකාලයෙන් සකස් කරපු වාර්තාවේ තිබෙනවා, ජනාධිපති ජයවර්ධන පාලන සමයේ විධායක ජනාධිපති ක්‍රමය ඇති කළේ කොහොමද කියලා. මේ වාර්තාවේ එය සඳහන්ව තිබෙනවා. මම මේ වාර්තාව සභාගත කරන්නම්. මේ වාර්තාවේ තිබෙන්නේ මොකක්ද? "1977 අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - එම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සකස් කිරීමෙන් පසු, ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු මහජන අවධානය පිණිස රජයේ ගැසට් පත්‍රයේ පළ කළේ නැත. ප්‍රවෘත්ති පත්‍රවල පළ කළේවත් නැති බව කියැවේ. සෑම පනත් කෙටුම්පතක්ම පාහේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම වෙත ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදායක් තිබුණද, මෙම ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු කණ්ඩායමට ඉදිරිපත් කළේ නැත. සාකච්ඡාවට ලක් වූයේ කැබිනට් මණ්ඩලය තුළ පමණය" කියා මෙහි සඳහන් වනවා.

එතැනදී තමයි අර, "Emperor without clothes" කියන එක ඔබතුමන්ලාගේ 77ට අදාළ වෙන්නේ. "ඊට කැබිනට් මණ්ඩලය 'ජාතික අවශ්‍යතා මත සම්මත කර ගත යුතු හදිසි පනතක්' යන සහතිකය ලබා දෙන ලදී. එවැනි පනත් කෙටුම්පතක් පිළිබඳව පැය 24ක් තුළ සිය තීරණයන් ප්‍රකාශ කිරීමට ව්‍යවස්ථා අධිකරණය බැඳී සිටියේය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම් පතෙහි අන්තර්ගතයෙහි කිසිදු දෝෂයක් නොමැති බව තහවුරු කරමින් ව්‍යවස්ථා අධිකරණය පැය 24ක් තුළ සිය තීන්දුව ප්‍රකාශයට පත් කළේය" යනුවෙන් මෙහි සඳහන් වනවා.

රේස් පත්තරයක්වත් ගහන්න බැහැ, පැය 24න්. ඔයගොල්ලන් ව්‍යවස්ථා ගෙනැල්ලා තිබෙන්නේ එහෙමයි; ගැසට් කරන්නේත් නැතිවයි. එහෙම නම්, රජ්ජුරුවෝ නිරුවතින් ඉන්න කොට නිරුවතින් ඉන්න බව දැන දැනත් අත ඉස්සුවේ කවුද? ඒ කාලයේ ඇමති මණ්ඩලවල හිටපු, ඔබතුමන්ලා ගොඩක් දෙනෙකුගේ තාත්තලායි.

ගරු කථානායකතුමනි, 1978 ව්‍යවස්ථාව බලාත්මක වීමේදී විනිශ්චයකාරවරුන්ට මොකක්ද කළේ? මම හිතුවා, 1978 මේ කරලා තිබෙන දේවල් කියවන්නේ නැහැ කියලා. මේවා කියවන්න ඇත්තටම මම බය වුණා, ගරු කථානායකතුමනි. හේතුව, අපි නරක් වෙයි කියලා. ඇත්තටම මේක dark web එකක් වාගෙයි. මේ බලන්න, කරපු ඒවා. ඇත්තටම සාප වෙනවා, අධිකරණ ක්ෂේත්‍රයට කරපු ඒ දේවල්වලට! ඒ වචනය කියන්න හොඳ නැහැ. නමුත් මට කියැවුණා. මොකක්ද කරලා තිබෙන්නේ?

"ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් පත් කරන ලද්දේ ව්‍යවස්ථාවේ දක්වා ඇති උපරිම සංඛ්‍යාව නොව අවම සංඛ්‍යාවයි. මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කළ ජ්‍යෙෂ්ඨ විනිසුරුවන් 12දෙනෙකු ඉවත් කරන ලදී. ඉන් සිව්දෙනෙකු අභියාචනාධිකරණය වෙත පහළ හෙළන ලද අතර, සෙසු හත්දෙනා සම්පූර්ණයෙන් ඉවත් කරන ලදී. එම අධිකරණ ප්‍රතිසංවිධානය කිරීම හේතුවෙන් එහි සිටි විනිසුරුවන් දෙදෙනෙකුට අනපේක්ෂිත ලෙස ජ්‍යෙෂ්ඨත්වය හිමි විය. ශ්‍රේෂ්ඨාධිකරණ ඉතිහාසයේ මෙම සුවිශේෂී සිදුවීම නීතිමය සහ දේශපාලන සමාජයන් තුළ දැඩි කම්පනයක් ඇති කළේය. පැරණි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් 19දෙනා අතරින් හත්දෙනෙකු ඉවත් කර තිබුණි. - හත්දෙනෙක් ඉවත් කරලා - මහාධිකරණ විනිසුරුවන් අතරින් පස්දෙනෙකු නැවත පත් කිරීමෙන් වැළකී සිටියේය. අගවිනිසුරු ධුරයට තෝරා පත්කර ගන්නා ලද්දේ ඉතිරි වී සිටි විනිශ්චයකාරවරුන් අතරින් ජ්‍යෙෂ්ඨතම පුද්ගලයා නොවේ. තමාගේම පෞද්ගලික නීති උපදේශක නෙවිල් සමරකෝන් මහතා අග්‍ර විනිශ්චයකාරවරයා ලෙස පත් කරනු ලැබුවේ ඒ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ වසර ගණනක් සේවය කර සිටි විනිසුරු සමරවික්‍රම මහතා නොසලකා හරිමින් බව මාධ්‍යවේදීන් වාර්තා කර තිබේ" කියා මෙහි සඳහන් වනවා. එදා එහෙමයි කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මොකක්ද තිබෙන්නේ? අපි අධිකරණ පද්ධතිය ගැන විතරක් නොවෙයි, දැනට ඉන්න අලුත්ම මහෙස්ත්‍රාත්තුමාගේ සිට ජ්‍යෙෂ්ඨතම අග්‍ර විනිශ්චයකාරතුමා දක්වා අධිකරණයේ සිටින සියලුම විනිශ්චයකාරවරුන් ගැන - ඔවුන් කවුරු පත් කළත්, කුමන ආණ්ඩුව පත් කළත් - සම්පූර්ණ විශ්වාසය තබලායි, මේ ප්‍රතිසංස්කරණය ගෙන එන්නේ. අධිකරණය ගැන පමණක් නොව අධිකරණ නිලධාරින් ගැන පවා අපි පූර්ණ විශ්වාසයක් තබා තිබෙනවා. ගරු කථානායකතුමනි, අප කරන්නේ, මෙතුමන්ලා කරපු දෙයට වඩා හාත්පසින් වෙනස් එකක්. මොකක්ද අපි මේ කරන්නේ? දැනට පත් වෙලා ඉන්න ඒ කියපු ඔක්කොම විශ්වාස කරලායි විශ්‍රාම ගත යුතු වයස අවුරුදු දෙකකින් දීර්ඝ කරලා තිබෙන්නේ. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා වාගේම අපි හිතනවා, අධිකරණයටත් විශාල වගකීමක් තිබෙනවා කියලා. අපට

[ගරු බිමල් රත්නායක මහතා]

එහෙම කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ අපට ලැබුණු ජනවරමට අනුවයි. අපේ රටේ අධිකරණය ප්‍රතිසංස්කරණය කරලා, විනිශ්චයකාරවරුන්ට විශ්වාසයෙන්, වගකීමෙන්, ඇඟිලි ගැසීම්වලින් තොරව වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් හදන්නයි අප කටයුතු කරන්නේ. එහෙම නම්, අපි කරලා තිබෙන්නේ මොකක්ද? අපි දැන් ඉන්න සියලුම විනිශ්චයකාරවරුන් ගැන පූර්ණ විශ්වාසය ඇතිවයි මේක කරලා තිබෙන්නේ. නමුත්, ඔබතුමන්ලා මොකක්ද කරලා තිබෙන්නේ? එහෙම නම් විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ කණ්ඩායම කැඳවලා, "The Emperor's New Clothes" කියන පොත අරගෙන ඒ අයට කියලා දෙන්න.

ගරු කථානායකතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය ගැන මේ පනත් කෙටුම්පත් පිළිබඳ Judgment එකේ විශාල වශයෙන් කියලා තිබෙනවා. මා හිතන විධියට, එම තීරණයේ 91වැනි පිටුවේ ඉතා වැදගත් දෙයක් තිබෙනවා. අධිකරණය ස්වාධීන විය යුත්තේ කුමකින්ද කියලා 91වැනි පිටුවේ මෙහෙම කියනවා:

> "Independence here means more than independence from government direction. It means also that judges in making their decisions should as far as humanly possible not be influenced by public opinion, or by any sense of obligation to the government or to any individual, party, or pressure group."

මෙන්න මේක අතිශය වැදගත් කියලායි මා හිතන්නේ. ගරු කථානායකතුමනි, මම ඒකයි අපේ අධිකරණ ක්ෂේත්‍රය ගැන විපක්ෂ නායකතුමාට කිව්වේ, අර උදාහරණයෙන් දක්වපු counterstory එකෙන්, Omelas කියන නගරයේ කථාවෙන්. ඒ කථාවේ වාගේම මෙතැනත් දැක්කේ නැහැ වාගේ වහගෙන ඉන්න එකක් තිබෙනවා. 2015-2020 කාලයේ අධිකරණයේ අහන්න දාපු, රාජපක්ෂලාගේ නඩු අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා පළිගන්න දාපු ඒවා නොවෙයි. ගරු විපක්ෂ නායකතුමනි, යහපාලන ආණ්ඩුව කාලයේ ඔබතුමන්ලා ඒ නඩු දැම්මේ පළිගන්න නොවෙයි, අපි ඒ කටයුතු ඉදිරියට කරගෙන යන්නේත් පළිගන්න නොවෙයි. හැබැයි, ඒවාට මොකක්ද වුණේ 2019න්, 2020න් පස්සේ? සම්පූර්ණයෙන් නීතිපති දෙපාර්තමේන්තුව යොදා ගෙන ඒ නඩු ඔක්කොම ඇකිළුවේ නැද්ද? අධිකරණයේත් සමහර අය එයට සම්බන්ධ කර ගන්න ඇති. එදා නඩු විශාල ප්‍රමාණයක් ඇකිළුවා; අයින් කර ගත්තා. මට මතක හැටියට අල්ලස් කොමිසමෙන් දාපු නඩු 42ක්ද කොහේදෝ අයින් කර ගත්තා, කොමසාරිස්වරියගේ අත්සනක් මදි කියලා. ඕනෑ නම් ඊට පස්සේ අත්සන ගහලා ආයෙත් දමන්න තිබුණා නේ. නමුත්, දැම්මේ නැහැ. මේක දැක්කේ නැහැ වාගේ තමයි, Bar Association සහ ඔබතුමන්ලා ඇතුළුව අරගොල්ලෝ, මේගොල්ලෝ; මේ ගැන විශාල උනන්දුවක් තිබෙන අය හිටියේ. මම සජබයට පමණක් නොවෙයි මේ කථා කරන්නේ.

අධිකරණය ස්වාධීන - independent - වෙන්න ඕනෑකම තිබෙන්නේ, හුදු ආණ්ඩුවෙන් පමණක් නොවෙයි; pressure groupsවලින්, තිබෙන status quo එකෙන්, යාළුවන්ගෙන්, social mediaවලින්, ඒ ඔක්කොගෙන්ම නිදහස් වෙන්න ඕනෑ. මේ Judgment එකෙන්ම ඒ ගැන කියනවා. නමුත්, ඔබතුමන්ලා දන්නවා උසාවිය හැදිලා තිබෙන විධිය මොකක්ද කියලා. ඇප ගන්න නම් අල්ලන්න ඕනෑ කියලා විශේෂ නීතිඥයෝ දෙදෙනෙක් තුන්දෙනෙක් හැදිලා ඉන්නවා, "මේකට නම් මේ අය" කියලා. මම කියන්නේ, දක්ෂතාවෙන් ඒ හැකියාව අත්පත් කර ගන්නා එක ගැන නොවෙයි. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඊට වඩා දෙයක් අපි දන්නවා.

ගරු කථානායකතුමනි, අධිකරණය ස්වාධීන වෙන්න ඕනෑකම තිබෙන්නේ, ආණ්ඩුවෙන් පමණක් නොවෙයි. මේ රටේ නීතියට උඩින් කටයුතු කරන, අසමානතාව මත වරප්‍රසාදිත යම් යම් කණ්ඩායම්, කුඩා කණ්ඩායම්, කල්ලිවලින් සමන්විතව හැදිච්ච විශාල ව්‍යුහයක් තිබෙනවා. ඒ නිසා නේ, මහජන මුදල් නාස්තිය ගැන රනිල් අත්අඩංගුවට ගත්තාට පස්සේ අධිකරණ ක්ෂේත්‍රයේම කෙනෙක් කිව්වේ, Rubicon එක cross කළා කියලා. එතුමාගේ දැනුම ගැන අපට අගයක් තිබෙනවා. හැබැයි, එහි moral value එකේ තත්ත්වය බලන්න. මොකක්ද එතුමා කිව්වේ? රනිල්ව අත්අඩංගුවට ගන්න එක සම්බන්ධයෙන් එතුමා කිව්වා, Rubicon එක cross කළා කියලා. කවුද රනිල් වික්‍රමසිංහ කියන්නේ? මම විපක්ෂ නායකතුමා අගය කරනවා. මොකද, එතුමාට අද කොන්දක් තිබුණා "ඡන්දත් නැහැ, සල්ලිත් නැහැ" කියපු ඒකාධිපතියෝ කවුද කියලා කියන්න; හෙළිදරව් කරන්න. Rubicon එක cross කළා කිව්වේ, ලංකාවේ අධිකරණයෙන් රනිල්ව අත්අඩංගුවට ගන්න නියෝගය දුන්නාට පස්සේ. ඒවාද මේ රටේ parameters? ඒකයි මා කියන්නේ, අධිකරණය සමහරුන්ට බලපා තිබුණේ නැහැ කියලා. සමහරු හැමදාම අධිකරණයට, නීතියට උඩින් හිටියේ. අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපි හෙළිදරව් කරලා තිබෙනවා, මේ නගරය යට දුප්පත් මිනිස්සු, සාමාන්‍ය ජනතාව අඬ අඬා ඉන්න බව. අපි ඒක තමයි මේ හෙළිදරව් කරලා තිබෙන්නේ. ඒ නිසා අධිකරණය ස්වාධීන විය යුත්තේ ආණ්ඩුවෙන් පමණක් නොවෙයි.

ගරු කථානායකතුමනි, මම කැමැතියි තවත් ඉදිරියට යන්න. අධිකරණ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් කරන මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මොනවාද විපක්ෂයේ මේගොල්ලන් නොකිව්වේ? මේගොල්ලෝ ඒ ගැන විශාල දේවල් කිව්වා. මුලින්ම ගත්තොත්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව බොරු මතයක් හැදුවා. ඔබතුමන්ලා මේක යක්ෂාකරණය කළා. ඔබතුමා මේකට දැන් අහු වෙලා ඉන්නේ, ගරු විපක්ෂ නායකතුමනි. Demonization! විශාල demonization එකක් කළා, මේකෙන් අරක වෙනවා, මේක වෙනවා කියලා. ඉතින්, මිනිස්සු භය වුණා. ඔබතුමන්ලා ගිහිල්ලා ආගමික නායකයන්ටත් ඒකම කිව්වා. ආගමික නායකයෝ ඕවා පාඩම් කරන්න යන්නේ නැහැ නේ. ඒකේ කියන දේ එතුමන්ලා විශ්වාස කළා. මොකද, ඔබතුමන්ලා එක එක දේවල් කිව්වා; ලෝකයට බොරු කිව්වා; UN එක පවා රැවැට්ටුවා. අවසානයේ මොකක්ද වෙලා තිබෙන්නේ? මේ රටේ අතිවිශාල අධිකරණ ප්‍රතිසංස්කරණයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ඇවිත් තිබෙනවා. නමුත් සමාජයේ කිසිම කලබලයක් නැහැ. නිකම් ලොකු බොරුවක් පස්සේ ඔබතුමන්ලා විශාල බිල්ලෙක් හදලා තිබෙනවා. ඔබතුමන්ලා බැලුවේ මොකක්ද? මේකෙන් සමාජය පොඩ්ඩක් දෙකට බෙදනවා වාගෙයි. ඒකෙන් දේශපාලන mileage එකක් ගන්න විපක්ෂය කටයුතු කිරීම ගැන අපට තේරෙනවා.

අපි ආණ්ඩුවක් විධියට දෙකට බෙදාගෙන වැඩ කළේ නැහැ, මේ තාක් කල්. මේකෙන් තමයි චූටි හරි බෙදීමක් වුණේ කියලා අපි දන්නවා. ඒ ගැන නොදන්නවා නොවෙයි. අපට ඒකේ calculation එකක් තිබෙනවා. ඒ බෙදිලා තිබෙන විධිය 10යි, 90යි ද කියන එක වෙනම තර්කයක්. නමුත්, ඔබතුමන්ලා හිතුවා මේකෙන් political mileage එකක් ගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒ political mileage එක ගන්න ඔබතුමන්ලා මොකක්ද කළේ. නැති දෙයක් මවා පාන්න ගිහිල්ලා ඇත්තටම වරද්දා ගත්තා. Cricketවල තිබෙනවා hit-wicket යනවා කියලා එකක්. ගරු කථානායකතුමනි, hit-wicket යන්නේ සාමාන්‍යයෙන් එක්කෙනෙකු පමණයි. මේ case එකේදී වෙලා තිබෙන්නේ මොකක්ද? Hit-wicket ගිහිල්ලා තිබෙනවා, කීප දෙනෙක්ම. ඒ අදාළ වෘත්තික සංවිධානයත් hit-wicket ගිහිල්ලා තිබෙනවා; සජබ නායකයෝත් hit-wicket ගිහිල්ලා තිබෙනවා. කියන්න දෙයක් නැහැ, කිසිම content එකක් නැහැ. බොරු කිව්වා. මුලින්ම

විශාල මතයක් හැදුවා, වයස වැඩි කරන්නේ ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විතරයි කියලා. ඒක තමයි ඔක්කෝම කිව්ව බොරුව. ඊට පස්සේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත table කරපු දවසේ කිව්වා, මේ පනත් කෙටුම්පත වැරදියි, මේකේ බලපෑමේ ප්‍රකාශය නැහැ කියලා. එතුමන්ලාගේ මහා ලොකු නීතිඥයෙක් තමයි ඒක කිව්වේ. අන්තිමට අපි පෙන්නුවා, ව්‍යවස්ථා සංශෝධනයකදී බලපෑමේ ප්‍රකාශය දාන්නේ නැහැ කියලා. අඩුම ගාණේ නිහතමානි වෙන්න එපායැ, නීතිඥයෙකු නොවන කෙනෙක් වැරැද්දක් පෙන්නුවාම ඒක පිළිගන්න. ඒවා මොකක්වත් නැහැ.

ඊට පස්සේ ඊයේ බොරුවක් කිව්වා, සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත් අතර birthdays සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, වෙලාව ගන්නේ නැතිව මම ඉන්දියාවේ, ලංකාවේ, Englandවල birthday එක ගණනය කරන්නේ කොහොමද කියලා සඳහන් ලේඛනයක් **සභාගත*** කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two minutes remaining.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම හිතනවා, මට තව වෙලාව ලබා දෙයි කියලා.

ගරු කථානායකතුමනි, ඒවා අතිවිශාල ඉතිහාසයක් තිබෙන විෂයයන්. 1860 ගණන්වල පවා birthday එක calculate කරලා තිබෙනවා. ඉන්දියාව ඒ සම්බන්ධව law එක ගෙනැල්ලා තිබෙන්නේ 1875දී. මම නීතිඥයෙක් නොවෙයි. නමුත් ඒවා කියවන්න පුළුවන් නේ. මේ, basic sociology. එතකොට, 1875 වැනි කාලයකදී පවා උපන් දිනය ගණනය කරන්නේ කොහොමද කියලා නීති හදලා තිබෙනවා. උපන් දිනය පටන් ගන්නේ අදාළ දවසේ midnight එකෙන්, 00:00වලින්. අපි හිතමු, උදේ 3ට කෙනෙකු ඉපදුණොත් ඒ දවස එක දවසක් ලෙස තමයි ගණන් ගන්නේ. කෙනෙකු හවස කීයට ඉපදුණත් ඒක දවසක් ලෙස ගණන් ගන්නේ. වයස තීරණය වන විධිය පවා අපි මෙහිදී study කරලා තිබෙනවා. ඒවා නීතිඥයෝ දන්නා දේවල්, මෙතැනට ඇවිල්ලා බොරු කිව්වාට. ලංකාවේ pension minutes අරගෙන බලන්න, pension එක දෙන්නේ කොහොමද කියලා. ඒ වාගේම පහ වසර ශිෂ්‍යත්ව විභාගයට ලියන්න නිශ්චිත වයසක් තිබෙනවා. ඒ වයස සම්පූර්ණ කරන දවසේ සිට තමයි ඒ දරුවාට ශිෂ්‍යත්වය ලියන්න පුළුවන්කම ලැබෙන්නේ, ඊට පසුවත් බැහැ, කලිනුත් බැහැ. Double promotion ඇවිල්ලා තිබුණොත් කලින් පුළුවන් ඇති, නැත්නම් බැහැ. ඒකයි මම කියන්නේ, මේ සභාවේ ඉතා පැහැදිලිව බොරු කිව්වා කියලා.

ඊට පස්සේ කිව්වා, නඩු භාර ගත්තේ නැහැ කියලා. දැනුත් ඒක කිව්වා. ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ 47 පිටුවේ අන්තිම නඩුව ගැනත් තිබෙනවා. ඒ තරමටම ශ්‍රේෂ්ඨාධිකරණය ගිහිල්ලා තිබෙනවා. ඒක ඇවිල්ලා තිබෙන්නේ මෙහෙමයි. ඒ බොරුවලට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් උත්තර දෙන්න එපායැ. ඒකේ තිබෙන්නේ මෙහෙමයි:

"The last Petition to have been filed is SC/SD/No.109/2026 which has been electronically filed at 1806 hrs...."

ඒ කියන්නේ, හවස 6 පහු වෙලා.

"...in the Registry of this Court on 31st August 2026."

බොරු කිව්වා, අධිකරණය ඇහුම්කන් දුන්නේ නැහැයි කිව්වා.

මුලින්ම ඉතාම ප්‍රාථමික level එකේ තර්ක ටිකක් ගෙනාවා. මේ ගොඩක් අය වාගේම මමත් මේ පාර්ලිමේන්තුවේදී මීට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවලට මුහුණ දීලා තිබෙනවා, විවාද කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු 10ක්, 12ක් විතර පාඩම් කරලා තිබෙනවා. ඕනෑම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක විශාල දැනුමක් තිබෙනවා, ඒක poetic. ඒකේ Shakespeare, Dickens, ධම්මපදය, භගවත් ගීතාව වාගේ විශාල දැනුමක් තිබෙනවා. මාක්ස්ගේ "දාස් කැපිටාල්" වාගේ.

සාමාන්‍යයෙන් හැම වෙලාවේම petitionersලාගේ පැත්තෙන් ඉතාම දක්ෂ විධියට තර්ක ඉදිරිපත් කරනවා. මම අවංකවමයි මේක කියන්නේ. මේ තරම් දුර්වල තර්ක ඉදිරිපත් කළ නඩුවල තීන්දුවක්, - මම නීතිඥයෙක් නොවුණාට - මම නම් මීට පෙර කියවා නැහැ. ඇත්තටම ගත්තොත්, මෙහිදී ඉතාම දුර්වල තර්ක තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. උදාහරණ ටිකක් මම ඉක්මනින් කියන්නම්. එතුමන්ලා ගෙනෙන ප්‍රධානම තර්කය තමයි, legislative bribe එකක් දෙනවා කියන එක. ඒ කියන්නේ මේ ආණ්ඩුව අල්ලසක් දෙනවා, අධිකරණ නිලධාරින්ට. හරි, අපි ඒක එහෙම තියමුකෝ. හැබැයි අධිකරණයට ගිහිල්ලා මොකක්ද කියන්නේ? එතුමන්ලාගේ නීතිඥයින් කියනවා, ඒ bribe එක හම්බ වන පළමුවෙනියා තමයි අග්‍ර විනිශ්චයකාරතුමා, එතුමාට ඒ bribe එක දෙන එක වැරදියි කියලා. එතකොට අධිකරණය අහනවා, දෙවෙනියාට කොහොමද කියලා, දෙවෙනියාට bribe එක ප්‍රශ්නයක් නැහැයිලු. අපි හයේ පන්තියේ විවාද කණ්ඩායමේදීත් ඔයිට වඩා හොඳට තර්ක කර තිබෙනවා. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු මේ අධිකරණ මණ්ඩලය අහන්නේ මොකක්ද? පළමුවෙනියාට bribe එක හොඳ නැත්නම්, දෙවැනියාට, තුන්වැනියාට, හතරවැනියාට bribe එක හොඳ වෙන්නේ කොහොමද? මම ඒකයි කිව්වේ, hit-wicket ගියා කියලා. ඉතාම දක්ෂ නීතිඥයෝ hit-wicket ගියා. මොකද, මේ case එක ගොඩ දමන්න පුළුවන් case එකක් නොවෙයි.

ඊයේ කාරියප්පර් මන්ත්‍රීතුමා ඉතා වැදගත් ප්‍රශ්න දෙක තුනක් ඉදිරිපත් කළා. එතුමා ඇහුවා, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්නේ නැතුව සංශෝධනයක් කරන්නේ ඇයි කියලා. ගරු කථානායකතුමනි, අපට සරලව කළ හැකි දේ කළ යුතු නැද්ද? සරලව දෙන්න පුළුවන් සහනය අලුතින් හෝ අමුතුවෙන් දෙන එක වැරැද්දක් නොවෙයි. අපට කළ හැකි දෙයක් නොකර සිටීම වැරැද්දක්. අපි මේ අධිකරණ ප්‍රතිසංස්කරණය කරනවා, ව්‍යවස්ථාව සංශෝධනය කරලා. අපි නැවත නැවතත් මේ ගැන කියලා තිබෙනවා. "දිට්වා" ව්‍යසනය ආවේ නැත්නම් අපට තිබුණේ 'Sri Lankan Day' එක කරලා ඒකේ discourse එකෙන් පසුව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මණ්ඩලයක් පත් කරලා ඉදිරියට යන්නයි. ඒක තමයි අපට තිබුණු සැලැස්ම. අපි ඒක කියා තිබෙනවා. ඔබතුමන්ලාට ඔප්පු කරන්න දෙයක් අපට නැහැ. අපි ඔප්පු කරගන්නේ අපට සහ ජනතාවට පමණයි. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ අපි ව්‍යවස්ථා සංශෝධනත් කරනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකුත් ගෙනෙනවා කියන එකයි. ඒ ගැන කිසිම සැකයක් තියාගන්න එපා. සංශෝධනයක් ගෙන ඒම නව එකක් ගෙන එන්න බාධාවක් නොවෙයි.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

ඊට පසුව කාරියප්පර් මන්ත්‍රීතුමා කිව්වා, තුනෙන් දෙකට අපි ඇබ්බැහි වෙයි කියලා. ඔබතුමන්ලා දන්නවා, පසුගිය අවුරුදු දෙක තුළම අපට තිබුණු චෝදනාව මොකක්ද කියලා. තුනෙන් දෙකක බලයක් දීලා තිබෙනවා, ඒක කොස් කොටන්නවත් ගන්නේ නැහැ කිව්වා. ගරු කථානායකතුමනි, අපට ලැබී තිබෙන තුනෙන් දෙකක බලය නිතර නිතර යොදා ගන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. අපට එහෙම ඕනෑ වෙන්නේත් නැහැ. මේ රට ප්‍රජාතන්ත්‍රවාදයෙන් තොරව පාලනය කිරීමේ කිසිම අරමුණක් අපට නැහැ. අපට අත්‍යවශ්‍ය දේ වන්නේ මොකක්ද? අපි මේ ජන වරමේ සාරයට අනුවයි යන්නේ. තුනෙන් දෙකක බලයක් ජනතාව අපට දීලා තිබෙන්නේ පාවිච්චි කරන්න තමයි. අපි ඒක පාවිච්චි කළ යුතුයි. නමුත් අපි ඒකට ඇබ්බැහි වෙන්නේ නැහැ. මොකද, අපට මේක බලය සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි.

ඔබතුමන්ලා ගොඩක් දේවල් පටලවා ගත්තා. මීට කලින් දීපු හැම නඩු තීන්දුවකම තිබුණේ ව්‍යවස්ථාදායකයේ කාලය, විධායකයේ කාලය සහ ඉහළ අධිකරණවල නිලධාරින්ගේ විශ්‍රාම කාලය දිගු කරනවා නම් ඒකට ජනමත විචාරණයක් ඕනෑය කියන එකයි. ඒක තමයි ඔය හැම තැනකදීම උපුටා දැක්වූ නඩු තීන්දු වුණේ. මේකෙන් විධායකයේ කාලය දිගු වෙන්නේ නැහැ; ව්‍යවස්ථාදායකයේ කාලය දිගු වෙන්නේත් නැහැ. ඉහළ අධිකරණ නොවෙයි, පහළම අධිකරණයේ කෙනාගේත් - ඔක්කොගේම - විශ්‍රාම කාලය දිගු වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සම්පූර්ණයෙන්ම කියා තිබෙන්නේ මොකක්ද? ඔබතුමන්ලා out of context; වෙන තත්ත්වයකට යොදා ගෙන තිබෙන තර්කයක් මෙතැනට ගෙනැල්ලා දමනවා. අපට තුනෙන් දෙකක බලයට ඇබ්බැහිවීමේ කිසිම අවශ්‍යතාවක් නැහැ.

හැබැයි, අපි කාටත් වගකීමක් තිබෙනවා. අද මේ සංවාදය තුළ විපක්ෂය විශාල වශයෙන් අධිකරණයේ ඉතාම නපුරු තත්ත්වයක් ගැන විශාල බිල්ලෙක් මවා තිබෙනවා. ඒ නිසා අධිකරණයටත් විශාල වගකීමක් තිබෙනවා, තව තවත් නූතන ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයන් අනුව ඉතාම සාධාරණ විධියට, ඉතාම කාර්යක්ෂම විධියට නඩු තීන්දු ලබා දීමටත්, නඩු ප්‍රමාද නොකර හරියාකාරව අහන්නත්. මේ සංවාදය මෙතුමන්ලා demonize කළා. අන්න ඒ demonization එක ඇත්තක් නොවෙයි, බොරුවක් කියා ඔප්පු කරන්න අප කාටත් වගකීමක් තිබෙනවා කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, ඊයේ කාරියප්පර් මන්ත්‍රීතුමා අන්තිමට කියපු දේත් මම කියන්නම්. එතුමා කිව්වා, එතුමාට බයයිලු, මෙහෙම සංශෝධනයක් කළාට පසුව ලැබෙන නඩු තීන්දු පසු කාලීනව මේ දූෂිතයන්, හිරේ යමින් ඉන්න අය නඩුවලින් නිදහස් වෙන්න පාවිච්චි කර ගනීවි කියලා. මම විපක්ෂයෙන් අහන්න කැමැතියි, 2015-2019 කාලයේ දමපු නඩුවලින් නිදහස් වුණේ, ඔබතුමන්ලා නඩුකාරයින්ගේ විශ්‍රාම වයස දිගු කරලාද කියලා. තේරෙන සිංහලෙන් කිව්වොත්, ගෝඨාභය රාජපක්ෂ දිනුවාට පසුව 2015-2019 කාලයේ දමපු නඩු සියල්ල හකුළා ගත්තේ, ඔබතුමන්ලා අධිකරණයේ විනිශ්චයකරුවන්ගේ විශ්‍රාම යන වයස වැඩි කරලාද? නැහැ. දුර්දාන්ත පාලකයෝ ආවාම ඒ දුර්දාන්ත පාලකයෝ මොකක් හරි excuse එකක් හොයා ගන්නවා, ඒක වෙනස් කරන්න.

අපි කියන්නේ මේකයි. මේ රටේ ජනතාව නැවත වතාවක් ඒ දුෂ්ට පාලකයින්ට ඡන්දය දෙනවා නම් මීට වඩා ලොකු දේවලුත් ඒගොල්ලන් කරාවි. සමහර විට ඒගොල්ලන් අධිකරණ වහලාම දමාවි. දැන් මේකයි තර්කය. අපි මේ සංශෝධනය කළාට පසුව දෙන නඩු තීන්දු ඔක්කෝම ඒ දූෂිතයින් පාවිච්චි කරයි කියන එක. ඒකට වැඩියෙන්ම උදවු කරන්නේ කවුද? ඔබතුමන්ලා නේ. ඔබතුමන්ලා පොල්දූවට එන්න එපා කියනවා, හොරුන්ට.

හැබැයි, අධිකරණය සම්බන්ධයෙන් සිදු කරන ඉතාම ප්‍රාථමික ප්‍රතිසංස්කරණවලට ඔබතුමන්ලා ලොකු යක්ෂයෙක් මවනවා. ඇත්තවශයෙන්ම, එමඟින් immediate වාසිය ලබන්නේ කවුද? එම immediate වාසිය ලබන්නේත් ඒ පට්ට හොරු. ගරු විපක්ෂ නායකතුමනි, එම නිසා ඔබතුමාටත් ඒ සම්බන්ධයෙන් ලොකු වගකීමක් තිබෙනවා. මොකද, මේ demonizationහි වන්දිය අවසානයේ මේ රටට ගෙවන්න සිදු වුණොත් ඒක ඔබතුමන්ලාත් දායක වෙලා ජනතාවට කරන විපත්තියක් කියන එක මතක තබා ගන්න.

ඊළඟට, නඩු තීන්දුව පිළිබඳව ප්‍රධාන තර්ක කිහිපයක් මම කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඊට කලින් කිව යුතු කාරණයක් තිබෙනවා. අපේ අධිකරණ ඇමතිතුමා කිව්වා, මේක පුළුල් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළක එක් කාරණයක් පමණක් බව. විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස වැඩි කිරීම විතරක් නොව, අපි උසාවි ඉදිකරනවා, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව දියුණු කරනවා යනාදි වශයෙන් එතුමා සඳහන් කළා. ඒ වාගේම, උසාවි ගණනාවක් ස්ථාපිත කරන බවත්, දැනටමත් එවැනි උසාවි ස්ථාපිත කර තිබෙන බවත් එතුමා සඳහන් කළා. ඒ සම්බන්ධයෙන් ගරු අධිකරණ ඇමතිතුමා එම අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

අද දෙවැනි වර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතත්, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතත් නීතියේ යහ පාලනය වෙනුවෙන් සිදු කරන පුළුල් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළක එක් කොටසක් පමණයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙම නඩු තීන්දුව පිළිබඳවත් මම වචන කිහිපයක් කියන්න කැමැතියි. මම මුලිනුත් කිව්වා, මෙම නඩු තීන්දුව සම්බන්ධයෙන් මෙතුමන්ලා ඉදිරිපත් කරන තර්ක ඉතාම දුර්වලයි කියලා. මෙතුමන්ලා ලොකු තර්කයක් ඉදිරිපත් කළා. ඒ කියන්නේ, අග්‍ර විනිශ්චයකාරතුමාට නඩුව විභාග කළ යුතු Bench එක තෝරා ගැනීමට තිබෙන අයිතිය සම්බන්ධයෙන් ප්‍රශ්න කරලා තිබුණා. මෙතුමන්ලා කිව්වා, දැනට සිටින විනිශ්චයකාරවරුන් 13දෙනාම මෙම නඩුව විභාග කිරීමට වාඩි වෙන්න ඕනෑ කියලා.

හැබැයි, මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලි කරුණක් මම කියන්න කැමැතියි. අපි මේ පාර්ලිමේන්තුවෙන්ම සම්මත කරන්න යන Anti-Corruption (Amendment) Bill එකට එරෙහිව petitions 15ක් ඉදිරිපත් කර තිබුණා. ඒ petitions විභාග කිරීම සඳහාත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් තුන්දෙනෙකුගෙන් යුත් විනිශ්චය මණ්ඩලයක් ඒ වනවිටත් පත් කරලා තිබුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, සැප්තැම්බර් 24වන දා වනවිට, එනම් ඊයේ වනවිට එතුමන්ලා විසින් එම නඩු තීන්දුවත් ලබා දිය යුතුයි. කොහොමත් එම විනිශ්චය මණ්ඩලයට විනිශ්චයකාරවරුන් 13දෙනාම පත් කරන්න බැහැ. ඒ වාගේම, එහි සිටි විනිශ්චයකාරවරුන් තුන්දෙනාම ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් තමයි. එම නිසා කොහොමත් විනිශ්චයකාරවරු 13දෙනාම පත් කරන්න බැහැ.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අග්‍ර විනිශ්චයකාරතුමාට ලබා දී තිබෙන ව්‍යවස්ථාපිත බලය සම්පූර්ණයෙන්ම alienate කරන්න බැහැ. එතුමාට තමයි

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විනිශ්වයකාරවරුන් තෝරා පත් කිරීමේ බලය ලබා දී තිබෙන්නේ. එය මෙම අග්‍ර විනිශ්වයකාරතුමාට පමණක් අදාළ වූවක් නොවෙයි. සෑම අග්‍ර විනිශ්වයකාරවරයෙකුටම එම බලය ලබා දී තිබෙනවා. ඒ පිළිබඳව මාර්ක් ප්‍රනාන්දු මැතිතුමා ලබා දුන් නඩු තීන්දුවක් මෙහි උපුටා දක්වා තිබෙනවා. උදාහරණයක් ලෙස ගත්තොත්, හමුදාපතිවරයා තෝරා පත් කිරීමේ බලය ලබා දීලා තිබෙන්නේ සේනාධි නායකයාටයි. සේනාධි නායකයා ඒ සඳහා public opinion ගන්නේ නැහැ. අඩුම ගණනේ සේනාධි නායකයා ඒ ගැන කැබිනට් මණ්ඩලයෙන් අහන්නේත් නැහැ. එම නිසා, මේ රටේ රාජ්‍ය නායකයන්ට, අගමැතිවරුන්ට, ඇමතිවරුන්ට සහ අග්‍ර විනිශ්වයකාරවරුන්ට නිශ්චිත වූ විශේෂ බලතල ලබා දී තිබෙනවා. එතුමාට තමයි benches තේරීමේ බලය දීලා තිබෙන්නේ. එය ඉතිහාසයේ සිට පැවත එන ක්‍රමවේදයක්. මෙතුමන්ලාගේ තර්කය වෙලා තිබෙන්නේත් එයයි. දැන් මෙතුමන්ලාට තිබෙන්නේ පුද්ගල ප්‍රශ්නයක් නේ. මෙතුමන්ලාට තිබෙන්නේ වෙන පුද්ගල ප්‍රශ්නයක්. එම පුද්ගල ප්‍රශ්නය නිසා තමයි මෙතුමන්ලා මේ තරම් දුර්වල තත්ත්වයකට පත් වුණේ. එහෙම නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මෙම බලය සෑම අවස්ථාවකදීම පාවිච්චි කර තිබෙන බව ඉතාම පැහැදිලියි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙතුමන්ලා සඳහන් කළා, මේක bribe එකක් කියලා. ඇත්තවශයෙන්ම, මෙම නඩු තීන්දුවේ සඳහන් කර තිබෙන ආකාරයට විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කරන ලෙස ඉල්ලීම, අපේ රටේ කිසිදු විනිශ්වයකාරවරයෙකු විසින් ඉල්ලා සිටි දෙයක් නොවෙයි. ඇත්තටම මම ඒ ගැන කියලා තිබෙනවා. ඒ කියන්නේ, එවැනි bribe එකක් ඉල්ලලා නැහැ. විනිශ්වයකාරවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීම තනිකරම ආණ්ඩුවේ, එසේත් නැත්නම් විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ ඉල්ලීමක්. එම ඉල්ලීම තමයි අධිකරණය විසින් පිළිගෙන තිබෙන්නේ. එසේ නොමැතිව අධිකරණයේ විනිශ්වයකාරවරුන් ගිහිල්ලා එම ඉල්ලීම ඉදිරිපත් කරලා නැහැ.

හැබැයි, අපි මේ කාරණය සඳහන් කරන විට ඔබතුමන්ලා ප්‍රශ්න කරනවා. මෙම නඩු තීන්දුවේ 76වැනි පිටුවේ සඳහන් වෙන්නේ මොකක්ද? මීට පෙර විවිධ ආණ්ඩු විසින් විනිශ්වයකාරවරුන්ට ඉඩම් ලබා දීලා තිබෙනවා. ඒ බව මෙම නඩු තීන්දුවේ 76වැනි පිටුවේ සඳහන් වෙනවා. ඒකත් bribe එකක් විධියට සලකන්න තිබුණා නේ. ඒ වාගේම, විනිශ්වයකාරවරුන්ට වාහන ලබා දීලා තිබෙනවා. අග්‍ර විනිශ්වයකාරතුමා ඇතුළු මෙම නඩු තීන්දුව ලබා දුන් විනිශ්වයකාරවරුන් මේකේ ලියලා තිබෙනවා, ඇතැම් විනිශ්වයකාරවරුන්ට වාහන ලබා දුන්නා, නමුත් එම පහසුකම සියලුම විනිශ්වයකාරවරුන්ට ලැබුණේත් නැහැ කියලා. ඔවුන් කියනවා, ආණ්ඩුවකට තිබෙන limitations අපි පිළිගන්නවා, හැබැයි අපි කවදාවත් වාහනයක් ලබා දීම මත නඩු තීන්දු වෙනස් කළේ නැහැ, ආණ්ඩුවට පක්ෂව නඩු තීන්දු ලබා දුන්නේත් නැහැ, ඉඩමක් ලබා දීම මත නඩු තීන්දු හැසිරෙව්වේත් නැහැ කියලා. එම නිසා අපි කියන්න කැමැතියි, අධිකරණයට අල්ලසක් ලබා දීමක් සිදු වී ඇති බව තහවුරු කිරීම සඳහා මෙතුමන්ලා මෙතැනදී ඉදිරිපත් කළේ ඉතාම දුර්දාන්ත තර්ක ප්‍රමාණයක් බව.

ඒ වාගේම මේ නඩු තීන්දුවේත් උපුටා දක්වලා තිබෙනවා, ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණයම තමන්ගේ අධිකරණවල විනිශ්වයකාරවරුන්ගේ සේවා කාලය වැඩි කරන්න කියලා කියා තිබෙන බව. අපේ අධිකරණය bribe එකක් ඉල්ලලා නැහැ. අපේ අධිකරණයට විවිධ ආණ්ඩුවලින් විවිධ දේවල් දීලා තිබෙනවා. ඒවා ඔක්කෝටම දීලාත් නැතුව තිබියදී පවා මෙතුමන්ලා කියන්නේ මොකක්ද? දැන් ඉන්න විනිශ්වයකාරවරු, නැත්නම් හිටපු විනිශ්වයකාරවරු කාර්වලට, ඉඩම්වලට විකිණුනා කියන එක නේ මේකේ යටි අදහස විධියට තිබෙන්නේ. අවුරුදු දෙකක් සේවා කාලය දීර්ඝ කළාම එච්චර විකිණෙනවා නම්, අරවාට ඊට වැඩිය විකිණෙන්න එපා යැ. ඒ නිසා, ඔබතුමන්ලාට තමයි අධිකරණය ගැන විශ්වාසයක් නැත්තේ. ඒ වාගේම තව කරුණක් මම කියන්න ඕනෑ. අධිකරණයේ විනිශ්වයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අඩු කිරීමත්, වැඩි කිරීමත් කියන දෙකම එකම මූලධර්මයකට දමනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, වැටුප් අඩු කරන්න බැහැ කියලා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත්, විශ්‍රාම වැටුප් පනතේත් කියා තිබෙන බව. හැබැයි, වැටුප් අඩු කරන්න බැරි වුණාට වැටුප් වැඩි කරන්න පුළුවන්. ඒක නිසා ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයෙන් මේ තර්කය ගැන ප්‍රශ්න කරනවා, එහෙම නම් සේවයට join වුණු දවසේ තිබුණු වැටුපටම තමයි විනිශ්වයකාරවරුන්ට දිගටම වැඩ කරන්න වෙන්නේ කියලා. මම ඒකයි කිව්වේ, hit-wicket කියලා. දැන් මේගොල්ලන්ට තිබෙන්නේ වෙන දුෂ්ට වුවමනාවක්. ඒක නිසා වෙච්ච දේ තමයි, මේගොල්ලන්ට තමන්ගේ තර්කය ඔප්පු කරගන්න බැරි වීම. අග්‍ර විනිශ්වයකාරතුමා ඇතුළු විනිශ්වය මණ්ඩලය කියන්නේ මොකක්ද? මේ තර්කය පිළිගත්තොත්, join වුණු වෙලාවේ තිබුණු වැටුපෙන්ම, join වුණු වෙලාවේ තිබුණු දේවල්වලින්ම විශ්‍රාම යන්න වෙනවා. ඒක තමයි ඔයගොල්ලන්ගේ තර්කය. ඒ නිසායි මම කියන්නේ තමුන්නාන්සේලා ඉදිරිපත් කරලා තිබෙන සමහර තර්ක විහිළුසහගතයි කියලා. මීට වඩා වේලාව ගන්න එක සාධාරණ නැහැ කියලා මම හිතනවා. ඒක නිසා මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්.

හැබැයි, මේකේ ඉතාම නපුරු දෙයක් ගැන ලියලා තිබෙනවා. ඒ ගැනත් මම කියන්න ඕනෑ. චාල්ස් ඩිකන්ස්ගේ "Oliver Twist" කියන පොතෙන් නඩු තීන්දුවේ උපුටා දක්වලා තිබෙනවා, "Please, sir, I want some more" - "මහත්මයාණෙනි, මට තව ටිකක් ඕනෑ" - කියන එක. ඒ කථාව අපි කවුරුත් කියවලා තිබෙනවා. අපි දන්නවා, ඔලිවර් ට්විස්ට් කියන්නේ අනාථ දරුවෙක් බව. ඒ දරුවාට හරියට කෑමක්, ආදරයක්, කරුණාවක් ලැබුණේ නැහැ. ඒක නිසා ඒ දරුවා හැම වෙලාවේදීම වැඩිපුර කෑම ටිකක් ඉල්ලනවා. හැබැයි, ඒ කෑම ටික දෙන්නේ නැහැ. ඒ කෑම ටික දෙන්නේ නැතුව අනාථ නිවාසය කරගෙන යන ධනවතුන් මොකක්ද කරන්නේ? ඒ දරුවාට දෙන්න පුළුවන් ප්‍රමාණය වාගේ සිය ගුණයක් මුදල් නාස්ති කරමින්, කෑමවලට වෙන් කරන මුදල් පවා ගසා කමින්, බොහොම සුඛෝපභෝගී - lavish - ජීවිතයක් ගත කරනවා. හැබැයි, දරුවාට ලේබලයක් හදනවා, "Please, sir, I want some more" කියලා.

අද අධිකරණයේ විනිශ්වයකාරවරුන් සම්බන්ධයෙනුත් විවිධ ආකාරයේ දුර්දාන්ත ප්‍රකාශ කරලා තිබෙනවා. ඇත්තටම මේ නඩු තීන්දුවේම තිබෙනවා, අධිකරණය ගැන මෙවැනි අපහාසාත්මක ප්‍රකාශ කරන්නේ ඇයි කියලා. ගරු කථානායකතුමනි, මේ නඩු තීන්දුවේ අවසාන පිටුවට කලින්, 87වැනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "Disparaging our Country to advance an argument at the expense of our national reputation is unfortunate and regrettable."

ඔබතුමා දන්නවා, හොරෙන් පැනලා යන කට්ටිය වීසා ගන්න විවිධ embassiesවලට ගියාම ලංකාව ගැන කොච්චර බොරු කියනවාද කියලා. වීසා එක ගහගන්න ඕනෑ නිසා ලංකාව ගැන ඇති තරම් බොරු කියනවා. මේකත් ඒ වාගේ වැඩක්. අධිකරණය ගැන කියලා තිබෙන දේවල් ගත්තාම, නඩු තීන්දුවේත් කියලා තිබෙනවා, මේගොල්ලන්ගේ case එක ගොඩ දා ගන්න අතිවිශාල අපහාසයක් රටට කරලා තිබෙනවා කියලා. ඒක නිසා තමයි මම අර Oliver Twist උදාහරණය ගැන කිව්වේ. *[බාධා කිරීමක්]* ඒ වධකයෝ තමයි ඉස්සර ඒක කියන්නේ. පෞද්ගලික වධකාගාර තිබුණු අය.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. Oliver Twist කියනවා, "Please, sir, I want some more" කියලා. ඔහුගේ කෑමට තිබෙන සල්ලිත් හොරකම් කරන සමහර පාලකයෝ, "අපෝ! එයාට දෙන්න බැහැ" කියලා, ඒ මුදල්වලින් බොහොම සුඛෝපභෝගී ජීවිතයක් ගත කරනවා. අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් ප්‍රමාණ ගැන කියන්න මම දන්නේ නැහැ. හැබැයි, ඒගොල්ලන්ට ලැබෙන වැටුපයි, යම් යම් දීමනායි ගත්තාම මම හිතන විධියට ඒගොල්ලන් අවුරුද්දකට ගන්න වැටුප එක court case එකක fee එක විධියට ගන්න නීතිඥයෝ තමයි ගිහිල්ලා කියන්නේ, "මේක වැරැදියි, මේගොල්ලන්ට මෙහෙම දෙන එක වැරැදියි, වයස අවුරුදු 65 සිට 67 දක්වා වැඩි කරන එක වැරැදියි, bribes දෙනවා" කියලා. ඒක නිසායි මම Oliver Twist උදාහරණයට ගත්තේ. ගොඩක් දේවල් බඩ පිරෙන්න කාලා, ඉස්මුරුත්තාව වනතුරු කාලා, සියලු වරප්‍රසාද භුක්ති විඳින ගමන්, ඉතා සුළු වෘත්තික කණ්ඩායමක් - සුළු පිරිසක් - තමයි මේ විධියට කටයුතු කරන්නේ. මම කියන්නේ සියලුදෙනා ගැන නොවෙයි. ඔය කියන නීතිඥයන් 26,000න්, 600ක්වත් ඒ ස්ථාවරයේ නැහැ. ඒ අය ඔය ඔක්කෝම කරන ගමන් මොකක්ද කරන්නේ? මේ අධිකරණයේ විනිශ්චයකාරවරුන්ට දේවල් වැඩි කරන එක බොහොම නරක වැඩක් කියලා මතයක් හදනවා. ඒ නිසා අපි කියන්න කැමැතියි ගරු කථානායකතුමනි, මේ ප්‍රතිසංස්කරණ අපි සිදු කරන්නේ සමස්ත ප්‍රතිසංස්කරණ රාමුවක් ඇතුළේ බව. අපේ ජනවරම කිසිම දේකින් හානි කරගන්න අපි කිසිසේත්ම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

දැන් බලන්න, ඊයේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා තෙමුණේ වැස්සට. එහෙම නැතිව පොලීසියෙන් වතුර ගහලා නොවෙයි. අපි ප්‍රජාතන්ත්‍ර විරෝධී කිසිම දෙයක් ඔබතුමන්ලාට කළේ නැහැ. එසේ කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. ඔබතුමා ඔතැනම තියාගන්න එක තමයි අපේ අරමුණ. ඒක තමයි අපට කරන උදව්ව. අපට ඉතාම පැහැදිලිව කියන්න තිබෙන්නේ මේකයි. අපි මේ අධිකරණ ප්‍රතිසංස්කරණයත්, ව්‍යවස්ථා සංශෝධනයත් කාලයේ පරීක්ෂාවට ලක් කරලා බලමු. ඊළඟ මාස හයේ, ඊළඟ අවුරුද්දේ මේ ප්‍රතිසංස්කරණ කොහොමද රටේ යහපත සඳහා යෙදවෙන්නේ කියලා එතකොට අපට බලාගන්න පුළුවන්. ඒ නිසා අපට කිසිම අගතියක් නැහැ. අපි මේ සංශෝධන තුළ අධිකරණයේ ඉන්න සියලුම විනිශ්චයකාරවරුන්ගේ, - මම court packing ගැන කියන්න ගියේ නැහැ - විශ්‍රාම යෑමේ වයස් සීමාව තමයි දීර්ඝ කර තිබෙන්නේ. අලුත් අය නොවෙයි. අපි මේ ඉන්නා අය ගැන පූර්ණ විශ්වාසයකින් වැඩ කරන්නේ. ඒ නිසා අපි select කරලා නැහැ, අපි තෝරලා නැහැ, handpick කරලා නැහැ. ඒක කරලා තිබෙන්නේ ඔබතුමන්ලා සහ ඔබතුමන්ලාගේ පරණ අය. අපට එවැනි කිසිම අවශ්‍යතාවක් නැහැ. අපි ඉතාම ප්‍රජාතන්ත්‍රවාදීව මේ කටයුත්ත කරගෙන යනවා. මින් ඉදිරියටවත් ලංකාවට බොරු කිව්වාට කමක් නැහැ, UN එකට බොරු කියන්න එපා. රටේ ඉතාම වැදගත් ආගමික නායකයන් මුණ ගැහිලා බොරු කියන්නත් එපා කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Sivagnanam Shritharan. You have fifteen minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[பி.ப. 12.13]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் பாராளுமன்றத்தில் கொண்டுவரப்பட்டு இருக்கின்ற அரசியல மைப்புக்கான இருபத்திரண்டாவது திருத்தம் சட்டமூலம் தொடர்பில் குறிப்பாக, நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையைக் கூட்டுதல் தொடர்பில் - Court of Appeal நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையைக் கூட்டுதல் தொடர்பில் - கொண்டுவரப்பட்டுள்ள amendment பற்றி பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றிகள்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீதி என்பது சுதந்திரமானது; தலையீடற்றது. இது கிரேக்க மரபிலிருந்து பிறந்த ஒரு கருத்தாகும். சுதந்திரமானதும் தலையீடற்றதுமான நீதி இலங்கையில் காணப்படுகின்றதா அல்லது அது இலங்கையில் எவ்வாறு கையாளப்படுகின்றது? என்பதை நாம் சற்று பின்நோக்கிப் பார்க்க வேண்டும். இலங்கையினுடைய நீதித்துறை தமிழர்களுக்கு என்ன செய்துள்ளது? நீண்ட நெடும் வரலாற்றைக் கொண்ட இலங்கையின் நீதித்துறை, தமிழர் களுடைய வரலாற்று ரீதியான அடிப்படைகளை எவ்வாறு தன்னுடைய இசைந்த வடிவங்களில் மாற்றி அமைத்து இருக்கின்றது? அதனை எவ்வாறு வேறு வழிக்குக் கொண்டுபோய் இருக்கின்றது? இதற்கு கடந்த கால ஆட்சியாளர்களும் பதில் சொல்லியே ஆகவேண்டும். குறிப்பாக, 1954ஆம் ஆண்டு திருகோணமலை மாவட்டத்தின் அல்லைக் கந்தளாயில் 154 விவசாயிகள் பொலிசார் பார்த்திருக்க சிங்களக் காடையர்களால் வெட்டிப் படுகொலை செய்யப்பட்டார்கள். அப்பொழுது இந்த நீதித்துறை என்ன செய்தது? நான் நினைக்கின்றேன், அன்று அதற்கு நீதி கிடைத்திருந்தால் இந்த நாட்டில் முள்ளிவாய்க்கால் சம்பவம் ஏற்பட்டிருக்காது என்று.

அதேபோல, 1983ஆம் ஆண்டு இடம்பெற்ற வன்முறையின்போது, மலையகத்தில் இருந்த ஏதுமறியாத இலட்சக்கணக்கான அப்பாவித் தமிழர்களை கப்பல்களில் ஏற்றியும் கால்நடையாகவும் வடக்கு, கிழக்குப் பகுதிகளுக்கு அனுப்பியபொழுது, இலங்கையின் நீதித்துறை என்ன செய்தது? இதனை அது எவ்வாறு பார்த்தது? அந்த மக்கள் என்ன செய்தார்கள்? அப்பொழுது, கொழும்பிலிருந்த பெரும் வர்த்தகர்கள், தனவந்தர்களுடைய சொத்துகள் எல்லாம் எரித்து அழிக்கப்பட்டன. ஜே.ஆர். ஜயவர்த்தன, காமினி திசாநாயக்க, லலித் அத்துலத்முதலி போன்றவர்களுடைய தலைமையில் மிகப் பெரியதோர் இன அழிப்பும், இன ரீதியான முறை கேடான நடவடிக்கைகளும் இந்த மண்ணிலே நடந்தன. அப்போது, இந்த நீதித்துறை எதுவுமே செய்யவில்லை. அதே காலகட்டத்தில் - 1983ஆம் ஆண்டு - வெலிக்கடை சிறைச்சாலையில் அப்பாவித் தமிழ் இளைஞர்கள் வெட்டிப் படுகொலை செய்யப்பட்டார்கள். அப்போது இந்த நீதித்துறை என்ன செய்தது? இந்த நீதித்துறையால் என்ன செய்ய முடிந்தது?

நீதித்துறை தமிழர்களுக்கு எவ்வாறு நீதியைத் தந்தது என்பதைத்தான் நான் இந்த இடத்தில் மிகவும் உன்னிப்பாகப் பார்க்கின்றேன். நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லை அதிகரிக்கப்பட இருக்கிறது. அதற்காகச் சட்டத்தில் மாற்றம் கொண்டுவரப்பட இருக்கிறது. இது இந்த நாட்டுக்கு ஏதோவோர் வகையில் அபகீர்த்தி என்று பலர் சொல்கின்ற இந்த நேரத்தில், அவ்வாறு சொல்கின்றவர்களிடம் நான் கேட்கிறேன், இந்த நீதித்துறை தமிழர்களின் வரலாற்றில் அவர்களுக்கு என்ன செய்தது? என்று. திருகோணமலையில் 5 பாடசாலை மாணவர்களைக் கடற்படையினர் கடத்திக் கொலை செய்தார்கள். நீதி கோரி போராடிய அம்மாணவர்களில் ஒருவரின் தந்தையான வைத்தியர் மனோகரனும் இறந்துவிட்டார். ஆனால், அவர்களுடைய போராட்டத்துக்கு இதுவரை எந்த நீதியும் கிடைக்கவில்லை. நீதித்துறையால் என்ன செய்ய முடிந்தது?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2009ஆம் ஆண்டு பிரான்சிஸ் அடிகளார் தலைமையில் தமிழீழ விடுதலைப் புலிகளுடைய மூத்த உறுப்பினர்கள் அரசாங்கத்திடம் சரணடைந்தார்கள். இராணுவத்திடம் எத்தனையோ மனைவிமார் தங்களுடைய கணவன்மாரை ஒப்படைத்தார்கள்; பிள்ளைகள் தங்களுடைய தாய், தந்தையரை ஒப்படைத்தார்கள். அவர்கள் கண்கண்ட சாட்சியங்களாக இருந்தார்கள். பலர் சட்ட நடவடிக்கைக்காக நீதிமன்றம் சென்றார்கள். எழிலனின் மனைவியான அனந்தி சசிதரன் அவர்கள்கூட, பிரபல சட்டத்தரணியான ரத்தினவேல் ஐயா அவர்கள் ஊடாக நீதிமன்றத்தை நாடி, “என்னுடைய கணவரை நானே ஒப்படைத்தேன். அவரைக் காட்டுங்கள்!" எனக் கோரினார். நீதிமன்றத்தால் இதுவரை அவரைக் காட்ட முடியவில்லை. நீதிமன்றத்தால் என்ன செய்ய முடிந்தது? இலங்கையில் நீதித்துறையானது தமிழர்களுக்கு எப்பொழுதும் எதிரானதாகவே இருந்திருக்கின்றது. தமிழர்களுடைய மரணங்களை, அவர்கள் மீதான படுகொலைகளை நியாயப்படுத்துகின்றதோர் இடமாகத்தான் நீதித்துறை இருந்திருக்கின்றதா? என்ற கேள்வி தமிழர்களிடம் இப்பொழுதும் இருக்கின்றது. இவ்வளவு விடயங்களுக்குமான நீதியை இலங்கையில் உரிய நேரங்களில் வழங்கியிருந்தால், முள்ளிவாய்க்கால் சம்பவம் ஏற்பட்டிருக்காது; நீதிக்குப் புறம்பான நடவடிக்கைகள் நடந்திருக்காது; தமிழர்கள் மிகப் பெரியதோர் இனப்படுகொலையைச் சந்தித்திருக்க வேண்டிய தேவை வந்திருக்காதென நான் நினைக்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 1978ஆம் ஆண்டு இலங்கையில் பயங்கரவாதத் தடைச் சட்டம் கொண்டுவரப்பட்டது. அப்போது நீதித்துறையால் எதுவும் செய்ய முடியவில்லையே! இன்று கிட்டத்தட்ட 50 ஆண்டுகளை நெருங்குகின்றபொழுது, இந்த நீதித்துறையுடைய மௌனமும் வெளிச்சமில்லாத் தன்மையும் எவ்வளவு உயிர்களைக் காவுகொண்டு இருக்கின்றன? எத்தனை ஆயிரம் பேருடைய உயிரை இந்த நிலத்தில் பறித்திருக்கின்றன? இந்த அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்று இரண்டு ஆண்டுகளாகியும்கூட, 1978ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட பயங்கரவாதத் தடைச் சட்டத்தை இதுவரை எந்த மாற்றத்தை நோக்கியும் கொண்டு செல்ல முடியவில்லையே! ஆகவே, நீதித்துறையால் நடந்தது என்ன? நீதித்துறையால் என்ன செய்ய முடிந்தது? இதுதான் இன்று எங்கள் முன்னால் இருக்கின்ற கேள்வி!

நீங்கள் நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிக்கிறீர்கள். உலகத்தில் பல நாடுகளில் நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லை என்பது ஒரு பிரச்சினையே இல்லை. அமெரிக்காவில் நீதிபதி ஒருவர் தன்னுடைய ஆயுட்காலம் வரை பதவியில் இருக்கலாம். ஐரோப்பிய நாடுகளில் நீதிபதிகளுக்கென ஓய்வுபெறும் வயதெல்லை இருக்கின்றது. இலங்கையில் நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிக்க முற்படுகின்ற உங்களால், ஏன் ஏனைய அரச உத்தியோகத்தர்களின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிக்க முடியவில்லை? இன்றைக்கு இலங்கையின் பல பகுதிகளில் தனது இளமையான தோற்றத்தோடு பல அரச உத்தியோகத்தர்கள் 60 வயதோடு ஓய்வுபெற்றுச் செல்கின்றார்கள். அவர்கள் பாடசாலை அதிபர்களாக இருக்கலாம்; கல்வி நிருவாகிகளாக இருக்கலாம்; ஏனைய அரச நிருவாகிகளாக இருக்கலாம்! அவர்கள் 60 வயதோடு ஓய்வுபெற வேண்டும் என்றிருக்க, நீதித்துறையில் அனுபவம் வாய்ந்தவர்கள் 67 வயதுவரை இருக்க வேண்டும் என்ற நியாயம் எவ்வளவு தூரம் பொருத்தமானது? அப்படியென்றால், இந்த நாட்டில் இருக்கின்ற எல்லா அரச உத்தியோகத்தர்களினதும் ஓய்வுபெறும் வயதெல்லையைக் கூட்டியிருக்கலாமே! ஏன், அதைச் செய்ய அரசாங்கம் தயங்குகின்றது?

குறிப்பாக, யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களில் 2026, 2027ஆம் ஆண்டுகளில் மிக இளமையான தோற்றத்தோடு, பாடசாலைகளை நடத்தக்கூடிய பல அதிபர்கள் ஓய்வுபெற இருக்கிறார்கள். அது கிளிநொச்சி மாவட்டத்தில் அதிபர்களுக்கான நிருவாக வறுமையை ஏற்படுத்தப் போகின்றது. 2028ஆம் ஆண்டின் இறுதியில், கிளிநொச்சி மாவட்டத்திலுள்ள பாடசாலைகள் தரம்வாய்ந்த அதிபர்களைப் பெறுவதில் மிகப் பெரிய சிக்கலைச் சந்திக்கப் போகின்றது. யாழ்ப்பாணத்திலும் அப்படித்தான். நிலைமை இப்படி இருக்க, நீங்கள் எல்லா அரச ஊழியர்களினதும் ஓய்வுபெறும் வயதெல்லையைக் கூட்டக்கூடிய நிலைமையை உருவாக்கி இருக்கலாமே! அது ஏன் நீதிபதிகளுக்கு மட்டும் ஒரு சட்டம்? இதற்கு ஏதோவொரு காரணம் இருக்கின்றது. யாருக்கோ ஒரு தேவை இருக்கின்றது; அரசாங்கத்துக்கு ஒரு தேவை இருக்கின்றது. க

அரசாங்கத்தின் தேவையை நிறைவேற்ற, நீங்கள் ஒரு கருவியாக இந்த நீதித்துறையைப் பயன்படுத்த முனைகிறீர்களா? என்ற சந்தேகம் எங்களுக்கு உண்டு.

அமரர் அத்துலத்முதலி அவர்கள் ஒரு பேட்டியில் குறிப்பிட்டிருந்தார், “தமிழர்களுக்கு என்ன தீர்ப்பு வழங்க வேண்டும்; அவர்களை எவ்வாறு சிறையிலே அடைக்க வேண்டும்; அவர்களை எவ்வாறு அடக்க வேண்டும் என்பதற்காக நாங்கள் எங்களுடைய நீதித்துறையைப் பயன்படுத்துவோம். அதற்காக நாங்கள் நீதிபதிகளுக்குச் சன்மானமாக வீடுகளையோ, கார்களையோ வாங்கிக் கொடுப்போம்" என்று. அப்போது, ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய ஆலோசகராக இருந்த ஏ.ஜே. வில்சன் அவர்கள் தன்னுடைய "The Break-up of Sri Lanka: The Sinhalese -Tamil Conflict" என்ற புத்தகத்தில் இதனை மிகத் தெளிவாகக் குறிப்பிட்டு இருக்கிறார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஏ.ஜே. வில்சன் அவர்களுடைய "The Break-up of Sri Lanka: The Sinhalese-Tamil Conflict" என்ற புத்தகத்தில் இருக்கின்ற விடயங்களை யாரும் இதுவரை இலங்கையில் கேள்விக்கு உட்படுத்தவில்லை. ஏனெனில், அவர் அதில் எழுதிய ஒவ்வொரு விடயமும் உண்மையானது. ஜே.ஆர். ஜயவர்தன, அத்துலத்முதலி, காமினி திசாநாயக்க போன்றவர்களின் அடாவடிகளை, அவர்கள் சட்டங்களைப் பயன்படுத்திய விதங்களை, ஏ.ஜே. வில்சன் அவர்கள் கூடவே இருந்து அனுபவ ரீதியாக எழுதியதுதான் "The Break-up of Sri Lanka: The Sinhalese-Tamil

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

Conflict" என்ற புத்தகம்! அதில் இருக்கும் உண்மைகளை நான் இந்த இடத்தில் சொல்ல விரும்புகின்றேன். கடந்த காலத்தில் இந்த நாட்டில் அப்படித்தான் இருந்திருக்கிறது. நீதி பக்கச் சார்பாக இருந்திருக்கிறது; ஓர் இனத்துக்கானதாக இருந்திருக் கிறது; பெரும்பான்மையானவர்களுக்காக இருந்திருக்கிறது. அதனால்தான் இந்த நாட்டில் நீதி நீதியானதாக இருக்கவில்லை என்ற ஆதங்கம் தமிழ் மக்களிடம் உண்டு.

நீதி பற்றி பேசுகிறார்கள். உலகத்தில் நீதித்துறை சுதந்திரமானது. ஆனால், இலங்கையில் நீதித்துறை சுதந்திர மானதா? இது கேள்விக்குரிய ஒரு விஷயம்! குருந்தூர் மலையில் விகாரை கட்டக்கூடாதென முல்லைத்தீவு நீதிமன்றம் கட்டளையிட்டது. அந்தக் கட்டளையையும் மீறி இன்று குருந்தூர் மலையில் பிக்குமாரால் விகாரை கட்டி முடிக்கப்பட்டு இருக்கிறது. இது என்ன நீதி? அதேபோல், நீராவியடி பிள்ளையார் ஆலயத்தில் பிள்ளையார் இருக்கக்கூடியதாக புத்தர் சிலையை வைத்தார்கள். பிக்குவின் உடலை எரிக்கக்கூடாதென நீதிமன்றம் உத்தரவிட்டது. ஆனால், எரித்தார்கள். எனவே, நீதி செத்துப்போய் இருக்கிறது. நீதித்துறையால் என்ன செய்ய முடிகிறது? எல்லாமே சட்டம், எல்லாமே நீதி என்றால், இந்த நாட்டினுடைய எந்த மூலைக்கு அது போகப் போகிறது?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, குருந்தூர் மலைக்கு ஒரு நீதி; வெடுக்குநாறி மலைக்கு ஒரு நீதி; கன்னியா வெந்நீர் ஊற்றுக்கு ஒரு நீதி; நாட்டில் ஏனைய இனங்களுக்கு ஒரு நீதி! இதனால்தான் முல்லைத்தீவு மாவட்ட நீதிபதியாக இருந்த சரவணராஜா அவர்கள், தான் வழங்கிய தீர்ப்பை மாற்றி எழுதுமாறு தனக்கு நெருக்கடி தருகிறார்கள், தனது உயிருக்கு ஆபத்தெனக் கூறி, இந்த நாட்டை விட்டே ஓடிவிட்டார். ஒரு நீதிபதி இந்த நாட்டைவிட்டு ஓடுகின்ற அளவுக்கு இலங்கையில் நீதி செத்துப்போய் இருக்கிறது. எனவே, நீங்கள் இந்தச் திருத்தச் சட்டமூலத்தைக் கொண்டுவருவது யாருக்காக? இதனூடாக நாளை என்ன நடக்கப் போகிறது? யார் தீர்ப்பு அளிக்கப் போகிறார்கள்? யாருக்கான தீர்ப்பாக அது இருக்கும்?

பிளோட்டோவின் சகோதரர்களான Glaucon மற்றும் Adeimantus விவாதிக்கும்போது ஒரு கட்டத்தில் சொல்கிறார்கள், “சமமானவர்களுக்கு இடையில் நிகழ்வதுதான் நீதி! ” என்று. இங்கு பெரும்பான்மை, சிறுபான்மை என்று உருவாக்கப்பட்டால், எப்படி நீதி நீதியானதாக இருக்கும்? பிளோட்டோவின் சகோதரர்களின் கருத்தின் அடிப்படையில் பார்த்தால், சமமான இரண்டு தேசிய இனங்களுக்கு இடையில்தான் நீதி சரியானதாக இருக்கும். சிங்களப் பேரினவாத சிந்தனையோடு இருக்கின்ற பெரும்பான்மை இனம், தமிழ் தேசிய இனத்தை சிறுபான்மையாகவே பார்க்கின்ற நிலையில், எவ்வாறு இந்த நாட்டில் நீதி சமமானதாக, நீதியானதாக இருக்க முடியும்? அதனால்தான் நாங்கள் நீதித்துறை தொடர்பில் அதிக கரிசனை செலுத்துகின்றோம்.

இன்று நீங்கள் கொண்டுவந்து இருக்கின்ற விடயம் நீதிக்கு விரோதமானது. நாட்டில் ஒரு சட்டம் கொண்டுவரப்பட்டால், அது எல்லோருக்கும் உரியதாக இருக்க வேண்டும். நீதவான்கள், மாவட்ட நீதிபதிகள், உயர் நீதிமன்ற நீதிபதி களின் ஓய்வுபெறும் வயதெல்லையை மாத்திரம் நீங்கள் கூட்டாமல், இலங்கையில் இருக்கின்ற எல்லா அரச உத்தியோகத்தர்களின் ஓய்வுபெறும் வயதெல்லையையும் கூட்டியிருந்தால், நீங்கள் இந்த நாட்டில் நீதி விடயத்தில் நியாயமானதொரு நடைமுறையைப் பின்பற்றுகிறீர்கள் என்ற எண்ணம் எங்களுக்குத் தோன்றியிருக்கும். ஆனால், நீங்கள் கொண்டுவந்து இருக்கின்ற முறை மிகவும் தவறானது என்பதைத்தான் நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நோபல் பரிசு பெற்ற அமர்த்யா சென் அவர்கள், “வன்முறையும் இன அடையாளமும்” என்ற தலைப்பிலான தன்னுடைய விரிவுரை யில் குறிப்பிடுகிறார், “வேறுபாடுகளை அங்கீகரிக்காது விட்டால் சமாதானத்துக்கு இடமில்லை” என்று. அதாவது, இனங்களுக்கு இடையில் இருக்கின்ற வேறுபாடுகளை, இனங்களுக்கு இடையில் இருக்கின்ற புரிதல்களை, இனங்களுக்கு இடையில் இருக்கின்ற அன்னியோன்னிய உறவுகளைச் சரியான முறையில் இனங்கண்டு அங்கீகரிக்காது விட்டால், இந்த நாட்டில் நீங்கள் சமாதானத்துக்கான எந்த இடத்தையும் தேட முடியாது. இதனைத்தான் அவர் மீண்டும் மீண்டும் வலியுறுத்துகின்றார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அரசியலமைப் புக்கான இருபத்திரண்டாவது திருத்தத்தைப் பலரும் எதிர்க்கின்றார்கள்; வேண்டாமெனச் சொல்கிறார்கள். ஏன் அதனைக் கருத்திலெடுக்க அரசாங்கம் தவறுகின்றது? இந்தத் திருத்தத்தை சட்டத்தரணிகள் சங்கம் வேண்டாமெனச் சொல்கிறது; மதத் தலைவர்கள் வேண்டாமெனச் சொல்கிறார்கள். நீதவான்கள் சங்கம் வேண்டாமெனச் சொல்கிறது; நீதிச் சேவைகள் சங்கம் வேண்டாமெனச் சொல்கிறது; ஐக்கிய நாடுகள் சபை வேண்டாமெனச் சொல்கிறது. மேலும், பொதுநலவாய சட்ட வல்லுநர்கள் இந்தத் திருத்தம் வேண்டாமெனச் சொல்கிறார்கள். ஆசிய சட்ட வல்லுநர்கள் சொல்கிறார்கள், "இந்தச் சட்டத் திருத்தத்தைக் கொண்டுவராதீர்கள்;. இது பாதகமானதாக அமையும்" என்று. இவ்வளவு பேர் சொல்கின்ற விடயங்களையும் தாண்டி, ஏன் இந்த அரசாங்கம் ஒரு கரும்புள்ளியாக இந்த இருபத்திரண் டாவது திருத்தத்தைக் கொண்டுவர முனைகிறது? இதற்குப் பின்னால் என்ன இருக்கிறது? நாட்டில் சில சட்டங்கள் கொண்டுவரப்படுகின்றபொழுது, நாங்கள் அவற்றை வரவேற் கிறோம். நீங்கள் போதைவஸ்துக்கு எதிராகக் கொண்டு வருகின்ற நடவடிக்கைகள், 'ஈஸ்டர்' தாக்குதல் தொடர்பாகக் கொண்டுவந்து இருக்கின்ற விடயங்கள் மற்றும் சட்டத்திருத்தங்களை நாங்கள் எதிர்க்கவில்லை.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)a

Hon. Sivagnanam Shritharan, you have two minutes left of the time allotted to you.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தின அமர்வு நேரத்தை பி.ப. 7.00 மணி வரைக்கும் நீடித்து இருக்கிறார்கள். எனக்கு இன்னும் இரண்டு நிமிடங்களை அதிகமாகத் தாருங்கள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sivagnanam Shritharn, we have to suspend the Sitting for lunch.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
அதற்குப் பிறகு பேசலாமா?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will give you only one more minute.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நிறுவனங்களின் சுயாதீனம், நீதித்துறையின் பாதுகாப்பு, அதிகாரப் பரவலாக்கம், சிறுபான்மையினரின் உரிமைகள் மற்றும் அடிப்படைச் சுதந்திரத்துக்கு வலுவான சட்ட உத்தரவாதம் இல்லாத ஒரு நாட்டில் எவ்வாறு உங்களால் இந்தத் திருத்தத்தின் ஊடாக ஒரு நடைமுறையைக் கொண்டுவர முடியும்?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, JVPஇனர்தான் இணைந்திருந்த வட, கிழக்கை நீதிமன்றத்தை நாடிப் பிரித்தார்கள். இது பற்றி உங்களுக்குத் தெரியுமென நான் நினைக்கின்றேன். இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து 2 ஆண்டுகளாகியும் இன்றுவரை சமாதானம் பற்றி பேசவில்லை. இந்த நாட்டில் சமாதானம் ஏற்பட்டு, நல்லிணக்கம் ஏற்பட்டு, நீதிமன்றத்தில் சட்டரீதியாகப் பெறப்பட்டதை மாற்றுவதற் கான காலம் வருமா? புதிய அரசியலமைப்பு கொண்டு வரப்படுமா?

இந்த நாட்டில் புரையோடிப்போய் இருக்கின்ற இனப் பிரச்சினைக்கான தீர்வை முன்வைப்பதற்குப் பதிலாக, இந்தத் திருத்தமும் நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரித்தலும் நீதிமன்றங்களுடைய நியாயாதிக்கமும் இனங்களுக்கு இடையில் இருக்கின்ற முறுகல் நிலைமையை இன்னும் மோசமாக்கப்போகிறது என்றுதான் தமிழர்களாகிய நாங்கள் கவலைப்படுகின்றோம். அதனால்தான் நாங்கள் இந்த அரசியலமைப்புத் திருத்தத்தை எதிர்க்கின்றோம். இலங்கை தமிழரசுக் கட்சியினராகிய நாங்கள் அரசியலமைப்புக்கான இருபத்திரண்டாவது திருத்தச் சட்டமூலத்துக்கு எதிராக வாக்களிக்க இருப்பதன் நோக்கமே இதுதான். நீங்கள் இதற்குப் பொதுசன வாக்கெடுப்பு ஒன்றை நடத்தியிருக்கலாம்! அதுகூட இல்லை.

இந்த நாட்டில் தமிழர்களுக்கு அநீதி நடந்திருக்கிறது. அவர்கள் நீதியான முறையில் நடத்தப்படவில்லை. அவர்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். நாளைய தினம்கூட, வெடுக்குநாறி மலையில் கலவரமொன்றைத் தூண்டுவதற்காக பிக்குமார் தலைமையில் பாரிய நடவடிக்கை நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. இந்த நாட்டில் நீதியைச் சரியான முறையில் நிலைநாட்ட முடியாத நிலையில், நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிப்பதும், நீதித்துறை சார்ந்து கொண்டுவரப்படுகின்ற விடயங்களும், எங்களைப் பொறுத்தவரை பாதகமானது என்பதைத்தான் நாங்கள் இந்த இடத்திலே குறிப்பிட விரும்புகிறோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அரசியலமைப் புக்கான இருபத்திரண்டாம் திருத்தமானது, அதிகாரப் பகிர்வு, இனப் பிரச்சினைக்கான அரசியல் தீர்வு, வடக்கு, கிழக்கு தமிழ் மக்களின் நீண்டகால அரசியல் கோரிக்கைகளுக்கு நெருக்கடியை ஏற்படுத்தலாம். அதாவது, அதிகாரப் பகிர்வு தொடர்பில், இனப் பிரச்சினைக்கான அரசியல் தீர்வு தொடர்பில், வடக்கு, கிழக்கு தமிழ் மக்களின் நீண்டகால அரசியல் கோரிக்கைகள் தொடர்பில் இந்தத் திருத்தமானது இன்னும் பல நெருக்கடிகளை ஏற்படுத்தலாம் என்பதை நான் இந்த இடத்தில் மீண்டும் பதிவு செய்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு ஒதுக்கப்பட்ட நேரம் போதாது. இன்றைய தினம் பி.ப. 7.00 மணிவரை இந்த விவாதம் நடைபெறவிருப்பதால், மதிய உணவுக்கான இடைவேளையின் பின்னர் எனக்கு 2 நிமிடம் தாருங்கள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can ask the Chief Opposition Whip to allot more time.

Order, please! The ongoing Proceedings of this House shall stay suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. **1.00**ට නැවත පවත්වන ලදී.*
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Sagarika Athauda. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක වෙනසක් වාගේම ජනතා අවශ්‍යතාව මනාව පිළිබිඹු කරමින් වෙනස්කම් රාශියක් සිදු කරමින් සිටින අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි දෙවන සංශෝධනය හරහා, අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය තව වසර දෙකකින් දීර්ඝ කිරීමටත්, අවශ්‍යතා හඳුනා ගන්නා ලද අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කිරීමටත් මේ රජය බලාපොරොත්තු වනවා.

මේ කථා කරන මාතෘකාව ගැන මගේ අදහස් ඉදිරිපත් කරන්න කලින් කාරණා කිහිපයක් කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න මම කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම අද උදේ වරුවේ සාකච්ඡා වුණා, මේ සංශෝධනය හරහා විධායකයේ බලය වැඩිවීමක් සිදුවනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධනය සිදු කරන්නේ, පාර්ලිමේන්තුවට පැවරිලා තිබෙන බලතල අනුවයි. මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා, ගරු අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය වැඩි කිරීමක් සිද්ධ වනවා. මේ සංශෝධනයට කලිනුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමයි

[ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය]

විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස තීරණය කළේ. ඒ වාගේම මේ සංශෝධනය ගෙනාවාට පසුවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම තමයි විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස තීරණය කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මාතෘකාව ගැන කථා කරනකොට විපක්ෂය ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපි මේ සාකච්ඡා කරන්නේ, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන විවිධ සාකච්ඡා ඇති වුණු අවස්ථාවලදී අධිකරණ ක්ෂේත්‍රයට කළු පැල්ලම් එකතු වුණු අවස්ථා කිහිපයකුත් තිබෙනවා. අපට මතකයි, දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඒ සංශෝධනය හරහා සිද්ධ වුණේ, විධායකයේ බලතල වැඩි කිරීමක්. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා සිද්ධ වුණේ, විධායකයේ බලතල අඩු කිරීමක්. අපි අද ප්‍රතිසංස්කරණයක් වෙනුවෙන්, එහෙම නැත්නම් මහජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැල්ලා අධිකරණවල වැඩ කටයුතු කාර්යක්ෂම කරන්න, එහෙම නැත්නම් නීතියේ ආධිපත්‍යය ගැන මහජනතාව තුළ නැතිවෙලා තිබෙන විශ්වාසය නැවත තහවුරු කරන්න මහන්සි වනකොට, දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඔසවලා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඔසවපු විපක්ෂය, මේ ප්‍රතිසංස්කරණවල දුර්වලතා ගැන අද කථා කරනවා.

ඊළඟට දිගින් දිගටම කථා වුණා, ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ Bench එක, එහෙම නැත්නම් මේ නඩුව අහන්න පත් කරපු විනිශ්චය ආසනය ගැන. මේ විනිශ්චය ආසනයට full bench එකක් අවශ්‍යද, එහෙම නැත්නම් පංච පුද්ගල විනිශ්චය මණ්ඩලයක් අවශ්‍ය ද කියන කාරණය තීරණය කිරීමට හේතු වූ කරුණු පිළිබඳව මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ 40වන පිටුවේ ඉඳලා බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා දිගින් දිගටම ප්‍රශ්න කළා, අධිකරණවල විනිශ්චයකාරතුමන්ලාගේ පමණක් විශ්‍රාම යන වයස වැඩි කරන්නේ ඇයි, රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම යන වයස වැඩි නොකරන්නේ ඇයි කියලා. අපි මේ කථා කරන්නේ එක ප්‍රතිසංස්කරණයක් ගැන පමණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ රටේ මහජනතාවට පොරොන්දු වුණේ, ඔවුන් බලාපොරොත්තු වන පොහොසත් ජීවිතය ලබා දීලා, ලස්සන රටක් හදලා දෙනවා කියලායි. ඒ සඳහා අපට කරන්න පුළුවන් හැම ප්‍රතිසංස්කරණයක්ම අපි කරනවා, නීත්‍යනුකූල විධියට. අන්න එහෙම සිදු කරන ප්‍රතිසංස්කරණ මාලාවේ එක් ප්‍රතිසංස්කරණයක් පමණයි, අධිකරණ ක්ෂේත්‍රය. අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදු කළාට පසුව අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස තීරණය කරන්න අවශ්‍යයි කියලා අපට දැනුණා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙනැල්ලා, අධිකරණ සංවිධාන පනතට සංශෝධනයක් ගෙනැල්ලා ඒ අවශ්‍ය ප්‍රතිසංස්කරණ අප සිදු කරනවා. හැබැයි, ඊට සමගාමීව අධ්‍යාපන ක්ෂේත්‍රයේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වාගේම ජනතාවගේ සුබසිද්ධියට අවශ්‍ය සියලු ක්ෂේත්‍රවලත් අවශ්‍ය වෙනස්කම් අප කරගෙන යනවා. එවැනි අවස්ථාවක යම් යම් ධුරවල විශ්‍රාම වයස වැඩි කිරීමේ අවශ්‍යතාවක් මතු වුණොත්, අපි රජයක් විධියට - අපි ප්‍රජාතන්ත්‍රවාදී රජයක් - ඒ සියලු කාරණා පිළිබඳව සලකා බලන්නත්, සාධනීය වෙනස්කම් සිදු කරන්නත් සූදානම් කියන කාරණය මේ සභාවට කියන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් මම මගේ කථාවට එන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ප්‍රතිසංස්කරණ මාලාව කියන්නේ එක විධියකින් ගත්තොත්, අධිකරණයේ පවතින ගැටලු රාශියක් හඳුනාගෙන, ඒ ගැටලුවලට ක්‍රමිකව විසඳුම් ලබා දෙමින් එන ගමනෙහි එක් අදියරක් පමණයි. අධිකරණ ක්ෂේත්‍රයේ මානව සම්පතෙහි ගැටලු තිබෙනවා. රජය විධියට අපි මේ වනකොට ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ වාගේම මෙහි ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනා ගැනීමේ අවශ්‍යතාවත් තිබෙනවා. ඒ හඳුනා ගත් වෙනස්කම්වලට අවශ්‍ය සාධනීය මැදිහත්වීම් අපි කර තිබෙනවා. භෞතික සංවර්ධනයේත් විශාල ගැටලු තිබෙනවා, අපේ අධිකරණ පද්ධතිය තුළ. පසුගිය කාලයේ ඒ සංවර්ධන කටයුතු විශාල වශයෙන් නැවතී තිබුණා. ඒවා නැවත ආරම්භ කර අධිකරණ පද්ධතියට අවශ්‍ය භෞතික සම්පත් ලබා දීමට අපි කටයුතු කර තිබෙනවා. එය එතැනින් නවතින්නේ නැහැ.

අපි, ඩිජිටල්කරණය ගැන කථා කරන ආණ්ඩුවක්. අධිකරණ ක්ෂේත්‍රයේ කටයුතු වඩාත් කාර්යක්ෂම කරන්න, වඩාත් වේගවත් කරන්න, අපි අධිකරණ පද්ධතියට නවීන තාක්ෂණය හඳුන්වා දෙමින් සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අධිකරණ පද්ධතියක කාර්යභාරය කියන්නේ ජනතාවගේ ප්‍රශ්න ටිකට උත්තර දෙන එක, ජනතාව අධිකරණය ඉදිරියට ගෙනෙන නඩු ටික ඉක්මනින් විසඳා දෙන එක. මේ වනකොට රටක් විධියට ගත්තොත්, අපේ රටේ අධිකරණ පද්ධතිය තුළ නඩු 1,134,000කට වැඩි ප්‍රමාණයක් ගොඩ ගැසී තිබෙනවා. අපට ඒ පිළිබඳව වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්න ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ අපි ජනතාවට පොරොන්දු වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක්" යටතේ 200වන පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "අධිකරණය මඟින් ස්වාධීනව හා කාර්යක්ෂමව යුක්තිය පසිඳලීම මෙන්ම මහජනයාට ඒ ක්‍රියාවලිය පිළිබඳව ඇති විශ්වාසයත්, නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමෙහිලා අතිශය වැදගත් වේ. නමුත් අද ලංකාවේ මෙම ක්‍රියාවලිය අධික මිල සහිත, මහජනතාවගෙන් ඈත් වූ සහ ජනතා විශ්වාස පලුදු වූවකි. ස්වාධීන, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුත් හා මහජනතාවට දැරිය හැකි අධිකරණ පද්ධතියක් ඇති කිරීමෙන් ඒ පිළිබඳව බිඳී ගිය ජනතා විශ්වාසය නැවත ගොඩනඟා ගැනීමට ජාතික ජන බලවේගය අපේක්ෂා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ උත්සාහ කරන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන් මැතිවරණ ව්‍යාපාරය පුරාවටම අපි පොරොන්දු වුණු අධිකරණ පද්ධතියක් සකස් කරන්නයි. ඒ වාගේම බිඳී ගිය ජනතා විශ්වාසය නැවත ජනතාව තුළ ඇති කර, නීතිය විශ්වාස කර අධිකරණයෙන් සහන පතන ජනතාවට නීතිය කාටත් සමානයි කියන විශ්වාසයෙන් කටයුතු කරන්න පුළුවන් අධිකරණ පද්ධතියක් ගොඩනඟන්නයි. ඒ වෙනුවෙන් තමයි අපි මේ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සරලව ගත්තොත්, නඩුවක් කියන්නේ එක් පැත්තකින් මනුස්සයෙකුගේ ජීවිතයක්. ඒ කියන්නේ, ඒක පෞද්ගලික කාරණයක් වෙන්න පුළුවන්, දේපළ හා සම්බන්ධ කාරණයක් වෙන්න පුළුවන්, ඒ කෙනා අධිකරණයට එන්නේ යුක්තිය අපේක්ෂාවෙන්. ඒ යුක්තිය ඉටුවන තෙක් ඔහුට දශක ගණනක් බලාගෙන ඉන්න වෙනවා නම්, එවැනි අධිකරණ පද්ධතියක් කෙරෙහි ඒ තැනැත්තා තුළ තිබෙන විශ්වාසය දිනෙන් දින පලුදු වනවා. එවිට මිනිස්සු අධිකරණයෙන් ඈත් වනවා. හැබැයි, අපි හදන්න ඕනෑ වේගවත්ව නඩු අහන, ජනතාව රස්තියාදු නොවන, කාර්යක්ෂම අධිකරණ පද්ධතියක්. ඒ වෙනුවෙන් තමයි අපි මේ සියලු වෙනස්කම් කරන්නේ. එක් අතකින් දේපළක් සම්බන්ධ ගැටලුවක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් චෝදනාවක් ඇවිල්ලා තමන් අධිකරණයකින්

වැරදිකාරයා වෙනවාද, නිවැරදිකාරයා වෙනවාද කියලා බලාපොරොත්තු සහගතව ඉන්න මනුස්සයෙක් මුහුණ දෙන ගැටලුවක් වෙන්න පුළුවන්, තමන්ට සිදු වෙච්ච අකටයුත්තකට යුක්තිය ඉල්ලා සිටින අවස්ථාවක් වෙන්න පුළුවන්, ඒ වාගේම රක්ෂිත බන්ධනාගාරගතව සිටින තැනැත්තෙක් හැකි ඉක්මනින් අධිකරණ ක්‍රියාවලියකින් එළියට එන්න බලාපොරොත්තු වනවා වෙන්න පුළුවන්. මේ තමයි අධිකරණ පද්ධතිය තුළින් මිනිස්සු අපේක්ෂා කරන දේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ පද්ධතිය තුළ ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් සිදු කරන්නට ඕනෑය කියා අපි හිතනවා. ඒ අනුව අපේ අධිකරණවල තිබෙන තදබදය අඩු කරන්නට නව සිවිල් අභියාචනාධිකරණ, මහාධිකරණ, සුළු හිමිකම් අධිකරණ සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩි කිරීම දක්වා වෙනස්කම් කර තිබෙනවා. ඊළඟට, පසුගිය වසර දෙක තුළ අධිකරණ ශාලා 29ක් සකස් කර අධිකරණ කටයුතු නිදහසේ, වේගවත්ව සිදු කරන්න අවශ්‍ය පසුබිම අපි හදලා දීලා තිබෙනවා. ඒ වාගේම 2025.09.12 දිනැති 2453/36 දරන අති විශේෂ ගැසට් පත්‍රය හරහා අඟුණකොළපැලැස්ස, දෙයියන්දර, බිබිල, හෙට්ටිපොල, ගල්ගමුව, ආනමඩුව, තඹුත්තේගම වැනි මහේස්ත්‍රාත් අධිකරණවලට දිස්ත්‍රික් අධිකරණ බලතල ලබා දී තිබෙනවා. මේ තුළින් අපේක්ෂා කරන්නේ කුමක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ රටේ වැඩිම නඩු ප්‍රමාණයක් ගොඩ ගැසී තිබෙන්නේ පහළ අධිකරණවලයි. ඒ නඩු ටික වේගවත්ව අහලා ජනතාව බලාපොරොත්තු වන සාධාරණය ඉෂ්ට කරන්නයි අපි මේ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ ක්ෂේත්‍රයේ මානව සම්පතේ පුරප්පාඩු තිබුණා. අපේ රජය බලයට එනකොට පුරප්පාඩු 6,000කට වැඩි ප්‍රමාණයක් තිබුණා. මේ වනකොට ඒ සඳහා බඳවා ගැනීම් සිදු කරන්න අධිකරණ අමාත්‍යාංශය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට අවශ්‍ය සහයෝගය ලබා දෙමින්, ඒ සියලු කටයුතු සිද්ධ කරමින් ඉන්නවා. මෙහි අවශ්‍යතාව වන්නේ, මානව සම්පතේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම තුළින් අධිකරණවල කාර්යභාරය වඩාත් සාර්ථක ලෙස ඉටු කිරීමයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)
ඔබතුමාගෙන් තව පොඩි වේලාවක් මා ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි රජයක් විධියට අවුරුදු දෙකක බොහොම පොඩි පාලන කාලයක් තමයි තවම අවසන් කරලා තිබෙන්නේ. ඒ කාල සීමාව තුළදී ගෝලීය නීතියේ ආධිපත්‍යය දර්ශකයට අනුව අපි 75වන ස්ථානයේ සිට 74වන ස්ථානය දක්වා ඇවිල්ලා තිබෙනවා; ලෝක දූෂණ සංජානන දර්ශකයට අනුව 121වන ස්ථානයේ සිට 107වන ස්ථානය දක්වා ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව අපි ගුණාත්මකභාවයෙන් ඉහළට එමින් සිටිනවා. ඒ වාගේම මූලික අයිතිවාසිකම් දර්ශකයට අනුව අපි 86වන ස්ථානයේ සිට 85වන ස්ථානය දක්වා ඇවිල්ලා තිබෙනවා; සිවිල් යුක්ති දර්ශකයට අනුව 103වන ස්ථානයේ සිට 100වන ස්ථානය දක්වා අපි ඇවිල්ලා තිබෙනවා. ඒ තමයි පසුගිය කාල සීමාව ඇතුළත අප සිදු කළ ප්‍රතිසංස්කරණ හරහා ලැබුණු ගුණාත්මක තත්ත්වයන්. ඒ තත්ත්වයන් තවදුරටත් ඉදිරියට ගෙනයමින්, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන පොහොසත් රටක් ලබා දෙන්නට, එහෙම නැත්නම් පොහොසත් ජීවිතයක් හදා දෙන්නට රජයක් විධියට අපි අවශ්‍ය සියලු කැපකිරීම් කරනවාය කියන පණිවුඩය ලබා දෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, කාලය ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.11]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ පැවැත්වෙන්නේ, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි දෙවන සංශෝධනය පිළිබඳව වන විවාදයයි. මේ රටේ මැලිමාවට 159ක බහුතර පාර්ලිමේන්තු බලයක් දීලා, ජනාධිපතිවරයෙක් දීලා රටේ ජනතාව මොනවාද බලාපොරොත්තු වුණේ? තමුන්නාන්සේලාගේම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා, සම්පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන. ඒ, අපි කියපු ඒවා නොවෙයි, තමුන්නාන්සේලා කියපු ඒවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කියලා. ඉන්නකල් තමුන්නාන්සේලා බැන්නා නේ, හැම ජනාධිපතිටම. කොයි එක්කෙනාටවත් නොබැණ හිටියේ නැහැ නේ. එහෙම නම් විධායක ජනාධිපති ක්‍රමය හොඳ නැහැ, ඒ නිසා එය අහෝසි කරනවාය කියන එකට තමයි ජනතාව ඔබට ඡන්දය දුන්නේ. එතකොට මිනිස්සු බලාපොරොත්තු වුණා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අද දවස වනකොට මෙතැනට එයි කියලා. හැබැයි, ඒක නොවෙයි ආවේ. ඒක හරියට මොකක් වාගේද?

දැන් වාගේ ඉස්සර අපේ ගම්වල ඉස්පිරිතාල තිබුණේ නැහැ නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සර දරුවෙක් හම්බ වෙන්න ඉන්නකොට ගෙදරට ආවේ වින්නඹු අම්මා. එහෙම වින්නඹු අම්මා ගෙදරට ආවේ දරුවා ගන්න. මේ මාලිමාවට ඡන්දය දීපු මිනිසුන්ටත් වින්නඹු අම්මාට වෙච්ච දේ තමයි වෙලා තිබෙන්නේ. මොකක්ද, වින්නඹු අම්මාට වෙච්ච දේ? වින්නඹු අම්මා දරුවා ගන්න ගියාම එන ඕනෑ දෙයක් භාර ගන්න ඕනෑ. ඇය අත් දෙකෙන් දරුවා ගන්න තමයි යන්නේ. හැබැයි, ඒක හරි අමාරු කාර්යයක් නේ. ඉතින් සමහර වෙලාවට ඒ අම්මා දරුවා එළියට දෙන්න හදනකොට එන්නේ දරුවා නොවෙන්නත් පුළුවන්. වින්නඹු අම්මාගේ අතට අසූචි එන්නත් පුළුවන්. ඒක තමයි ගමේ වින්නඹු අම්මාට වුණේ. බලාපොරොත්තුවෙන් හිටියේ දරුවා වුණාට, ආවේ අසූචි. ඉතින් ඒ වාගේ තමයි මේකත්. බලාපොරොත්තුවෙන් හිටියේ මොකක්ද? බලාපොරොත්තුවෙන් හිටියේ එකක්, හම්බ වුණේ වෙන එකක්. මේක නොවෙයි මිනිස්සු බලාපොරොත්තුවෙන් හිටියේ. ඒක මතක තියාගන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බලන්න, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දිහා. අධිකරණය ස්වාධීන වෙන්න ඕනෑ. ඒක වෙන්න ඕනෑ දෙයක්. ආණ්ඩු එනවා, යනවා. ජනාධිපතිවරුනුත් එනවා, ඒ වාගේම කැබිනට් මණ්ඩලත් එනවා. හැබැයි, ආවා වාගේම ආණ්ඩු යනවා. කවුරු හරි හිතනවා නම් මේක එහෙම පිටින්ම වෙනස් කරන්න බැරි ආණ්ඩුවක් කියලා, ඒක බොරුවක්;

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

අමූලික බොරුවක්. ආණ්ඩු වෙනස් වනවා. ඉස්සර නම් අවුරුදු පහයි. දැන් පහත් නැහැ. මොකද, අපට අත්දැකීම් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් හිටපු අය හැටියට අපි දන්නවා, ආණ්ඩු වෙනස් වන විධිය. ඒ නිසායි අපි මේවා කියන්නේ. අද වෙන දේත් දැන් කියන්නම්. අද හවස මේ පනත් කෙටුම්පත් සඳහා ඡන්දය ගන්නවා. ලාල් කාන්ත ඇමතිතුමා, අද හවස ඡන්දය ගන්නවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වනවා. මේක කියන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඒක සම්මත වනවා. මේ ඉන්න 158දෙනා ඡන්දය දුන්නාම ඒක සම්මත වනවා. හැබැයි, ඒකට කියන්නේ මොකක්ද? බලය. ඔබතුමන්ලාට ජනතාව බලයක් දීලා තිබෙනවා. ඒ බලයෙන් මේක සම්මත කර ගන්නවා.

මම හොඳ කථාවක් කියන්නම්. මොකක්ද දන්නවාද? බලය ලැබුණාම, සමහර වෙලාවට අපි ඒ බලය අයුතු විධියට පාවිච්චි කරනවා; අපි බලයෙන් මත් වනවා; බලයෙන් අපේ ඔළුව ඉදිමෙනවා. එහෙම වුණාම බලය තුළ නොයෙක් නොයෙක් දේවල් ක්‍රියාත්මක කරනවා. මේ, ඉතිහාසයේ මේ රටේ සිදු වෙච්ච දේවල්. අපි කියනවා නේ, ආත්ම ගණනක ඒවා තමයි පඩිසන් දෙන්නේ කියලා. නමුත් එහෙම නැහැ. මීට කලින් මේ බලය පාවිච්චි වෙච්ච විධිය තමුන්නාන්සේලා මතක් කරලා බලන්න.

ඔබතුමන්ලාට මතක ඇති, ජනතා විමුක්ති පෙරමුණ 1988-89 කාලයේ මහා ප්‍රබල විධියට රට තුළ අණසක පතුරපු බව. දකුණේ විතරක් නොවෙයි, හැම තැනකම ඔබතුමන්ලාගේ අණසක පැතිරුවා. කොහොමද ඒ අණසක පැතිරුවේ? එක තුණ්ඩු කෑල්ලයි දාන්නේ. ලයිට් නිවන්න කියපු ගමන්ම මිනිස්සු ලයිට් ටික නිවනවා. ඊට පස්සේ මිනිස්සුන්ට වැඩට යන්න එපා කියනවා. එතකොට මිනිස්සු වැඩට යන්නේ නැහැ. ඒ කාලයේ මේ තත්ත්වය තිබුණා. ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණට ආණ්ඩුවකට වැඩිය බලය තිබුණා. ඒ වෙලාවේ ඒගොල්ලන් මොකක්ද කළේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගමේ හිටපු පොලිස්කාරයාව, ගමේ හිටපු ග්‍රාම සේවක මහත්මයාව, තව අයව මැරුවා. ඒවා කළේ කවුද? ඒවා කළේ ජනතා විමුක්ති පෙරමුණේ යම් යම් අය. සමහර අය එහෙම නොකළා වෙන්න පුළුවන්, සමහර අය එහෙම කළා වෙන්න පුළුවන්. කොහොම හරි ඒ අයව මැරුවා.

ඊට පස්සේ මොකක්ද වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඊට පස්සේ සිද්ධ වුණේ ඒ බලය පාවිච්චි කරපු අයට විරුද්ධව ආණ්ඩුව සන්නද්ධ වීම. ඒ වෙලාවේ ආණ්ඩුව සන්නද්ධ වුණා. ආණ්ඩුව සන්නද්ධ වෙලා මොකක්ද කළේ? දිගට හරහට මැරුවා. මේ රටේ තරුණයෝ 60,000ක් මැරුවා. ජේවීපී කරපු එකාවත් මැරුවා, නැති එකාවත් මැරුවා, පාරේ යනකොට ඇදගෙන ගිහිල්ලා ටයර් එකක් දාලා මැරුවා. එහෙම මරන්න කියලා හිටපු නායකයින්ගෙන් යම් යම් අය - මම කාටවත් දොස් කියන්නේ නැහැ - උදව් කළා නම් ඒ නායකයොත් මැරුණා. මොකද, ඒකත් බලය. ජනතා විමුක්ති පෙරමුණ තමන්ට බලය තිබිලා මිනිස්සු මැරුවා. ඒකට සහාය දුන් රජය නියෝජනය කරන දේශපාලන නායකයෝ හිටියා නම් ඒගොල්ලොත් මැරුණා. ඒගොල්ලන් විතරක් නොවෙයි, යුද හමුදාවේ කොටසකුත්, නාවික හමුදාවේ යම් යම් කොටසුත්, පොලීසියේ යම් යම් කොටසුත් අයුතු විධියට එදා මේ රටේ තරුණයෝ මරන්න දායක වුණා. ඒ අයට මොකද වුණේ? ඒ අය මෙහේ මරලා යාපනේට ගියා. ඊට පස්සේ ඒ අයට මොකද වුණේ? ඒ අය බලය අයුතු විධියට පාවිච්චි කිරීම නිසා එල්ටීටීඊ එකෙන් ඒ අයවත් මැරුවා. ඊට පස්සේ මොකක්ද වුණේ? ආපහු හමුදාවෙන් එල්ටීටීඊ එකේ අයව මැරුවා. මතක තියාගන්න, බලය අයුතු විධියට පාවිච්චි කිරීම නීතියේ රැහැනට හසු නොවුණත්, දිට්ඨධම්ම වේදනීය කර්මය අනුව ඒකට පඩිසන් දෙනවා. ඔබේ චේතනාව අනුව මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් බලාපොරොත්තු වන්නේ, ඔබ හිතන්නේ වෙනත් දෙයක් නම් ඒ සඳහා මේ බලය අයුතු විධියට පාවිච්චි කරන්න එපා. ආණ්ඩුවට මිනිස්සු බලය දීලා තිබෙන්නේ අවුරුදු 5කටයි. ඒකෙන් පස්සේ දිට්ඨධම්ම වේදනීය කර්මය වාගේ මේවා පිටිපස්සෙන් එනවා කියන එක හොඳට මතක තියාගන්න. අපි ආණ්ඩු කරපු අය, තුනෙන් දෙකක බලයක් තිබිච්ච අය. හැබැයි ආණ්ඩුවෙන් ගැලවිලා යනකොට බුරුතු පිටින් යන්නේ; පරාජය වනකොට බුරුතු පිටින් යන්නේ. ඒවා එන්නේ නිකම් නොවෙයි තොගයට එන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ඒක ගැන අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මේ රටේ නඩු 1,130,000ක් පමණ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්නේ මොකටද? ඒක ගෙනෙන්නේ මේ නඩු ටික ඉක්මනට ඉවර කරන්නලු. අන්න හොඳයි. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට අපට වරප්‍රසාදයක් තිබෙනවා, මේ වන විට කොපමණ නඩු සංඛ්‍යාවක් තිබේද, ඒ නඩු මොනවාද කියලා විෂය භාර ඇමතිවරයාගෙන් අහන්න. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහෙස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණය යන අධිකරණවලින් අපට ඒක අහන්න පුළුවන්. ඒවායෙන් අපි ඒවා ගැන අහනවා, අද සම්මත කරගන්න විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පින් සිද්ධ වෙන්න. ඊට පස්සේ 2027 සැප්තැම්බර් මාසයේ 25වැනි දාට විෂය භාර - අධිකරණ - ඇමතිතුමාගෙන් අපි නැවත ප්‍රශ්නයක් අහනවා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අධිකරණවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ කාලය දීර්ඝ කිරීම තුළින් මේ වන විට අඩු වෙච්ච නඩු ප්‍රමාණය කීයද කියලා. ඒ අනුව නඩු අඩු වෙලා තිබෙනවා නම් තමුන්නාන්සේලා දිනුම්, මේකට වැරදියි කියපු අපි පරාදයි. හැබැයි ඒක පොළොවේ පැළ කරන්න අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ කාලය විතරක් නොවෙයි වැඩි කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙනම් ඉතින් අධිකරණ පද්ධතියේ ඉන්න ඔක්කෝගේම විශ්‍රාම කාලය වැඩි කරන්න එපායැ. අධිකරණවල ඉන්න තෝල්ක මහත්මයාගේ විශ්‍රාම යෑමේ වයසත් වැඩි කරන්න ඕනෑ, රෙජිස්ට්‍රාර්ගේ විශ්‍රාම යෑමේ වයසත් වැඩි කරන්න ඕනෑ, ලිපිකරුවන්ගේ විශ්‍රාම යෑමේ වයසත් වැඩි කරන්න ඕනෑ. මේ ඔක්කෝම අය අධිකරණයට සම්බන්ධයි. විනිසුරුතුමා විතරක් නොවෙයි නේ, අධිකරණය කියන්නේ. ඒ නිසා මේක ප්‍රායෝගිකව පොළොවේ පැළ කරන්න කියලා අපි කියනවා. පුළුවන් නම් තමුන්නාන්සේලා ඒක කරන්න. අපි බලමු, ඒ තිබෙන නඩු ප්‍රමාණය අඩු වෙනවාද කියන එක. ඉදිරියේදී අපට ඒක බලාගන්න පුළුවන්කමක් ඇති වෙයි.
ඒ වාගේම තමයි තමුන්නාන්සේලා දන්නවා, මේකට නීතිඥ සංගමය සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියලා. තමුන්නාන්සේලාගේ කථිකයෝ ඒ, ඒ නීතිඥ මහත්තුරුන්ට නරක විධියට කථා කරනවා අපි දැක්කා. නමුත් ඔවුන් කරන්නේ ගෞරවාන්විත සේවයක්. මේ රටේ ඉන්න සමස්ත නීතිඥවරු ඉතා ගෞරවාන්විත සේවයක් කරන අය. හොඳ උගත්, බුද්ධිමත් නීතිඥ මහත්තුරු අපේ රටේ ඉන්නේ. නීතිඥ සංගමයේ ඉන්න මේ නීතිඥ මහත්තුරුන්ට එක එක දේශපාලන පක්ෂ තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ කළු කබායට දේශපාලන පක්ෂයක් අදාළ නැහැ. ඔවුන් අධිකරණය තුළදී ඔවුන්ගේ රාජකාරිය කරනවා. නමුත් තමුන්නාන්සේලා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැල්ලා කළේ මොකක්ද කියන එකයි මම අහන්නේ. හරියට රේල් පාර වාගේ. එක පැත්තක් අධිකරණය. අනෙක් පැත්ත නීතිඥ සංගමය. මේ දෙගොල්ලන් විරසක කරලා අධිකරණය ස්වාධීන කරන්නයි යන්නේ. මේ දෙගොල්ලන් විරසක කරන්න එපා. අද ඒවා තමුන්නාන්සේලාට පෙනෙනවා.

අද "ලංකාදීප" පුවත් පත වාර්තා කර තිබෙනවා, "මාස 5ට කෝටි පහළොස්දාහක රන් බඩු උකස් කරලා" කියලා. රන් බඩු කෝටි පහළොස්දාහක, මාස පහයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් තමයි ඔබතුමන්ලා හදන්න යන්නේ. මේවා අපි කියන ඒවාද? මේවා මහ බැංකුව කියන ඒවා. තමුන්නාන්සේලාගේ යටතේ තිබෙන මහ බැංකුවෙන් මේවා කියන්නේ. මේ රත්‍රන් බඩු බැංකුවට තියලා තිබෙන්නේ ගෙදර තියා ගන්න බැරි නිසාද? ගෙදර තිබුණොත් හොරකම් කරගෙන යන නිසාද මේවා බැංකුවට තියලා තිබෙන්නේ? නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. දැන් පොහොසත් රට හැදිලා. පොහොසත් රට හැදුණු බව මේකෙන් පෙනෙනවා. පොහොසත් රට නොවෙයි, මිනිස්සු කනවා නොවෙයි, ලෙව කනවා, උලා කනවා. මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. මතක තියා ගන්න, මේ මාස පහ කියලා කියන්නේ, දෙසැම්බර් මාසය අයිති වෙලා නැහැ. සිංහල අවුරුද්ද අයිති වෙලාත් නැහැ. සාමාන්‍යයෙන් නත්තල් කාලයට ඒක සමරන්න ජනතාව රත්‍රන් බඩු උගස් තියනවා. සිංහල අවුරුද්දට රත්‍රන් බඩු උගස් තියනවා. මේ උගස් තියලා තිබෙන්නේ මොනවාටද? ජීවත් වෙන්න, බඩගින්න නිවා ගන්න. මේකයි ඇත්ත කථාව. හැබැයි, නමට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාව මේ ප්‍රශ්න නිසා ආතතියෙන් ඉන්නේ. මානසික ආතතියෙන් ඉන්න වෙලාවට කරන්න තිබෙන්නේ එකම දෙයයි. ඒක තමයි, සින්දුවක් අහන එක. විනාශ වෙලා නේ ඔක්කොම. ලයිට් බිල ගෙවන්න විධියක් නැහැ. පෙට්‍රල් ගහ ගන්න විධියක් නැහැ. ජීවත් වෙන්න විධියක් නැහැ. දරුවන්ට ඉස්කෝලේ පොත් ටික අරගෙන දෙන්න විධියක් නැහැ. මේ හේතු නිසා ආතතියෙන් ඉන්නකොට අඩුම ගණනේ මිනිස්සුන්ට දැන් සින්දුවක්වත් අහන්න විධියක් නැහැ. JBL එකක් දමාගෙන සින්දුවක් කියන්න බැහැ. කිව්වොත්, විනාශයි. ඒකටත් බදු ගහලා තිබෙනවා. මේක නොවෙයි වෙන්න ඕනෑ. පොළොවේ පය ගහන්න ඕනෑ, ආණ්ඩුව. පොළොවේ ඇත්ත තත්ත්වය දකින්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් දෙන්න.

දැන් මට පෙනෙන විධියට කොහොමත් ඉස්සරහට උසාවි වැඩි කරන්න වෙයි. මොකද, මිනිස්සුන්ට ආතතිය වැඩි වෙනකොට ඒ අය නොයෙක් වැරදි වැඩ කරයි. දැන් ගෙදර ඉන්න බල්ලාටත් බද්ද ගහන්න නේ හදන්නේ. අපි හිතුවේ නැහැ නේ, බල්ලාටත් මෙච්චර විනාශයක් වෙයි කියලා. ගෙදර බත් කකා ඉන්න බල්ලාටත් දැන් බදු ගහනවා. ඒ බදු ගහනකොට වෙන්නේ මොකක්ද? අනිවාර්යයෙන්ම මිනිස්සුන්ගේ ආතතිය වැඩි වනවා.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොවෙයි, රටේ තිබෙන ප්‍රශ්නය. රටේ තිබෙන ආර්ථිකය හදන්න. මිනිස්සුන්ව ජීවත් කරවන්න නම්, මිනිස්සුන්ට දෙපයින් නැඟිටලා ඉන්න පුළුවන් රටක් හදලා දෙන්න කියන එකයි අපි යෝජනා කරන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, I would like to bring Standing Order No. 91(g), (h) and (j) to your kind consideration.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 23වැනි දා හවස 5.00ට අපේ ධීවර ඇමතිතුමා මට තිත්ත කුණුහරුපෙන් බැණපු දේවල් සටහන් වුණු ඒ හැන්සාඩ් වාර්තාව තිබෙනවා. මම එදා ඒක ඉල්ලා අස්කර ගන්න කියලා ඉල්ලන්න හැදුවා. හැබැයි, මට එදා ඒක ඉල්ලා අස්කර ගන්න කියලා කියන්න chance එකක් ලැබුණේ නැහැ. මම කියන්න කැමතියි, මට "තමුසේ, තමුසේ" කියලා ආයේ ආයේ බැන්න බව. ඒ වචන ඉල්ලා අස් කර ගන්න කියනවා. ඊට පස්සේ "එළියට එන්න, මම බලා ගන්නම්" කියලා මට තර්ජනයක් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම එළියට ගියා. හැබැයි, මොකුත් වුණේ නැහැ. එතුමා තිලිපන් සමරන්න ගියේ කොහොමද කියලා පින්තූරයක් පෙන්වන්න කිව්වා. ඒ පින්තූරය මම පෙන්නුවා. මේ වාගේම පින්තූරයක් මම එළියේදීත් පෙන්වලා තිබෙන්නේ. ඒ නිසා මට Privilege එකක් raise කරන්න දෙන්න, next Parliament Sitting එකේදී, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, you could raise a matter of Privilege with the Hon. Speaker.

Next, the Hon. (Dr.) Susil Ranasinghe. You have 13 minutes.

[අ.භා. 1.24]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ සජබයේ මන්ත්‍රීතුමෙක් අද පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා කිව්ව දෙයක් අද social mediaවල තිබෙනවා. ඒ තමයි, "අද ප්‍රජාතන්ත්‍රවාදයේ මළගමට යන්න යන්නේ. අපි අද පාර්ලිමේන්තුවට සහභාගි වෙන්නේ කළු ඇඳ ගෙන" කියන එක. මාර වැඩක් වෙලා තිබෙන්නේ. සමහර කට්ටියට මළ ගෙදර කියන්න අමතක වෙලා. අපි දැක්කා, සමහර කට්ටිය කුමාරවරු වාගේ ඇඳගෙන ඇවිල්ලා ඉන්නවා, මළ ගෙදර කියන්න අමතක වෙලා. "අනේ කාලේ, වනේ වාසේ" කිව්වාලු. ඊයේ උද්ඝෝෂණය අංක එක. ඒකේම අංක දෙක තමයි, අද මේ කළු පාට ඇඳුම් ඇඳගෙන කරන විරෝධය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔක්කෝම ඇඳගෙන ඇවිල්ලා නැද්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
බලන්න, ඔක්කෝම කළු ඇඳුම් ඇඳගෙනද ඇවිල්ලා තිබෙන්නේ කියලා. මෙහෙමයි. රටේ ජනතාව නොවෙයි, ඔබතුමන්ලාගේ ළඟ ඉන්න පාක්ෂිකයන්වත් ඔහොම රවටන්න එපා, පව්. එහෙම දේශපාලනය කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු ඊයේ ඉඳලා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට විරුද්ධව කථා කරනවා; සිංහ ගර්ජන කරනවා. නමුත්, ඒ කථා, ඒ සිංහ ගර්ජන පිටුපස ඔබතුමාට අඳෝනාවක් ඇහෙනවාද? අපට ඇහෙනවා. සාමාන්‍ය ජනතාවටත් එය ඇහෙනවා ඇති කියා අපි හිතනවා. ඒ කථා පිටුපස වේදනාවක් ඇහෙනවාද? අපි හිතනවා, වේදනාව ඇහෙනවා කියලා. මීට සුළු මොහොතකට ඉස්සෙල්ලාත් එහෙම නේ ඇහුණේ. ඒ කථාව ඇතුළේ ඇති වේදනාව හොඳටම දැනෙනවා. ඒ වේදනාව මොකක් නිසාද කියා දන්නවාද? මෙතුමන්ලා කැමති නැහැ, නීතිය ශක්තිමත් වෙනවාට, නීතිය පසිඳලනවාට, නීතිය ක්‍රියාත්මක කරන ආයතන හරිහැටි ක්‍රියාත්මක වනවාට. අපේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍යය ක්‍රියාත්මක වෙනවාට මෙතුමන්ලා කැමති නැහැ. ඇයි, ඒ? දැන් පාර්ලිමේන්තුවේ සුලබව කථා වන අය ඉන්නවා නේ. ඒ අයගෙන් කොටසක් සැකපිට ඉන්නවා, කොටසක් ඇපපිට ඉන්නවා. ඒ බොහෝ දෙනෙකුගේ කිල්ලෝටවල හුනු තිබෙනවා. එම නිසා නීතිය ශක්තිමත් වෙනවාට කැමති වෙයිද? කැමැති වෙන්නේ නැහැ. එම නිසා මේකට වෙන කථාවක් ආරූඪ කරගෙන, මේ එන්නේ උසාවියට අත තියන්න, මේ එන්නේ අපේ අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය නැති කරන්න වැනි දේවල් කියන්න පටන් අරගෙන තිබෙනවා. මෙතුමන්ලාගේ මුළු දේශපාලනයම, දේශපාලන සංස්කෘතියම, මුළු දේශපාලන ක්‍රියාදාමයම නීතියට පටහැනියි. ඔය කළු ඇඳගෙන ඉන්න, කළු අඳින්න අමතක වෙච්ච, කළු අඳින එක ප්‍රතික්ෂේප කළ, මේ නිල් ඇඳගෙන ඉන්න සහ සුදු ඇඳගෙන කළු චරිතය වහගෙන ඉන්න ඒ හැමෝගේම දේශපාලනය නීතියට පටහැනියි.

අපි උදාහරණයකට ගනිමුකෝ, ඒ අය මැතිවරණ කරන්නේ කොහොමද කියන එක. මැතිවරණ කාලයට ඒ අය ඒවා කරන්නේ කොහොමද? බඩු බෙදනවා, බොන්න දෙනවා, කන්න දෙනවා, සල්ලි දෙනවා. එහෙම තමයි මැතිවරණ කරන්නේ. වටේ ඉන්න ක්‍රියාකාරිකයෝ කොහොමද තියාගෙන ඉන්නේ? ඒ කට්ටියට, මෙන්න මේ දේශපාලන න්‍යාය මත අපි මෙන්න මෙහෙමයි රට වෙනස් කරන්න ඕනෑ කියලා දේශපාලන ප්‍රතිපත්තිය පැහැදිලි කරනවාද? එහෙම නැහැ. දෙන වරදාන, වරප්‍රසාද ගැන, අනීතික දේවල් ටික ගැන තමයි පැහැදිලි කරන්නේ. නීතිය හරියට ක්‍රියාත්මක වෙන්න ගත්තොත් මොකද වෙන්නේ? නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු වුණොත් මොකද වෙන්නේ? එතකොට එතුමන්ලාගේ දේශපාලනය කරගෙන යන්න බැහැ. මැතිවරණයක්වත් කරන්න බැහැ. මැතිවරණය දිනලා මොනවාද කළේ? මැතිවරණය දිනලා ඒ බලය පාවිච්චි කරලා, බලයෙන් ඉදිමිලා, බලයෙන් වැජඹිලා නීතියට පටහැනි දේවල් තමයි කරන්නේ. කෝටි ප්‍රකෝටි ගණනක විශාල මුදලක් වියදම් කරනවා, පාර්ලිමේන්තුවට එන්න. ප්‍රාදේශීය සභාවට යන්නත් එහෙමයි. මෙතුමන්ලාගේ හැම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්ම ප්‍රාදේශීය සභාවට යන්නත් කෝටි ගණනක් වියදම් කරනවා. මන්ත්‍රීකම හම්බ වුණාට පස්සේ, බලයට ආවාට පස්සේ ඒ සල්ලි හොයන්න ඕනෑ. ඒ සඳහා කොන්ත්‍රාත් ගන්න ඕනෑ, කොමිස් ගන්න ඕනෑ, අල්ලස් ගන්න ඕනෑ. තමන්ගේ වටේ ඉන්න කට්ටිය නඩත්තු කරන්න ඒ කට්ටියටත් පොඩ්ඩක් කන්න, බොන්න දෙන්න ඕනෑ. ඒ කට්ටියටත් මේවායෙන් කීයක් හරි හම්බ කර ගන්න අවස්ථාව දෙන්න ඕනෑ. දැන් ඒවා කරලා තිබෙන්නේ. ඒක තමයි ඒ කට්ටියගේ විධිය. එහෙම කරපු කට්ටිය දැන් ඉන්නේ අබ කැව කවුද වාගේයි. ඒවා කළ බව දන්නවා. හෘදය සාක්ෂිය ඒ ගැන දන්නවා. සිංහ ගෝරනාඩු කළාට යටින් ඒ අඳෝනාව ඇහෙනවා. එම නිසා මෙතුමන්ලාගේ සම්පූර්ණ දේශපාලන සංස්කෘතියට නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන එක ප්‍රශ්නයක්. එම නිසා විරුද්ධ වෙන්න ඕනෑ තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියත් කිව්වා, අපේ රටේ දූෂණය ඉහවහා ගිහින් තිබෙන බව. දූෂණය පිළිලයක් වාගේ හැම තැනකටම පැතිර ගිහින් තිබෙන්නේ. එහි වගඋත්තරකරුවෝ කවුද? ඔය ඉන්නේ වගඋත්තරකරුවෝ. ආණ්ඩු කරපු, නොකරපු, ආණ්ඩුවලට උදවු කරපු හැමෝම ඒකට වග කියන්න ඕනෑ.

2020දී ලෝක බැංකුවෙන් වාර්තාවක් එළිදක්වා තිබෙනවා, ලෝකයේ කොහොමද මේ දූෂණය කියන කාරණය මහා ව්‍යසනයක් වෙලා තිබෙන්නේ කියලා. කාල වේලාව සීමිත නිසා මට මෙය කියවන්න වෙලාවක් නැහැ. දූෂණය නිසා රටවල් නැත්තටම නැති වෙලා තිබෙන්නේ. මහජන මුදල් නාස්ති වෙලා තිබෙන්නේ. මිනිසුන්ට සංවර්ධනය ගැන ලියන්න බැරි වෙලා තිබෙන්නේ. මිනිසුන්ට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් තිබෙන විශ්වාසය සම්පූර්ණයෙන් දූෂණය නිසා බිඳ වැටිලා තිබෙන්නේ. එම නිසා ලෝකයේ රටවල් ගොඩක් අද විශාල පරිශ්‍රමයක් දරනවා වාගේම ඔවුන් ලොකු fight එකක් දෙනවා, ඔවුන්ගේ රටවලින් දූෂණය නැති කරන්න. ලෝකයේ රටවල දූෂණයේ මට්ටම මැනීමේ, රටවල් වර්ගීකරණය කිරීමේ සහ රටවල් ශ්‍රේණිගත කිරීමේ ජාත්‍යන්තර දර්ශක ගොඩක් තිබෙනවා.

Transparency International විසින් ලෝකයේ රටවල් 182ක් සම්බන්ධයෙන් සලකා බලා නිකුත් කර තිබෙන දර්ශකය අනුව රටවල් 122ක්ම තිබෙන්නේ ඉතා නරක තැනක; දූෂණය වැඩියි. ඒක ව්‍යසනයක් වෙලා. ඒ දර්ශකයට අනුව, හොඳයි කියන පැත්තේ තිබෙන්නේ රටවල් පහයි; හොඳයි කියන කොටසට වැටිලා තිබෙන්නේ රටවල් පහයි. හොඳම රටවල් නැහැ. දූෂණය නැති, සුපිරිසිදු, හොඳම රටවල් නැහැ. ඒක තමයි ලෝකයේ තත්ත්වය. අපේ රටත් තිබෙන්නේ නරකම කියන ගොඩේ. නමුත් අපි බලයට ඇවිල්ලා ගෙවුණු අවුරුදු දෙකහමාර ඇතුළත අපේ රට ස්ථාන 14කින් උඩට ගිහිල්ලා තිබෙනවා. ඇයි? දූෂණය පිටුදැකීමට අපි කරපු වැඩසටහන් නිසා, අපි ගත්ත ක්‍රියාමාර්ග නිසා. අපේ රට හදනවා නම්, අපේ රට ඉස්සරහට අරගෙන යනවා නම් දූෂණය පිටුදකින්න ඕනෑ, ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. මම ඉස්සෙල්ලා කියපු ලෝක බැංකු වාර්තාවේම කියා තිබෙනවා, ඒ සඳහා ගන්න ඕනෑ ක්‍රියාමාර්ග මොනවාද කියලා. පළමුවැනි එක මොකක්ද? දේශපාලන නායකත්වය - political leadership - තමයි පළමුවැනි එක. මොන වාගේ දේශපාලන නායකත්වයක්ද ඕනෑ? මෙතුමන්ලාගේ වාගේ දේශපාලන නායකත්වයක්ද ඕනෑ? නැහැ. එතුමන්ලාට ඒක කරන්න බැහැ. දූෂණය පිටු දකිනවා නම් ජාතික ජන බලවේගයේ වාගේ නායකත්වයක් තමයි ඕනෑ. ඇයි ඒ?

මට මතකයි, අපේ ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා මාධ්‍ය නාළිකාවක සාකච්ඡාවකට ගියාම නිවේදකයා ඇහුවා, ඔබතුමා හොරකම නවත්වන්නේ කොහොමද කියලා. අනුර කුමාර දිසානායක මැතිතුමා එදා කිව්වේ, මම ඉස්සෙල්ලාම

හොරකම නවත්වනවා, මම හොරකම නවත්වලා පෙන්වනවා කියලායි. ඒක තමයි පළමුවැනි එක, ආදර්ශය. ජනාධිපතිතුමා විතරක් නොවෙයි, අගමැතිතුමිය, අපේ අමාත්‍ය මණ්ඩලය ප්‍රමුඛ පාර්ලිමේන්තුවේ 159දෙනකු ඉන්නවා. ඒ වාගේම අපට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 4,000කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. අපි ආයතනවලට සභාපතිවරුන්, අධ්‍යක්ෂ මණ්ඩල පත් කරලා තිබෙනවා. අපේ අමාත්‍ය කාර්යාලවලට, නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලවලට, මන්ත්‍රී කාර්ය මණ්ඩලවලට දහස් ගාණක් පත් කරලා තිබෙනවා. අල්ලස් ගත්ත කෙනෙක් ගැන ආරංචියක් තිබෙනවාද? අල්ලස් ගත්ත කෙනෙක් ගැන චෝදනාවක් තිබෙනවාද? නැහැ. එක්කෙනෙකුට, දෙන්නෙකුට අල්ලස් නොගෙන ඉන්න පුළුවන්. සියදහසක් දෙනෙක් මේ ආදර්ශය දෙන්නේ කොහොමද? තනතුරු දරන අය විතරක් නොවෙයි, අපේ ගමේ තනතුරු නැතිව, පඩි නැතිව ස්වේච්ඡාවෙන් දේශපාලනය කරන කෙනාට පවා චෝදනා නැහැ නේ. ඇමතිතුමාට කියලා රස්සාවක් අරගෙන දෙනවා කියලා පගා අරගෙන තිබෙනවාද? වැලි පර්මිට් එක අරගෙන දෙන්නම්, බොරලු පර්මිට් එක අරගෙන දෙන්නම් කියලා පගාව අරගෙන තිබෙනවාද? නැහැ, අරගෙන නැහැ. ඒ විධියට කටයුතු කරන්න බැහැ වෙන කාටවත්. ඒ ආදර්ශය දෙන්න පුළුවන් ජාතික ජන බලවේගයට විතරයි. අපි ඒ ආදර්ශය දීලා තිබෙනවා. ඒ නිසා පළමුවැනි එක, ආදර්ශය. අපි නීතියට ගරු කරන, නීතියට යටත් ඉන්න, නීතිය අගයන, තිබෙන නීති පද්ධතිය මත වැඩකටයුතු කරන දේශපාලන පක්ෂයක්; ඒ ආදර්ශය දීලා තිබෙනවා.

දෙවැනි එක මොකක්ද? දූෂණය සඳහා පෙලඹීම අඩු කරන්න ඕනෑ. ඒකට පෙලඹෙන්න දෙන්න හොඳ නැහැ. ඒකට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගොඩක් තිබෙනවා. පළමුවැනි එක තමයි, ඒ සඳහා ජනතා බලයක් ගොඩ නඟන්න ඕනෑ. ඒක නීතියෙන්ම විතරක් කරන්න බැහැ. ඒකට මිනිස්සු එකතු වෙන්න ඕනෑ. අද රටේ මොකක්ද වෙලා තිබෙන්නේ? දූෂණයට විරුද්ධව, දූෂණය පිටුදකින්න, දූෂණයට පෙලඹීම නැති කරන්න මිනිස්සු එකතු වෙලා තිබෙනවා. ඒකට අපේ අය විතරක් නොවෙයි, මෙතුමන්ලාට ඡන්දය දුන්න කට්ටියත් ඇවිල්ලා තිබෙන්නේ. ඒ කට්ටියත් ඒක අගය කරනවා.

ඊයේ උද්ඝෝෂණයේදී මොකක්ද වුණේ? කන්න දීලා, බොන්න දීලා, බස් එකේ නග්ගා ගෙන ගෙනැල්ලා බැස්සුවාට මිනිස්සුන්ට උද්ඝෝෂණය කරන්න ධෛර්යයක් නැහැ, energy එකක් නැහැ, ඇත්ත ආවේගයක් නැහැ, ඇත්ත සටන්කාමීත්වයක් නැහැ. ඇයි? ඇතුළාන්තයෙන් ඔවුන් මේකට විරුද්ධ නැහැ; ඇතුළාන්තයෙන් මේ ක්‍රියාමාර්ගයට විරුද්ධ නැහැ. ඒ නිසා මොකක්ද වුණේ? දුන්න ෂොට් එකේ සූර් බැහැලා යනකම් වැස්සේ නටලා ගියා. ආවේ මොකටද කියලා දන්නෙත් නැහැ. ඇයි ඒ? අපට විතරක් නොවෙයි, මෙතුමන්ලාට ඡන්දය දුන්නු මිනිස්සුත් මේ ක්‍රියාදාමය අගය කරනවා, රට හොඳ අතට යන්න නම් මේක වෙන්න ඕනෑ කියලා. එම නිසා දූෂණයට, වංචාවට, හොරකමට විරුද්ධව ජනතා බලයක් ගොඩනැඟෙමින් තිබෙනවා. නීතියේ විධානය, ආධිපත්‍යය තහවුරු කරන එක සම්බන්ධයෙන් ජනතා බලයක් ගොඩ නැඟෙමින් තිබෙනවා. එහෙම තිබෙද්දිත් කවුරු හරි මේ දේවල් කරනවා නම් ඒවාට ක්‍රියාමාර්ග ගන්න ඕනෑ.

වත්කම්, බැරකම් ප්‍රකාශයට පත් කරන්න අපි නීති ගෙනැල්ලා තිබෙනවා. ඒ ක්‍රියාදාමය පටන් අරගෙන තිබෙනවා. Digitalization පටන් අරගෙන තිබෙනවා. විවිධ අණපනත් සම්මත කරලා තිබෙනවා. අපි රජයේ ප්‍රසම්පාදන Guidelines හඳුන්වා දීලා තිබෙනවා. ඒවාට අනුවම රජයේ සියලු ටෙන්ඩර් පටිපාටිවලට අනුකූලව වැඩ සිද්ධ වෙමින් තිබෙනවා. ඒවාට අත තියන්න දෙන්නේ නැහැ. ඒ අතරෙත් කෙනෙක් අල්ලස් ගන්නවා නම්, ඒ අතරෙත් කෙනෙක් කොමිස් ගන්නවා නම් ඔවුන්ට ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඔප්පුවක් ගන්න යනකොට රුපියල් 500ක් ඉල්ලනවා. ළමයා ඉස්කෝලයට දාන්න යනකොට රුපියල් 200ක් ඉල්ලනවා. ඉස්පිරිතාලයේ ට්‍රොලියේ ලෙඩා තියාගෙන යන්නත් සල්ලි ඉල්ලනවා. දූෂණය ඒ තරමට අපේ රටේ පිළිලයක් වෙලා තිබෙන්නේ. ඒවාට අදාළ ක්‍රියාමාර්ග ගන්න තිබෙනවා. එම නිසා පළමුවැනි එක, ආදර්ශය. දෙවැනි එක, පෙළඹවීම නවත්වන එක. තුන්වැනි එක තමයි, ඒ සඳහා ක්‍රියාමාර්ග තිබියදීත් මේවාට අත තියනවා නම්, ඔවුන් සම්බන්ධවත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න එක. ඊළඟ එක තමයි, දූෂණ වංචා කරපු, මහජන මුදල් අවභාවිත කරපු අයට දඬුවම් දෙන එක. ඒ සඳහා නීතිය ශක්තිමත් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් අලුත් නීති ගේන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. තරාතිරම නොබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. එහෙම වෙනකොට තමයි මේ අයගේ ඉහ මොළ රත්වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔවුන් දන්නවා මේකෙන් මොකක්ද වෙන්නේ කියලා. ඒ නිසා තමයි මේකට විරුද්ධව හඬ නඟන්නේ; ඒ නිසා තමයි මේකට විරෝධයක් හදන්න හදන්නේ. නමුත්, ඒකට ජන මතයක් හැදෙන්නේ නැහැ; ඒකට ජන බලයක් හැදෙන්නේ නැහැ; ඒකට මිනිස්සු පෙලඹිලා එන්නේ නැහැ. හොඳ වෙලාවට මේ සංශෝධනයට ජනමත විචාරණයක් ඕනෑ කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වේ නැහැ. ජනමත විචාරණයකට ගියා නම් මොකක්ද වෙන්නේ? විපක්ෂයට දුම් දදා දුවන්න වෙන්නේ. එහෙම නම් දුම් දදා දුවන්න වෙන්නේ. මම කියන්නේ මේකයි. කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් සජබයට ඡන්ද ලක්ෂ කීයක් හම්බ වුණාද? විරෝධතාවට කොළඹ දිස්ත්‍රික්කයෙන් විතරක් මිනිස්සු දහ පහළොස්දාහක් ගේන්න බැරිද? රට පුරාම එකතු කරලා, එකතු කරලාත් කී දෙනාද ගෙනාවේ? ඇයි ඒ? මිනිස්සු මේවාට එන්නේ නැහැ. මිනිස්සු මේකට ඇතුළාන්තයෙන් බද්ධ නැහැ. මේකට විරුද්ධ වෙන්න ඕනෑ කියලා මිනිස්සුන්ට energy එකක් එන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා මේකට විරුද්ධව ජන බලයක් එන්නේ නැහැ. මිනිස්සු මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කැමතියි. මේ සංශෝධනයට ජනමත විචාරණයක් ආවා නම් මිනිස්සු උත්තර දේවි විපක්ෂයට රෙදි නැතිව දුවන්න. ඒක තමයි ඇත්ත කථාව.

අද රටක් විධියට නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන එක, නීතිය පසිඳලන ආයතන විධිමත් කරන එක අපි සිදු කරනවා. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ, ඒ වෙනුවෙන් සිදු කරන එක දෙයක් විතරයි. පළමුවැනි එක ආදර්ශය. ඒක දැවැන්ත ආදර්ශයක්. අපි ඒ ආදර්ශය දීලා තිබෙනවා. අපි අණපනත් ගොඩක් සම්මත කරලා තිබෙනවා. පොලීසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ අධිකරණයට අදාළ අනෙකුත් සියලු නිලධාරීන් බඳවාගෙන තිබෙනවා, පහසුකම් දීලා තිබෙනවා, තාක්ෂණය හඳුන්වා දීලා තිබෙනවා. මේ ආකාරයේ නොයෙකුත් ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා. ඒ ක්‍රියාමාර්ග අතරේ සිදු කරන එක දෙයක් පමණයි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම. අපි දූෂණය පිටුදැකීම සඳහාත්, නීතිය හරිහැටි ක්‍රියාත්මක කිරීම සඳහාත් වැරදිකරුවන්ට දඬුවම් දෙනවාය කියන එක පමණක් තෝරලා නැහැ. ක්‍රියාමාර්ග ගොඩක් ගන්න ඕනෑ. ඒ ක්‍රියාමාර්ග සියල්ලම දෙස විද්‍යානුකූලව බලා ඒවා ශක්තිමත් කර තිබෙනවා. එම නිසා මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට බොරුවට විරුද්ධ වෙමින් ගෝරනාඩු කළාට, ඒ කථා පිටුපස තිබෙන හඬ අපට ඇහෙනවා. ඒ හඬ ජනතාවට හොඳටම ඇහෙනවා. ඒ නිසා අද ඓතිහාසික දවසක්. මේක අපේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන යම් කඩඉමක්. මේ තුළින් අපේ රටේ හොඳ සුබදායක තත්ත්වයක් ඇතිවෙයි කියලා අපි හිතනවා. ඒ සම්බන්ධයෙන් ජනතාවට සුබ පතමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Jeevan Thondaman. You have 11 minutes, Hon. Member, and the Floor is yours.

[பி.ப. 1.38]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Deputy Speaker, முதலாவதாக, இன்றைய தினம் வாக்கெடுப்பு இடம்பெற இருக்கின்ற அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம் சம்பந்தமாக என்னுடைய தொகுதி மக்களுக்கும் சரி, மலையக சமூகத்துக்கும் சரி தெளிவுபடுத்தவேண்டிய கடமை எனக்கு இருக்கின்றது.

நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிப்பதற்காகக் கொண்டுவரப்பட்டுள்ள இத்திருத்தத்தைப் பெறுத்த வரையில், எனக்கு எந்தவிதமான பிரச்சினையும் இல்லை. இன்றைக்குப் பல்வேறு நாடுகளில் நீதிபதிகளின் ஓய்வுபெறும் வயது கிட்டத்தட்ட 75ஆகத்தான் இருக்கும்; கட்டாயம் 65ஐவிடக் கூடுதலாகத்தான் இருக்கும். அப்படி இருக்கும் போது, நீங்களும் நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிப்பது தவறு கிடையாது. ஆனால், அதை நீங்கள் எந்த வகையில் கொண்டுவருகின்றீர்கள் என்பதில்தான் பிரச்சினை இருக்கின்றது.

நாம் ஒரு விஷயத்தைப் புரிந்துகொள்ள வேண்டும். அதாவது, 65 வயதில் திறமையுள்ள ஒரு நீதிபதி, 67 வயதில் திறமையற்ற நீதிபதியாக மாறப்போவது கிடையாது. எனவே, இது வயது சம்பந்தப்பட்ட ஒரு பிரச்சினை கிடையாது. நமக்கு இருக்கின்ற பிரச்சினை என்னவென்றால், இதை எப்படிக் கொண்டுபோகப் போகின்றார்கள்? என்பதுதான். That is, how it has been brought in. ஏன் நான் இதைச் சொல்கின்றேன் என்றால், இன்றைக்கு இந்த விடயத்தைக் கொண்டுவருவதற்கு அரசாங்கம் முன்வைக்கின்ற காரணம், நிறைய cases pendingஇல் இருக்கின்றன என்பதுதான். அதாவது, பத்து இலட்சத்துக்கும் மேற்பட்ட வழக்குகள் நிலுவையில் இருக்கின்றன. நீதிபதிகளின் ஓய்வுபெறும் வயதை அதிகரித்தால் மட்டும்தான் இந்தப் பிரச்சினைக்கு ஒரு முடிவைக் காணமுடியும் என்கிறார்கள். இது தவறானதோர் எண்ணம்! ஏனென்றால், இன்றைக்கு நாடளாவிய ரீதியிலுள்ள நீதிமன்றங்களைப் பொறுத்தவரைக்கும், அங்கு உட்கட்டமைப்பு வசதிகள் போதாமல் இருக்கின்றன. நாங்கள் பேதியளவு நிதி ஒதுக்கீட்டைச் செய்து, அங்கு உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்தினாலே cases குறைவதற்கு வாய்ப்பு இருக்கிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாங்கள் நீதிமன்றத்திலுள்ள நீதிபதிகளின் எண்ணிக்கையைக்கூட அதிகரிக்க முடியும். இவை இரண்டையும் செய்ய முடியவில்லை, கட்டாயம் நீதிபதிகளுடைய ஓய்வுபெறும் வயதைத்தான் அதிகரிக்க வேண்டுமென்றால், தற்போதைய நீதிபதி மற்றும் நீதியரசர்களுடைய பதவிக் காலம் முடிந்த பிற்பாடு இதைச் செய்திருக்கலாம். அதை ஏன் இடையில் செய்ய வேண்டும்? அதுவும் ஒரு சட்டத் திருத்தம் மூலமாக. அதுதான் ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாக இருக்கிறது. இதில் ஒரு முக்கியமான விஷயம் இருக்கிறது. இதை எளிமையாகச் சொல்வதென்றால், ஒரு விளையாட்டுப் போட்டியில் கலந்துகொள்ளும் விளையாட்டு வீரர்கள் யார் என்பது தெரியும். விளையாடப் போகின்ற களம் என்னவென்றுகூட எங்களுக்குத் தெரியும். அந்த விளையாட்டை ஆரம்பிப்பதற்கு முன்னர், அதன் விதிகளை மாற்றினால் அதில் நியாயம் இருக்கிறது. விளையாடிக் கொண்டு இருக்கும்போது இடைநடுவில் விதிகளை மாற்ற வேண்டும் என்று சொல்வது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயம். இதற்கு முன்னர் பதவிவகித்த பல சனாதிபதிகள் இந்த மாதிரியான விடயங்களில் ஈடுபட்டதனால்தான் ஆட்சியை இழந்தார்கள். மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு நல்ல நோக்கம் இருக்கிறது; சிறப்பாகச் செயற்பட வேண்டும் என்ற எண்ணம் இருக்கிறது. அப்படி இருக்கும்போது, இந்த மாதிரியான ஒரு தவறான விஷயத்தில் கைவைத்து, நாளைக்கு அவருக்கு ஏதும் பிரச்சினை ஏற்பட்டுவிடக்கூடாது என்றுதான் நாங்களும் எதிர்பார்க்கின்றோம். நீங்கள் ஒரேயொரு விஷயத்தைச் சிந்தித்தாக வேண்டும்.

மலையக மக்கள் கேட்கலாம், "அரசியலமைப்புக்கான இருபத்திரண்டாவது திருத்தம் நீதிமன்றத்துடன் தொடர்புடைய விடயம்தானே? எங்களுக்கும் இதற்கும் என்ன சம்பந்தம்?" என்று. மலையக மக்களைப் பொறுத்தவரை, வீட்டுப் பிரச்சினை, காணிப் பிரச்சினை, சம்பளப் பிரச்சினையோடு அவர்களுடைய பிரச்சினைகள் முடிந்து விட்டன என்றுதான் நாங்கள் நினைக்கிறோம். . ஆனால், அப்படி இல்லை! ஓர் இலங்கையராக இதுவும் எங்களுக்கு ஒரு பிரச்சினைதான். இது எப்படி எங்களுக்கு ஒரு பிரச்சினையாக அமையும்? என்பது நியாயமான ஒரு கேள்விதான். மலையக மக்களாகிய நாங்கள் வரலாற்றைக் கொஞ்சம் திரும்பிப் பார்க்க வேண்டும். வரலாற்றைப் பார்த்தாலே தெரியவரும், எங்களுக்குத் தேவையான பதில் எங்கே இருக்கின்றது என்று.

மலையகத் தமிழர்களாகிய எமது சமூகத்தினர், 200 ஆண்டுகளுக்கும் மேலாகப் பரம்பரை பரம்பரையாக வேலைசெய்து, பல்வேறு கஷ்டங்களுக்கு முகம்கொடுத்து, கொஞ்சம் கொஞ்சமாக முன்னேறி வந்தவர்கள். நாங்கள் அரசாங்கத்தில் இருந்திருக்கிறோம்; பிரதிநிதித்துவம் இருந்திருக்கிறது. எங்களுடைய பிரஜாவுரிமை பறிக்கப்பட்டு, அது திரும்பவும் வழங்கப்படும்போது, அதில் பிரதிநிதித்துவமும் இருந்திருக்கிறது. அரசாங்கத்தில் அமைச்சர் பதவியும் கிடைத்திருக்கிறது. இலங்கை தொழிலாளர் காங்கிரஸுக்கு மட்டுமல்ல, பல்வேறு கட்சிகளுக்கும் அமைச்சர் பதவி கிடைத்திருக்கிறது. தயவுசெய்து, மக்கள் ஒரேயொரு விடயத்தைப் பற்றி சிந்தித்தாக வேண்டும். நாங்கள் என்றைக்குமே எதிர்நீச்சல் அடித்துத்தான் ஒரு வேலையைச் செய்து முடித்து இருக்கின்றோமே தவிர, நாங்கள் உட்கார்ந்திருக்க, சனாதிபதியோ அல்லது வேறு யாருமோ வந்து, "இதோ வைத்துக் கொள்ளுங்கள்!" என்று எதையும் கொடுக்கவில்லை.

நீங்கள் சற்று சிந்தித்துப் பாருங்கள்! எங்களுடைய மக்களுக்கான வீட்டுத்திட்டமாக இருக்கட்டும், காணி உரிமையாக இருக்கட்டும், சம்பளமாக இருக்கட்டும், கல்வியாக இருக்கட்டும்; அடிப்படை வசதிகளாக இருக்கட்டும்! ஒவ்வொரு விடயத்திலும் போராட்டம் இருந்திருக்கிறது. அதாவது, ஒவ்வொரு முன்னேற்றத்துக்குப் பின்னாலும் மாபெரும் போராட்டம் இருந்திருக்கிறது; பாரிய கஷ்டம் இருந்திருக்கிறது. சிலர் கேட்கலாம், "இவ்வளவு காலமாக என்ன செய்து இருக்கிறீர்கள்?" என்று. இன்றைக்கு இருக்கின்றவர்களுக்குப் புரிகிறது, மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துவது எவ்வளவு கஷ்டம் என்று.

அதனால்தான் நானும் அரசாங்கத்தை விமர்சிக்கக்கூடாதென நினைக்கின்றேன். எல்லோரும் சேர்ந்து பயணிக்க வேண்டும் என்றுதான் நானும் நினைக்கின்றேன். அது நாங்கள் மக்களுக்குச் செலுத்த வேண்டிய ஒரு கடன்! எங்களுடைய கட்சியாக இருந்தாலும் சரி, எந்தக் கட்சியாக இருந்தாலும் சரி, அவர்களுடைய பிரதிநிதிகளை அவர்கள் மறக்கவே இல்லை. ஒவ்வோர் இடத்திலும் ஏதோவொரு முன்னேற்றம் வந்திருக்கிறது. அந்த முன்னேற்றத்துக்குப் பின்னால் கஷ்டங்கள் இருந்திருக்கின்றன; எதிர் அலைகள் இருந்திருக் கின்றன. "இதனை எடுத்துக்கொள்ளுங்கள்! நாங்கள் உங்களுக்கு வழங்குகின்றோம்" என்று இந்த நாட்டில் ஆட்சிக்கு வந்த எந்தவொரு சனாதிபதியுமே எங்களுக்கு எதனையும் சுலபமாகத் தூக்கிக் கொடுக்கவில்லை.

நாங்கள் ஒரு விஷயத்தைப் புரிந்தாக வேண்டும். ஓர் உரிமையைப் பெற்றெடுப்பது எவ்வளவு கஷ்டமோ, அதைவிடக் கஷ்டம் அந்த உரிமையைத் தக்கவைப்பது. அதன் அடிப்படையில்தான் நான் இந்த இடத்தில் ஒரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். அரசியல் என்பது நிரந்தரம் கிடையாது. இன்றைக்கு நீங்கள் அரசாங்கத்தில் இருக்கிறீர்கள்; நாங்கள் எதிர்க்கட்சியில் இருக்கிறோம். நாளைக்கு நாங்கள் அரசாங்கத்தில் இருக்கலாம்; நீங்கள் எதிர்க்கட்சியில் இருக்கலாம் அல்லது நாங்கள் அனைவரும் எதிர்க்கட்சியில் இருப்பதற்கும் வாய்ப்பு இருக்கிறது. ஏன் நான் இதைச் சொல்கின்றேன் என்றால், அரசியல் களம் மாறலாம்; அரசியல்வாதிகள் மாறலாம். ஆனால், மக்களின் உரிமைகள் மாறவே மாறாது. எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும், அவற்றைக் கட்டிக்காத்தாக வேண்டும்.

இன்றைக்கு இருக்கின்ற சூழலில், நாங்கள் இந்த விடயத்தை மலையக மக்களின் உரிமை சார்ந்த விடயமாகப் பார்க்கின்றோம். இந்த அரசாங்கத்தின் அரசியல் பாதையில் யார் யார் எந்தெந்த இடத்தில் இருக்கின்றார்கள் என்பதை அரசாங்கம் அடையாளங்கண்டு இருக்கிறது. நான் ஏற்கெனவே சொன்னமாதிரி, தற்போதை நீதியரசர்களின் பதவிக்காலம் முடிவடைந்த பின்னர் இந்தச் சட்டத்திருத்தத்தைக் கொண்டு வந்திருந்தால், உண்மையிலேயே நீங்கள் நியாயமான முறையில்தான் இதைச் செய்கிறீர்கள் என்று எனக்குப் புரிந்திருக்கும்.

நான் ஒரேயொரு விடயத்தை அரசாங்கத்துக்குச் சொல்ல விரும்புகின்றேன். ஏன் இந்தச் சட்டத் திருத்தத்தைக் கொண்டுவருகிறீர்கள் என்று உங்களுக்கும் தெரியும்; எனக்கும் தெரியும். அது தொடர்பில் எந்தவிதமான பிரச்சினையும் கிடையாது. ஆனால், சிறியதோர் எச்சரிக்கை! இன்றைக்கு மக்கள் மனதை வென்ற சனாதிபதி அவர்கள் நாற்காலியில் உட்கார்ந்து இருக்கிறார். அதனால் பிரச்சினைகள் எதுவும் கிடையாது. வரலாற்றைப் பார்த்தால் தெரியும், இந்த நாற்காலி எப்பொழுதும் மாறிக்கொண்டே இருக்கும் என்பது. அப்படி இருக்கும்போது, இன்றைக்கு நீங்கள் இந்தத் திருத்தச் சட்டமூலத்தைக் கொண்டுவந்து நிறைவேற்றுவதன்மூலம் நிரூபிக்கப் போகின்ற விஷயம் என்னவென்றால், எதிர்காலத்தில் எந்த சனாதிபதி வந்தாலும் அவர் நீதித்துறைமீது கைவைக்க முடியும் என்பதைத்தான்.

சிறியதோர் உதாரணத்தைச் சொல்கின்றேன். மதிப்புக்குரிய எதிர்க்கட்சித் தலைவர் அவர்கள், போராட்டத்துக்குப் பின்னர் அறிக்கை ஒன்றை விட்டிருந்தார். அதாவது, “நாங்கள் ஆட்சிக்கு வரும்போது இதனை நீக்குவோம்" என்று. இன்றைக்கு நீங்கள் சட்டரீதியான நீதிபதிகளின் ஓய்வுபெறும் வயதை 2 வருடங்களால் அதிகரிக்கிறீர்கள். நாளை ஆட்சி மாறினால், 2 வருடங்களால் குறைக்கவா போகின்றோம்? இவ்வாறு நீதித்துறையை வைத்து விளையாடிக்கொண்டு இருந்தால், நாளை எவ்வாறு சாதாரண மக்களுக்குச் சட்டத்தின்மீது நம்பிக்கை வரும்? சட்டம் என்பது வெறும் கட்டிடமோ, அமர்ந்திருக்கும் நபரோ கிடையாது. சட்டம் என்பது நம்பிக்கை! இன்றைக்கு என்னதான் மக்கள் பல்வேறு கஷ்டத்தில் இருந்தாலும், "நாளை நான் சட்டத்தின்முன் நின்றால், எனக்கு கட்டாயம் நியாயம் கிடைக்கும்" என்று அவர்களுக்கு ஒரு நம்பிக்கை இருந்தாக வேண்டும். நான் இந்த இடத்தில் என்னுடைய நிலைப்பாட்டைத்தான் சொல்கின்றேனே தவிர, அரசாங்கம் செய்வது சரி அல்லது தவறு என்றோ, எதிர்க்கட்சி செய்வது சரி அல்லது தவறு என்றோ சொல்ல வரவில்லை. என்னுடைய தனிப்பட்ட அபிப்பிராயம் என்னவென்றால், நீங்கள் கொண்டுவருகின்ற இந்தச் சட்டத் திருத்தத்துக்கு என்னுடைய ஆதரவு கட்டாயம் இருக்கிறது. ஆனால், நீங்கள் கொண்டுவருகின்ற விதத்தில்தான் என்னுடைய எதிர்ப்பு இருக்கிறது. இதுதான் என்னுடைய நிலைப்பாடு! இது வாக்கெடுப்பு நிகழும் நேரத்தில்கூட தெரியவரும்.

Sir, I would like to just repeat what I said in Tamil, just the last line. I clearly mentioned that, though I do agree with the policy objective of the Government, I do not agree with the way in which they are bringing it forward because we are setting a bad precedent with so much opposition not only from the Bar Association within the country, but also from collective international organizations. This should have been reviewed. We should have taken a stronger step, and if we genuinely wanted not to interfere with the Judiciary, then, we should have allowed it to go on, at least, until the term ends.

So, when this is the case, I hope the Government is well aware of the risks they are taking, and the consequences of it may be felt later on.

However, as far as the Opposition is concerned, we have clearly communicated what our stand is. My stand, which is also the stand of the Ceylon Workers' Congress, is that we are opposed to the way in which the Amendment was brought in, but we are not opposed to its policy concept, as a whole.

நான் இந்த இடத்தில் இன்னும் ஒருசில விடயங்களைச் சொல்லியாக வேண்டும். இன்றைக்கு மலையக மக்களைப் பொறுத்தவரைக்கும், அவர்களுக்குப் பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. நீதிமன்றம் சம்பந்தமாக எடுக்கப்பட்ட அதே நோக்கத்தில்தான் நோர்வூட் பிரதேச செயலகத்தை ஹட்டன் பிரதேசத்துக்குக் கொண்டுவந்தார்கள். நான் இதை ஒரு குற்றமாக முன்வைக்கவில்லை. மாறாக, ஓர் ஆலோசனையாகவே முன்வைக்கின்றேன். ஹட்டனைப் பொறுத்தவரைக்கும், அது எங்களுடைய பிரதானமான ஒரு நகரம் என்பதில் எந்தவிதமான மாற்றுக் கருத்தும் கிடையாது. அதேநேரத்தில், நோர்வூட்டில் ஒரு பிரதேச செயலகத்தைக் கொண்டுவந்ததற்குக் காரணம் என்னவென்றால், அங்கு இருக்கின்ற மக்களுக்கு உதவியாக இருக்க வேண்டும் என்பதற்காகத்தான்.

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

இன்றைக்கு ஒருசில ஊழியர்களின் சொகுசுக்காக நோர்வூட்டில் இருந்த பிரதேச செயலகத்தை ஹட்டனுக்குக் கொண்டுவந்து இருக்கிறோம். கௌரவ மஞ்ஜுள சுரவீர ஆரச்சி அவர்கள் சொல்லியிருந்தார், "கினிகத்தேனைக்கு ஹட்டன் வலயக் கல்விக் காரியாலயம் மாற்றப்படாது" என்று. அதை நான் வரவேற்கின்றேன். அதேநேரத்தில், நிராகரிக்க முடியாத ஓர் உண்மை என்னவென்றால், ஹட்டன் வலயக் கல்விக் காரியாலயத்தை மாற்றுவதற்குப் பேச்சுவார்த்தை நடைபெற்றிருக்கிறது. கினிகத்தேனையில் குறிப்பாக ஒரு நபரிடம் இரண்டு இடங்கள் இருக்கின்றன. அவர் இலவசமாக அதை வழங்குவதால், அந்த இடத்துக்கு ஹட்டன் வலயக் கல்விக் காரியாலயத்தை மாற்றுவோமென பேசப்பட்டு இருக்கின்றது. இது பற்றி நாங்கள் பாராளுமன்றத்தில் பேசியதனால்தான் இன்று அதில் மாற்றமொன்று வந்திருக்கிறது.

எங்களுடைய ஹட்டன் வலயக் கல்விக் காரியாலயமாக இருக்கட்டும், நோர்வூட் பிரதேச செயலகமாக இருக்கட்டும், அந்தந்தப் பகுதிகளில் அரசாங்கக் கட்டிடங்கள் இருக்கின்றன. ஹட்டனில் நிறையவே இருக்கின்றன. நிதி ஒதுக்கீடு இருந்தால், ஹட்டன் வலயக் கல்விக் காரியாலயத்தை அங்கு கொண்டுவந்து, நோர்வூட் பிரதேச செயலகம் இருக்கின்ற இடத்தில் அதனை மேம்படுத்த முடியும். ஒரு பாராளுமன்ற உறுப்பினராக எனக்கு பத்து மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு கிடைக்கிறது. நான் அந்த நிதி ஒதுக்கீட்டை நோர்வூட் பிரதேச செயலக வளாகத்தில் கட்டிடம் அமைப்பதற்குக் கொடுப் பதற்குத் தயார். ஏன் நான் இதைச் சொல்கின்றேன் என்றால், நாம் வைத்திருக்கின்ற நோக்கம் வேறு; ஆனால், செய்கின்ற செயற்பாடு வேறு என்பதைச் சுட்டிக்காட்டத்தான். குறிப்பாக, மலையக மக்கள் சனாதிபதிமீது அளவுக்கு அதிகமான நம்பிக்கை வைத்திருக்கிறார்கள். அந்த நம்பிக்கைக்கு நிகராக அவர் நடப்பார் என்றுதான் நான் எதிர்பார்க்கின்றேன். நான் இதுவரைக்கும் அவருடைய எண்ணம், நோக்கத்தைக் குறை சொல்லவில்லை. அதேநேரத்தில், செயற்பாடுகளில் சில விஷயங்கள் தவறாக இருந்தால், அதைச் சுட்டிக்காட்ட வேண்டியது என்னுடைய பொறுப்பு! என்னைப் பொறுத்த வரைக்கும், இது என்னுடைய மக்களும்தான். இந்த சனாதிபதியின்கீழ் வேலைகளை முடிக்க முடியும் என்றால், நான் சந்தோசமாக ஆலோசனை வழங்குவேன்.

கௌரவ கலைச்செல்வி அவர்களிடம் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். அவர் என்னைவிட வயதில் முத்தவர். நான் நேற்று முன்தினம் பாராளுமன்றத்தில் ஒரு விடயத்தைச் சொல்லியிருந்தேன். தயவுசெய்து, நீங்கள் அதைத் தவறாக நினைத்துக்கொள்ளாதீர்கள். நீங்கள் personalஆக ஒரு குடும்பத்தைப் பற்றி பேசும்போது, நானும் அந்தளவுக்குப் போவேன் என்பதைக் காண்பிக்கத்தான் நினைத்தேனே தவிர, யாரையும் இந்த இடத்தில் மானபங்கப்படுத்த நினைக்க வில்லை. நன்றி!

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister, what is your point of Order?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ ஜீவன் அவர்களே, உங்களிடம் சிறியதொரு வேண்டுகோளை விடுக்கிறேன். நீங்கள் கலைச்செல்வி பற்றி சொன்னதால்தான் சொல்கிறேன். கலைச்செல்வி அவர்கள் ஒரு பெண்! ஆனால், இன்று உங்களுக்குச் சார்பாக இயங்குகின்ற ஒருசில social media மிகவும் மோசமான முறையில் அவருக்கு எதிராக அவதூறுகளைக் கட்டவிழ்த்து விட்டுக்கொண்டு இருக்கின்றன. *[இடையீடு]* என் தொடர்பாக - I am not worried about that, okay? ஆனால், பெண் பிள்ளைகள்மீது அவ்வாறு செய்ய வேண்டாமெனச் சொல்லுங்கள்! நீங்கள் சொல்வீர்களென நான் எதிர்பார்க்கிறேன். அப்படி இல்லை யென்றால், அடுத்த கட்ட நடவடிக்கை பற்றி பார்ப்போம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. *[Interruption.]* Hon. Jeevan Thondaman, let us not go into a debate, but you can reply to him.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்தை என்னுடைய கவனத்துக்குக் கொண்டுவந்ததற்கு ரொம்ப நன்றி! என்னைப் பொறுத்தவரை, social mediaஐ வைத்து யாரையும் அவதூறாகப் பேசவேண்டிய அவசியமில்லை. அதேநேரத்தில், நான் உங்களிடமும் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். நாங்கள் அரசியலில் இருக்கிறோம். அரசியலில் என்னைக்கூட அநாகரிகமாகப் பேசியிருக் கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, let us make it short.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
I am done, Sir.

குறிப்பாக, நான் திருமணம் முடித்து புதிதாக வரும்போது, உங்களுடைய பாராளுமன்ற உறுப்பினர் ஒருவர் சொன்னார், "ஜீவன் தொண்டமானை அப்படியே அவருடைய மனைவி யோடு சேர்த்து இந்தியாவுக்கு அனுப்புங்கள்!" என்று. எனவே, நீங்கள் உங்களுடைய உறுப்பினர்களுக்கும் பாடம் எடுப்பீர்களென நான் எதிர்பார்க்கின்றேன். விஜயன் அரசரும் அங்கிருந்துதானே இங்கு வந்தார். அவர் வரவில்லை என்றால், நமக்கு இவ்வளவு பிரச்சினை இல்லையே!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. K.D. Lal Kantha. You have 15 minutes.

[අ.භා. 1.51]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාව අපේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන ප්‍රධාන දේවල් අතරින් එකක් තමයි, මේ පාර්ලිමේන්තුවේ කටයුතු ප්‍රතිඵලදායක ලෙස මෙහෙයවීම. අපට මතකයි, මේ දසවන පාර්ලිමේන්තුවට පෙර පසුගිය කාලය තුළ අපේ රටේ පාර්ලිමේන්තුවේ කාලය මොන විධියටද පාවිච්චි වුණේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඔබතුමා ඔය වාඩි වෙලා ඉන්න පුටුවේ එදා මේ සභාවේ මන්ත්‍රීවරු ඇවිල්ලා වාඩි වුණා; මිරිස් කුඩු ගහ ගත්තා; විවිධාකාරයේ ක්‍රියාකාරකම් සිද්ධ වුණා; සෙංකෝලය උස්සාගෙන එහේ මෙහේ දිව්වා; හරයාත්මක බවක් නැති සාකච්ඡා, කථා, වාද විවාද, කුණුහරුප, මන්ත්‍රීවරියන්ට එරෙහිව කියපු ඒ කථා තුළ ස්ත්‍රී හිංසනයන් විශාල වශයෙන් තිබුණා. ඒ නිසා අපේ රටේ ජනතාව අපේ පාලනයක් යටතේ බලාපොරොත්තු වුණා, විනයානුකූල, පිළිවෙළකට වැඩ කරන, රටටත් වැඩදායක ලෙස මේ පාර්ලිමේන්තුවේ කාලය යොදා ගන්නා තත්ත්වයක්. එහෙම තත්ත්වයක් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා. පාර්ලිමේන්තුවේ සංස්කෘතිය විශාල වශයෙන් පිරිහීමකට ලක් වෙලා තිබුණු නිසා ඒ තත්ත්වය වෙනස් තත්ත්වයකට පත් කරන පාර්ලිමේන්තුවක් ඔවුන් බලාපොරොත්තු වුණා. ඒ වාගේම ගෞරවනීය පාර්ලිමේන්තුවක් ඔවුන් බලාපොරොත්තු වුණා. එහෙම පාර්ලිමේන්තුවක් පවත්වාගෙන යෑමට අපි කාටත් වගකීමක් තිබෙනවා. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ අපට ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමාට, ගරු නියෝජ්‍ය කථානායකතුමාට, අපේ ලේකම් මණ්ඩලයට සහ විපක්ෂය පැත්ත නියෝජනය වන සියලු දෙනාට - අපි හැමෝටම - වගකීමක් තිබෙනවා, යහපත් දියුණු සංස්කෘතියක් සහිත පාර්ලිමේන්තු ක්‍රියාවලියක් පවත්වාගෙන යන්න. ඒකත් මතක් කරමින් මම තව කාරණයක් කියන්න කැමැතියි.

අපේ රටේ ජනතාව පාර්ලිමේන්තුවෙන් තව දෙයක් බලාපොරොත්තු වුණා. අපේ රටේ කාලයක් තිස්සේ තිබෙන අණපනත් ප්‍රමාණයක් තිබෙනවා. ඒ අණපනත් යාවත්කාලීන කර ගැනීමේ වුවමනාවක් තිබෙනවා. එවැනි අණපනත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව අපට අණපනත් සංශෝධනය කර ගැනීමක් කර ගන්න අවශ්‍යව තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි පසුගිය දිනවල කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින පනත් කිහිපයක්ම සංශෝධනය කළා, ඒ වුවමනාවට අනුව. මොකද, ඒක ජනතාවගේ වුවමනාවක්. ඒ අතරින් උදාහරණයක් ගත්තොත්, අපි සත්ව පනත වැඩිදියුණු කළා. ඒක ජනතාව අගය කළා වාගේම අගය කරනවා. මොකද, ඒක ජනතාවගේ වුවමනාවක්, අවශ්‍යතාවක්. ඒ වාගේම අපි වැඩිදියුණු කළා වාගේම සංශෝධනය කර ගත්තා, අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත. ඒක මේ පාර්ලිමේන්තු වාරයේ, පසුගිය 23වැනි දා සම්මත කර ගත්තා. අපි ඒකට ඡන්ද විමසීමක් ගත්තේත් නැහැ, විපක්ෂයේ විරුද්ධවීමක් තිබුණේත් නැහැ. අපි ඒ පනත හොඳ විධියට, දියුණු ආකාරයට, අපනයන කෘෂිකර්මාන්තය දියුණු කිරීමේ පැත්තට සංශෝධනය කර ගත්තා. ඒ නිසා පාර්ලිමේන්තුවෙන් ජනතාව බලාපොරොත්තු වෙනවා, විනයානුකූල සංස්කෘතියක් පවත්වාගෙන යන අතරම අණපනත් විශාල ප්‍රමාණයක් යාවත්කාලීන කර ගැනීමට. මොකද, රටේ ජනතාව අපට දේශපාලන වරමක් දුන්නේ ඒවා ඒ විධියට යල්පැන ගිය ආකාරයෙන් පවත්වාගෙන යාමට නොව වෙනසක්, අලුත් කිරීමක් බලාපොරොත්තුවෙනුයි. දැන් අපි ඒ වැඩේ කරගෙන යනවා. අද දක්වාම අපි මේ පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තේ මේ රටේ පොදු මහජනතාවට සෘජුවම සේවයක් වන අණපනත්, සංශෝධන පමණයි. ඊට පිටින් අපි මොකක්වත් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන නැහැ. එහෙම සම්මත කරගන්න බලාපොරොත්තුවකුත් නැහැ. ඒ වාගේම අලුත් අණපනත් ගෙනැල්ලා සම්මත කරගන්න ඕනෑකමකුත් අපට තිබෙනවා. මගේ අමාත්‍යාංශයට අදාළව ගත්තොත්, සත්ව සුබසාධන පනත් කෙටුම්පත ඉදිරියේදී ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක අලුත් පනතක්. ඒ කියන්නේ, අලුත් නීතියක්. අපි තිබෙන නීති වෙනස් කරගන්න ඕනෑ, අලුතෙන් නීති සම්මත කරගන්න ඕනෑ. ඒක පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යයක්. සාමාන්‍ය ජනතාවට අපි කියන්නේ, ජනතාවත් කථා වෙන්නේ පාර්ලිමේන්තුව තිබෙන්නේ නීති සම්පාදනය කරගන්න කියායි. ඒක තමයි පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යය විධියට තිබෙන්නේ. ඒ නිසා අපි ඉදිරියේදී අලුත් අණපනත් ගණනාවකුත් ගෙනෙන්න සැලසුම් කර තිබෙනවා.

ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළින් අපි පසුගිය කාලයේ කරගත්ත යම් යම් කාර්යයන් ප්‍රමාණයක් තිබෙනවා. ඒ කාර්යයන් අතරින් එකක්, දෙකක් මම මතක් කරන්නම්. මේ පාර්ලිමේන්තුව හිටපු ජනාධිපතිලා නඩත්තුවට යන විශාල මුදලක් ඉතිරි කර තිබෙනවා. ඒ කියන්නේ, පාර්ලිමේන්තුව මැදිහත් වෙලා ඒවා කප්පාදු කිරීමක් කරගත්තා. මොකද, අපේ රටේ සංස්කෘතිය එන්න එන්නම හැඩ ගැසී තිබුණේ, මහජන නියෝජිතයන්, ජනාධිපතිවරුන් සහ හිටපු අය වෙනුවෙන් පොදු මහජන මුදල් පාවිච්චි කිරීමටයි. ඒ නිසා අපි පාර්ලිමේන්තුව පාවිච්චි කරමින්, වැඩි ජනතාවකගේ සහයෝගය ලබා ගනිමින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බහුතරයකගේද සහයෝගය ලබා ගනිමින් ඒවා වෙනස් කළා. ඒ කියන්නේ, පාර්ලිමේන්තුව රටේ යහපත් පැත්තට අපි ඉතා පැහැදිලිව යොදාගෙන තිබෙනවා, මේ ගෙවුණු අවුරුදු දෙක තුළ. ඒ, අපි ජනතාවගේ පැත්තේ ඉඳලා.

ඒ වාගේම පසුගිය කාලය තුළ ජනතාවගේ විශාල විරෝධයක් තිබුණා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන්. මොකද, පාර්ලිමේන්තුවට දවස් කිහිපයක් ආවාම -මාස තුනකට දවසක්, අවුරුද්දකට දවස් හතරක්, අවුරුදු පහට දවස් විස්සක් ආවාම- මුළු ජීවිත කාලයටම විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ හැකියාවක් තිබුණා. මේ රටේ කාටවත් එහෙම එකක් නැහැ. රාජ්‍ය සේවකයන් අවුරුදු 60ක් ගත වනතුරු ඉන්න ඕනෑ විශ්‍රාම වැටුපක් ලබන්න. ඒ නිසා පාර්ලිමේන්තුව පාවිච්චි කරලා, මහජන නියෝජිතයන් ලබා ගත්ත ඒ විශ්‍රාම වැටුප අපි මුළුමනින්ම අහෝසි කළා. ඒවා කළේ මහජනතාව වෙනුවෙන්. අපේ වරප්‍රසාද වැඩි කරගන්න අපි පාර්ලිමේන්තුව පාවිච්චි කරලා නැහැ. එහෙම කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. පසුගිය කාලය තුළ අපි මේ පාර්ලිමේන්තුව හරහා වැදගත් කාර්යයන් ගොඩක් කළා. ඒ අතරින් එකක් දෙකක් මතක් කළොත්, - ගොඩක් කියන්න අවශ්‍ය නැහැ - මේ පාර්ලිමේන්තුව හරහා රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා. පොහොර සහනාධාරය රුපියල් 15,000 සිට රුපියල් 30,000 දක්වා වැඩි කළා. මේ ඔක්කොම මහජනතාවගේ පැත්තේ ඉඳන් අපි ගත්ත පියවර. එයින් කිහිපයක් පමණයි මම මේ මතක් කළේ. ඒ විධියට ජනතාවාදී බොහෝ දේවල් අපි ඉටු කර තිබෙනවා. ජනතාව විසින් ජාතික ජන බලවේගයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනෙක් ලබා දුන්නා. ඒ කියන්නේ, තුනෙන් දෙකකට වැඩි බලයක්. තනි පක්ෂයකට විශාල බලයක් ලබා දී තිබෙනවා. ඒ තුනෙන් දෙකේ බලය අද ජනතාව වෙනුවෙන් අපි පාවිච්චි කරනවා. අපි බලයට ඇවිල්ලා අවුරුදු දෙකක කාලයක් ගත වුණා. අපි සාමාන්‍ය බහුතරය මත කටයුතු කරගෙන ඇවිල්ලා තිබෙනවා.

අද අපි මේ පාර්ලිමේන්තුවේදී අපට ජනතාව දීපු තුනෙන් දෙකට වැඩි ජන වරම පාවිච්චි කරනවා. ඒ බලය අද අපි පාවිච්චි

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

කරන්නේ ජනතාව වෙනුවෙන්මයි. ඊයේ මම ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටු රැස්වීම අවසන් වෙලා සවස 5.30ට විතර එනකොට උද්ඝෝෂණය ඉවර වෙලා එන මන්ත්‍රීවරුන් පිරිසක් හම්බ වුණා. එතුමන්ලාගෙන් මම ඇහුවා, අද සටන්කාමී ක්‍රියාමාර්ගයක් ගත්තා නේද කියලා. එතකොට එතුමන්ලා කිව්වේ මොකක්ද දන්නවාද? එතුමන්ලා කිව්වා, ඇමතිතුමා, අපිත් දේශපාලනය කරන්න ඕනෑ නේ කියලා. මම කිව්වා, ඔව්, මට තේරෙනවා, කරගෙන යන්න කියලා. එහෙම තමයි, දේශපාලනය කරද්දි ආණ්ඩුව ගෙනෙන සමහර දේවල්වලට විරුද්ධ වන්න සිදු වනවා, සමාජය ඇතුළේ දේශපාලන බලයක් ගොඩ නඟන්න, ඒ නිසා ඔහොම කරගෙන යන්න කියලා මම කිව්වා.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අද අපි සම්මත කරනවා නේ. මේ සංශෝධනයේ අරමුණ වන්නේ, ජනතාවගේ එක් ප්‍රධාන අභිලාෂයක්, ඕනෑකමක් ඉටු කිරීම සඳහා ආරම්භයක් ගැනීමයි. නැවත මම කියනවා, ආරම්භයක් ගැනීමයි කියලා. මේ සංශෝධනයේ අරමුණ ජනතාවගේ එක් ප්‍රධාන අභිලාෂයක් ඉටු කිරීම. ඒක බරපතළ අභිලාෂයක්. ජනතාවට අභිලාෂ ගොඩක් තිබෙනවා. මෙය ඉන් ප්‍රධාන අභිලාෂයක් සම්පූර්ණ කරගැනීම සඳහා වන ආරම්භක පියවරක්ය කියන එක මම නැවත කියනවා.

අපේ අධිකරණ පද්ධතිය යාවත්කාලීන නොකිරීම නිසා පොදු මහජනතාව විශාල පීඩාවකට පත්ව තිබෙනවා. ඒක පොඩි පහේ පීඩාවක් නොවෙයි. අපේ රටේ බිඳ වැටුණු දේශපාලන සංස්කෘතියක් නිසා ජනතාව පීඩාවට පත් වුණා වාගේම අපේ රටේ පොදු මහජනතාව අතිවිශාල පීඩාවකට පත් වනවා, අපේ අධිකරණ පද්ධතියේ තිබෙන මේ ස්වභාවය නිසා. අපේ අධිකරණ පද්ධතිය යාවත්කාලීන නොකිරීම විශාල වශයෙන් පොදු ජනතාවගේ විවේචනයට ලක් වෙලා තිබෙනවා. ඉන් කිහිපයක් මම කියන්නම්. අධිකරණ පද්ධතියේ ක්‍රියාවලිය ජනතාව බරපතළම පීඩාවකට පත් කරන තවත් එක් ක්ෂේත්‍රයක්. නඩු කල් යෑම නිසා රජයට ඒ වෙනුවෙන් විශාල මුදලක් වැය කරන්න වනවා. නඩුවක් එකවර ඉවර වුණත්, දෙපාරින් ඉවර වුණත්, තුන්පාරින් ඉවර වුණත් ඒ සඳහා යම් මුදලක් වියදම් වනවා. කඩදාසි කොළයේ ඉඳන්, කාර්ය මණ්ඩලවල ඉඳන් අතිවිශාල මුදලක් රජය වියදම් කරනවා, නඩු කල් යෑම නිසා. ඒක එකක්. ඒක කවුරුත් හිතලා බලන්න ඕනෑ කාරණයක්.

මම තව කාරණයක් කියන්න ඕනෑ. නඩු කල් යෑම නිසා මහජනතාවටත් විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. කාට හරි නඩු වාර 20කට, 25කට යන්න වුණොත්, නීතිඥයාට අඩුම ගණනේ රුපියල් 3,000 ගණනේ ගෙවන්න වුණොත් කීයක්ද? සමහර නීතිඥයින් රුපියල් 500ටත් ඉදිරිපත් වනවා, මම ඒ ගැන කියන්න කැමැති නැහැ. ඒ අය ඒ තරම් මට්ටමකට දමන්න මම කැමැති නැහැ. අඩුම ගණනේ රුපියල් 3,000ක් ගත්තොත්, නඩු වාර 20කට ගියොත් රුපියල් 60,000ක් නේද? එතකොට රජයට වියදම් යනවා වාගේම අනෙක් පැත්තෙන් නඩුවක් අවසන් කරගැනීම වෙනුවෙන් පොදු මහජනයාටත් තමන් දුක් මහන්සි වෙලා හම්බ කරන මුදලින් අතිවිශාල මුදලක් මේ රටේ වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක අපේ රටේ ජනතාවට බරපතළ පීඩාවක්. තමන්ගේ ජීවිතයේ වෙනත් ප්‍රතිඵලදායක කටයුත්තකට යොදන්න තිබෙන මුදල් නේද මේ? ඒ මුදල් අධිකරණ කටයුත්තක් අවසන් කරගැනීම සඳහා යොදවන්න ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගමන් ගාස්තුත් දරන්න වනවා. මේවා අපි බලන්න ඕනෑ, ජනතාවගේ පැත්තෙන්. ගමන් ගාස්තු, කෑම බීම සඳහා කොපමණ මුදලක් වැය කරන්න වනවාද? අධිකරණ පද්ධතියේ තිබෙන දුර්වලතාවලට ජනතාවගේ ආණ්ඩුවක් උත්තර හොයන්න ඕනෑ නේද? අධිකරණ ක්ෂේත්‍රය තුළ පවතින මේ තත්ත්වයට වගකිව යුතු ආණ්ඩුවක් උත්තර හොයන්න ඕනෑ නේද? ඔව්, හොයන්න ඕනෑ. මේ වෙනුවෙන් ජනතාවගේ වැදගත් කාලය මොන තරම් කැප කරන්න සිද්ධ වෙලා තිබෙනවාද?

ඒ වාගේම, රජයේ වැදගත් කාලය මොන තරම් විනාශ වනවාද මේ පද්ධතියේ තිබෙන දුර්වලතා නිසා? මේ තත්ත්වය වෙනස් කිරීමටයි, අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසි දෙවන සංශෝධනය ගේන්නේ. අපි කියන්නේ නැහැ, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පමණක්ම ඒ කාර්යය සම්පූර්ණ කරන්න පුළුවන් කියලා. ඒ සඳහා තව බොහෝ දේවල් කරන්න සිද්ධ වනවා. අපි අනිවාර්යයෙන්ම ඒවාත් කරනවා. එය කිරීම සඳහා වන ආරම්භක පියවරක් ලෙස තමයි, අපි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරන්නේ. මේ සංශෝධනය කරන්නේ අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව සඳහා එක් පියවරක් ලෙස පමණක් කියලා මම කිව්වා. තවත් දේ කරන්න තිබෙනවා කියලාත් මම කිව්වා.

දැන් ජනතාව අධිකරණය ළඟට යනවා. ජනතාව යාපනයේ ඉඳන් කොළඹ එනවා, අම්පාරේ ඉඳන් කොළඹ එනවා. ඒ කියන්නේ, ජනතාව එනවා, අධිකරණය ළඟට. ඔවුන්ට එන්න වෙලා තිබෙනවා, එන්න ඕනෑ. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත්, අධිකරණය ජනතාව ළඟට ගෙනියන්න ඕනෑ. මොකද, මේ අධිකරණ බලය ජනතාවගේ, වෙන කාගේවත් නොවෙයි. අධිකරණ බලය පාර්ලිමේන්තුවේත් නොවෙයි, අධිකරණයේත් නොවෙයි, අධිකරණ බලය ජනතාවගේ. දැන් ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා, අධිකරණය පස්සේ යන්න. යාපනයේ ඉඳන් මෙහේ එන්න ඕනෑ; අම්පාරේ ඉඳන් මෙහේ එන්න ඕනෑ. නමුත් අපි ඒක වෙනස් කරන්න ඕනෑ. ඒ කටයුත්ත අපි කළ යුතුයි. ආණ්ඩුවත්, අධිකරණයත් ජනතාව ළඟට යන්න ඕනෑ. ඒ සඳහා අපට ගොඩක් වැඩ කරන්න තිබෙනවා.

අපේ රටේ ජනතාවට යුක්තිය ඉටු කිරීම මඟ හැර යන අවස්ථා කොපමණ තිබෙනවාද? ජනතාවගේ පැත්තෙන් මම මේ කියන්නේ. ජනතාවත් යුක්තිය ඉටුවීම වෙනුවෙන් තමන්ගේ මැදිහත්වීම මොන තරම් මඟ හැර යනවාද, එහෙම අවස්ථා කොච්චර තිබෙනවාද? අපරාධ දැක දැක සාක්ෂි දීමට ඉදිරිපත් නොවී කොච්චර ඉන්නවාද? යම් සිදුවීමක් වුණාම කටඋත්තරයක් දෙන්න පොලීසියට යන්නේ නැතුව කොච්චර ඉන්නවාද? ඇයි ඒ? පොලීසියකට යන්න මිනිස්සු මැළිකමක් දක්වනවා. ඒවාට ගියාම තමන්ට කරදර සිද්ධ වනවා, විශාල කාලයක් ගත වනවා, උසාවි ගාණේ රස්තියාදු වෙන්න සිදු වනවා කියා මිනිස්සු හිතනවා. පාරෙදි රිය අනතුරක් දැක්කත්, මිනී මැරුමක් දැක්කත් ජනතාව කල්පනා කරනවා, ඕකට මම පොලීසියට ගියොත් ඊළඟට උසාවි ගාණේත් යන්න වෙයි, අවුරුදු කීයක් එහෙම යන්න වෙයිද දන්නේ නැහැ, එතකොට විශාල කරදරයකට මුහුණ දෙන්න සිද්ධ වනවා කියලා. ඒ නිසාත්, මේ අධිකරණ පද්ධතියේ වෙනස්වීමක් අවශ්‍ය වනවා, ඉක්මන් පියවර ගැනීමක් අවශ්‍ය වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවගේ ප්‍රගතිශීලී පාලනයක් විධියට අපි මේ සංශෝධනය කළ යුතුමයි. විපක්ෂය පැත්තෙන් මේ සම්බන්ධව කියන අසත්‍ය කරුණු බොහෝ ප්‍රමාණයක් අපට ඇහෙනවා. මේ පාර්ලිමේන්තුවේත් කියපු එකක් මම මතක් කරන්නම්. තනි පක්ෂ ක්‍රමයක් ඇති කරන ඒකාධිපතිවාදයකට තමයි මේ යන්න හදන්නේ කිව්වා. විපක්ෂයෙන් මම මෙය අහන්න කැමැතියි. අපි විපක්ෂයේ සජබය ගත්තොත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 40දෙනෙක් ඉන්නවා, ඒ වාගේම පළාත් පාලන ආයතනවල තවත් පිරිසක් ඉන්නවා, සමහර ප්‍රාදේශීය සභාත් ජයග්‍රහණය කරලා තිබෙනවා, තවත් පක්ෂ ක්‍රියාකාරකම් පවා තිබෙනවා. එතකොට මේ පියවර ගත්තාම එහෙම වෙනවා නම්, ඒ කියන්නේ සජබය වහනවාද, සජබයේ

ක්‍රියාකාරිත්වය නතර වනවාද? එහෙම නැත්නම් ඇත්තටම දිනපතා විපක්ෂයේ බිඳවැටීම මේකට හේත්තු කරන්නද මේ හදන්නේ? අපට පෙනෙනවා, සමාජය ඇතුළේ විපක්ෂය දෛනිකව කඩාගෙන වැටෙන බව. ඒක අපට පෙනෙන දේ, මහ පොළොවේ තිබෙන දේ. ඊයේ උද්සෝෂණයෙන් වුණත් පෙනෙන්නේ ඒක තමයි. තනි පක්ෂ ක්‍රමයකට යනවා නම්, විපක්ෂයක් මෙහෙමද ක්‍රියා කරන්න ඕනෑ. දැවැන්ත මැදිහත්වීමක් කරන්න ඕනෑ. ඊයේ දවසේ රට පුරාම බරපතළ විධියට උද්සෝෂණ තිබෙන්න ඕනෑ.

ඔය පොල්දූව හන්දියේ මම ඇති තරම් උද්සෝෂණ කරලා තිබෙනවා, ඒවාට නායකත්වය දීලා තිබෙනවා. මමත්, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත්, බිමල් රත්නායක ඇමතිතුමාත් ඒ කාලයේ මේ පාර්ලිමේන්තුව විසුරුවන්න කියලා පොල්දූව හන්දියට ඇවිල්ලා උද්සෝෂණය කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒකත් කිව්වේ, පාර්ලිමේන්තුව ගිනි තියන්න ආවා කියලා. එහෙම තමයි, ඒ කාලයේ ඔය පැත්තෙන් කිව්වේ. අපි එදා ආවේ මොනවාටද? එක්තරා අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මහත්මයාව මේ පාර්ලිමේන්තුවෙන් ජනාධිපති කර ගත්තා නේ.

ඊට පස්සේ, හිටපු පාලකයෝ පැනලා ගියා. එහෙනම් ජන වරම ඉවරයි, ජන වරම බිඳ වැටිලා තවදුරටත් පාර්ලිමේන්තුව පවත්වාගෙන යාමට අයිතියක් නැහැ. ඒ නිසා අපි කිව්වා, දැන් පාර්ලිමේන්තුව විසුරුවලා මහ මැතිවරණයක් තියන්න කියලා. ඒකට තමයි අපි පොල්දූව හන්දියට ආවේ. ඒවා ජනතාවගේ ඉල්ලීම්. මේක ජනතාවගේ ඉල්ලීමක් නොවෙයි. ජනතාව මේක දන්නෙත් නැහැ, ජනතාව මේක අදාළ කරගෙනත් නැහැ. හැබැයි, මේක ඇත්තෙන්ම ජනතාවගේ වුවමනාවක් තමයි.

අපට පෙනෙනවා, මේ සංශෝධන ක්‍රියාත්මක කරනකොට එක්තරා කවයක වරප්‍රසාද බිඳ වැටෙනවාය කියන එක. නීතිඥ ක්ෂේත්‍රයේ ඉන්න සමහර අයගේත් වරප්‍රසාද බිඳ වැටෙනවා. අද අධිකරණය පහළට ගෙනියන්න ඕනෑ. පසුගිය කාලයේ විශාල විවේචනයක් කළා මට මතකයි, අධිකරණය ගමට ගෙනියන්න ඕනෑ, අධිකරණ බලය ගමට දෙන්න ඕනෑ කිව්වාය කියලා. අධිකරණ බලය ගමට ගෙනියන එක තමයි අපේ අරමුණ. ඒක අපේ දිගුකාලීන අරමුණක්. ඒ කියන්නේ, අධිකරණය ජනතාව ළඟට ගෙනියනවා, ජනතාව ඒකට මැදිහත් වෙනවා. එහෙම, අධිකරණය ජනතාව ළඟට ගෙනියන්න ඕනෑ. දැන් අධිකරණය තිබෙන්නේ කන්ද මුදුනේ. අධිකරණය කන්ද පා මුලට ගෙනියන්න ඕනෑ. ජනතාව ඒකට සම්බන්ධ වෙන්න ඕනෑ. හැබැයි, එතැනට යන්න බොහෝ කාලයක් ගත වනවා. ඒ තත්ත්වයට එන්න මානව සම්පත්වලත් සංවර්ධනයක් අවශ්‍යයි. අපේ රටට මේ මොහොතේදී එතැනට යන්න පුළුවන්කමක් නැහැ. නමුත් අධිකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය ප්‍රසාරණය කිරීම අත්‍යවශ්‍යයි. එය ප්‍රසාරණය කිරීම සඳහා වන ආරම්භක පියවරක් විධියට තමයි අපි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ.

විපක්ෂය තේරුමක් නැති තර්ක ගෙනෙනවා, තනි පක්ෂ ක්‍රමයට එනවා, ඒකාධිපතිත්වයක් බිහි වෙනවා වාගේ දේවල් කියමින්. එතුමන්ලා එහෙම කල්පනා කරන්නේ එතුමන්ලාගේ සංස්කෘතිය තිබුණේ ඒ විධියට නිසායි. එතුමන්ලාගේ භාවිතාව, සංස්කෘතිය පැවතුණේ ඒ ආකාරයෙන්. එවැනි සංස්කෘතියක හිටපු අයට ජනතාවාදී වෙනස්කම් කරනකොට පෙනෙන්නේ එහෙමයි. ඒකයි මේ වෙලා තිබෙන්නේ. අපට තව පැය කිහිපයයි ඉතිරිව තිබෙන්නේ. පස් වරු 7.00ට ඡන්ද විමසීම පැවැත්වෙනවා. ඒ නිසා විපක්ෂයට පුළුවන් නම් මේ අවසාන මොහොතේදීවත් ඓතිහාසික තීරණයක් අරගෙන මේ මල් වට්ටියට අත ගහලා පිනක් දහමක් කර ගන්න කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Mrs.) Chamindranee Kiriella. You have seven minutes and the Floor is yours.

[අ.භා. 2.13]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මාහට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූලික වශයෙන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අපේ රටේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු දෙකකින් වැඩි කරනවා. ඊයේ දිනයේදී සහ අද දිනයේදී විශේෂයෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සාධාරණීකරණය කිරීම සඳහා නොයෙකුත් තර්ක ඉදිරිපත් කරනවා අපි දැක්කා. නමුත්, ඒ කථා බහුතරයක් - සියයට 95ක්ම - ගත්තාම මන්ත්‍රයක් ජප කරනවා වාගේ පුනපුනා කියපු එක තර්කයක් තිබෙනවා. අපේ අධිකරණ පද්ධතියේ නඩු ගොඩ ගැසීම - backlog of cases - අඩු කිරීම තමයි මූලික හේතුව, මූලික තර්කය වශයෙන් එතුමන්ලා දක්වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිඥවරියක් වශයෙන් මමත්, සමගි ජන බලවේගයත් නඩු ගොඩ ගැසීම අඩු කිරීම අත්‍යවශ්‍යයි කියලා පිළිගන්නවා. නමුත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මූලික හේතුවක් ලෙස ඒක ඉදිරිපත් කිරීම හරියට කිතුල් ගහට නැඟපු මිනිහාටත් කියන්න දෙයක් තිබුණා හා සමානයි. මොකද, කිතුල් ගහේ ඉන්නකොට කිතුල් ගහට නැග්ගේ ඇයි කියලා අහපුවාම තණකොළ කපන්න ආවා කියායි කිව්වේ. නමුත් ඇත්තටම කිතුල් ගහට නැග්ගේ රා ගන්න. කිතුල් ගහට නැග්ගේ ඇයි කියලා අහනකොට තණකොළ කපන්න නැග්ගා කියනවා හා සමානයි මේකත්. ඇත්ත අරමුණ නොවෙයි කියන්නේ. යටි අරමුණක් තියාගෙන වෙන හේතුවක් තමයි ඉදිරිපත් කරන්නේ. විපක්ෂය, නොයෙකුත් දේශපාලන පක්ෂ, නීතිඥ සංගම්, ජාත්‍යන්තර සංවිධාන, ජ්‍යෙෂ්ඨ නීතිඥවරු වාගේ විශාල පිරිසක් මේ සංශෝධනය හදිසියේ ගෙන එන්නේ ඇයි කියලා අහන ප්‍රශ්නයට තවමත් පිළිතුරක් ලැබිලා නැහැ.

අපේ ගරු අධිකරණ ඇමතිතුමා ජූලි 03වැනි දා කැබිනට් මණ්ඩලයට ඒ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී කරුණු - හේතු - 10ක් දැක්වූවා.

මුලින්ම දැක්වූ හේතුවක් තමයි, අපේ රටේ සමාජයීය සහ ආර්ථික තත්ත්වය වෙනස්වීම සහ සෞඛ්‍ය සේවාවන්වල දියුණුව නිසා ආයු කාලය දීර්ඝ වීම කියන කාරණාව. ඊළඟට, අනික් ක්ෂේත්‍රයන්හි විශ්‍රාම වයස වැඩි කිරීම නිසා විනිසුරුවරුන්ගේත් විශ්‍රාම වයසත් වැඩි කරන්න ඕනෑ කියලා කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම පිට රටවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි නිසා අපේ රටේ විනිසුරුවරුන්ගේත් විශ්‍රාම වයස වැඩි කරන්න ඕනෑ යනාදී හේතු තමයි ඉදිරිපත් කළේ. දැන් මූලික වශයෙන් ඉදිරිපත් කරන නඩු ගොඩගැසීම කියන කාරණය, මේ කරුණු දහයෙන් අටවෙනි කාරණය තමයි මේ කැබිනට් පත්‍රිකාවේ දමා තිබුණේ. සාමාන්‍යයෙන් ඕනෑම කාරණයක් සාධාරණීකරණය

[ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය]

කරන්න ඕනෑ නම් වැදගත්ම හේතු තමයි අපි මුලින්ම සඳහන් කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මට පුදුම හිතුණා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කවුරුවත් මේ කියපු හේතුව පිළිබඳව මුල් අවස්ථාවේදී වැඩියෙන් කථා කළේ නැති එක ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ 4ක් සහ අභියාචනාධිකරණයේ 4ක් වශයෙන් අපේ රටේ අධිකරණ පද්ධතිය තුළ පුරප්පාඩු 8ක් තිබුණු බව අපි දන්නවා.අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ මේ පුරප්පාඩු පුරවා තිබුණේ නැහැ. අපේ ගරු සභානායකතුමා ඊයේ මේ සභාවට කිව්වා, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික විනිසුරුවන්ගේ පුරප්පාඩු ඉතාම කෙටි කාලයකින් පිරෙව්වා කියලා. මම හිතන විධියට ඒ අවස්ථාවේදී එතුමා සඳහන් කළා, "සමහර පුරප්පාඩු දවස් තුනකින් පිරෙව්වා, වැඩිම කාලයක් විධියට ගත වුණේ දින 12ක්" යනාදි වශයෙන්. ඉතින් ඒ ආකාරයට අධිකරණ සේවා කොමිෂන් සභාවේ විනිසුරු සාමාජිකයන් ඉතාම කෙටි කාලයකින් තෝරා පත් කර ගත්තා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරයන් එසේ ඉක්මනින් තෝරා පත් කර ගැනීමට කටයුතු නොකළේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

අපි හැමෝම දන්නා කරුණක් තමයි අපේ අධිකරණ පද්ධතිය තුළ සියයට 90ක්ම නඩු ගොඩගැහිලා තිබෙන්නේ දිසා අධිකරණයේ සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ කියන එක. ලක්ෂ 11ක් පමණ වන නඩු ප්‍රමාණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ හිර වෙලා තිබෙන්නේ නඩු 10,000ක් විතර තමයි. ඊළඟට, මහෙස්ත්‍රාත්වරුන් 50ක් අලුතින් පත් කරන්න ඕනෑ කිව්වා. නමුත් අද වෙනකොට පත් කර තිබෙන්නේ 33යි. මම කලින් සඳහන් කළ විධියට, මේ පනත් කෙටුම්පත ගෙනා වේගයෙන්ම මේ විනිසුරුවන් මහෙස්ත්‍රාත් අධිකරණවලට පත් කරන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය අපට මතු වෙලා තිබෙනවා.

අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු කලින් සඳහන් කළා, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව අදහස් දැක්වුවත්, දැන් නම් ඒ ගැන කථා කරන්නේ නැහැ කියලා. මම හිතන විධියට මේ backlog of cases, ඒ කියන්නේ නඩු ගොඩගැසීම කියන එක අවුරුදු 10ක් විතර තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. නමුත් මේ ගැන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර තිබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා නොයෙකුත් සුරංගනා කථා කියනවා. නමුත් මහ පොළොවේ යථාර්ථය ඊට වඩා වෙනස්. ඊයේ දෙහිවල අධිකරණයේදී මත්ද්‍රව්‍යවලට සම්බන්ධ කණ්ඩායම් දෙකක් අතර ගැටුමක් ඇති වුණා. ඒ වාගේම අපි දැක්කා, මහ දවල් මහ පාරේ වෙඩි තැබීම් රාශියක් සිදු වුණු බව. ඒ වාගේම දැනට සති කිහිපයකට පෙර ගල්කිස්සේදී තරුණයන් දෙදෙනෙකු ඝාතනය වුණා. ඒ අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකතුමා එතුමාගේ කනස්සල්ල ප්‍රකාශ කරලා, මේ පිළිබඳව වගකිවයුත්තන්ට ඉක්මනින්ම දඬුවම් කළ යුතු බව ප්‍රකාශ කළා. මේ විධියට අපේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් සිදු වෙලා තිබෙන අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් හිත යොමු කරන්නේ නැත්තේ ඇයි කියලා තමයි මම මේ අවස්ථාවේදී අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන්නේ මහනුවර දිස්ත්‍රික්කය. "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව මහනුවර දිස්ත්‍රික්කයේ අධිකරණ ගොඩනැඟිල්ලට හානි සිදු වුණා. එය තට්ටු තුනකින් සමන්විත එකක්. තවම එහි lift එක හදලා නැහැ. වැස්සක් ආපු හැම වෙලාවකදීම එහි ලේඛනාගාරයේ තිබෙන ඔක්කෝම බඩු, ඒ කියන්නේ නඩු භාණ්ඩ වාගේම නඩු වාර්තා අධිකරණ පද්ධතියේ ඉන්න සියලුදෙනා එකතු වෙලා සියලු වැඩ නවත්වලා පඩි පෙළ දිගේ උඩට අරගෙන යන්න ඕනෑ. මොකද, lift එක තවම වැඩ නැහැ. මෙවැනි ප්‍රශ්න තිබියදී මේවා පිළිබඳව අවධානය යොමු නොකරන්නේ ඇයිද යන්නයි මම අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දී තිබෙනවා. අපි එම තීන්දුවට ගරු කරනවා. විශේෂයෙන්ම, එම තීන්දුවේ සඳහන් කර තිබෙන්නේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රමවේදය පිළිබඳව පමණයි. එහෙම නැතුව ශ්‍රේෂ්ඨාධිකරණය කිසිදු අවස්ථාවකදී මෙම තීන්දුව හරිද, වැරදිද යන්න ප්‍රකාශ කර නැහැ. එම නිසා, අද මෙහි සිටින සියලුම මන්ත්‍රීවරුන්ගෙන්, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටින්නේ, තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන ලෙසයි. මෙහිදී වැදගත් වන්නේ අපි කළු පාට ඇඳුම් ඇඳගෙන සිටිනවාද, අළු පැහැයෙන් සැරසී සිටිනවාද යන්න නොවෙයි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් කිහිපදෙනකුත් අද අළු පැහැයෙන් සහ කළු පැහැයෙන් සැරසී සිටින බව මා දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් මම මගේ කථාව අවසන් කරන්න කැමැතියි. එතුමා කියා තිබෙනවා, "In matters of conscience, the law of the majority has no place" යනුවෙන්. ඒකෙන් කියන්නේ, "යම් ක්‍රියාමාර්ගයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අකුරට අනුකූලව විය හැකිය. නමුත්, එය ව්‍යවස්ථානුකූල වීම පමණක් හෘදය සාක්ෂිය ඉදිරියේ එය නිවැරදිද යන්න පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරක් නොවේ" යන්නයි. මට කථා කරන්න කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Susantha Dodawatta. You get 10 minutes and the Foor is yours.

[අ.භා. 2.21]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය විසින් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ Judicature Act එක සම්බන්ධයෙන් ගෙන එන සංශෝධනය පිළිබඳව කථා කළ බොහෝ අවස්ථාවලදී හෘදය සාක්ෂිය සම්බන්ධ කාරණයක් මතු කළා. මේ රටේ සුවහසක් ජනතාව 2024 සැප්තැම්බර් මාසයේදී තමන්ගේ හෘදය සාක්ෂියට අනුකූලව තීන්දුවක් අරගෙන, මේ රට වෙනුවෙන් සහ තමන් වෙනුවෙන් ජයග්‍රහණයක් ලබා ගත්තා. එම නිසා, 2024 සැප්තැම්බර් මාසය මේ රටට ඉතාම තීරණාත්මක මෙන්ම ඓතිහාසික මාසයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 සැප්තැම්බර් මාසයේ අද දිනයත් මේ රටේ ජනතාවට ඉතාම ඓතිහාසික මෙන්ම තීරණාත්මක දිනයක් කියලා මම හිතනවා. ඇයි අපි එහෙම කියන්නේ? එදා ලබා දුන් ඒ ජනවරමෙන් මේ රටේ ජනතාව අපේක්ෂා කළ, ඒ වාගේම මේ රටේ ජනතාව වෙනුවෙන් පත්වූ ජනතාවාදී රජය ලබා දුන් පොරොන්දු ඉටු කිරීමේ එක් ප්‍රධාන පියවරක් ලෙස, අපි අද සවස 7.00ට මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමට කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ යම් කණ්ඩායමක් අද පාර්ලිමේන්තු සභා ගර්භයට කළු පාට ඇඳුම් ඇඳගෙන ඇවිල්ලා ඉන්නවා අපි දැක්කා. මම හිතන විධියට,

ඇඳුමේ වර්ණය නොවෙයි වැදගත් වන්නේ. මෙම විවාදයේදී ඉදිරිපත් කරන කරුණු සහ ඒවායේ තර්කානුකූලභාවය වර්ණවත් වෙනවා නම් වඩා හොඳයි කියලා තමයි අපි හිතන්නේ. මොකද, dress code එක නොවෙයි වඩා වැදගත් වන්නේ. තමන් කොයි තරම් කරුණු සහිතව සහ තර්කානුකූලව මේ සම්බන්ධයෙන් කටයුතු කරනවාද යන්නයි වැදගත් වන්නේ. නමුත්, අපට එවැනි තත්ත්වයක් පෙනුණේ නැහැ.

මම දැක්කා විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී කියනවා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහාය දුන් අයත් අද ඇවිල්ලා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කථා කරනවා කියලා. එහෙම කියනකොට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සපු රවුෆ් හකීම් මැතිතුමා එතුමා අසල ආසනයේ ඉඳගෙන ඉන්නවා. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාත් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සලා අද කළු පාට ඇඳුමක් ඇඳගෙන මෙතැනට ඇවිල්ලා ඉන්නවා. මොකක්ද, මේ ප්‍රතිපත්තිය? කොහේ ඉඳලාද, ප්‍රජාතන්ත්‍රවාදය ගැන මේ කථා කරන්නේ?

මම දැක්කා, ඊයේ පොල්දූව මංසන්ධියේ සිට පැමිණි විරෝධතාවේදී විපක්ෂ නායකතුමා මාධ්‍ය අමතමින් කියනවා, "සමගි ජන බලවේගයේ ආණ්ඩුවක් ආපු ගමන් අපි මේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරනවා" කියලා. එක් පැත්තකින් කියනවා, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව විනිසුරුවරුන් විශ්‍රාම ගැන්වීමේ වයස වැඩි කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධීයි කියලා. ඒ නිසා, මේ සංශෝධනය අහෝසි කරලා විශ්‍රාම ගැන්වීමේ වයස නැවත අඩු කරනවාලු. නැවතත් එකිනෙකට පරස්පර විරෝධී කරුණු ඉදිරිපත් කරමින් ඔවුන් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න මම දන්නේ නැහැ. මේ රටේ සාමාන්‍ය ජනතාවගේ දේශපාලන සාක්ෂරතාව පිළිබඳව ඔවුන් කුමක් සිතාගෙන මේ විධියට කටයුතු කරනවාද කියලාත් මම දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි මේ රටේ ජනතාව වෙනුවෙන් මේ රටේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම සඳහා රජය සතු වගකීම ඉෂ්ට කරමින් තමයි මේ කටයුතු කරමින් ඉන්නේ. ඒ සම්බන්ධයෙන් අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කිරීමේදී අපට තිබෙන අභියෝග මොනවාද? මේ රටේ අධිකරණ 293ක් තුළ නඩු 1,134,474ක් පමණ ගොඩගැසී තිබෙනවා; ප්‍රමාද වී තිබෙනවා. මේ තත්ත්වය නිසා මේ රටේ ජනතාවටත්, රජයටත් සිදු වී තිබෙන බලපෑම මොකක්ද?

නඩුවක් ප්‍රමාද වෙනවා කියන්නේ යුක්තිය ප්‍රමාද වීමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නඩුවක් දීර්ඝ කාලයක් ඇදී යනවා කියන්නේ ජනතාවටත්, රජයටත් විශාල වියදමක් දැරීමට සිදු වෙනවා කියන එකයි. ඒ සම්බන්ධයෙන් ලාල් කාන්ත ඇමතිතුමාත් දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කළා. ඒ වාගේම මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ගත්තාම, ආයෝජකයන්ටත් මේ තත්ත්වය බලපානවා. විශේෂයෙන්ම බේරුම්කරණය වැනි ක්‍රියාවලීන් සඳහා ඉතා දීර්ඝ කාලයක් ගත වෙනවා නම්, ආයෝජකයන් නැවත මේ රටේ ආයෝජනය කරන්න පෙලඹෙන්නේ නැහැ. ඒක නිසා නඩු තදබදය සහ නඩු දීර්ඝ කාලයක් ඇදී යාම මේ රටේ ආර්ථිකයටත් දැඩි ලෙස බලපානවා. ඒ වාගේම අපි හැමෝම දන්නවා, මේ රටේ බන්ධනාගාරවල පවතින තදබදය පිළිබඳව. මේ බන්ධනාගාර තදබදයත් නඩු දීර්ඝ කාලයක් ඇදී යාමේ එක් ප්‍රතිඵලයක් විධියටයි අපි දකින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියල්ලත් සමඟ මේ රටේ ජනතාව අත්දැකලා තිබෙනවා, අත්විඳලා තිබෙනවා, පවතින ක්‍රමය තුළ නඩු කටයුතු අවසන් වීමට දීර්ඝ කාලයක් ගත වීම නිසා අවසානයේ ජයග්‍රාහකයන් නිර්මාණය වෙන්නේ නැහැ කියන එක. පැමිණිලිකරුවෙක් වෙන්න පුළුවන්, විත්තිකරුවෙක් වෙන්න පුළුවන්, සාක්ෂිකරුවෙක් වෙන්න පුළුවන්, මැදිහත්කාරයෙක් වෙන්න පුළුවන්, අවසානයේ සියලුදෙනාම පරාජිතයන් බවට පත් වෙනවා. මේක තමයි අපට තිබෙන අභියෝගය. ඒ අභියෝගයට හේතු වෙලා තිබෙන්නේ මොන කාරණාද? ඒ අභියෝග ජය ගැනීම සඳහා වර්තමාන රජය විසින් ගෙන තිබෙන පියවර මොනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අධිකරණ තුළ භාවිත වන තාක්ෂණය බොහෝ දුරට යල් පැන ගිය තාක්ෂණයක්. ඔබතුමා දන්නවා, ජාතික ජන බලවේගයේ රජය බලයට පත්වීමෙන් පසුව අපි අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා පියවර ගත් බව. දැන් e-filing ක්‍රමවේදය තිබෙනවා; e-courts සංකල්පය හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම, විදේශගතව සිටින සාක්ෂිකරුවන් වෙන්න පුළුවන්, විත්තිකරුවන් වෙන්න පුළුවන්, ඔවුන්ගේ සාක්ෂි online තාක්ෂණය ඔස්සේ ලබාගැනීමට හැකි වන පරිදි නීති සම්පාදනය කර තිබෙනවා. ඒ වාගේම court management system එකක් digital platform එකක් හරහා හඳුන්වා දී තිබෙනවා. මේ ආකාරයට නඩු ප්‍රමාදයට හේතු වන කාරණාවලට විවිධ ප්‍රවේශයන් ඔස්සේ විසඳුම් ලබා දෙමින් තමයි අපි මේ අවුරුදු දෙක තුළ ඉදිරියට ඇවිත් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, නඩු දීර්ඝ කාලයක් ඇදී යාමට විමර්ශන ක්‍රියාවලියේ පවතින දුර්වලතාත් බලපානවා කියලා. විශේෂයෙන්ම පොලීසියේ, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරි හිඟය, ඒ වාගේම ඔවුන්ට තිබෙන තාක්ෂණික සහ යටිතල පහසුකම්වල හිඟය අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය පිරිස් බඳවා ගනිමින්, තාක්ෂණය ලබා දෙමින් සහ යටිතල පහසුකම් සපයමින් ඉන්නවා. ඒ අනුව සමස්ත ක්‍රියාවලියම ශක්තිමත් කිරීමේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ වාගේම අධිකරණ පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම, නව අධිකරණ ඉදිකිරීම සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් සැපයීම සඳහාත් මේ අවුරුදු දෙක තුළ රජය විශාල වැඩකොටසක් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟ කාරණය තමයි, මානව සම්පත් හිඟය. අපේ පාර්ලිමේන්තුව තුළත් අධිකරණ කටයුතුවල නියැළෙන නීතිඥවරුන් ඉන්නවා. ඔවුන් දන්නවා, stenographersලාගේ හිඟය කොයි තරම්ද, අනෙකුත් කාර්ය මණ්ඩලවල කොයි තරම් හිඟයක් තිබෙනවාද කියලා. ඒ වාගේම මේ රජය බලයට පත්වීමෙන් පසුව ඒ සඳහා කොපමණ පිරිසක් බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවාද කියන එකත් ඔවුන් දන්නවා. ඒක නිසා අපි නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය බඳවා ගැනීම් සිදු කර තිබෙනවා. ඒ වාගේම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අවශ්‍ය බඳවා ගැනීම් සිදු කර තිබෙනවා. නව තාක්ෂණය ලබා දී තිබෙනවා. මේ ආකාරයට කාලයක් තිස්සේ පැවති අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාදාමය අපි අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් ඉන්නවා. එහි තවත් එක් පියවරක් විධියට තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසි දෙවන සංශෝධනය ගෙන එන්නේ. ඒ හරහා ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයස දීර්ඝ කරනවා. ඒ වාගේම අධිකරණ සංවිධාන පනතට ගෙන එන සංශෝධනය හරහා අනෙකුත් විනිසුරුවරුන්ගේ විශ්‍රාම යාමේ වයසත් දීර්ඝ කරනවා.

ඇයි අප මේක කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනිසුරුවරයෙක් කියන්නේ රජය විසින් කරන ලද ආයෝජනයක්. අපි ඔවුන්ට වැටුප්, දීමනා සහ වෙනත් පහසුකම් ගෙවලා දීර්ඝ කාලයක් ඔවුන් ආයෝජනයක් විධියට ගොඩ නඟනවා. ඇයි ඒ?

[ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා]

අපට වඩා පරිණත පරිචයකින්, අත්දැකීම්වලින් යුක්ත විනිසුරුවරුන් අපට අවශ්‍ය නිසායි. ඔවුන් යම් වයසකදී විශ්‍රාම ගිහිල්ලා ඔවුන්ගේ සේවය පෞද්ගලික අංශයට ලබා දෙනවා නම් මේ කරන ආයෝජනයේ ප්‍රතිඵලය අපට නිසි විධියට ලැබෙන්නේ නැහැ. ඒකත් හේතුවක්, අපට මෙවැනි සංශෝධනයක් ගෙනැල්ලා ඔවුන්ගේ ඒ පරිචයන් එක්ක අපේ අධිකරණ පද්ධතිය දියුණු කර ගැනීමට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතීතයේදී අපි දැක්කා තමන්ට ඕනෑ අය පත් කරගත්තු ජයවර්ධනාධිකරණ තිබුණු බව; රාජපක්ෂාධිකරණ තිබුණු බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මාලිමාව ආණ්ඩුව, මේ ජනතා ආණ්ඩුව කිසි දවසක මාලිමාධිකරණ නිර්මාණය කරන්නේ නැහැ; අනුරාධිකරණ නිර්මාණය කරන්නේ නැහැ. අපි නිර්මාණය කරන්නේ ජනතාවාදී අධිකරණයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවට එරෙහිව විපක්ෂය විසින් සමාජ මාධ්‍ය හරහා, "මේ ආණ්ඩුව ඇතුළේ බෙදීමක් තිබෙනවා, යම් කණ්ඩායම් මේකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන්න ඉන්නවා" ආදි බොරු මත ප්‍රකාශ කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Susantha Dodawatta, your time is up.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන් මම විපක්ෂයට අභියෝගයක් කරනවා. මේ ආණ්ඩුව නියෝජනය කරන්න ජනතාව විසින් මන්ත්‍රීවරු 159දෙනෙකු පාර්ලිමේන්තුවට පත් කර එවා තිබෙනවා. ගරු කථානායකතුමාගේ ඡන්දය හැරුණාම මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 158දෙනෙක් ඉන්නවා. අද රාත්‍රි 7.00ට මේ මන්ත්‍රීවරු 158දෙනාම මේ සංශෝධනයට පක්ෂව ඡන්දය දෙනවා. විපක්ෂයට මන්ත්‍රීවරු 66දෙනෙක් ඉන්නවා. පුළුවන් නම් ඒ 66දෙනා මේකට විරුද්ධව ඡන්දය දෙන්න, එහෙම නැත්නම් හෘදය සාක්ෂියක් තිබෙන කෙනෙක් ඉන්නවා නම් මේකට පක්ෂව ඡන්දය දෙන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි, මට කාලය ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. R.M. Ranjith Madduma Bandara.You have nine minutes, Hon. Member.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Ten minutes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Nine minutes.

[අ.භා. 2.32]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරුත්, අමාත්‍යවරයෙකුත් කිව්වා අප අද කළු පාට ඇඳුම් ඇඳගෙන ආපු කථාව. අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේත්, ඒ වාගේම මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයේත් අඳුරු දිනයක් නිසා තමයි අපි කළු ඇඳගෙන ආවේ. ආණ්ඩුවේ එක අමාත්‍යවරයෙක් කථා කරද්දී කිව්වා, අපි තේරී පත් වුණු ආකාරය ගැන. අපි නම් මහජනතාව ඉදිරියට ගිහිල්ලා ඡන්දය ඉල්ලලා, මනාප ඉල්ලලා තමයි මෙතැනට ඇවිල්ලා ඉන්නේ. තමුන්නාන්සේලා ඇවිල්ලා ඉන්නේ පැලවත්තෙන් තෝරා ගත්තු කට්ටිය විධියටයි. ජනතාව දන්නේත් නැහැ. තුන්දෙනාගේ පින්තූර දාලා පෝස්ටරේ ගැහුවාම පැලවත්ත කියන විධියට අත උස්සන්න තමයි මේගොල්ලන් ඇවිල්ලා ඉන්නේ. පැලවත්තේ කට්ටිය තමයි ඔය ඇවිල්ලා ඉන්නේ.

අද අප කථා කරන්නේ අධිකරණයට සිදු කරන සංශෝධන ගැනයි. අපි දන්නවා, මේ රටේ විධායකයත්, ව්‍යවස්ථාදායකයත්, අධිකරණයත් තිබෙන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න බව. විධායකයේ බලය සියයට 43ක ජනවරමකින් තමුන්නාන්සේලාට ලැබී තිබෙනවා. ඒකෙන් පස්සේ පවත්වපු මහ මැතිවරණයේදී තමුන්නාන්සේලාට මන්ත්‍රී ධුර 159ක් ලැබී තිබෙනවා. මේ රටේ ජනතාවට විශ්වාසයක් තිබුණා, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අධිකරණයට ගියාම අධිකරණය ස්වාධීනව කටයුතු කරනවා කියලා. අධිකරණය කෙරෙහි ජනතාව තුළ තිබුණු විශ්වාසය අද බිඳිලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ මේ සංශෝධනයත් එක්ක අධිකරණය අද දේශපාලනීකරණයට භාජන වෙලා තිබෙනවා කියලා ජනතාව විශ්වාස කරනවා. මෙවැනි දේවල් සිද්ධ වන හැම දාකම අපි පක්ෂයක් විධියට ඒවාට විරුද්ධ වුණා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ඉවත් කරද්දී අපි විරුද්ධ වුණා. ඒක තමයි අපේ ප්‍රජාතන්ත්‍රවාදය.

මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මේ රටේ සියලු මහා නායක ස්වාමීන් වහන්සේලා විරුද්ධ වුණත් ආණ්ඩුව ඒකට උත්තරයක් දුන්නේ නැහැ. මහෙස්ත්‍රාත්වරු, දිස්ත්‍රික් විනිශ්චයකාරවරු 65දෙනෙක් මේකට විරුද්ධ වුණා. නීතිඥ සංගමයේ නීතිඥවරු 20,000ක් විතර මේකට විරුද්ධ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු වෛද්‍ය සංගමයම මේකට විරුද්ධ වුණා. විශ්වවිද්‍යාල ආචාර්යවරු, වෘත්තීය සමිති නායකයෝ, විපක්ෂයේ සියලුම කඳවුරු මේකට විරුද්ධ වුණා. මේකට පක්ෂව ඉන්නේ පැලවත්තට ඕනෑ විධියට පත් කරපු තමුන්නාන්සේලා 159දෙනාත්, ජනාධිපතිවරයා සහ ටිල්වින් සිල්වා මහ ලේකම්වරයාත් විතරයි.

අනෙක් සේරම මේකට විරුද්ධයි. ජාත්‍යන්තරයත් විරුද්ධයි. තමුන්නාන්සේලා යන්නේ ඒකාධිපති ගමනක්ය කියලා අපි මෙතැනදී ප්‍රකාශ කරනවා. ඒ නිසා තමයි ජනතාව ඊයේ විදි බැහැලා ධාරානිපාත වැස්සේ තෙමි තෙමී, පොල්දූව හන්දියට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ ගේට්ටුව ළඟට ආවේ, මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරන්න. ඒක තමයි ජනතාවගේ මතය. හැබැයි, තමුන්නාන්සේලා ඊයේ හරිම මෝඩ වැඩක් කළා. තමුන්නාන්සේලා හිතුවා අපි ඒකට අහුවෙයි කියලා. මොකක්ද කළේ? තමුන්නාන්සේලා ජයන්තිපුර පිවිසුමේ ගේට්ටුවත් ඇරලා, පාර්ලිමේන්තුවේ ගේට්ටුවත් ඇරලා කැමරා තියාගෙන බලාගෙන හිටියා, අපි ඇතුළට ඇවිල්ලා කලබල කරයි කියලා. අපි ප්‍රජාතන්ත්‍රවාදියි. අපි නීතිගරුකයි. *[බාධා කිරීමක්]* අපි

නීතිගරුකයි. අපි ආවේ නැහැ- *[බාධා කිරීමක්]* ඔය ඉදිරි පෙළේ ඉන්න ඇමතිවරුන්ට අත දිගු කරලාම මම කියන්නම්- *[බාධා කිරීමක්]* අරගළය වෙලාවේ පාර්ලිමේන්තුව ගිනි තියන්න පාර්ලිමේන්තුව ඉස්සරහට ආවා. *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තුව ගිනි තියන්න ආවා. අපි ඒ වාගේ වැඩ කරන්නේ නැහැ. තමුන්නාන්සේලා අද වැදි බණ දෙසන්නේ. ඔබතුමන්ලා අද කියනවා, පාර්ලිමේන්තුවේ සෙංකෝලය උස්සපු එක ගැන; මිරිස් කුඩු ගහපු එක ගැන; ඒ වාගේම කථානායක ආසනයේ වාඩි වෙච්ච එක ගැන. අපි ඒවාට විරුද්ධයි. හැබැයි, තමුන්නාන්සේලාට අමතකද, පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු එක? හොඳයි දැන් ටිකක් හැදිච්ච එක; ශීලාචාර වෙච්ච එක; civilize වෙච්ච එක.

ඊයේ ආපු ඒ ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා සාමකාමීව හැසිරීම ගැන. මා අහන්නේ, පාර්ලිමේන්තුවේ ගේට්ටුව ඔහොම ඇරියේ කවදාද කියලායි. අපි පාර්ලිමේන්තුව ඇතුළට එනකොටත් අපේ වාහන check කරලායි ගන්නේ. හැබැයි, ඊයේ ගේට්ටුව ඇරලා දැම්මා. කවුද, පොලිස්පතිට ඒ නියෝගය දීලා තිබෙන්නේ?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඒක ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි. පාර්ලිමේන්තුවට එද්දී පරීක්ෂා කරනවා. තමුන්නාන්සේලා හිතුවා, අපි මෙතැනට ඇවිල්ලා කලබල කරයි කියලා. තමුන්නාන්සේලාගේ මෝඩකම්වලට අපි අහු වෙන්නේ නැහැ; භය වෙන්න එපා. *[බාධා කිරීමක්]* ඒ මෝඩකම්වලට අපි අහු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුව ගිනි තියන්න නේ ආවේ. ලාල් කාන්ත ඇමතිතුමනි, කට වහගෙන ඉන්න. අපි ළඟ තිබෙනවා, වීඩියෝ එක. පාර්ලිමේන්තුව ගිනි තියන්න ආපු උදවිය තමයි අද අපට මේ බණ කියන්නේ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ප්‍රජාතන්ත්‍රවාදියිලු; කට වහගෙන ඉන්නලු.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
තමුන්නාන්සේලා කටවල් කැපුවා, අපේ කට්ටියගේ. 1988-89 භීෂණය කාලයේ ජේවීපී එක සමහර අයගේ කටවල් කැපුවා. ඒගොල්ලෝ තමයි මේ කථා කරන්නේ. අද ඒගොල්ලෝ අධිකරණය ගැන කථා කරනවා. ඒ දවස්වල තිබුණා කැලෑ අධිකරණයක්. ඒකේ හිටියා, කීර්ති විජේබාහු කියලා කෙනෙක්. එහෙම නේද? එයා තමයි තීරණය දෙන්නේ, කවුද මරන්නේ කියලා. තමුන්නාන්සේලා දැන් වැදි බණ කියනවා. මේ දෙන බලතල අනුව අපට සැකයක් තිබෙනවා. ඇයි? පසුගිය දවස්වල විනිශ්චයකාරවරුන්ගේ මාරුවීම් කළේ ආණ්ඩුවට ඕනෑ විධියටයි. විනිශ්චයකාරවරු ආණ්ඩුවට විරුද්ධව තීන්දු දෙනවා නම්, ඒ අය අයින් කළා. එහෙමද මේ ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ? මා අහන්නේ ඒකයි. උසස්වීම් දුන්නේ තමුන්නාන්සේලාට ඕනෑ අයට. අභියාචනාධිකරණයේ හිටියා, දක්ෂ විනිශ්චයකාරවරු දෙන්නෙක්. ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩුත් තිබුණා. නමුත් ඒ අය pension යනකල්ම හිටියා. ඇයි, ඒ අයට උසස්වීම් දුන්නේ නැත්තේ? තමුන්නාන්සේලාට ඕනෑ කට්ටිය ඉහළට ගෙනැල්ලා, තමුන්නාන්සේලාට ඕනෑ තීන්දු ගන්න තමයි අද මේ කටයුත්ත තමුන්නාන්සේලා කරන්නේ. අපි ඒක පැහැදිලිවම කියනවා. ඒක කියන්න අපි භය නැහැ. තමන්ට අවනත අය තමයි හදාගන්න යන්නේ. අපි දන්නවා, "A" ශ්‍රේණියේ පාසලකට දාන්නේ ජ්‍යෙෂ්ඨ විදුහල්පතිවරු බව. එහෙම නැතිව "B" ශ්‍රේණියේ, "C" ශ්‍රේණියේ පාසලක ඉන්න අය දාන්නේ නැහැ නේ. නමුත් අද තමුන්නාන්සේලා අධිකරණයේ මර්මස්ථානවලට දාලා තිබෙන්නේ, කනිෂ්ඨ විනිශ්චයකාරවරු. ඒ, තමුන්නාන්සේලාට ඕනෑ තීන්දු ගන්නයි. ඇමතිවරුන් තුන් දෙනෙකුට විරුද්ධව නඩුවක් තිබුණා. ඒකෙන් කිව්වා, ඒ අයව උසාවියට ඉදිරිපත් කරන්න කියලා. නමුත් මොකක්ද කළේ? ඒ විනිශ්චයකාරවරයා මාරු කළා. මේ නිසායි අපට භය හිතෙන්නේ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඔබතුමා අප කියන ඒවාට උත්තර දෙන්න යන්න එපා. එතකොට කියන්න ආපු ටික කියා ගන්න බැරි වෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම කොහොමත් මට ඕනෑ ටික කියනවා, භය වෙන්න එපා. තමුන්නාන්සේ ඉස්සෙල්ලාම ගිහිල්ලා ගොවීන්ගෙන් වී ගන්න. අන්න ඒ මිනිස්සු තමුන්නාන්සේලාට විරුද්ධ වෙලා ඉන්නවා. තමුන්නාන්සේලාට ගොවියාත් විරුද්ධයි; නීතිඥයාත් විරුද්ධයි; වෛද්‍යවරයාත් විරුද්ධයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වී විකුණපු හැටි අපි දන්නවා, වී මෝල් දාලා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මිනිසුන්ට තිබෙන අයිතියක් තමයි, මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරන එක.

පසුගිය අවුරුද්දේ ඉදිරිපත් කරපු පෙත්සම්වලින් සියයට 80ක් කාට විරුද්ධව ද ඉදිරිපත් කර තිබෙන්නේ? ආණ්ඩුවට විරුද්ධව. ආණ්ඩුවේ ආයතනයකට විරුද්ධව, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්, පොලිස් නිලධාරීන්ගේ උසස්වීම් වෙනුවෙන්. ඒවා සේරම ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඉතින්, ජනතාවට භයක් දැනෙනවා. තමුන්නාන්සේලා කරන මේ සංශෝධනයෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වෙනවා, අධිකරණයේ ස්වාධීනත්වය විනාශ වෙනවා. තමුන්නාන්සේලා මොකකටද එන්නේ කියලා අපි දන්නවා.

ලාල් කාන්ත ඇමතිතුමා කථා කළා, 1978 ජේ.ආර්. ජයවර්ධනගේ ව්‍යවස්ථාව ගැන. "ජේ.ආර්. මරමු" කියලාත් තමුන්නාන්සේලා තමයි පෝස්ටර් ගැහුවේ. ජේ.ආර්.ගේ විධායක ජනාධිපති ක්‍රමය තබාගෙන, ඒකට වැඳ වැඳ, ඒකට පින් සිද්ධ වෙන්න දැන් කටයුතු කරනවා. මේක නැති කරනවා කියලා නේ කිව්වේ. "ජේ.ආර්. මරමු", "විධායක ජනාධිපති ක්‍රමය නැති කරමු" කියලා නේ කිව්වේ. එහෙනම් ඒක නැති කරන්න. ඒකට නේ, තමුන්නාන්සේලා ව්‍යවස්ථා සංශෝධන ගෙනෙන්නේ. අද වෙනකොට මේ රටේ ජනතාවට භයක් ඇතිවෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ රට ඒකාධිපති ක්‍රමයකටයි ගෙන යන්නේ.

තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ වියදම් ගැන කිව්වා. පාර්ලිමේන්තුවේ කොහේද දැන් වියදම් වැඩිවෙලා තිබෙන්නේ?

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

භෝජනාගාරයේ වියදම් තමයි වැඩිවෙලා තිබෙන්නේ, කන ඒවා වැඩිවෙලා. ඉස්සර 70ක්, 80ක් වාගේ පිරිසක් තමයි කෑවේ. දැන් කනවා 160ක්, 170ක් වාගේ පිරිසක්. මම දැක්කා, ඊයේ පෙරේදා. ගාණ වැඩියි. *[බාධා කිරීම්]* ඉතින් කන්නකෝ. කෑම පාර්සල් ගෙනෙනවා කියපු කට්ටිය නේ. වැඩියෙන්ම Members' Dining එකේ ඉන්නේ, මෙගොල්ලන්. *[බාධා කිරීම්]* තමුන්නාන්සේත් ඒ ගාණට කෑවා නේ. ලජ්ජා නැතුව දැන් කථා කරන්නේ. තමුන්නාන්සේත් කලින් පාර්ලිමේන්තුවේ ඉඳිද්දී ඒ ගාණට කාලා දැන් කියනවා, මේ ගාණට අනික් අය කෑවාලු. අයියෝ! තමුන්නාන්සේලා මේ ගෙනෙන, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන, අධිකරණය දේශපාලනීකරණය කරන, තමුන්නාන්සේලාට ඕනෑ අයව පත් කරන්න කටයුතු කරන, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි විරුද්ධ වෙනවා. අපි ඊයේ පාරට බැහැලාත් ඒක පෙන්නුවා. *[බාධා කිරීම්]* අපි ඉදිරියටත් මේක කරනවා. තමුන්නාන්සේලාට ඔච්චර ජන මතයක් තිබෙනවා නම්, පළාත් සභා මැතිවරණය පවත්වන්න. පළාත් සභා මැතිවරණය පවත්වන්න බයයි. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරලා දිගින් දිගටම මේක කල් දමන්න යනවා. මම මේ සංශෝධනයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් නවතිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chandana Sooriyaarachchi. You have ten minutes.

[අ.භා. 2.43]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංවාදය දින දෙකක් පැවැත්වෙනවා. අද එහි අවසාන දිනය. මේ සංශෝධන පිළිබඳ කථාබහට කලින් කාරණයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. මීට පෙර අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් විවිධ කථා කිව්වා. ඒවා ටිකක් විහිළු සහගත කථා. කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු අර වින්නඹු කාන්තාවකගේ උදාහරණය අරගෙන කිව්වා, දරුවෙකු අපේක්ෂාවෙන් දැත තබාගෙන ඉන්නකොට අතට වැටී තිබෙන්නේ අසූචි ගොඩක් කියලා. මට එතුමාගේ කථාව අහගෙන ඉන්නකොට ගැටලුවක් මතු වුණා, ඒ අතට වැටුණේ එතුමා ද කියලා. මොකද, එතුමාගේ දේශපාලන භාවිතාව ගත්තොත්, අපි ඉතිහාසයේ දැක තිබෙන ආකාරයට ඒ ජාතියේ වැඩ තමයි එතුමන්ලා කාලයක් කරලා තිබෙන්නේ. ඒ වාගේම, එතුමා දිට්ඨධම්ම වේදනීය කර්මය ගැන කියමින් කිව්වා, ඒවා වේගයෙන් පටිසන් දෙනවා, යද්දී බුරුතු පිටින් යනවා කියලා. එතුමාට අපි කියනවා, ආපසු හැරී බලන්න කියලා. එතුමා නියෝජනය කරපු දේශපාලන කඳවුරට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අම්මා, තාත්තා, දරුවෝ, ලේලිලා, බෑනලා, තව තව ගැව්ච්ච අය ආදී වශයෙන් බුරුතු පිටින් ඒ බලය අයුතු ලෙස පාවිච්චි කරලා දිට්ඨධම්ම වේදනීය කර්මය ලෙස හෝ කුමන හෝ ආකාරයකට අද තමන් කරපු දේවල් විඳින්න සිද්ධ වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි දකිනවා, අද සමගි ජන බලවේගයේ ඇතැම් නීතිඥ මන්ත්‍රීතුමන්ලා අධිකරණයේ විනිසුරුවරුන් පිළිබඳව, ඒ වාගේම ඒ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව ඉතාම ද්වේශ සහගත, වෛරී මතයක්, එවැනි ස්වභාවයක් ජනගත කරන්න සැහෙන උත්සාහ දරන බව. ඒකට හේතුව මොකක්ද කියන එක ඉතාම පැහැදිලියි. අද අපේ රටේ අධිකරණ පද්ධතිය තුළ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ඉතාම ශක්තිමත්ව, නිවැරදිව, කාර්යක්ෂමව ක්‍රියාත්මක වෙද්දී විපක්ෂයේ බොහෝ අයට ඒ පිළිබඳ ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ නිසා පොළොවේ පස් කාගෙන, බඩ කපාගෙන, කන් විකාගෙන ඒගොල්ලන් උත්සාහ කරනවා, අධිකරණ පද්ධතිය පිළිබඳව ද්වේෂයක්, වෛරයක් නිර්මාණය කරන්න. නමුත් මම හිතන විදියට, ජනතාවට එහෙම ප්‍රශ්නයක් නැහැ. ඒ ප්‍රශ්නය තිබෙන්නේ විපක්ෂයට කියන එකයි අපේ අදහස.

මට කලින් අදහස් දක්වපු විපක්ෂයේ, නුවර ඉන්න මන්ත්‍රීතුමියක් කිව්වා - එතුමිය නීතිඥතුමියක්ය කිව්වා - අධිකරණයෙන් දීලා තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟද, නැද්ද කියන කාරණයයි කියලා. ඔව්, ඉතාම පැහැදිලියි. නීතිඥවරියක් විධියට එතුමියට තේරෙන්නේ නැද්ද දන්නේ නැහැ, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ආණ්ඩුව සතුයි කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව යම් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම ආණ්ඩුවේ වගකීමක්; ආණ්ඩුවේ කාර්යභාරයක්; ආණ්ඩුවේ විෂයයක්. ඒ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිද නැද්ද, අනුකූලයිද, අනනුකූලයිද කියන එක තමයි ඒ පිළිබඳව අධිකරණයට යම් පෙත්සමක් ඉදිරිපත් වුණොත් විභාග කරන්නේ. ඉතින් ඒක ඉතාම පැහැදිලියි. ඒ නිසා තීරණ ගැනීම වැරදි වෙන්නේ නැහැ. ඒ තීරණ අපේ රටේ මූලික නීතියට පටහැනිද, නැද්ද කියන එක වග විභාග කිරීම තමයි ඒ පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් වුණාට පස්සේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්යභාරය වෙන්නේ. අද ඒක සම්පූර්ණයෙන්ම ඉටු කරලා තිබෙනවා. ඒ නිසා මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපේ රටේ මූලික නීතියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඉතා අනුකූල එකක් බව ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ සංශෝධනය ගෙනෙන්න බලපෑ හේතුව මොකක්ද? මම තවත් අභියෝගයක් කරනවා විපක්ෂයට. තවත් පැය කිහිපයක් තිබෙනවා, පුළුවන් නම් අද හවස 7.00ට කලින්, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතත්, ඒ වාගේම අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතත් ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි වෙන්නේ කොහොමද, ඒ වාගේම ඒ තුළින් ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම ඇති වෙන්නේ කොහොමද, අධිකරණයේ ස්වාධීනත්වය නැති වෙන්නේ කොහොමද, ඒ තුළින් විනිසුරුවරුන්ට ඇතිවන බාධා මොනවාද යනාදිය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමක් කරන්න. එක එක කථා කිය කියා ඉන්නේ නැතුව, තමන් නඟන චෝදනාවේ පදනම මොකක්ද කියන එක පිළිබඳව හරි තාර්කික කරුණු පැහැදිලි කිරීමක් මේ ගරු ව්‍යවස්ථාදායකයට - මේ පාර්ලිමේන්තුවට - කරන්න කියලා මම කියනවා.

මේ සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, විශේෂයෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය තවදුරටත් ශක්තිමත් කිරීම; ඒ වාගේම ගොඩගැහිලා තිබෙන නඩු ප්‍රමාණය කාර්යක්ෂමව අවසන් කරලා, ජනතාවට යම් සහනදායී තත්ත්වයක් නිර්මාණය කරදීම; අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කිරීම සඳහා, අධිකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා දැනට ඉන්න පළපුරුදු විනිසුරුවරුන්ගේ සේවය තවදුරටත් ලබා ගැනීම. ඒ අරමුණ, ඒ චේතනාව ඉතාම පිරිසිදුයි; පැහැදිලියි. ඒ චේතනාව ප්‍රජාතන්ත්‍ර විරෝධී එකක් නොවෙයි. ඒක ජනතාවාදී වුවමනාවක්; අරමුණක්. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිසිදු ආකාරයකින් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි, ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි එකක්

නොවෙයි කියලා. ඒක ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන තීන්දුවක්. ඒ වාගේම මේ රටේ ජනතාව අපේක්ෂා කරන දෙයක්. ඒ වාගේම ඒක ජනතාවාදී තීරණයක් බව අපි ඉතා පැහැදිලිව මේ වෙලාවේ කියන්න ඕනෑ.

ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රී, නීතිඥ සුසන්ත දොඩාවත්ත සහෝදරයාත් පැහැදිලි කළා, යුක්තිය ඉටුවීම ප්‍රමාද වීම බරපතළ සමාජ ගැටලුවක් බව. නඩු කල්යාම තුළින්, නඩු අවසන් කරන්න ප්‍රමාදවීම තුළින් සිද්ධ වෙන්නේ යුක්තිය ඉටුවීම ප්‍රමාදවීම; සාධාරණත්වය අපේක්ෂා කරන සමාජයට යුක්තිය ඉටුවීම ප්‍රමාද වීම. අපි දැක්කා, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු පාස්කු ප්‍රහාරය පිළිබඳ අධිකරණමය කටයුත්තට බාධා කරන්න කොයි ආකාරයෙන්ද උත්සාහ කළේ කියලා. විමර්ශන නිලධාරින් වෙනස් කරමින්, විවිධ අයට අඩන්තේට්ටම් කරමින්, පරීක්ෂණ නිලධාරින් අත්අඩංගුවට ගනිමින්, පාස්කු ප්‍රහාරයට අදාළව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට පසුගිය ආණ්ඩු කාලයේ කොතරම් බාධා කළාද කියලා අපි දැක්කා. හැබැයි, වත්මන් ජාතික ජන බලවේගය ආණ්ඩුව කාලයේ ඊට අවශ්‍ය කරන පසුබිම සපයලා, ඒ ක්‍රියාවලිය ශක්තිත් වුණා; යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වේගවත් වුණා. නඩු කල්යාම තුළින් සිද්ධ වෙන්නේ, යුක්තිය අපේක්ෂා කරන සමාජයේ අපේක්ෂාවන් තවදුරටත් බිඳවැටිලා, ඒ සමාජය ව්‍යසනකාරී සමාජයක් බවට පත්වීමයි.

නමුත්, අද මේ කරන සංශෝධන ක්‍රියාවලිය ඇතුළේ යුක්තිය ඉටුවීම ප්‍රමාද වීම වළක්වාගන්න පුළුවන්කම තිබෙනවා. මොකද, නඩු කල්යෑම තුළ යුක්තිය ඉටු වීම ප්‍රමාද වීම අපට දක්නට ලැබුණා. විශේෂයෙන්ම තාජුඩීන් ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් යුක්තිය ඉටු වීමේ අපේක්ෂාව සමාජයට තිබෙන බව අපි දැක්කා. එක්නැලිගොඩ අතුරුදහන් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙනුත් වේගයෙන් යුක්තිය පසිඳලීමේ අවශ්‍යතාව සමාජයට තිබෙනවා. ක්‍රිෂ් ගනුදෙනුව, එයාර්බස් ගනුදෙනුව, මිග් යානා ගනුදෙනුව, මහ බැංකු බැඳුම්කර වංචාව ආදී වශයෙන් සමාජය අපේක්ෂා කරන, කඩිනමින් යුක්තිය බලාපොරොත්තු වන කාරණා තිබෙනවා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව මේ කාරණය කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ ආණ්ඩුවේ අභිලාෂය, අපේක්ෂාව, චේතනාව වන්නේ, මේ රටේ ජනතාවට වඩා කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් මඟින් යුක්තිය පසිඳලීම සහ ඒකේ ප්‍රතිඵල අපේක්ෂා කරන සමාජයට ඒ අවශ්‍ය සහනය කඩිනමින් ලබා දීමයි. මේක පද්ධතියක කරන ප්‍රතිසංස්කරණයක්.

ඊළඟට, විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස විතරක් දීර්ඝ කරන්නේ ඇයි, රාජ්‍ය සේවයේ අනෙක් අයගේ විශ්‍රාම වයස දීර්ඝ කරන්න බැරි ඇයි කියලා අහනවා මම දැක්කා. අපි දන්නවා, දැනටත් වෛද්‍ය සේවාවේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවා කාලය වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කර තිබෙන බව. ඒ වාගේම ඒ ඒ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල සිටින වෙනත් විශේෂ වෘත්තීය හැකියාවන් තිබෙන අය විශ්‍රාම ගියාට පස්සේ ඔවුන්ට සේවා දිගු ලබා දීලා ඒ අයගේ සේවය නැවත ලබා ගන්නවා. හැබැයි විනිසුරුවරුන් සම්බන්ධව ගත්තොත්, එහෙම කැමැති කැමැති අයට සේවා දිගු ලබා දීලා කටයුතු කරන්න බැහැ. අන්න ඒවායෙන් තමයි අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් ඇතිවන්නේ. එසේ බලපෑම් ඇතිවීම වැළැක්වීම තමයි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සහ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීමෙන් අපි අපේක්ෂා කරන්නේ. ඒ කියන්නේ ඒ තුළින් අපේක්ෂා කරන්නේ සමස්ත අධිකරණ පද්ධතියේම ඉන්න විනිසුරුවරුන්ගේ සේවා කාලය තවත් වසර දෙකකින් දීර්ඝ කිරීමයි. ඒක ඉතාම පැහැදිලියි.

විශේෂයෙන්ම ඊයේ විවාදය ආරම්භ කරපු විපක්ෂයේ නීතිඥ මන්ත්‍රීතුමා කිව්වා, අධිකරණ ක්‍රියාදාමය සාධාරණ නැහැ කියලා. අපි කියන්නේ, ඒක අභියෝගයට ලක් කරන්න තිබුණේ එහෙම නොවෙයි කියලායි. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් 72ක් විතර ලැබිලා තිබුණා. ඒවා ඉතාම විවෘතව ඒ අධිකරණයේදී වගවිභාගයට ලක් වුණා. එතකොට, ඒවාට දායක වෙච්ච මන්ත්‍රීවරුන් ඇවිල්ලා අද පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා කියනවා, අධිකරණ ක්‍රියාදාමය සාධාරණ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කලින් කිව්වා වාගේම අදත් කියනවා, ඒගොල්ලන්ට ඕනෑකම තිබෙන්නේ, මේ අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව මිනිස්සු තුළ අවිශ්වාසයක්, ද්වේෂයක්, වෛරයක් නිර්මාණය කරන්න කියලා. ඒක අද විපක්ෂයේ තක්කඩි වුවමනාවක් බවට පත් වෙලා තිබෙනවා කියන එක ඉතාම පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය බලයට පත්වන්න කලින් තිබිච්ච විධිය මේකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chandana Sooriyaarachchi, you need to wind up now.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

කලින් තිබුණු විධිය අනුව නම් ආණ්ඩුව බොරු කියනවා. ජනතාවට යම් ප්‍රමාණයක හරි ඇත්තක් දැනගන්න තිබ්බේ විපක්ෂය. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව ආවාට පස්සේ අපි කරන දේ ඉතා පැහැදිලිව, ක්‍රියාමාර්ගය ඉතා පැහැදිලිව, නිශ්චිතව ජනතාවට කියනවා. ජනතාව ඒක දන්නවා. හැබැයි අද විපක්ෂයට වෙලා තිබෙන්නේ පටන් ගත්ත දවසේ ඉඳලාම බොරු කියන තැනට පත්වීමයි. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව විපක්ෂය මවපු බිල්ලෝ කොච්චරද කියනවා නම් ඉතාම බරපතළ බිල්ලෝ නිර්මාණය කරලා, බොරු කියලා සමාජයත්, ලෝකයත්, රටත් නොමඟ යවලා ඒගොල්ලන් උත්සාහ කළා, මේ ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධත්වයක් ගොඩනඟන්න. නමුත්, ඒක පුස්සක් බව අපට ඊයේ ඉතා පැහැදිලිව පෙනී ගියා.

ඊයේ මේ පාර්ලිමේන්තු වටරවුමට ආපු විරෝධතාකරුවන්ට ඔවුන්ගේ විරෝධතාව දක්වන්න අපි ගේට්ටුව ඇරලා දුන්නා. ඉතිහාසයේ පළමුවැනි වතාවට ඊයේ සිද්ධ වෙච්ච දේ මේකයි. සාමාන්‍යයෙන් උද්ඝෝෂණයකදී අපට බාධා වන්නේ ගේට්ටුව නම්, barrier එක නම් අපේ අරමුණ ඉටු කරගන්න, අපේ අවශ්‍යතාව අවධාරණය කරන්න අපට ඒක බිඳගෙන ඉස්සරහට යෑමේ අවශ්‍යතාවක් තිබෙනවා. නමුත් ඊයේ මොකක්ද වුණේ? ගේට්ටුව ඇරලා දුන්නා, තමන්ගේ විරෝධතාව දක්වන්න. හැබැයි ඒගොල්ලන්ට ආපහු හැරිලා යන්න සිද්ධ වුණා.

ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම සිදු වුණා කියලා සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා කිව්වාට මේ ගෙවිච්ච අවුරුදු දෙක ඇතුළේ ජාතික ජන බලවේගය ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත්, මිනිස්සුන්ගේ නිදහසත්, ජනතාවගේ ජීවත් වීමේ අයිතියත් සහතික කරමින් සැලසුම් සහගත පාලනයක් ඉදිරියට ගෙනියන්න. ඒ නිසා මේ රටේ ජනතාවගේ යුක්තිය පසිඳලීමේ අයිතිය, ඒ අවශ්‍යතාව, අපේක්ෂාව තවත් ශක්තිමත් කරන ක්‍රියාමාර්ගයක් තමයි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

සංශෝධනයත්, ඒ වාගේම අධිකරණ සංවිධාන පනතට ගෙනෙන සංශෝධනයත් කියන එක පැහැදිලිව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Rajakaruna. You have five minutes and the Floor is yours.

[අ.භා. 2.55]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ නොයෙක් අය කියනවා, පසුගිය කාල සීමාවලදී - පසුගිය ආණ්ඩුවලදී - රටට අහිතකර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු වෙලා තිබෙනවා කියලා. ඔව්, ඒකට අපි එකඟයි. හැබැයි, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන එනකොට ඊට විරුද්ධව පෙනී හිටපු කණ්ඩායමක්, අපි. ඒ නිසා අපට විශේෂයෙන් අයිතියක් තිබෙනවා, වැරැද්දක් වෙනකොට ඒ වැරැද්ද පෙන්වා දෙන්න. තමුන්නාන්සේලාව පත් කළේ ඒ වැරදි නිවැරදි කරන්න මිසක්, පසුගිය කාලයේ වැරදි වුණා, ඒ නිසා අපි තවත් වැරැද්දක් කරනවා කියන්න නොවෙයි. කරුණාකරලා මේ රටේ අධිකරණයේ තිබෙන ස්වාධීනත්වය විනාශ නොකර, අධිකරණය පැලවත්තකරණය නොකර මේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න කියලා තමයි ලෝකයම කියන්නේ.

ඔබ සියලුදෙනා පැලවත්තත් එක්ක එකතු වෙලා කරන මේ කුමන්ත්‍රණයට විරුද්ධව අපේ ගරුතර මහා නායක ස්වාමීන් වහන්සේලා නිවේදනයක් නිකුත් කළා, නීතිඥ සංගමය නිවේදන නිකුත් කළා, ඊට විරුද්ධව පෙනී සිටියා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය, Commonwealth එකේ නීතිඥ සංගමය ආදී දේශීය, විදේශීය බොහෝදෙනා මේක කරන්න එපා කියන ඒ බලපෑම සිදු කළා; ඒ අදහස ප්‍රකාශ කළා. හැබැයි, ඒ හැම දෙයක්ම අමතක කරලා, ඒ දේවල් ශත පහකටවත් ගණන් ගන්නේ නැතිව ඔබ කටයුතු කරනවා. ගරුතර මහා නායක ස්වාමීන් වහන්සේලාගේ ලියුමට මොනවාද වුණේ කියලාවත් සමහර අය දන්නේ නැහැ. ඒ මහා නායක ස්වාමීන් වහන්සේලාගේ ලිපිය කුණු බක්කියට දාන්න සිදු වුණා. ඉතින්, මෙන්න මේ විධියට තමයි ඔබ අද ඒකාධිපතිවාදයකට සැලසුම් කරන්නේ. එදා 1988-89 යුගයේදී ඔබ රාජ්‍ය බලය ගන්න උත්සාහ කළා. අන්න ඒක අද නීත්‍යනුකූලව සිදු කරන්න උත්සාහ කරනවා.

අපට මතකයි, 1988-89 යුගයේදී ඔබ රාජ්‍ය බලය ගන්න කරන්න පුළුවන් හැම දෙයක්ම කළ ආකාරය. ජීවිත දහස් ගණනක් විනාශ කළා, මිනී මරලා, බෝම්බ ගහලා, වෙඩි තියලා, ගිනි තියලා. මේ පාර්ලිමේන්තුවටත් බෝම්බ ගහපු කණ්ඩායම අද ආණ්ඩු බලය අරගෙන රාජ්‍ය බලය ගන්න ගහන තවත් එක් ගැටයක් තමයි, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඔබතුමන්ලා දන්නවා, පසුගිය ආණ්ඩුවලදී රටට අහිතකර ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙනා බව. ඒවා ගෙනැල්ලා ලොකුකමත් කියෙව්වා. හැබැයි, අන්තිමට ජාත්‍යන්තරයත් මැදිහත් වෙලා, බලපෑම් කරලා GSP Plus සහනාධාරයත් නැති වුණා. මම මේ වෙලාවේ ඉතා පැහැදිලිවම අනතුරු අඟවනවා, මෙන්න මේ වාගේ තත්ත්වයක් මත ජාත්‍යන්තර වශයෙන් අපට බලපෑම් ඇති වන්න පුළුවන් බවට.

ඉදිරියේදී ඔබ මෙතැන මහලොකුවට තුනෙන් දෙකේ බලයක් අරගෙන මේක නීතියක් බවට පත් කරයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් බවට පත් කරයි. ඔබට මන්ත්‍රීවරුන් 158දෙනෙක් ඉන්නවා, ඒක කරන්න පුළුවන්. මොකද, මේ සම්බන්ධව අපි බලාපොරොත්තු නොවුණු ආකාරයට අධිකරණය තීන්දුවක් ලබා දුන්නා. හැබැයි, ඔබ කරන මේ වැඩෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට විශාල හානියක් සිදු වනවා. ජාත්‍යන්තරය කියන්නේත් ඒකයි. මහා නායක ස්වාමීන් වහන්සේලා කියන්නේත් ඒකයි. දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, වෘත්තීය සමිති ආදී ඒ සියල්ල කියන්නේත් ඒකයි. හැබැයි, ඊට විරුද්ධව තමුන්නාන්සේලා කටයුතු කරලා අන්තිමේදී මොකක් වෙයිද? මම මේ කථා කරන්නේ, අපි මේ පෙනී සිටින්නේ තමුන්නාන්සේලාත් වෙනුවෙන්. තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවාද, සදාකාලිකව ආණ්ඩු පක්ෂයේ ඉන්න? නැහැ. සදාකාලිකව ආණ්ඩු පක්ෂයේ ඉන්න කණ්ඩායම් නැහැ. ඔහොම ගොඩක් අය ආවා. මැරෙනකම් ජනාධිපති වෙන්න හිටියා. තමුන්නාන්සේලා තමයි ඒ අයව ජනාධිපති කරන්න වැඩියෙන්ම මහන්සි වෙච්ච කණ්ඩායම. අපි නොවෙයි. මැරෙනකම් ජනාධිපති වෙන්න හිටපු අයට අවුරුදු තුන හතරක් යනකොට රට අතහැර දාලා යන්න සිදු වුණා.

එම නිසාම තමයි අපි කියන්නේ, ඔබතුමන්ලා වෙනුවෙනුත් අද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට අපේ විරෝධය ප්‍රකාශ කරන බව. කරුණාකරලා හිතට එකඟව, හෘදය සාක්ෂියට අනුව රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව වෙනුවෙන් මේ වාගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩකටයුතු ඉටු නොකරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ruwan Wijeweera. You have 10 minutes.

Order, please! Before he starts, the Hon. Deputy Chairperson of Committees will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[3.01 p.m.]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Thank you very much, Hon. Deputy Chairperson of Committees, for giving me this opportunity to be part of

this important Debate on the Twenty Second Amendment to the Constitution Bill and the Judicature (Amendment) Bill.

Madam, the Twenty Second Amendment to the Constitution is not a matter that should divide Parliament. Every Member of this House should support the fight against corruption, the battle against illegal drugs and the Government's wider effort to strengthen the rule of law. There should be no ideological division when it comes to building institutions which could protect public money, investigate serious crimes and ensure that justice is available to every citizen. The Government's accelerated campaign against corruption and narcotics -"*Ratama Ekata*" Programme under the Clean Sri Lanka campaign - is part of the broader effort to rebuild public confidence in government institutions.

Sir, I believe everyone knows that we are slowly emerging from the worst economic crisis in our recent history; we are moving from a period of stabilization towards growth. That growth must be equitable, sustainable and founded on strong institutions. It must be supported by a determined effort to tackle bribery, corruption and the abuse of public trust.

Madam, what Parliament is considering today is part of that wider programme of judicial and criminal justice reform. It is intended to strengthen the capacity of the courts, improve administration of justice and provide a more effective foundation for enforcing the law.

The Supreme Court has now determined that the provisions of the Twenty Second Amendment to the Constitution Bill do not require approval by the people at a Referendum. The Court has also determined that the Judicature (Amendment) Bill, too, is not inconsistent with the Constitution, and may be passed by a simple majority of Parliament. The Court further found that the relevant provisions of the two Bills apply on a non-discriminatory and non-discretionary basis. It concluded that the provisions do not impair the independence of the Judiciary in the manner alleged by the petitioners.

Madam, it clears the Constitutional path for Parliament to consider and pass these reforms with the required majority. It does not remove Parliament's responsibility to debate the provisions carefully nor does it diminish the importance of judicial independence. Both these requirements have been respected by the Supreme Court.

When an independent Judiciary is able to do its work and criminal investigators are free from political interference, the law can reach even those who once believed themselves beyond accountability. No person, however powerful or well-connected, should assume that influence could permanently shield them from investigation or prosecution.

Madam, our position, the Government's position, in this regard is very clear: institutions must be allowed to do their work; investigations must be conducted according to the law; prosecutors must exercise their independent responsibilities; courts must decide on cases based on evidence and in accordance with the law and accountability must not depend on political connections. That is the stance and the position of the Government in this regard.

The Twenty Second Amendment to the Constitution is not only a part of the wider judicial reforms this Government has undertaken: it is not only a part. There is no doubt that the Supreme Court's Determination gives Parliament the Constitutional guidance necessary to move forward. But, this is not a moment for triumphalism. It is not a contest in which the Government has defeated the Opposition; it is not a victory for one political party over another. So, there is no defeat or victory in this regard. This is a collective effort that we all must strive for. It is a step forward for the people who wait for justice. Madam, we all know that the people of this country have been waiting for a long period of time for justice to be meted out. So, we all should understand that as well.

For too long, citizens have been entering courts seeking relief and have been facing years of delay. Families wait for decisions; victims wait for a closure of their cases; accused persons wait for their cases to be heard; businesses wait for disputes to be resolved; witnesses grow old; evidence becomes more difficult to be preserved and public confidence suffers whenever justice is delayed beyond a reasonable time

Madam, there is a very important and very popular legal maxim which says "justice delayed is justice denied". It highlights the importance of an effective judicial system in any country. The figure of pending cases before the country is deeply troubling. Government data indicates that approximately 1.1 million cases remain pending in Sri Lankan courts. Behind that number are real human lives, not statistics, but parents, children, workers, entrepreneurs, victims and accused persons, whose futures remain uncertain. Therefore, the Government's responsibility is to confront that problem honestly and systematically.

Madam, the Judicature (Amendment) Bill must, therefore, be read together with the wider judicial reform programme. It raises the retirement age of judges by two years on a non-discriminatory and non-discretionary basis. It also provides for an increase in the number of Judges in the Court of Appeal and the High Court, together with safeguards concerning an individual who holds the Office of Chief Justice for an extended period.

These are not measures designed to favour one individual or one political faction. The common argument the Opposition is levelling against us is nothing else, but that this Constitutional reform is targeting one individual, which is very wrong and false. They are structured as general institutional measures. The Supreme Court considered the relevant provisions and concluded that the two Bills, taken as a whole, do not impinge on the independence of the Judiciary in the manner alleged by the petitioners.

Judicial reform cannot be reduced to slogans; it must be assessed against the Constitution, the separation of powers, the independence of judges and the practical ability of courts to deliver justice. The Court has performed its constitutional function and Parliament must now perform its legislative function responsibly.

But, we must also be candid. Changing the retirement age or increasing the number of judges alone would not clear a backlog of this scale. It is very clear that increasing the retirement age or increasing the number of judges alone would not make this endeavour successful. There are many more things to be done.

A modern justice system requires a complete chain, from investigation to prosecution, from forensic examination to court administration, from filing of a case to the delivery and enforcement of the judgment. That is why the Government has announced plans to strengthen the entire criminal justice system. Those plans include the recruitment of an additional 10,000 police officers, the expansion of forensic capacity through thousands of additional forensic technicians and recruitment and strengthening of court clerks and other essential personnel.

The reforms must also be accompanied by accountability. Additional resources must produce measurable results. The public deserves transparent information about vacancies, case disposal, adjournments, forensic turnaround times and the age of pending cases. The Government must be prepared to report progress, identify failures and correct them.

Madam, at the same time, efficiency must never mean abandonment of fairness. There are various things to be done to achieve that target. The rights of accused persons must be protected; victims must be treated with dignity; judges must be able to decide cases independently and without fear and legal representation, due process and the rule of law must remain the foundation of every reform.

It was frequently argued in Parliament as well as outside by the Opposition that this Constitutional Amendment is going to destroy the independence of the Judiciary. That was the common argument the Opposition was levelling against us, the Government. In the discussion of judicial independence, the Supreme Court emphasized that judges must decide cases according to the law and the evidence and not according to public pressure, social-media posts, political demands, media campaigns or the wishes of any individual or party. That principle protects every citizen, including those who disagree with the Government.

The Government invites every party in this House to approach the next stage with that objective. Let us improve administration, invest in people and technology, strengthen investigations, prosecutions, forensic services and court management and make sure that a citizen's access to justice does not depend on wealth, influence or political connection. That very clear motive, everybody should understand. So, this is not about one Government or one Opposition, but about the integrity and effectiveness of the Republic's justice system. Therefore, let us proceed with constitutional discipline, practical ambition and urgency not for political advantage, but for the people of Sri Lanka who have waited long enough for quick justice.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[3.12 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Chairperson of Committees, the question of constitutional validity for purposes under Article 83 has been answered by Supreme Court saying that a Referendum is not required, but that does not conclude the Parliamentary Debate. The Supreme Court has determined what Parliament may constitutionally enact. Parliament must still determine what Parliament ought to enact, having regard to constitutional principle, institutional independence and long-term precedents. Constitutional validity is not necessarily the same thing as constitutional wisdom. Therefore, let us look into this matter.

Madam, a maximum six-year tenure is introduced for future Chief Justices. The Supreme Court has directed the addition of a proviso, expressly excluding the person holding the Office of Chief Justice from that six-year limitation when the Act comes into operation. My central objection is that this is about institutional independence. I am not making any allegation against any individual judge; I do not question the integrity, qualifications or dignity of the Chief Justice or any other judge, but a perception has emerged to the effect that the Government is acting with an improper motive. Madam Deputy Chairperson, there is a famous idiom or maxim which says "power corrupts, and absolute power corrupts absolutely". That applies to this Government, according to the arguments we are placing.

Here, I am not alleging that any judge requested for an extension of tenure. Be that as it may, however, a Constitutional safeguard must be judged not only by the intentions of the people exercising power today, but also by the precedent it creates for governments exercising power tomorrow. Judicial independence is not merely the absence of actual interference, but it also requires protection against the perception of possibility of institutional influence. That is the issue here. So, the crucial distinction between prospective and retrospective application must also be dealt with. If 67 years is the appropriate retirement age, why should it not apply prospectively to judges appointed after this Amendment?

A judge accepts office under a particular constitutional framework and that framework determines the conditions governing his or her tenure. Parliament is now proposing to alter the retirement age while the judges are already in office. This, therefore, has a direct effect on the tenure of the serving judges. On the other hand, prospective application would avoid any perception of targeting and inducement, protect judicial independence, create a clear rule for future appointments, avoid transitional constitutional controversy and prevent future governments from using the same mechanism to influence the composition of the Judiciary, which is the danger. So, the safest constitutional rule is one which applies prospectively and does not depend upon the identity of the judges presently sitting.

Then, we observe that the Supreme Court's own Determination creates an important distinction concerning the Chief Justice. The Court required that the Bill expressly provide that that six-year term limit will not apply to the person holding the Office of Chief Justice when the Act comes into operation. That is constitutionally significant. Why was that transitional provision necessary? Why would applying the six-year term limit to the incumbent potentially raise a tenure issue? Then, may I ask, if changing the tenure of the incumbent Chief Justice requires protection, why should changing the retirement age of other incumbent judges be treated as institutionally insignificant? Does this not demonstrate that changes affecting the serving judicial office-holders require particular constitutional caution? I would dare say that the suggested Amendment by the Court itself demonstrates the importance of prospective protection of judicial tenure.

Then, let us deal with Article 132.(3) and the Full Bench issue now. What happened in that? When this issue was raised, petitioners requested that constitutional challenges to be heard by a Full Bench of all sitting Supreme Court Judges. The request was rejected and the matter continued before the five-judge Bench originally constituted by the Chief Justice. The reported argument by the Attorney-General was that Article 132.(3) gives the Chief Justice authority to determine the composition and the number of Judges constituting a bench. A request was made for the constitutional challenge to be heard by a Full Bench because the legislation directly affected the tenure and conditions of service of the entire Judiciary. That request was declined and the matter proceeded before the five-judge Bench constituted by the Chief Justice.

Then, Madam, let us examine the argument of institutional conflict of interest. The petitioners' argument deserves Parliamentary consideration even though the Court rejected it. Their concern, essentially, was that the Bill directly affects the retirement age of the serving judges. The Judges hearing the constitutional challenge themselves are members of the Judiciary, whose institutional conditions would be affected. Therefore, the question arises whether the ordinary principle that no person should adjudicate a matter in which he or she has a direct interest should apply. The Court rejected that argument, citing the doctrine of necessity.

The doctrine of necessity may answer the question, who can constitutionally hear the case, if no alternative court exists? But, that is not necessarily the same question as what legislative procedure best protects public confidence in judicial independence? That is the question here; that distinction is very important. The doctrine of necessity does not resolve the policy question. The Court relied on the doctrine of necessity because the Supreme Court has exclusive constitutional jurisdiction over the determination. Therefore, if no other court could determine the constitutional validity of a Constitutional Bill, the Court cannot simply decline to exercise jurisdiction even where an institutional interest exists. But, Parliament is in a different position. Parliament could choose a more cautious legislative approach, apply the increased retirement age prospectively, consult the Judiciary and the legal profession, undertake broader constitutional reform and separate judicial administration from changes affecting the serving judges. The doctrine of necessity may justify judicial adjudication, but it does not necessarily justify legislative intervention into the existing tenure arrangements.

Then, let me come to Article 108, diminution vs enhancement. The Court's substantive reasoning distinguishes a reduction in judicial tenure or emoluments from a general enhancement of tenure applicable across the Judiciary. The Court treated the proposed extension as an across-the-board enhancement rather than a reduction or a selective benefit. But, Parliament should consider a further question. The fact that something is an enhancement does not automatically eliminate every institutional concern. For example, an additional two years has economic value, it extends the period during which a judge remains in office, changes the composition of the Judiciary and also potentially changes the timing of succession and affects appointments, which would otherwise become available. Therefore, an enhancement of tenure could still have constitutional and institutional consequences, even if it is not a diminution of existing rights. That is my argument, Madam.

Then, let me deal with the legislative inducement issue. The petitioners argued that extending the tenure of sitting judges could be perceived as a financial or institutional inducement. The Court rejected the characterisation of the extension as a "legislative bribe". I would not use that expression or such characterisation. Instead, I would say, even where an across-the-board extension is legally characterised as an enhancement rather than an inducement, Parliament must consider how such a measure may be perceived when it directly benefits the serving constitutional office-holders. That is a much stronger institutional argument. This is why the perceptions of bias and influence must be done away with because it affects the perception among the people regarding the confidence placed in the Judiciary.

Then, Madam, let me also deal with the argument on judicial experience. I do not dispute the value of experience. But, experience is an argument for judicial policy; it is not necessarily an argument for changing the tenure of judges already holding office. The two questions should be separated. What should the retirement age be in the future? Should that new age be applied to judges already in office? With regard to judicial vacancies and court delays, the objective is to reduce delays and increase the number of judges.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන්වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Madam, I will conclude.

The Bill itself increases the number of Judges of the Court of Appeal from 19 to 24 and the number of Judges of the High Court from 110 to 120. I have dealt with in detail why the expansion of the courts matter and all other issues in my prepared speech.

Therefore, Madam, may I **table*** the rest of my prepared speech to be included in Hansard, since my time is up.

*සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled:*

Therefore, there are institutional solutions to delay which do not necessarily require altering the tenure of sitting judges.

Now, coming to why the expansion of the Court of Appeal matters, the Court considered the expansion of the Court of Appeal in connection with the practical ability to decentralize appellate sittings. That is a legitimate administrative consideration, but it should be considered separately from the constitutional question of extending the retirement age of judges who are already in office. These are two different policy questions placed together in one constitutional package.

Furthermore, on the Constitutional Council question, the petitioners argued that extending the tenure of sitting judges effectively changes the period for which judges remain in office without requiring a fresh appointment or fresh constitutional scrutiny.

I do not say that the Amendment literally bypasses every Constitutional Council function. Instead, I would say that the House should consider whether an automatic extension of the tenure of serving judges alters the practical effect of the constitutional appointment and succession mechanisms. That is a legitimate institutional question. The petitioners also argued that the proposal was not part of the Government's election manifesto and had not undergone sufficient public consultation. The absence of a prior public mandate is not necessarily a question of constitutional validity, but it is relevant to whether a fundamental alteration of judicial tenure should be undertaken through a narrowly focused amendment rather than through a broader constitutional reform process.

The Court also reaffirmed the importance of Article 121(1)'s requirement concerning delivery of petitions to the Hon. Speaker at the same time as filing in Court. The parliamentary lesson of it is that the Constitutional litigation concerning Bills is subject to strict procedural requirements. Parliament should likewise exercise particular procedural care when altering constitutional provisions concerning the judiciary.

Would we want a future Government to have exactly the same power that we are exercising today? Imagine a future Government faces difficult litigation; disagrees with particular judicial decisions; changes the retirement age; thereby alters when vacancies arise; changes the composition and succession of the superior courts. Even if today's Government acts in complete good faith, the constitutional precedent remains.

I would suggest three possible safeguards. The first is prospective application. Existing judges remain under the present retirement regime. The new retirement age applies to judges appointed after commencement. The second safeguard I would suggest is, comprehensive reform. Instead of a piecemeal amendment, Parliament could examine retirement age, judicial appointments, Chief Justice tenure, number of judges, court administration, case backlog, regional sittings and judicial resources. The third one is transitional safeguards. If Parliament proceeds with the Amendment, it should clearly define the treatment of every serving judge, avoid selective or personalized provisions, establish objective transitional rules and ensure that no future Government can manipulate tenure for short-term institutional advantage.

I would conclude my substantive argument around three dangerous precedents. First is, changing judicial tenure during tenure. If Parliament can alter the retirement age of serving judges today, future Parliaments may do the same. Second is, constitutional change affecting the composition of the judiciary. Altering retirement ages changes the timing of vacancies and therefore indirectly affects the future composition of the superior courts. Third is, constitutional amendments should not be designed around the present occupants. The Constitution must be overwritten for institutions, not individuals.

Hon. Deputy Chairperson of Committees, I wish to conclude by making it absolutely clear that my position is not directed against any individual judge. I make no allegation against the Chief Justice or against any other member of the judiciary. I have full respect for the dignity, integrity and constitutional office of our judges.

My concern is institutional. The Supreme Court has now determined that this Bill does not require approval by the people at a referendum. I fully acknowledge and respect that determination. But the constitutional question before the Court and the legislative question before Parliament are not identical. The Court has determined what Parliament may constitutionally enact. Parliament must now decide what constitutional precedent it wishes to create. If 67 is the appropriate retirement age for Supreme Court judges, let us ask ourselves a simple question: why should that rule not apply prospectively to judges appointed after this Amendment? Why should we alter the tenure of judges who are already holding office under an existing constitutional arrangement? Why should we create a precedent under which the retirement age of serving judges can be changed by Parliament during their tenure?

I am not suggesting that the present Government has an improper motive. I am saying that Constitutions must be designed not only for the Government we have today, but for every Government that may come after us. Good faith today cannot be the only safeguard against misuse tomorrow. The Supreme Court's own determination has recognized the importance of protecting the incumbent Chief Justice from the new six-year limitation by requiring an express transitional proviso. That demonstrates that changes affecting judicial tenure require careful consideration of the position of serving office-holders.

Therefore, my submission to this House is simple. Let us not personalize this issue. Let us not question the integrity of any judge. Let us not question the constitutional authority of Parliament, but let us protect the institution. If we believe that judicial retirement ages should be increased, let us establish that rule prospectively. If we believe broader judicial reform is necessary, let us undertake that reform comprehensively and transparently. The Constitution should not be written for the judges who happen to occupy the Bench today, nor for the Government that happens to occupy these Benches today. It should be written for the judges, Governments and Parliaments of tomorrow. That is the constitutional responsibility before us today. The contemporaneous report confirms that counsel requested a Full Bench and that the request was rejected, while the Government response relied on Article 132 (3); it does not support saying that a Bench larger than five was constitutionally impossible.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.23]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

අපේ ගරු මන්ත්‍රීතුමා absolute power ගැන කථා කරන කොට මට මතක් වුණා, මෙන්න මේ කාරණය. Absolute power may corrupt, but accountable power can empower. And also, power without accountability breeds corruption; power with responsibility serves the people. That is what we will be doing through the Twenty Second Amendment to the Constitution.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාවේ මට මතක් වෙනවා, දේශපාලන විචාරකයෙකු වන මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහත්මයා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් පසු ගිය දවසක පුවත්පතකට කළ ප්‍රකාශයක්. මම ඒක උපුටා දක්වන්නම්.

> " 'Justice delayed is justice denied' is a cliché often uttered during the ceremonial sittings of the Supreme Court. Yet very little has been done in practice to expedite justice. It is also no secret that the vast majority of the people who are denied justice because of delays are poor citizens, workers, peasants, and even the middle classes. Injustice caused by the justice system is, in fact, a class issue. This is exactly where the contradiction between law and justice is glaringly visible."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා කියන්න උත්සාහ කරන්නේ මෙන්න මේකයි. "ප්‍රමාද වූ යුක්තිය යනු යුක්තිය අහිමි කිරීමක්" යන කියමන බොහෝ අවස්ථාවලදී ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රකාශ කෙරෙන සුප්‍රසිද්ධ කියමනක්. ඒ වුණත්, යුක්තිය කඩිනමින් ඉටු කිරීම සඳහා ප්‍රායෝගිකව කෙරෙන දේවල් තිබෙන්නේ, ඉතා සුළු ප්‍රමාණයක්. ඒ වාගේම, ප්‍රමාදයන් හේතුවෙන් යුක්තිය අහිමි වන ජනතාවගෙන් අතිමහත් බහුතරය දුප්පත් පුරවැසියන්, කම්කරුවන්, ගොවීන් සහ සමහර වෙලාවට පහළ මධ්‍යම පන්තියේ ජනතාවයි. එය රහසක් නොවෙයි. ඇත්ත වශයෙන්ම යුක්තිය පසිඳලීමේ පද්ධතිය තුළින්ම සිදු වන අයුක්තිය පන්තිමය ගැටලුවක් බවට පත් වන්නේත් මෙන්න මේ නිසායි. නීතිය සහ යුක්තිය අතර පවතින පරස්පරතා වඩාත් පැහැදිලිව හා තීව්‍රව දක්නට ලැබෙන්නේ මෙවන් අවස්ථාවකදීයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී අපට පෙනෙන කාරණය තමයි, යුක්තිය ප්‍රමාද වීම නිසා බොහෝ වෙලාවට යුක්තිය අහිමි වන්නේ දුප්පත්, පහළ මැද පන්තියේ ජනතාවටයි කියන එක. ඒ නිසා යුක්තිය අහිමි වීමේ අවදානම දරන ඒ කොටසට ආමන්ත්‍රණය කිරීම අවශ්‍යයි; යුක්තිය ප්‍රමාද කිරීමේ ක්‍රියාවලිය ආමන්ත්‍රණය කිරීමට අවශ්‍යයි. ඒ සඳහා අපේ රටේ නීති පද්ධතිය අරමුණු සහගතව වෙනස් වීම, යාවත්කාලීනව සිද්ධ වෙන්න ඕනෑ. ඒ අනුව පසුගිය කාලයේ සම්මත කරගත් 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත, 2025 අංක 7 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත, 2026 අංක 7 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත, 2026 අංක 8 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ගත්තු නීතිමය ප්‍රතිපාදනවල එකතුවක් හැටියට අපට දකින්න පුළුවන්.

හැබැයි අපි දන්නවා, නීති පැනවූ පමණින්ම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සාර්ථක වන්නේ නැහැ කියන එක. ඒ සඳහා විමර්ශන ක්‍රියාවලිය සහ ඊට සම්බන්ධ වන යන්ත්‍රණය කාර්යක්ෂම සහ විධිමත්භාවයට පත් වෙන්න ඕනෑ; දේශපාලන වුවමනාවකින් තොර ස්වාධීන විමර්ශන ක්‍රියාවලියක් ඇති වෙන්න ඕනෑ. නමුත් අපට මතකයි, සමහර අවස්ථාවලදී සිද්ධ වෙච්ච දේ. අපි උදාහරණයක් ගනිමු. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වෙච්ච ගමන් සමහර විමර්ශන නිලධාරින්ව මාරු කළා. තමන්ටම චෝදනා එල්ල වෙලා තිබුණු මිග් යානා ගනුදෙනුව පිළිබඳ පරීක්ෂණ කටයුතු කරපු DIG පී.කේ.ඩී. ප්‍රියන්ත, ASP පවිත්‍ර දයාරත්න, නිහාල් ප්‍රැන්සිස් වගේම පාස්කු ඉරුදින ප්‍රහාරයට අදාළව පරීක්ෂණ කටයුතු කරපු SSP ශානි අබේසේකර, DIG රවී සෙනෙවිරත්න, ටී.ආර්.කේ.ආර්. පාලිත, වරුණ ජයවර්ධන ආදි නිලධාරින්, තමන් බලයට පත් වෙලා පළමුවෙනි පැය 24, 48 තුළ මාරු කළා. එහෙම කළේ, අඩුම ගණනේ කැබිනට් මණ්ඩලයවත් පත් කරන්නේ නැතිවයි. වාර්තා වන විධියට මේ මාරු කිරීම් නිසා ඒ වනකොට ප්‍රධාන වශයෙන් පවත්වාගෙන ගිය පරීක්ෂණ 7කට බාධා පැමිනුණු බව තමයි දැන ගන්නට ලැබී තිබෙන්නේ.

නමුත්, ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වෙලා කවදාවත් ඒ ආකාරයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා වන පරිදි, විමර්ශන ක්‍රියාවලියේ යෙදෙන නිලධාරින්ගේ ස්වාධීනත්වයට බාධා වන පරිදි කටයුතු කළේ නැහැ. දේශපාලන ඇඟිලි ගැසීම් වෙනුවට අපි විමර්ශන ක්‍රියාවලි ශක්තිමත් කරන්න අවශ්‍ය නිලධාරින් පත් කිරීමට කටයුතු කළා; නව ආයතන ඇති කරලා, ඒවායේ කාර්යක්ෂමතාව ඇති කරන්න අවශ්‍ය පියවර ගත්තා. FCID එක හා Illegal Assets Investigation Division එක ශක්තිමත් කිරීම, Provincial Crime Divisions පිහිටුවීම, අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය - Proceeds of Crime Investigation Division - ඇති කිරීම, පොලිස් විමර්ශන සඳහා digitalization සහ data sharing හඳුන්වා දීම වාගේම රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය සමඟ සෘජුවම දත්ත හුවමාරු කර ගනිමින් විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම යනාදිය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට ගත්තු පියවර කිහිපයක් හැටියට අපට හඳුන්වා දෙන්න පුළුවන්. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් වුණාට, නීතිය ශක්තිමත් වූ පමණින්ම යුක්තිය ඉටු කිරීම සාර්ථක නොවන බව අපි දන්නවා. ඒ සඳහා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ තිබෙන අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම අනිවාර්යෙන්ම කළ යුතුයි.

නව අතිරේක අධිකරණ පිහිටුවීම, අධිකරණ ශාලාවලට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ආදි වශයෙන් අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අප මෙම කාලය තුළ ගත් ක්‍රියාමාර්ග ගණනාවක් උපුටා දක්වන්න පුළුවන්. ඇත්තටම ගත්තොත්, අද මේ කථා කරන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත තුළින් අප බලාපොරොත්තු වන්නේත් අධිකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන පරිපාලනමය වෙනස්කම් ඇති කිරීම මිස, එහි පරිවර්තනීය වෙනසක් ඇති කිරීම නොවෙයි.

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින්, අධිකරණ පද්ධතිය සහ මහජනතාව සමීප කරන, වඩා පුළුල් පරිවර්තනීය

[ගරු අනුර කරුණාතිලක මහතා]

වෙනසක්, අපේ රටේ අධිකරණ පද්ධතියේ ප්‍රතිසංස්කරණීය වෙනසක් අපට අවශ්‍යයි. අධිකරණයේ ස්වාධීනත්වය වාගේම එහි වගවීම සහතික කරන ආයතනයක් බවට පත් කරන ප්‍රතිසංස්කරණ අපේ රටේ අධිකරණ ක්‍රියාවලිය තුළට ඕනෑ. අන්න ඒ සඳහා පුළුල් මහජන සංවාදයක් ඇති විය යුතුව තිබුණා. ඇත්ත වශයෙන්ම විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත කියන්නේ, අන්න ඒ පුළුල් මහජන අවකාශය, පුළුල් මහජන සංවාදය ඇති කරලීම සඳහා තිබුණු අවස්ථාවක්. නමුත්, ඒ සඳහා අවස්ථාවක් ලබා නොගෙන පටු සීමා කිරීම් හරහා දේශපාලන සටන් පාඨයක් බවට විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පත් කිරීම නිසා අන්න ඒ වටිනා අවස්ථාව අපට මඟ හැරුණා කියලායි මට හිතෙන්නේ. ඇත්ත වශයෙන්ම ඒ නිසා තමයි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට විරුද්ධව කථා කරන බොහෝ පාර්ශ්ව මේ සම්බන්ධයෙන් ඇත්ත අවබෝධයෙන් කටයුතු කළා ද කියන ප්‍රශ්නය අපට පැන නඟින්නේ.

එක රූපවාහිනී සංවාදයකදී පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් කිව්වා මට මතකයි, "විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යා යුතු වයස වැඩි කරන්න ඕනෑ ඉහළ අධිකරණවලට විතරක් නොවෙයි, පහළ අධිකරණවලත් එකී වයස වැඩි කරන්න ඕනෑ. පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යා යුතු වයස වැඩි කරන්නේ නැතිව කාර්යක්ෂමතාව ඉහළ නැංවෙන්නේ නැහැ" කියලා. හැබැයි ඒකෙන් පෙනෙන්නේ, එම මන්ත්‍රීවරයාවත් අඩුම ගණනේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතේ අඩංගුව පිළිබඳ අවබෝධයකින් කථා නොකළ බවකුයි. ඒ වාගේම අපි දැක්කා උද්ඝෝෂණවලට ආපු සමහර පුද්ගලයන් කියපු කථා. මම කියන්නේ නැහැ උද්ඝෝෂණවලට එන හැමෝම තමන් එන්නේ මොන දෙයට විරුද්ධවද කියන සියල්ල අවබෝධයෙන් එන්න ඕනෑ කියලා. හැබැයි, එක පුද්ගලයෙක් කථා කරලා කියනවා, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා තමන්ගේ ධුර කාලය වැඩි කර ගැනීම සඳහා කටයුතු කරනවා. ඒකට විරුද්ධව මම මේ උද්ඝෝෂණය කරන්න ආවා කියලා. ඒ වාගේම තවත් කෙනෙක් කියනවා, මේක තුළ වගන්ති ගොඩක් තිබෙනවා. එම වගන්ති ඔක්කෝටම අපි විරුද්ධයි කියලා. එලෙසත් අදහස් ප්‍රකාශ කළ පුද්ගලයෝ හිටියා.

ඒ වාගේම කිව්වා, "අපි ආණ්ඩුවට විරුද්ධයි, ඒ නිසා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතටත් විරුද්ධයි" කියලා. එහෙම කියපු පුද්ගලයෝත් හිටියා. ඒකෙන් අපට පෙනෙන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව සහ විපක්ෂව තිබුණු ඒ පුළුල් සංවාදය ඇති කර ගැනීමට අපි අසමත් වුණා කියන එකයි. මේකට හේතුවකුත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ නීති වෘත්තිය සාම්ප්‍රදායිකව ප්‍රභූත්වයේ ආධිපත්‍යය තිබෙන ක්ෂේත්‍රයක් හැටියට තමයි අපට හඳුනා ගන්න වෙන්නේ. අන්න ඒ නිසාම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය, ඒ හා සම්බන්ධ නීති ආයතනය කෙරෙහි කිසියම් විධියක බලපෑමක් ඇති කරන්න මේ ප්‍රභූත්වය මේ වනකොට සමත් වෙලා තිබෙනවා. ඒ නිසා මා කලින් කිව්වා වාගේ, පුළුල් ප්‍රතිසංස්කරණවලට මඟ පෑදෙන පරිපාලන ප්‍රතිසංස්කරණවලින් පටන් අරගෙන මහජනතාව සහ අධිකරණ පද්ධතිය අතර තිබෙන gap එක මඟ හරවා ගැනීම සඳහා ඒ වගකීම් සහගත සහ වගවීම් සහිත අධිකරණ පද්ධතියක්, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියක් ගැන කථා කරන සංවාදය මඟ හරවන්න ඒ ප්‍රභූ පන්තියට - ඒ ප්‍රභූ ආධිපත්‍යය දරන කණ්ඩායම්වලට - අවශ්‍යතාව තිබුණා. විශේෂයෙන් ජාතික ජන බලවේගය මුල් කර ගත් රජයක් යටතේ මේ විධියට ප්‍රතිසංස්කරණය සිද්ධ වනකොට තමන් දරන ඒ ප්‍රභූ ආධිපත්‍යයට යම් බලපෑමක් ඇති විය හැකි යැයි සිතා, තමන් දරන ප්‍රභූ ආධිපත්‍යයට අභියෝගයක් විය හැකි යැයි සිතා අන්න අර කියපු පුළුල් සංවාදය මතු කරන්න අවස්ථාව නොදී එය පටු සහ කුහක දේශපාලන මාතෘකාවක් බවට පත් කරන්න කටයුතු කරනවා කියන එක තමයි අපට පෙනුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ අවස්ථාවේදී විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් කරන සමහර චෝදනා ගත්තොත්, ඒවා පුළුල් සාකච්ඡාවකින් තොරව කරන චෝදනායි. සමහරු කියනවා, විනිසුරුවරයන්ගේ විශ්‍රාම යා යුතු වයස දීර්ඝ කිරීම අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් ඇති කරනවා කියලා. හැබැයි, අපි අතීතයේ සමහර අවස්ථා දැක්කා අධිකරණයට බලපෑම් එල්ල කළේ කොහොමද කියලා. අපේ ගරු සභානායකතුමා වන බිමල් රත්නායක මැතිතුමා ඉතා හොඳින් පැහැදිලි කළා, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව අධිකරණයට බලපෑම් ඇති කළේ කොහොමද කියන එක. ඒ කාලයේ සමහර අග්‍ර විනිශ්චයකාරවරුන් පත් වනකොට, නීතිපතිවරයා පත් වනකොට කරපු දේවල් අපි දැක්කා. කැබිනට් මණ්ඩලයේ තමන්ගේ නීති උපදේශක නීතිපතිවරයා බවට පත් කරගෙන, අවසානයේදී ඔහු අග්‍ර විනිශ්චයකාරවරයා බවට පත් කරගත්තා. එහෙම අතීතයක් තිබෙන, අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වයට අන්න ඒ විධියට ඇඟිලි ගහපු වටපිටාවක තමයි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත අපේ මේ ගරු සභාවට ගෙනැවිත් තිබෙන්නේ. හැබැයි, කවුරු හරි උත්සාහ කරනවා නම් අතීතයේ තිබුණු අන්න ඒ වාගේ සිදුවීම් හා සංසන්දනය කරමින් මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් කථා කරන්න, ඒක සාධාරණ නැහැ.

ඇත්තටම අප බලාපොරොත්තු වන්නේ මේකයි. ජාතික ජන බලවේගය හැටියට අපි මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, අදූෂිත, නීතියේ ආධිපත්‍යය තහවුරු වූ සමාජයක් හදනවා කියලා. ඒ සමාජය ඇති කරලීම සඳහා මා අර කලින් සඳහන් කළා වාගේ ඒ පද්ධතීන් තුන - නීති පද්ධතිය, විමර්ශන ක්‍රියාවලියට තිබෙන පද්ධතිය සහ අධිකරණ පද්ධතිය - ශක්තිමත් වෙන්න ඕනෑ. ජාතික ජන බලවේගය හැටියට අපි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා බලාපොරොත්තු වන්නේ, ජනතාවට දුන්නු ඒ පොරොන්දුව ඉෂ්ට කිරීමයි; ඒ වාගේම ජාතික ජන බලවේගයට; මාලිමාවට ඡන්දය දීමෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ අදූෂිත සමාජය ඇති කරලීම සඳහා දූෂණය සහ වංචාවෙන් තොර, නීතියේ ආධිපත්‍යය තහවුරු වෙච්ච සමාජයක් ඇති කරලීම සඳහා යන ගමන් මඟ ශක්තිමත් කිරීමයි. මා කලින් කිව්වා වාගේ, මේ වාගේ අවස්ථාවක් සන්ධිස්ථානයක් හැටියට නම් කරමින්, අපේ සමාජයට අවශ්‍ය වන, නීති පද්ධතියට අවශ්‍ය වන පුළුල් ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් ඇති වන සංවාදය විවර කර ගැනීම සඳහා සියලුදෙනා එකතු වෙලා වැඩ කරමු කියා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද දින මෙම විවාදයේදී විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන පනතට ගෙන එන සංශෝධනය පිළිබඳව කථා කරන්න ලැබීම ගැන ඇත්තටම සතුටුයි. මොකද, අප හැමෝම දන්නා, අප හැමදාම කියන දෙයක් තමයි, රටේ මූලික නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි කියන එක. ඒකට ගෙනෙන සංශෝධනය වෙනදා කථා කරන පනත් කෙටුම්පතක් වාගේ සරල, සැහැල්ලු දෙයක් නොවෙයි. රටේ මූලික නීතිය සම්බන්ධයෙන් වන සංශෝධනයක් මුල් කරගෙන තමයි අපි අද කථා කරන්නේ.

මේ සම්බන්ධව කථා කරන කොට කිව යුතුයි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්ම අප දීලා තිබෙන "නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක්" කියන පොරොන්දුව ගැන. මේවා අපි දුන්නු පොරොන්දු. අපි කියපු නැති දේවල් කරනවා කියලා කියන්න හදනවා නම්, ඒක වැරදියි. මොකද, අපි එදා ඉඳලාම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මේ බව කියා තිබෙනවා. එහි "නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක්" යන පරිච්ඡේදය යටතේ ස්වාධීන, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුක්ත හා මහ ජනතාවට දැරිය හැකි අධිකරණ පද්ධතියක් උරුම කර දෙන බවට ලබා දුන් පොරොන්දුව ඉටු කිරීම සඳහා තමයි අප මේ සූදානම් වන්නේ.

විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කිරීම කියන කාරණය ගත්තොත්, විපක්ෂය සහ මීට එරෙහි වන නොයෙකුත් කණ්ඩායම්, විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම කියන එක ගැන අදහසක් ඇති වනකොටම එය කෙළින්ම එල්ල කර ගත්තා, අග්‍ර විනිශ්චයකාරවරයාගේ විශ්‍රාම වයස වැඩි කිරීම කියන කාරණය මුල් කරගෙන. එහෙම එකතු වෙලා, බය වෙලා බොරු බිල්ලෙක් මැව්වා. ඊට පස්සේ මේක විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමේ අවශ්‍යතාව කියන එක තේරුම් අරගෙන, අද දින වන විට බොහෝදුරට ඒ කරන්න හදපු බොහෝ දේවල් නැවතිලා සමාජය තේරුම් අරගෙන තිබෙනවා, මේක ජනතාවගේ යහපත වෙනුවෙන් කෙරෙන කටයුත්තක් බව. අප නිකමට මේ සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ කරන ලද අධ්‍යයනයන් ගැන බැලුවොත්, මේ රටේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව සංඛ්‍යාත්මකව වැඩි විය යුතු බව අපේ රටේ සිදු කරන ලද නොයෙකුත් අධ්‍යයනවලින් නිර්දේශ කරලා තිබෙනවා. ලෝක ජනගහනයෙන් මිලියනයකට සිටින විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව සම්බන්ධයෙන් බැලුවොත්, ලෝකයේ දියුණු රටවල ඒ දර්ශකය ඉතා ඉහළින් තිබියදී, ශ්‍රී ලංකාවේ එය ඉතා අඩු අගයක් ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රුසියාවේ ජනතාවගෙන් මිලියනයකට විනිශ්චයකාරවරු 242ක් ඉන්නවා. එය ඉහළම අගයක් පෙන්නුම් කරනවා. ඒ වාගේම ජර්මනිය, ආර්ජන්ටිනාව, ඇමෙරිකා එක්සත් ජනපදනය වාගේ රටවල් ගත්තත් එහෙමයි. ඇමෙරිකා එක්සත් ජනපදය ගත්තොත්, ජනතාව මිලියනයකට විනිශ්චයකාරවරුන් 107දෙනෙක් ඉන්නවා. ඒ වාගේ රටවල් 8ක් එක්ක අපේ රට සංසන්දනය කරලා බලන කොට ලංකාව 9වන ස්ථානයේ ඉන්නවා. අපට ඉන්නේ, ජනතාව මිලියනයකට විනිශ්චයකාරවරු 19දෙනෙකු පමණයි. අප මේ නියැදියේදී සලකා බලන ළඟම රටක් තිබෙනවා. ඒ තමයි, තායිලන්තය. තායිලන්තයේත් මිලියනයකට විනිශ්චයකාරවරු 68දෙනෙක් ඉන්නවා. අපට ඉන්නේ 19දෙනෙකු පමණයි. එතකොට අපේ ජනතාවට යුක්තිය ඉෂ්ට වෙන්නේ කොහොමද? අපේ ගම් නියම්ගම්වල ජනතාව යුක්තිය ඉටු කරන කල් බලාගෙන ඉන්නවා. හැබැයි, ඒ අය වෙනුවෙන් යුක්තිය ඉටු කරන්න ජනතාවගෙන් මිලියනයකට විනිශ්චයකාරවරු 19දෙනෙකු පමණයි ඉන්නේ, මේ කියන අධ්‍යයන ප්‍රකාරව; ලැබෙන වාර්තා ප්‍රකාරව. මේ නියැදි අධ්‍යයනය කරලා අප ගත්තු තීරණයක් තමයි මේ අවස්ථාවේ මේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කළ යුතුයි කියන එක.

ඒ වාගේම අපට කරන්න තිබෙනවා, අභියාචනා කටයුත්ත පහසු කිරීම. අභියාචනයක් යනකොට අපි දන්නවා, අභියාචනාධිකරණයේ මොන තරම් නඩු සංඛ්‍යාවක් ගොඩගැහිලා තිබෙනවාද කියලා. ඒ වාගේම තමයි, අභියාචනා නඩුවක් සඳහා රට පුරාම ඉන්න හැම කෙනෙක්ම කොළඹට එන්න ඕනෑ. අපේ දිස්ත්‍රික්ක ගත්තත් ඉතාම අසීරු තත්ත්වයෙන් අප ඉන්නේ. ඒ අයට කොළඹට ඇවිල්ලා, අභියාචනයක් ඉදිරිපත් කරනවාට වඩා හොඳයි නඩුව අත්හැර දමන එක. එනම්, යුක්තිය බලාපොරොත්තු වෙනවාට වඩා අයුක්තිය භාර ගැනීම හොඳයි. එහෙම බැලුවාම, අභියාචනාධිකරණයේ අධිකරණ බලය ප්‍රාදේශීයව විහිදුවීම ඉතාම වැදගත්, කාලීන අවශ්‍යතාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම අප ඉටු කිරීමට බලාපොරොත්තු වන කාරණා අතරින් තවත් එකක් තමයි, මුල් අවස්ථා අධිකරණවල තිබෙන ගැටලුව විසඳීම. මුල් අවස්ථා අධිකරණවල තමයි නඩු ගොඩක් ගොඩගැහිලා තිබෙන්නේ. එම නිසා එම අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යා යුතු වයසත් දීර්ඝ කෙරෙනවා, අධිකරණ සංවිධාන පනතට එකතු කරන සංශෝධනය මඟින්.

අපි නීතිඥවරුන් හැටියට වෘත්තියේ යෙදෙන කොට අපේ ගම් ප්‍රදේශවල ජනතාවට අප කිව්වොත්, "මේ ඉඩම සම්බන්ධයෙන් බෙදුම් නඩුවක්, ඉඩම් නඩුවක් යන්න ඕනෑ" කියලා, සාමාන්‍යයෙන් ඒ අය කියන දේ අපි දන්නවා. බෙදුම් නඩුවක් කිව්වාම, ඒ අය ඒකට කැමැති වෙන්නේ නැහැ. බෙදුම් නඩුවක් යන්න ඕනෑ කිව්වාම, ඒ අය අහන ප්‍රශ්නය තමයි "ගම් නඩුවක්ද?" කියන එක. ඒ කියන්නේ, මුළු ගමකටම සම්බන්ධ වෙන්න සිදුවනවා, ඉඩමක් සම්බන්ධව බෙදුම් නඩුවක් යනවා නම්. ඒක පරම්පරා ගණනකට ඉවර වෙන නඩුවක් නොවෙයි. ගම්වල පරණ මතයකුත් තිබෙනවා, මනුස්සයෙක් විනාශ වෙන්න නම්, මනුස්සයෙකුගේ දියුණුව ඇහිරෙන්න නම්, පරණ වාහනයක් හරි, නඩුවක් හරි තිබෙන්න ඕනෑය කියලා. ඒකට ජීවිතයම ඉවර වෙනවා කියනවා. ජනතාව ඒ වාගේ අදහසක් දරන්නේ ඇයි? නඩු ඇසීම ප්‍රමාද වන නිසායි. විනිශ්චයකාරවරයෙකුට දවසකට අහන්න තිබෙන නඩු සංඛ්‍යාව බැලුවොත්, පහළ අධිකරණවල ඉතාම වැඩියි. මහෙස්ත්‍රාත් අධිකරණවල උදේ පටන් ගත්තාම හැන්දෑව වනතුරු නඩු අහනවා. දවසකට අහලා ඉවරයක් කරන්න බැරි තරම් නඩු සංඛ්‍යාවක් ඒවායේ තිබෙනවා. ඒ තරම් නඩු ප්‍රමාදයක් පවතිද්දි මෙවැනි සංශෝධනයක් අවශ්‍ය නැහැ කියලා හිතන එක ගැන මම පුදුම වනවා. මේ සංශෝධනය මේ වෙලාවේ ගේන්න එපා කියලා කියන්නේ කොහොමද? මේ සංශෝධනය මේ වෙලාවේ ගේන්න එපා කියනවා. මේක මේ වෙලාවේ ගේන්න එපා කියන්නේ ඒ අයට තිබෙන එක්තරා පටු අරමුණක් නිසායි. එහෙම නැතුව මේ සංශෝධනය අවශ්‍ය නැහැයි කියන්න පුළුවන් කිසිම පදනමක් ඉදිරිපත් කරන්න කොයි වෙලාවකවත් මේ අයට බැරි වෙලා තිබෙනවා.

විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 500ට වැඩි මහාධිකරණ සඳහා අතිරේක මහාධිකරණ ස්ථාපිත කිරීමට අවශ්‍ය විනිශ්චයකාරවරුන් 19 දෙනෙකු මේ සංශෝධනයෙන් පසුව පත් කරගන්න අපට හැකියාව ලැබෙනවා. මේ වන විට වැඩිම නඩු සංඛ්‍යාවක්

[ගරු නිතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය]

පෙන්වනවා, කුරුණෑගල මහාධිකරණයේ. එහි නඩු 1,819ක් තිබෙනවා. දෙවැනියට මහනුවර මහාධිකරණ ශාලා අංක 02හි නඩු 1,013ක් ගොඩගැසී තිබෙන බව පෙන්නුම් කරනවා. ඉතින්, මේ ප්‍රදේශවල ජනතාවට යුක්තිය ඉටු කිරීම සඳහා මෙවැනි සංශෝධනයක් අත්‍යවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය දිසා අධිකරණයේ කටයුතු ආරම්භ වන්නේ 1970 ගණන්වලයි. නාවලපිටියේ මුල් අවස්ථා අධිකරණයක් පැවත තිබෙනවා. එසේ පැවතගෙන ආපු අධිකරණය මහෙස්ත්‍රාත් අධිකරණයක් වශයෙන් සංවර්ධනය වෙලා, ඊට පසුව 2005 අවුරුද්දේ ඒක දිසා අධිකරණයක් බවට පත් වනවා. 2005 අවුරුද්දේදී තමයි නාවලපිටිය ප්‍රදේශයේ ජනතාවට තමන්ගේ ඉඩම් නඩු තමන්ගේ ගමේ උසාවියේ කථා කරන්න පුළුවන් වුණේ; තමන්ගේ වෛවාහක නඩුකර ගමේ උසාවියේ කථා කරන්න පුළුවන් වුණේ. ඒකත් පැවතුණේ, combined court එකක් විධියටයි. එහෙම නැත්නම්, දිසා-මහෙස්ත්‍රාත් නඩු වර්ග දෙකම එකම උසාවියේ විභාග වුණේ. නාවලපිටියට වෙනම දිසා අධිකරණයක් වශයෙන් කටයුතු කරන්න පුළුවන් වුණේ 2010 අවුරුද්දේයි. ඊට අදාළව මෙම ප්‍රදේශයේම තිබුණා, සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයක්, හෙල්බඩ. ඒක ඉතාම පැරණි අධිකරණ ශාලාවක්. මේ අධිකරණය ඉදිකිරීම් කටයුතු සඳහා වසා දමා තිබෙනවා. 2020 අවුරුද්දේ සිට මේ වන තෙක් ඒකේ අලුත්වැඩියා කටයුතු සිදු වෙලා නැහැ. අපි ඉක්මනින්ම ඒ කටයුතු ඉවර කරනවා. මොකද, ජනතාවගේ නඩු කටයුතු ඉක්මන් කිරීම සඳහා මේ කටයුතු ඉක්මන් කිරීම අවශ්‍ය වනවා.

දැන් මෙතැන කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අපට ව්‍යවස්ථා සංශෝධනය ගැන උගන්වන්න වාගේ දේවල් ටිකක් කියාගෙන, කියාගෙන ගියා, ජාත්‍යන්තරය ඉලක්ක කරගෙන ඉංග්‍රීසි භාෂාවෙන්. හැබැයි අපි දන්නවා, එතුමා විධායක ජනාධිපති ධුරයේ බලතල වැඩි කරගැනීම සඳහා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරනකොට අත උස්සපු බව සහ විධායක ජනාධිපති ධුරයේ බලතල කප්පාදු කිරීම සඳහා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරනකොටත් අත උස්සපු බව. එක මතයක් නැති කෙනෙකුට අපේ ගම්වල කියනවා නේ, දොන් නම් දොන්, සිමන් නම් සිමන්. දොන්, සිමන් දෙකක් බැහැ කියලා. ඒ නිසා අපි විපක්ෂයෙනුත් අහනවා, තමුන්නාන්සේලා මොකක්ද කියන්නේ, ඔය දෙකෙන් කොයි එකද හරි කියලා. ඒ කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.46]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පරිවර්තන ගැන මීට කලින් කථා කරපු ඇමතිවරයෙකු කියනවා අපි දැක්කා. ඉතිහාසයේ පරිවර්තන සිද්ධ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස්වීම්වලදී මොනවාද වුණේ, මොනවාද කළේ කියන කාරණය කියමින්, දැන් ඔවුන් මොකක්ද කරන්නේ කියන කාරණය රටට අමතක කරවන්නට උත්සාහයක් දරන බව තමයි මට කියන්න තිබෙන්නේ.

අපට මතකයි, වර්තමාන ජනාධිපතිවරයා විපක්ෂයේ ඉන්නකොට ඉතිහාසය පුරාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක් එක් ව්‍යවස්ථා වෙනස් කරනකොට කිව්වේ මොකක්ද කියලා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, මම වැරදි නම් ඔබතුමා මා නිවැරදි කරන්න. "අපට බලය දෙන්න, අපි එක ව්‍යවස්ථාවක් හදනවා, අපි ඔය එක එක, කඩ කඩ, කොනින් කොන, පිටුවෙන් පිටුව, අකුරෙන් අකුර වෙනස් කරන්නේ නැහැ" කියලා එතුමා එදා කිව්වා. පැච් දමන්නේ නැහැ කිව්වා. අද මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? ඉතිහාසයේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිතුමිය, මහින්ද රාජපක්ෂ හෝ තවත් ජනාධිපතිවරුන් තමන්ට බලය තියාගන්න පුළුවන් විධියට, තමන්ගේ අභිමතයට ගැළපෙන විධියට, තමන්ගේ ආණ්ඩුකරණයට, තමන්ගේ ආණ්ඩුව ඇතුළේ සිටින සියලුදෙනා රකින්න අවශ්‍ය විධියට, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව භාවිත කරන වෙලාවේ අපට මතකයි, අනුර කුමාර මැතිතුමා එදා ඊට විරුද්ධව කථා කළ බව. හැබැයි එතුමා අද මොකක්ද කරන්න හදන්නේ?

මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනු, හුදෙක්ම මේ බිඳවැටී යන, භංග වෙලා තිබෙන ජනතා විශ්වාසය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අධිකරණය පාවිච්චි කරන්න දරන උත්සාහයක් කියලා අපි භය නැතුව කියනවා. ඒ උත්සාහය වළක්වන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපට වඩා තේරෙන්න ඕනෑ, අද ජාතික ජන බලවේගය කියන ඒ ලෝගුව, එහෙම නැත්නම් ඒ ලාංඡනය හිමි වෙච්ච ඔබට, මේ රටේ හැත්තෑ අවුරුද්දක් තිස්සේ බලයට එන්න බැරි වෙච්ච ජේවීපී කියන ඔබට, ඒ බලය ලබා ගැනීම වෙනුවෙන් ජාතික ජන බලවේගය නැමැති සළුව පොරවා ගත් තමුන්නාන්සේලාට, මේ පාර්ලිමේන්තුවේ 159න් නිර්මාණය වෙච්ච අගමැතිතුමියට.

අගමැතිතුමිය දැන් නිහඬ වෙලා ඉන්නවා. දැන් කියනවා, සාමූහික තත්ත්වයේ ඉන්නවා කියලා. හැබැයි, මම අද අගමැතිතුමියට කියනවා, වෙලාවකට පෙනය පුප්පන්න කියලා. මොකද, මෙහෙම ගියොත් මේ ජන වරම තුළ තිබිච්ච, මේ ජන වරමේ අභිලාෂ සියල්ල යටපත් කරලා, ජනතා විමුක්ති පෙරමුණේ අභිලාෂය ඉදිරියට ගේන්න යනවා දෝ කියන සැකය අපට තිබෙනවා, සමහර ඇමතිවරුන් කියන දේවල්වලින්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විනාඩියක් ගියෙත් නැද්ද කොහේද.

1988-89 කාලයේ අපට ආණ්ඩු බලය ලැබුණේ නැහැ, අපට ආණ්ඩු බලය ගන්න බැරි වුණා, ඊළඟට රාජ්‍ය බලය අපට ගන්න බැරි වුණා, දැන් අපට ආණ්ඩු බලය තිබෙනවා, දැන් අපට රාජ්‍ය බලය ලබා ගන්න ඕනෑය කියන අදහස ඇතුළේ තිබෙන කාරණය මොකක්ද කියලා හිතන්න කියලා, ජාතික ජන බලවේගය කියලා

කියාගෙන ඇවිල්ලා මේ රට නන්නත්තාර කරන, ජනතා විමුක්ති පෙරමුණේ වැඩ පිළිවෙළේ ඉඳගෙන කටයුතු කරන උදවියට අපි කියනවා. මේක තමයි ඉතා බරපතළ කාරණය.

ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, අපි දන්නවා, පසුගිය කාලයේ කොහොමද තීන්දු ලිව්වේ කියලා. ඒවාට හෘදය සාක්ෂිය එක්ක ඔබතුමන්ලා එකඟද? බිමල් රත්නායක මහත්තයෝ, මම ඔබතුමාගෙන් අහනවා නඩු තීන්දුව දෙන්න ඕනෑ නඩුකාරයා නේද කියලා. හැබැයි, නඩුකාරතුමන්ලාට නඩු තීන්දු ලියා දීලා ඒක කියවලා, ඒ විධියට දඬුවම් දෙන්න පුළුවන් අවශ්‍යතාව එදා ඔබතුමන්ලාගේ මානසිකත්වයේ තිබුණේ නැහැ.

අපි දන්නවා, ඔබතුමන්ලාට ඕනෑ හොරු අල්ලන්න කියලා. ඒක කරන්න. හැබැයි, හොරු අල්ලන මුවාවෙන් ඔබතුමන්ලාට හොරකම් කරන්න මේ ජන වරමෙන් අයිතියක් දීලා නැහැ. ඒවා එළි වෙනකොට, ඒවා මාධ්‍යයෙන් කියනකොට, ඔබතුමන්ලාගේ පරණ සිදුවීම් සියල්ල අපි මතක් කරනකොට, ඒවා මර්දනය කරන්න මෙවැනි දේ පාවිච්චි කරනවා. ඔබතුමන්ලාට ආණ්ඩු බලය දීලා තිබෙනවා. හැබැයි, රාජ්‍ය බලය ලබා ගැනීමට, අනීතිකව විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා, ඒ තුළින් උසාවිය දේශපාලනීකරණය කරනකොට, ඒ දෛවයේ සරදම ඔබට අනිවාර්යයෙන්ම ලැබෙන බව අමතක කරන්න එපා. තමුන්නාන්සේලාට ඔය කියන හැම ඉතිහාසයම මතක තිබෙනවා නම්, ඉතිහාසයේ එවන් කටයුතු වලදී නැවත එයින් ගුටි කෑවේ, එයින් පෙළුණේ, ඒවා සම්මත කර ගත්, ඒවා සම්මත කරගෙන සදාකාලිකව බලයේ ඉන්න ඕනෑය කියලා හිතපු අයමයි. ඒ නිසා ඔබතුමන්ලාටත් ඒ කටයුත්ත වෙනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය, ඔබතුමියට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.51]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන වෙලාවේ මටත් ඒ ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

මේ රටේ අධිකරණ පද්ධතියේ පරිපාලනමය වශයෙන් පවතින අකර්මණ්‍යතාව නැති කිරීම, යුක්තිය පසිඳලීම වේගවත් කිරීම සහ මහජනතාවට පහසුවෙන් යුක්තිය ලබා ගැනීමට සිදු කරන ඕනෑම ප්‍රතිසංස්කරණයක් කාලීන අවශ්‍යතාවක් කියලා අපි හිතනවා. රටේ අධිකරණ පද්ධතියේ පවතින අකර්මණ්‍යතාව නැති කරලා යුක්තිය පසිඳලීම සහ මහජනතාවට උපරිම යුක්තිය සහ සාධාරණත්වය පහසුවෙන් ලබා ගන්න හැකිවීම කාලීන අවශ්‍යතාවක් ලෙස සලකා තමයි අපි මේ ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා තිබෙන්නේ.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ අධිකරණවල ධාරිතාව පුළුල් කිරීම, අභියාචනා යුක්තිය සඳහා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම, විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි කිරීම තුළින් ඔවුන්ගේ අත්දැකීම් තවදුරටත් නීති පද්ධතිය තුළට ලබා ගැනීම සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ ධුර කාලය සඳහා යම් සීමා පනවා ගැනීම කියන කාරණායි.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන මේ වෙලාව වනකොට 1978 අවුරුද්දේ ඉඳලා අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන 21ක් දක්වා ගමන් කරලා තිබෙනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙන වෙලාවේ කියැවුණේ ඒ හරහා බැරි වෙන්නේ ගැහැනියක් පිරිමියෙක් කරන්නත්, පිරිමියෙක් ගැහැනියක් කරන්නත් විතරයි කියලා. අන්න ඒ වාගේ ඉතිහාසයක අත්දැකීම් තිබෙන ජන ප්‍රජාවක් හැටියට එතුමන්ලා කළ ඒ දේවල් අතීතාවර්ජනය කරලා බලනකොට අද දවසේ භය වන එක සාධාරණයි. හැබැයි, අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ ඒ වාගේ කර්තව්‍යයකට නොවෙයි.

අපි දන්නවා, අද අපි මේ කථා කරන මොහොත වනකොටත් ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ නඩු ලක්ෂ 11කට අධික ප්‍රමාණයක් - 1,134,474ක් - ගොඩගැහිලා තිබෙන බව. ඒකෙන් වැඩිම නඩු ප්‍රමාණයක් තිබෙන්නේ මහෙස්ත්‍රාත් අධිකරණවල. ඒ වාගේම 260,000කට ආසන්න නඩු ප්‍රමාණයක් දිසා අධිකරණවල තිබෙනවා. මහාධිකරණවල අපරාධ නඩු 27,376ක් ගොඩගැහිලා තිබෙනවා. මම වඩාත් තීරණාත්මකව මතක් කරන්න කැමැතියි, මේ වනකොට මහාධිකරණවල ළමා අපයෝජන නඩු 5,000ක් විතර ගොඩගැහිලා තිබෙන බව. ඒ වාගේම මේ වනකොට ළමා මහෙස්ත්‍රාත් අධිකරණවල නඩු 1,556ක් තිබෙනවා. ඒ කාරණා පිළිබඳව මම සංවේදීව මේ සමාජය අවදි කරන්න අවශ්‍යයි. අපි ඒ ප්‍රමාදයන් පිටුදැකලා අගතියට පත් වුණු පාර්ශ්වයන්ටත් කඩිනමින් යුක්තිය ලබා දීමේ යන්ත්‍රණය සක්‍රිය කරන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි ප්‍රාදේශීය අභියාචනාධිකරණ පිහිටුවලා, ඒවා ක්‍රියාත්මක කරලා, ඒ නඩු විභාග ඉක්මනින් අවසන් කරන්න කටයුතු කරලා තිබෙන්නේ.

මහජනතාවට ඉහළ අධිකරණවල පිහිට ලබන්න නම් කොළඹට එන්න ඕනෑ. ඒ නිසා අපි ඉහළ අධිකරණයක නීතිමය යුක්තිය ලබා දෙන්න පළාත්බද මහාධිකරණ පද්ධතිය පුළුල් කරලා තිබෙනවා. ඒ හරහා මහාධිකරණ මට්ටමින් වැඩි වන නඩු බර අඩු කිරීමට අපි අවධානය යොමු කරලා තිබෙනවා. විශේෂයෙන් මම මෙහිදී වගකීමෙන් යුතුව කියනවා, අපි මහාධිකරණවල ගොඩගැහිලා තිබෙන ළමා අපරාධ නඩු අවසන් කර ගන්න ඕනෑ කියන එක. ඒක කඩිනමින් කළ යුතු කටයුත්තක්. ඒ සඳහා තමයි අපි පසුගිය කාලයේ - 2025 අවුරුද්දේ සහ 2026 අවුරුද්දේ - රස පරීක්ෂකවරු බඳවා ගැනීම, අධිකරණ සේවා කාර්ය මණ්ඩල පුළුල් කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ නඩු ප්‍රමාදයන් වළක්වා ගැනීමට ගන්න පුළුවන් සියලු ක්‍රියාමාර්ගවල නිරත වුණේ.

ඒ ප්‍රමාදයන් මඟ හරවා ගැනීම සඳහා අමතර අධිකරණ සහ අමතර විනිසුරුවන් අවශ්‍ය වෙනවා. ඒ නිසා තමයි අධිකරණ සංවිධාන පනතේ 4වන වගන්තිය සංශෝධනය කරලා, මහාධිකරණ විනිසුරුවරුන්ගේ පටන් මහෙස්ත්‍රාත් අධිකරණ දක්වා විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව - ධාරිතාව - වැඩි කරන්න කටයුතු කරලා තිබෙන්නේ. පිරිස් බලයෙන්, පරිපාලනමය බලයෙන් විතරක් නොවෙයි, ව්‍යුහාත්මක වශයෙන් ගත්තොත් පළාත්බද අධිකරණ පද්ධතිය පුළුල් කරලා තිබෙනවා.

[ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය]

අධිකරණ පරිපාලනයේදී වඩාත්ම වැදගත් වෙන්නේ විනිසුරුවරුන්ගේ අත්දැකීම් හා පරිණතභාවය. ලෝකයේ අනෙකුත් රටවලුත් ඒ කාරණය සලකන්නේ එහෙමයි. ඒ අනුව අපේ රටට පරිණත විනිසුරුවරුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමටත්, ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් අධිකරණ සේවය තුළ රඳවා ගැනීමටත්, සියලු මට්ටම්වල විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 2කින් වැඩි කිරීමටත් යෝජනා කරලා තිබෙනවා. ඒ නිසා පළපුරුදු විනිසුරුවරුන් හදිසියේ විශ්‍රාම යාම නිසා ඇති වන පුරප්පාඩු හේතුවෙන් සිදු වන නඩු ප්‍රමාදයන් මේ ප්‍රතිසංස්කරණ මඟින් මඟ හැරෙනවා කියන එක අපි සම්පූර්ණයෙන් විශ්වාස කරනවා. අධිකරණයේ ආයතනික ව්‍යුහය තුළ සමබරතාවය හා විනිවිදභාවය පවත්වා ගැනීමට අපි කටයුතු කරන්න ඕනෑ. මේ සංශෝධන හදිසියේ ඇති කරපු දේවල් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා නැවතත් කියනවා, මේ සංශෝධන කිසිවක් හදිසියේ ගත් තීරණ නොවෙයි කියන එක. සංක්ෂිප්තව කියනවා නම් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත කියන්නේ නීතිමය වශයෙන් ඉලක්කම් වෙනස් කිරීමක් පමණක් නොවෙයි. මේ තුළ අධිකරණවල ධාරිතාව පුළුල් කරලා ප්‍රාදේශීය වශයෙන් ජනතාවට යුක්තිය ලබා ගැනීමේ ප්‍රවේශය පහසු කරනවා, ගොඩගැසී තිබෙන නඩු ඉක්මනින් විසඳීමට මඟ පාදනවා. ඒ විනිසුරුවරුන්ගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින්, මේ රටේ පරිපාලනය නවීකරණය කිරීම, අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම තුළ කඩිනම් විසඳුම් ලබා දෙමින්, යුක්තිය පසිඳලීමට ගත වන කාලය අවම කිරීම හරහා ඉක්මනින් ජනතාවට යුක්තිය ලබා ගැනීමේ අවකාශ අපි ලබා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙනැවිත් තිබුණේ මහජනතාවට සේවය සලසන්න නොවෙයි. ඒ, ඒ කාලවල රට පාලනය කළ අය තමතමන්ගේ -පාලකයාගේ- බලය තව ශක්තිමත් කරගෙන අනීතිකව පාලනය කරන්න තමයි මෙච්චර කල් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙනැවිත් තිබුණේ. ඒක තමතමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා බැලුවොත් විපක්ෂයේ මේ හැම මන්ත්‍රීවරයෙකුටම දැනගන්න පුළුවන්. තමන්ට නායකත්වය දුන් ඒ පාලකයෝ හැම කෙනෙක්ම; තමන්ට නායකත්වය දුන් ඒ දේශපාලන නායකත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙනාවේ මොකටද කියන එක වත්මන් විපක්ෂයට හෘදය සාක්ෂියට අනුව දැන ගන්න පුළුවන්.

1978 වසරේ ජේ.ආර්. ජයවර්ධනගේ කාලයේ සිදු කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉඳලා මේ වෙනකොට ගත වී තිබෙන ජනාධිපති ධුර කාලයන් ගත්තොත්, මේ තමයි පළමුවෙනි වතාව මහජනතාව ගැන හිතා, මේ රටේ අගතියට පත් වන පාර්ශ්ව ගැන හිතා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ අධිකරණ සංවිධාන පනතට සංශෝධන ගෙන එන. මීට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙනාවේම එවකට පාලනයේ සිටි අයගේ පවුල් බලය වෙනුවෙන්, තනි පුද්ගලයෙකුගේ බලය වෙනුවෙන් කොයි විධියටද මේ රටේ තිබෙන සමස්ත බලය කේන්ද්‍රණය කර ගන්නේ කියලායි. ඒ නිසා තමයි අද වෙනකොට ඔවුන්ට බයක් ඇති වෙලා තිබෙන්නේ අපි අනීතිකව ඔවුන්ව පාලනය කරන්න උත්සාහ කරනවා කියලා. නැහැ! මේක ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම කියලා කියනවා. නැහැ! ඒ වාගේම තමයි මේක අඳුරු දිනයක් කියලා කියනවා. නැහැ! ඒ හැම දේම ඔවුන් පසු කරමින් පැමිණි, මේ රටේ ජනතාවට ඔවුන් විසින් දායාද කරපු යුගයන්.

ඒ ඔක්කෝම පසුකර අද වනවිට රාජ්‍ය පාලනය තුළ අපි මානුෂීය බව ඇති කරලා තිබෙනවා. ඇත්තටම මානුෂීය බව කියන්නේ සීමාසහිත, වරප්‍රසාද ලත් පන්තියකට විතරක් යුක්තිය ඉෂ්ට වීම නොවෙයි. ඈත ගම්මානවල ඉන්න, නීතියේ පිළිසරණ ගැන කිසිවක් නොදන්නා, නීතිය කියන එක; නීතියේ ආධිපත්‍ය නැත්නම් නීතියේ ස්වාධිපත්‍ය; නීතියේ පිළිසරණ කියන එක ලබා ගැනීමේ ප්‍රවේශය ගන්න බැරි අයවත් අපි මේකට හවුල් කරගන්න ඕනෑ. ඒ වාගේම ඔවුන් වෙනුවෙන් රජයක් හැටියට තීරණ ගන්න ඕනෑ; ඔවුන් වෙනුවෙන් ආණ්ඩුවක් හැටියට තීරණ ගන්න ඕනෑ. තමාගේ යුක්තිය ප්‍රමාද වෙනකොට මිනිසුන් එය අත්හැර දමනවා. ඒ වෙනුවෙන්, නීතිය වෙනුවෙන් පෙනී සිටීමට ඔවුන්ට තිබෙන ධෛර්යය හීන වෙනවා. හැබැයි, අන්න ඒ හඬක් නැති මිනිසුන් වෙනුවෙන් තමයි මේ අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කිරීමත්, පුළුල් කිරීමත් ඇතුළේ අපේ ආණ්ඩුව හඬ නඟමින් තිබෙන්නේ. ඒක නිසා මේක දැවැන්ත පරිවර්තනයක්.

මේක ඉක්මන් තීන්දුවක් හැටියට අපි හිතුවාට, ඇත්තටම ගත්තොත් මේක ජනතාවාදී තීන්දුවක්. ඒ ජනතාවගේ මානුෂීය අවශ්‍යතාවක් තමයි නීතිය ඉදිරියේ බියෙන් සැකෙන් තොරව පෙනී ඉන්න එක. ඒ නිසා ආයතන ස්වාධීන කිරීම අපි ආරම්භ කළා. අධිකරණය, පොලීසිය, මැතිවරණ කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වැනි ආයතන දේශපාලන හස්තයන්ගෙන් නිදහස් වූ විට තමයි සාධාරණ සමාජයක් නිර්මාණය වෙන්නේ. ඒ වාගේම තමයි අපි වගවීම හා පාරදෘශ්‍යභාවය මේකෙන් සහතික කරලා තිබෙනවා. බලය ලබා ගන්නා ඕනෑම කෙනෙකුට ඒ වගවීම හා පාරදෘශ්‍යභාවය ඇති කර ගන්න ඕනෑ කොයි විධියටද කියන ආදර්ශය අපි මේ හරහා ඇති කර තිබෙනවා.

අද අපි කථා කරන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ මෙතෙක් තිබුණු අතීත අත්වැරදීම් නිවැරදි කර ගන්නට අපට ලැබුණු තවත් එක් අවස්ථාවක්. කිහිපදෙනෙක් වෙනුවෙන් විතරක් යුක්තිය ඉෂ්ට කරමින් අධිකරණමය බලය දේශපාලනික හස්තයකට නතු කරගෙන තිබුණු තත්ත්වය අපි සමස්ත මහජනතාව සඳහා ස්වාධීන කරලා, පුළුල් කරලා විනිවිදභාවයකින් යුක්තව ඉදිරිපත් කරන අවස්ථාවක් හැටියට තමයි අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත සහ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත අප හඳුන්වන්නේ.

ඒක නිසා මේ වෙනස ක්‍රියාත්මක කරනකොට අපි මතක තබාගන්න ඕනෑ, ව්‍යවස්ථාවේ වගන්ති වෙනස් කළ පමණින් රටක් වෙනස් වෙන්නේ නැහැ කියලා. ඒ වෙනස ක්‍රියාත්මක කරන්න නම් පාලකයන්ගේ සහ වගකිව යුත්තන්ගේ කැපවීම මෙන්ම පිරිසිදු චේතනාවත් අවශ්‍යයි. රජයක් හැටියට අපි ඉතා පැහැදිලිව කියනවා, අන්න ඒ දේශපාලන කැපවීම සහ පිරිසිදු චේතනාව සහිතව තමයි ජාතික ජන බලවේගයේ අපි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ කියලා. ඒක නිසා, අතීතයේ සිදු වූ වැරදි නැවත සිදු නොකර, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර නිසි බලතල සමබරතාවක් ඇති කරමින්, ජනතාවගේ හඬට සහ අයිතිවාසිකම්වලට මූලිකත්වය දෙන පාලන තන්ත්‍රයක් ගොඩනැඟීම සඳහා අපි හැමෝම එක්විය යුතු බව මා සඳහන් කරනවා.

අවසාන වශයෙන්, මම මේ කාරණයත් සඳහන් කළ යුතුයි.

நாங்கள் 1978ஆம் ஆண்டு முதல் இன்றுவரை 21 அரசியலமைப்புத் திருத்தங்களைக் கடந்து வந்திருக்கிறோம். ஊசலாடிக்கொண்டிருந்த இந்த அரசியலமைப்பு நாடகத்தால் இறுதியில் பாதிக்கப்பட்டவர்கள் சாதாரண பொதுமக்களே

தவிர, வேறு யாருமல்லர். நாட்டின் பொருளாதார மற்றும் சமூக வீழ்ச்சிக்கு இந்த அரசியலமைப்பின் நிலையற்ற தன்மை நேரடியாகப் பங்களித்துள்ளதென நான் கூற விரும்புகின்றேன்.

தனிநபர் மைய ஆட்சிக்கு முற்றுப்புள்ளி வைக்கப்பட்டு, அரசாங்க நிருவாகத் தீர்மானங்கள் தனிநபரின் விருப்பு வெறுப்புகளின் அடிப்படையில் அல்லாமல், நிறுவனக் கட்டமைப்பு மற்றும் சட்டத்தின் ஆட்சியின் அடிப்படையில் அமைய வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். சுருக்கமாகக் கூறுவதென்றால், சுயாதீன நிறுவனங்களைச் செயற்படுத்துவதன்மூலம், குறிப்பாக நீதித்துறை, பொலிஸ், தேர்தல் ஆணைக்குழு, இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு போன்றவை அரசியல் தலையீடுகளிலிருந்து விடுவிக்கப் படுவதன்மூலம் நியாயமான சமுதாயத்தை உருவாக்க முடியுமென நாங்கள் முழுமையாக நம்புகின்றோம்.

இறுதியாக, அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் மற்றும் நீதித்துறை சட்டத்திருத்தம் என்பன வெறும் சட்ட எண்களில் மாற்றம் மட்டுமல்ல. இவை நீதிமன்றங்களின் கொள்கைகளை விரிவுபடுத்துகின்றன; பிராந்திய மக்களுக்கு நீதிக்கான அணுகலை எளிதாக்குகின்றன; தேங்கிக் கிடக்கும் வழக்குகளை விரைவாக முடிப்பதற்கு வழிவகுக்கின்றன; நீதிபதிகளின் அனுபவத்தைப் பாதுகாத்து, நீதிச் சேவையை வலுப்படுத்துகின்றன. எனவே, நாட்டின் நீதி நிருவாகத்தை நவீனமயமாக்கி, மக்களுக்கு விரைவாக நீதியைப் பெற்றுக் கொடுக்க உதவும் இந்த வரலாற்றுச் சிறப்புமிக்க திறந்த மசோதாக்களுக்குக் கட்சி பேதம் இல்லாமல் நீங்கள் அனைவரும் உதவிபுரிய வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොමත්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.05]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ දවස් දෙකේම - ඊයේත්, අද දවසේත් - විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව තමයි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ විවාදය පැවැත්වෙන්නේ.

ඇත්තටම අපි බලාපොරොත්තු වුණා, මීට වඩා උණුසුම් විවාදයක් අපට දකින්න ලැබෙයි කියලා. නමුත්, බොරු සහ පදනම් විරහිත තර්ක ඉදිරිපත් කරමින්, අවසානයේ කළු පාට ඇඳුම් ඇඳගෙන ඇවිල්ලා විරෝධය ප්‍රකාශ කරන තැනට විපක්ෂය දුර්වල වෙලා තිබෙනවා. ඡන්ද විමසීමේදී පාර්ලිමේන්තුවේ කැමැත්ත හෝ අකැමැත්ත ප්‍රකාශ කරන්න පුළුවන්කම තිබියදී, කළු පාට ඇඳුම් ඇඳගෙන ඇවිල්ලා විරෝධය පළ කරන තැනට විපක්ෂය දුර්වල වෙලා තිබෙනවා.

ඇත්තටම සමහරු පෙන්වා දෙන්න උත්සාහ කළා, අද දවසේ මේ සංශෝධන තුළින් ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම සිදු වෙනවාය කියලා. පසුගිය ආණ්ඩු යටතේ - එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව වෙන්න පුළුවන්, එහෙම නැත්නම් පොහොට්ටුවේ ආණ්ඩුව හෝ යහපාලන ආණ්ඩුව වෙන්න පුළුවන්, ඒ කොයි ආණ්ඩුව යටතේ වුවත් - අධිකරණයට එල්ල කළ කළු පැල්ලම් පිළිබඳව ජනතාව දන්නවා; අධිකරණ ක්ෂේත්‍රයේ කටයුතු කරන අයත් දන්නවා කියන කාරණය මම මතක් කර දෙන්න කැමැතියි. ඒ නිසා නැවත නැවත අපට ඒවා මතක් කරලා දෙන්න අවශ්‍ය නැහැ. එවැනි අඳුරු යුග පසු කරගෙන තමයි අපි අද මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, අපට විශාල ජනවරමක් ලබා දුන් ජනතාව අපෙන් ඒ දේවල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. එම නිසා මම එක කාරණයක් මතක් කරන්න ඕනෑ. අපට ලැබුණු තුනෙන් දෙකක් ඉක්මවා ගිය අතිවිශාල ජන වරම කිසිදු අවස්ථාවකවත් පොදු ජනතාවට අහිතකර වන ආකාරයේ පනත් සංශෝධන ගෙනෙන්න අපි උපයෝගී කර ගන්නේ නැහැ. ඒ කාරණය මම බොහොම අවධාරණයෙන් මතක් කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා නව දේශපාලන ක්‍රමයක් ඇති කරලා, ඒත් එක්කම ඒ පැවති අධිකරණවල සිටි ඉහළ අධිකරණ විනිසුරුතුමන්ලා අතරින් තමන්ට අකැමැති විනිසුරුතුමන්ලා නැවත ඉහළ අධිකරණවලට පත් කිරීම සිදු කළේ නැහැ. ඒ වෙනුවට, තමන්ට කැමැති අය තමයි එතුමා ඉහළ අධිකරණවලට පත්කර ගත්තේ. ඒ වාගේම, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා තමන්ට සමීප හිතවතකු වූ නෙවිල් සමරකෝන් මැතිතුමා තමයි ජ්‍යෙෂ්ඨත්වය සලකා බලන්නේ නැතිව අගවිනිසුරු ධුරයට පත් කර ගත්තේ. හැබැයි, එතුමා අගවිනිසුරු ධුරයට පත් වුණාට පසුව ස්වාධීනව කටයුතු කළ ආකාරයක් අපි දැක්කා. ඊට පසුව තමන්ට ඕනෑ ඕනෑ විධියට අධිකරණය මෙහෙයවා ගන්න බැරි වුණු නිසා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා නෙවිල් සමරකෝන් අගවිනිසුරුතුමාත් ඉවත් කරන්න කටයුතු සූදානම් කළා. ඒ කොහොම නමුත්, එතුමා 1984.10.21 වැනි දින ධුර කාලය අවසන් වීමෙන් විශ්‍රාම ගියා. නෙවිල් සමරකෝන් අගවිනිසුරුවරයා විශ්‍රාම ගැනීමෙන් පසුව ඇති වූ පුරප්පාඩුවට ජ්‍යෙෂ්ඨත්වය නොසලකා, විශ්වාසය මත එස්. සර්වානන්ද විනිසුරුතුමා පත් කර ගත්තා. එතුමා විශ්‍රාම ගියාට පසුව ජ්‍යෙෂ්ඨත්වය අනුව එම ධුරය හිමි විය යුතුව තිබුණේ, වනසුන්දර මැතිතුමාට. හැබැයි, එතුමාව පත් නොකර, ඊට පහළින් හිටපු පාරින්ද රණසිංහ මැතිතුමාව අගවිනිසුරු තනතුරට පත් කර ගත්තා. ඉතින් ඔහොම තත්ත්වයක් තමයි එදා තිබුණේ. ඔන්න ඔය විධියට තමයි ඒ ආණ්ඩු කටයුතු කළේ.

ඊට පස්සේ ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය ඉවත් කරන්න කටයුතු කළ ආකාරය අපි දැක්කා. ඒ වාගේම, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිවරිය කටයුතු කළ කාලයේදී ජ්‍යෙෂ්ඨත්වය නොසලකා, තමන්ට විශ්වාසවන්ත පුද්ගලයෙකු වූ සරත් එන්. සිල්වා මැතිතුමා අගවිනිසුරු විධියට පත් කර ගත්තා. ඒ වෙලාවේදී ජ්‍යෙෂ්ඨත්වය අනුව දක්ෂ විනිසුරුවරයෙකු විධියට මාර්ක් ප්‍රනාන්දු මැතිතුමා තමයි පත් විය යුතුව තිබුණේ. එවැනි ඉතිහාසයක් තමයි අපට අධිකරණ ක්ෂේත්‍රයේ දකින්න ලැබුණේ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, සරත් එන්. සිල්වා අගවිනිසුරුතුමාගේ කාලයේදී අධිකරණය විධායකයට පක්ෂපාතීව ක්‍රියා කරන තැනකට මෙහෙයවා තිබුණු බව. එවැනි තත්ත්වයන් තමයි අපි එදා දැක්කේ. රාජපක්ෂ පාලන යුගයේ විධායකය අතින් සිදු වන වැරැදිවලින් විධායකය ආරක්ෂා කරන තත්ත්වයකට අධිකරණය මෙහෙයවපු අවස්ථා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම සඳහා

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

විශේෂ ජනාධිපති කොමිසමක් 1978 අගෝස්තු මාසයේ පත් කළා. ඒ කොමිසමට ඒ සම්බන්ධයෙන් බලතල නොමැති බවට අභියාචනාධිකරණයට කරපු ඇපැලකදී, අභියාචනාධිකරණය විසින් කොමිසමට රිට් තහනමක් නිකුත් කළා. ඒ අවස්ථාවේදී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා පළමුවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, අභියාචනාධිකරණයට තිබුණු බලතල පාර්ලිමේන්තුවට පවරා ගත්තා. ඔන්න ඔය විධියට තමයි ඉතිහාසයේ අධිකරණයට කළු පැල්ලම් එකතු කරපු අවස්ථා අප දකින්නේ. අප මේ ගෙනෙන ව්‍යවස්ථා සංශෝධනයෙන් එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. අපි ජනවරම ලබා ගන්න කොට ජනතාවට පොරොන්දු ලබා දුන්නා අධිකරණයේ කටයුතු කාර්යක්ෂම කරන බවට. මොකද, අධිකරණයේ නඩු ගොඩගැහිලා තිබෙනවා, ලක්ෂ එකොළහකට වඩා නඩු විභාග වෙන්න තිබෙනවා. එම නිසා "නඩු විභාග කිරීම වේගවත් කරනවා, කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් පවත්වාගෙන යනවා" කියන පොරොන්දු අපි ජනතාවට ලබා දුන්නා. ඒ පොරොන්දු එකින් එක ඉෂ්ට කරගෙන යාමක් තමයි අප මේ සිද්ධ කරන්නේ. ඒකට අදාළ හොඳ සංශෝධන දෙකක් තමයි අද පාර්ලිමේන්තුවේ මේ සම්මත කර ගන්න අප බලාපොරොත්තු වන්නේ. විශේෂයෙන්ම විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම ගැන්වීම සහ පත් කිරීම සම්බන්ධයෙන් ඇතැම් ගැටලු තිබෙනවා. ඒවාට මෙතැනදී විසඳුමක් සැපයෙනවා.

අනෙක් අතට, අධිකරණ පද්ධතියේ අභියාචනාධිකරණය සහ පළාත්බද මහාධිකරණවල තිබෙන ධාරිතාව වාගේම කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම මේ සංශෝධනවලින් සිදු වෙනවා. අභියාචනාධිකරණයේ අධිකරණ බලය ප්‍රාදේශීය මට්ටමට විකාශනය වීමක් මේ තුළින් සිදු වෙනවා. දැනට අභියාචනාධිකරණ නඩු කටයුතු කොළඹ ප්‍රදේශයේයි සිදු වන්නේ. එම නිසා පිට ප්‍රදේශවල අය කොළඹට එන්න ඕනෑ. ඒ නිසා ජනතාව අපහසුතාවලට මුහුණ දෙනවා; නඩු ගොඩගැහිලා තිබෙනවා. ඒ තත්ත්වයන් මඟ හරවා ගන්න මේ සංශෝධන ඉවහල් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශේෂයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. අභියාචනාධිකරණයේ උපරිම විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව 19 සිට 24 දක්වා වැඩි කරන්න පුළුවන් වන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට යෝජනා වෙලා තිබෙනවා. පළාත්බද මහාධිකරණවල ධාරිතාවත් මේ සංශෝධන හරහා වැඩි වෙනවා. විශේෂයෙන් පළාත්බද මහාධිකරණවලට බරපතළ අපරාධ සම්බන්ධයෙන් මුල් අවස්ථා අධිකරණ බලය තමයි තිබෙන්නේ. 2006දී කරන ලද සංශෝධනයෙන් පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ ඇති කළා. එතැනදී පළාත්බද මහාධිකරණවලට අභියාචනා බලයත් ලැබුණා. හැබැයි, ඒකෙන් නඩු ගොඩ ගැහුණා. ඒ නඩු කටයුතු ඉක්මනින් අවසන් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. අප සිදු කරන මෙම සංශෝධනය තුළින් නඩු ප්‍රමාදය වළක්වා ගන්නත්, අතිරේක අධිකරණ සහ අතිරේක විනිසුරුවරුන් පත් කර ගන්නත් ඉඩ සැලසෙනවා. ඒ වාගේම, මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව 110 සිට 120 දක්වා වැඩි කළ හැකි වන පරිදි අධිකරණ සංවිධාන පනතේ 4වන වගන්තියත් මෙහිදී සංශෝධනයට ලක් වෙනවා.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. සමහර අය ඒත්තු ගන්වන්න හැදුවා, මෙම සංශෝධනය මඟින් වත්මන් අගවිනිසුරුතුමාගේ විශ්‍රාම යාමේ වයස තවත් වසර දෙකකින් දීර්ඝ කර ගැනීමේ වුවමනාව තමයි මේ තිබෙන්නේ කියලා. මේක එවැනි සංශෝධනයක් නොවෙයි. මෙහිදී සමස්තයක් ලෙස සියලුම විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම යෑමේ වයස වසර දෙකකින් දීර්ඝ වීමක් සිදු වනවා. ඒ වාගේම අපි මෙම සංශෝධනය ගෙන ඒමේදී විශේෂයෙන් ජාත්‍යන්තරව වෙනත් රටවල විනිසුරුතුමන්ලාගේ විශ්‍රාම යෑමේ වයස පිළිබඳවත් සලකා බලා තිබෙනවා. බහුතරයක් රටවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 70 හෝ ඊට වැඩියි. ඇමෙරිකා එක්සත් ජනපදයේ තත්ත්වය ගත්තාම, ඉහළ අධිකරණ විනිසුරුතුමන්ලාට ජීවිත කාලය පුරාම එම ධුරය දරන්න පුළුවන්. ඒ වාගේම, බ්‍රිතාන්‍යය 2022 වසරේදී විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 70 සිට අවුරුදු 75 දක්වා වැඩි කර තිබෙනවා. තමන්ගේ නඩුව අහන විනිසුරුවරයාගේ විශ්‍රාම ගත යුතු වයස තවත් වසර දෙකකින් වැඩි වීම හේතුවෙන්, එම විනිසුරුවරයා තවත් වසර දෙකක් තමන්ගේ නඩුව ඇහුවා කියලා නඩුවේ පාර්ශ්වයන්ට අගතියක් වෙන්නේ නැහැ. ඒ ලබා දෙන තීන්දුවේ ගුණාත්මකභාවය වැඩි වීමක් තමයි එමඟින් සිද්ධ වෙන්නේ. එම නිසා මේ සංශෝධනවලින් පොදු ජනතාවට යහපතක් මිස අයහපතක් වෙන්නේ නැහැ. හැබැයි, කලින් ආණ්ඩු කාලවලදී වැරැදි කරලා, ඒ සම්බන්ධව පිට පිට නඩු වැටෙන අය නම් දැන් කලබල වෙලා ඉන්නවා. මොකද, නඩු කටයුතු වේගවත් වනකොට, ඔවුන්ගේ නඩු ඉක්මනින් අහලා, ඔවුන්ට ඉක්මනින්ම තීන්දු ලැබෙනවා; ඔවුන්ට දඬුවම් විඳින්න සිද්ධ වෙනවා. ඒ හින්දා වසර 10ක්, 15ක් තමන්ගේ නඩුව කල් ඇද ඇද ඉන්න හැකි වන අවස්ථා මඟ හැරිලා යනවා. එම නිසා එවැනි සුළුතර පිරිසක් තමයි මේ ගැන කලබල වෙලා ඉන්නේ. එතැනින් එහා පොදු ජනතාවට මේකෙන් ගැටලුවක් වෙලා නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
මා අවසාන වශයෙන් කියන්නේ මෙයයි. අද දින මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකක බලයෙනුත්, ඒ වාගේම අධිකරණ සංවිධාන පනතට කරන සංශෝධනය සරල බහුතරයකිනුත් පහසුවෙන් සම්මත කර ගන්න පුළුවන් විධියේ ජනවරමක් අපට ජනතාව ලබා දීලා තිබෙනවා. එම ජනතා අභිලාෂයන් ඉෂ්ට කරමින් අපි ආණ්ඩුවක් විධියට සාර්ථකව ඉදිරියට යනවා. ඒ වාගේම, ජනතාව තවමත් මේ ආණ්ඩුව කෙරෙහි හොඳ විශ්වාසයකින් කටයුතු කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මගේ කථාව අවසන්කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.16]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මේ සම්පූර්ණ විවාදය ගැන කල්පනා කළාම මට තේරුම් ගිය කාරණයක් තිබෙනවා. ආණ්ඩුව පුළුවන් තරම් මේක ආරක්ෂා කරන්න හැදුවාට, අද උදේ බිමල් රත්නායක ඇමතිතුමා කියපු

කථාවෙන් මේ මුළු සමස්තයේම ඇතුළේ තිබෙන අභ්‍යන්තර අර්බුදය මොකක්ද කියලා බොහොම පැහැදිලිව තේරෙනවා. මොකක්ද එතුමා කිව්වේ? එතුමා කිව්වා, "අපි ආණ්ඩුවක් විධියට දෙකට බෙදාගෙන වැඩ කළේ නැහැ, මෙතෙක්. මේකෙන් තමයි චුට්ටි හරි බෙදීමක් වුණේ" කියලා. ඒක 90 ද, 10 ද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, බෙදීමක් වුණා කියන එක එතුමා පිළිගන්නවා. *[බාධා කිරීමක්]* ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, දැන් ඉතින් මට බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කරුණාකරලා මට මගේ වෙලාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා. *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලයෙන් අඩු වෙන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම point of Order එකයි raise කරන්නේ. ඒ, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මගේ නම කියලා මා නොකියපු දෙයක් සඳහන් කිරීම නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඒ කථාව මේ සභාවේදීයි සිදු කළේ. එහෙම දෙයක් කියැවුණා නම් මේ සභාවේ එවේලේම එය මතු වෙන්න ඕනෑ. මම ඉතාම පැහැදිලිව කියපු දේ තමයි- *[බාධා කිරීමක්]* නැහැ, මම ඉතාම පැහැදිලිව මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. වාක්‍යයක කෑල්ලක් අරගෙන අපට මඩ ගහන මාධ්‍යවලින් බොරු හැදුවාට වැඩක් නැහැ. අපි ඒ ප්‍රශ්නය ගන්නවා. ඉතාම පැහැදිලිව මම කිව්වේ, "ආණ්ඩුවක් විධියට අපි මෙතෙක් වැඩ කළේ සමාජය දෙකට බෙදාගෙන නොවෙයි. මේකෙන් අපි දන්නවා යම්කිසි බෙදීමක් සමාජයත් එක්ක ඇති වෙලා තිබෙනවා කියලා. අපි ඒකත් heal කර ගන්නවා. මොකද, අපි දන්නවා මේ ඇති වෙච්ච සංවාදය නිසාම අපට වගකීමක් තිබෙනවා, අධිකරණයටත් වගකීමක් තිබෙනවා, මේක හරියට කරන්න" කියලායි. ඒක තමයි හරි පැහැදිලිව කිව්වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා විනාඩියකට වඩා ගත්තා. මගේ වෙලාව යන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ. මගේ point of Order එක raise කරන්නයි විනාඩිය තිබෙන්නේ. ඒක පැහැදිලි කරන්න මට අවස්ථාව අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත වෙලාව දෙනවා, ගරු දයාසිරි මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඕනෑ බොරුවක් කියන්න ඔබතුමාට අයිතිය තිබෙනවා. නමුත්, ඒ සඳහා මාව යොදා ගන්න අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා සභමුලින්ම අපි ඒ අදාළ මාධ්‍ය ආයතනයට කියනවා, එක්කෝ හරියාකාරව ඒක වෙනස් කරන්න. නැතිනම්, අපි ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් ලෙස ගන්නවා කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේ කියපු කථාව අපි අහගෙන හිටියා පැය ගාණක්. බොරු කියන්න මට වුවමනාවක් නැහැ. මේ දේවල් මේ රටේ මිනිස්සුත් අහගෙන ඉන්නවා. ඔබතුමන්ලා බොරු කියලා, බොරු කියලා, ඒ බොරු වහන්න ආයෙත් බොරු කියනවා. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. මම කියන්න හැදුවේ මේකයි. බිමල් රත්නායක මහත්මයාගේ විතරක් නොවෙයි, සමස්ත කට්ටියගේම කථා ටික අරගෙන බැලුවාම පේනවා ඒ අයට විශාල ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ අය විශාල හීනමානයකින් පෙළෙනවා. ඒ හීනමානය නිසා තමයි කියන්නේ, lawyersලා කිහිපදෙනාටයි ඇප ගන්න පුළුවන්, lawyersලා කිහිපදෙනායි නඩු දිනන්නේ කියලා. එතකොට විනිශ්චයකාරතුමන්ලා අල්ලාගෙන ද මේක කරන්නේ? මතක තබාගන්න. තමුන්නාන්සේ විශ්වවිද්‍යාලයට ගියාට තවම උපාධි අපේක්ෂක නේ. කරුණාකරලා ඒකවත් මතක තබාගන්න. අපි නීතිඥ වෘත්තිය කරන්නේ, ඉන්න විනිශ්චයකාරවරයා කවුද කියලාවත් බලන්නේ නැතිවයි. එතුමන්ලා තීරණ දෙන්නේ, තිබෙන සාක්ෂි මත. මේකෙන් ඔබතුමන්ලා කරන්නේ ලොකු අපරාධයක්. කිහිපදෙනෙක් විතරයිලු, නඩු දිනන්නේ. කිහිපදෙනෙකුටලු, මේ රටේ අධිකරණය සීමා වෙලා තිබෙන්නේ. ඒක වැරදියි. දක්ෂතාව මත තමයි හැමතැනකම ඒ කටයුතු සිද්ධ වන්නේ. මීට කලින් නීතිඥතුමියක් කථා කළා. එතුමිය මාවත් දන්නවා. සමහර ප්‍රදේශවලින් ඉහළට ආපු දක්ෂ නීතිඥවරුන් ඉන්නවා. ඒ අය විනිශ්චයකාරවරුන්ට පගා දීලා නොවෙයි නේ එතැනට ඇවිල්ලා තිබෙන්නේ. තමුන්නාන්සේලාට තිබෙන්නේ හීනමානයක්. කවුරු හරි ගෙයක් හැදුවොත්, වාහනයක ගියොත් තමුන්නාන්සේලා හිතන්නේ ඒ කෙනා හොරෙක් කියලා. නැත්නම් වෙනත් විධියකට හම්බ කරපු කෙනෙක් කියලා. ඒ හීනමානය නවත්වන්න.

මම මේ අවස්ථාවේදී මූලික වශයෙන් ප්‍රශ්න කිහිපයක් මතු කරන්න කැමැතියි. රාජ්‍ය බලය අත්පත් කර ගැනීම කියන එක තමයි මූලික වශයෙන් තිබුණේ. මම දැක්කා, අපේ මිත්‍ර ලාල් කාන්ත ඇමතිතුමාත් කියනවා, රාජ්‍ය බලය ගමට ගෙනියන්න ඕනෑය කියලා. මොකක්ද මේ කරන්න හදන්නේ? අධිකරණ බලය ගමට ගෙනියන්න කියනවා. ඔව්, අධිකරණය ගමට ගෙනිහිල්ලා තිබෙන්නේ. මහෙස්ත්‍රාත් අධිකරණය ගමේ තිබෙනවා, දිසා අධිකරණය ගමේ තිබෙනවා. තව ගෙනියන්න බලයක් නැහැ. තමුන්නාන්සේලා තමයි 1988-89 කාලයේ නඩු ඇහුවේ, අධිකරණ බලය ගමට අරගෙන ගිහිල්ලා. තුණ්ඩුවලින් උසාවි වහලා එහෙම තමයි 1988-89 කාලයේ මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳුවේ. තමුන්නාන්සේලාට ඕනෑ, නැවත වතාවක් ඒක කරන්නද? ඒක තමයි තමුන්නාන්සේලා මේ කරන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වෙන කවුරුවත් අවශ්‍ය නැහැ, අපේ රටේ කාටුන් අඳින අය බලන්න. ඒ අය ඇප

[ගරු නිතිඥ දයාසිරි ජයසේකර මහතා]

පිටත් නැහැ, සැක පිටත් නැහැ. ඒ අය දැන් තිබෙන තත්ත්වය ඇඳලා පෙන්වා තිබෙනවා. මොකක්ද ඒ අය පෙන්වා තිබෙන්නේ? බලන්න, මේ මගේ ළඟ තිබෙන්නේ එහෙම ඇඳපු කාටූන් එකක්. මේකේ තිබෙන Executive - විධායකය - සහ Legislature කියන දෙකම රතු පාටයි. මොකද, දැන් පාර්ලිමේන්තුව රතු පාටයි නේ. ඊළඟට Judiciary තිබෙනවා, කළු පාටින්. මේකේත් රතු පාට ගාන්න තමයි මේ හදන්නේ. ඒක බොහොම පැහැදිලි කාරණයක්.

ඒ විතරක් නොවෙයි, මේකත් එක්ක දැන් මොකක්ද වෙන්නේ? මේකෙන් පස්සේ ජනාධිපතිතුමාට විශාල බලයක් ලැබෙනවා. මහාධිකරණයේ පුරප්පාඩු 17ක් තිබෙනවා. ඒකට තමුන්නාන්සේලා 10ක් එකතු කළා. එතකොට තමුන්නාන්සේලාට මහාධිකරණයට විනිසුරුවරුන් 27දෙනෙකු පත් කරන්න තිබෙනවා, අද රෑ මේ සංශෝධනය සම්මත වුණාට පස්සේ. ඊළඟට අභියාචනාධිකරණයට විනිසුරුවරුන් 4දෙනෙකු පත් කරන්නේ නැතිව හිටියා. ඒකටත් තමුන්නාන්සේලා 5දෙනෙකු අලුතින් එකතු කළා. එතකොට හෙට උදේට ජනාධිපතිතුමාට එතැන තිබෙන පුරප්පාඩු 9ත් පුරවන්න පුළුවන්. ශ්‍රේෂ්ඨාධිකරණයේත් පුරප්පාඩු 4ක් තිබෙනවා. ඒ 4දෙනාත් පත් කරන්න පුළුවන්. මේ ඔක්කෝම එකතු කරලා බැලුවාම, ජනාධිපතිතුමාට මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණයට සහ මහාධිකරණයට විනිසුරුවරුන් 40දෙනෙකු පත් කරන්න තිබෙනවා. මේකට තමයි අපි, court packing කියන්නේ. මේ අයව පත් කරන්න සම්පූර්ණ බලය තිබෙන්නේ ජනාධිපතිතුමාට. ඒක මතක තබාගන්න. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙහෙම පත් කළාට පස්සේ තව අවුරුදු 10ක්, 15ක් මේ අය තමන්ට වුවමනා විධියට දිගටම වැඩ කරගෙන යනවා. ඒක තමයි වුවමනා වෙලා තිබෙන්නේ. ඒකයි මම කිව්වේ. මේ කාටූන් ශිල්පියා ඇඳලා තිබෙන්නේ මොකක්ද කියලා බලන්න කියලා. හෙටින් පස්සේ මේ රටේ ජනාධිපතිතුමාගේ අතේ තිබෙන කූඩුවක් ඇතුළේ හිරවෙලා සිටින විනිශ්චයකාරවරුන් වාගේ තමයි ඉන්න වෙන්නේ. කැමැති කෙනෙක්ව නිදහස් කරන්න පුළුවන්. මේක තමයි තමුන්නාන්සේලා සිද්ධ කරන්න හදන්නේ. මේ, ඇප පිට ඉන්න අයත් නොවෙයි, සැක පිට ඉන්න අයත් නොවෙයි. මේ රටේ ඉන්න කාටූන් ශිල්පියෝ තමයි මේවා අඳින්නේ. ඒ අය මොන තරම් හිතනවා ඇත්ද, මෙන්න මේකයි වෙන්න යන්නේ කියලා. කුරුල්ලෝ එක එක්කෙනා නිදහස් කරනවා වාගේම පත් කරනවා. ඊයේ පෙරේදාත් තුන් දෙනෙක්ව පත් කළා. මේ අය කොයි විධියටද පත් කරන්නේ කියන එක ගැන කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ලෝකයේ තිබෙනවා, Bangalore Principles කියලා system එකක්. ඒකේ තිබෙනවා, පත්වීම් දෙන්නේ කොහොමද, උසස්වීම් දෙන්නේ කොහොමද, වැඩ තහනම් කරන්නේ කොහොමද කියලා. මේකේ ඒවා මොකුත්ම නැහැ. ඒකයි මම කිව්වේ, අවසානයේ මේක එක් කෙනෙකුගේ දෙන්නෙකුගේ අතට යන තැනකට තල්ලු වෙනවා කියලා.

ඊළඟට මම කියන්න කැමැතියි, ගිය සතියට එපිට සතියේ මහාධිකරණයේ පවරා තිබුණු මානව හිමිකම් නඩු 40ක් එකපාර අයින් කළ බව. පූජිත් ජයසුන්දර, දේශබන්දු තෙන්නකෝන් සිදු කළ උසස්වීම්වලට අභියෝග කරලා ඉදිරිපත් කරපු පොලිස් පෙත්සම් 40ක් එක දවසින් අයින් කළා. කවුද අයින් කළේ? මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමා. මේ රටේ අහන්න තිබුණු නඩු 40ක් එක දවසින් අයින් කළා. ඒවා අහිංසක මිනිස්සුන්ගේ නඩු. PC හිටපු කෙනාට sergeant තනතුර හම්බ වුණේ නැහැ. Sergeant හිටපු කෙනාට SI තනතුර හම්බ වුණේ නැහැ. SI හිටපු කෙනාට CI තනතුර හම්බ වුණේ නැහැ. ඒ තනතුරු හම්බ වුණේ නැති නිසා තමයි ඔවුන් ගිහිල්ලා නඩු දැම්මේ, පොලිස්පතිවරුන් ගණනාවකට විරුද්ධව. හැබැයි එක දවසින් petitions 40ක් එළියට වීසි කරන්න පුළුවන්ද, කෙනෙකුට? එහෙම කොහොමද මේ කටයුතු කරගෙන යන්නේ? ඒ විතරක් නොවෙයි. ගරු සුජීව සේනසිංහ මැතිතුමාත් මේ පිළිබඳව ප්‍රශ්නයක් ඇහුවා. මේ රටේ ව්‍යවස්ථාවේ තිබෙන මානව හිමිකම් පරිච්ඡේදය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා 1978 ඉඳලා පහර ගැහුවා. හැබැයි, ඒකේ ආපු හොඳම කොටස තමයි, මානව හිමිකම් කියන එක. ඒක අනුව, ඕනෑම කෙනෙකුට ගිහිල්ලා නඩුවක් දමන්න පුළුවන්. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

2021දී ඇවිල්ලා තිබෙන නඩු ප්‍රමාණය 443යි; 2022දී නඩු 399යි; 2023දී නඩු 319යි; 2024දී නඩු 351යි; 2025දී නඩු 301යි. හැබැයි, මේ අග්‍ර විනිශ්චයකාරතුමා පත් වුණට පසු 2026 වසරේ මේ දක්වා නඩු 25යි. මතක තබාගන්න, සූරසේන මැතිතුමා පත් වුණාට පසු නඩු 25යි. මේක තමයි සිද්ධ වන්නේ. ඒ, නඩු අඩු කරන ප්‍රමාණය.

මේ සංශෝධන සම්මත කළායින් පසු හෙට උදේ ඉඳලා මොකක්ද වෙන්නේ කියලා මම කියන්නම්. දැනට නඩු ලක්ෂ 11ක් තිබෙනවා නේ. ඔව්, කැදෙව්වා, මහාධිකරණ විනිසුරුවරුන්, මේ නඩු අවසන් කරන්න කියලා කියනවා. අහන්න ඕනෑ නැහැ, නඩුව අවසන් කරන්න. මම අද කිව්වා කියලා ලියලා තියාගන්න. මීට පස්සේ මේ රටේ නඩු අරගෙන ගිහිල්ලා කථා කරන්න බැහැ. මොකක්ද, හේතුව? අහන්න දෙයක් නැහැ; there is no fair hearing. තමන්ට තීරණය කරන්න පුළුවන්, ඊළඟ උසස්වීම දෙනකොට මොකක්ද කරන්නේ කියලා. මේගොල්ලන් කොච්චර නඩු ප්‍රමාණයක් ඉවත් කර තිබෙනවාද, ඒ නඩු ඉවත් කරපු ප්‍රමාණය තමයි පාදක වෙන්නේ මේ රටේ ඊළඟ තීන්දු ටික දෙන්න. මේ විධියට තමයි මේක සිද්ධ වන්නේ.

අද වනකොට විනිශ්චයකාරවරුන් 43දෙනෙක් ගෙදර යවලා තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒ ඔක්කෝම නිවැරදියි කියලා. හැබැයි, ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. ඒ අය කැඳවා ඒ අයට යම්කිසි විධියකට පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. ස්වාභාවික යුක්තියේ මූලධර්ම තිබෙනවා. Fair hearing එකක් තිබෙන්න ඕනෑ; *audi alteram partem* අනුව දෙපැත්තටම සවන් දෙන්න ඕනෑ. මේවා තමයි වැදගත් වන්නේ. හැබැයි, ඒ අයට මොකක්ද කළේ? 43දෙනෙක් අද වෙද්දි එළියට තල්ලු කරලා තිබෙනවා. මේ විධියට වැඩ කරන්න බැහැ. අපට මේ අග්‍ර විනිශ්චයකාරතුමා එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපි කියන්නේ මේ justice system එක විනාශ වෙනවා කියලායි.

තමුන්නාන්සේලා දැන් කථා කෙරුවා නේ, ඒ කාලයේ හිටපු සරත් එන්. සිල්වා ගැන. ඔව්, ඔහු තනිවම තමන්ට අවශ්‍ය දේ කළා. කැමැති කෙනෙක් ලවා නඩු දැම්මෙව්වා, කැමැති කෙනෙක් ලවා තීන්දු දුන්නා. ඊළඟට ආවා, මොහාන් පීරිස් මහත්මයා. එතුමාත් ඒ වාගේම තමයි වැඩ කළේ. Benches fix කරපු ඒවා වැරදියි කියලා, අපි ඒ ගැන කථා කරලා තිබෙනවා. තමුන්නාන්සේලා මුළු ඉතිහාසයම කථා කරනවා. දෙයියනේ කියලා දැන්වත් නවත්වන්න, ඉතිහාසය ගැන කථා කරන එක. තමුන්නාන්සේලා මෙතැනට ආවේ ඒක කරන්න නොවෙයි. දැන් බලාගෙන ගියාම තමුන්නාන්සේලාත් ඒකමයි කරන්නේ. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මොකක්ද කරන්න හදන්නේ? අපි කියන්නේ, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්න කියලායි. ඒකෙන් අවුරුදු 75 දක්වා නොවෙයි, අවුරුදු 100 දක්වා වැඩි කරන්න. හැබැයි, දැනට සිටින judgesලාට මේක ක්‍රියාත්මක කරන්න එපා කියලායි කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තව එක් කාරණයක් ඉදිරිපත් කරලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් බලන්න, මේ inner circle එක. අද Supreme Court එකේ වැඩිම නඩු ප්‍රමාණයක් අහන්නේ කවුද? අවල වෙන්ගප්පුලි මැතිතුමා සියයට 65යි නඩු අහලා තිබෙන්නේ. අර්ජුන ඔබේසේකර මැතිතුමා අපේ අග්‍ර විනිශ්වයකාරතුමා එක්ක නඩු 47ක් අහලා තිබෙනවා. සමයවර්ධන මැතිතුමා නඩු 27ක් අහලා තිබෙනවා. ඒ.එල්.එස්. ගුණරත්න මැතිතුමා නඩු 26ක් අහලා තිබෙනවා. සම්පත් බී. අබේකෝන් මැතිතුමා නඩු 26ක් අහලා තිබෙනවා. සෝභිත රාජකරුණා මැතිතුමා නඩු 6යි අහලා තිබෙන්නේ. ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාර යසන්ත කෝදාගොඩ මැතිතුමා නඩු 2යි අහලා තිබෙන්නේ. තුරෙයිරාජා මැතිතුමා එක නඩුවයි අහලා තිබෙන්නේ. මේ ක්‍රියාවලිය තුළ මෙහෙම කොහොමද කටයුතු කරන්නේ?

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ, let us pray together for the betterment of this country කියලායි. ඒක තමයි අපේ අග්‍ර විනිශ්චයකාරතුමාට මට කියන්න තිබෙන්නේ. Let us pray together.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[பி.ப. 4.27]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இலங்கையினுடைய வரலாற்றில் புதியதொரு சகாப்தம் படைக்கவிருக்கின்ற வரலாற்று ரீதியான ஒரு தினமாகும். காரணம் வேறெதுவுமல்ல, அரசியலமைப்புக்கான இருபத்தி ரண்டாம் திருத்தம் சட்டமூலம் நேற்றைய தினம் இந்தப் பாராளுமன்றத்தில் விவாதத்திற்காக எடுத்துக்கொள்ளப் பட்டதுதான். இந்த விவாதமானது நேற்று முழுநாளும் விவாதிக்கப்பட்டு மீண்டும் இன்று காலையில் இருந்து தொடர்ந்து விவாதிக்கப்பட்டு வருகின்றது. இந்த நாட்டில் இதுநாள் வரைக்கும் இருந்த நீதித்துறை எவ்வாறு இயங்கியது? அந்த நீதித்துறையினுடைய செயற்பாடுகள் எப்படி இருந்தன? அதனுடைய வரலாறு எப்படி இருந்தது? என்பதை நாங்கள் பார்க்கின்றபொழுது, உண்மையாக எங்களுக்கு ஒரு விடயம் தெரிகின்றது. அதாவது, ஒரு நாட்டில் சட்டம் இருந்தாலும், அது அனைவருக்கும் சமமாக நடைமுறைப்படுத்தப்பட்டதா? அதேபோன்று, நீதிமன்றம் இருக்கின்றது. ஆனால், அந்த நீதியின்மீது மக்களுக்கு முழுமையான நம்பிக்கை இருந்ததா? என்கின்ற கேள்விகள் எங்களுக்கு எழுகின்றன. இந்த நாட்டில் விசேடமாக இன்றைக்குப் பேசப்படுகின்ற அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தச் சட்டமூலத்தை நிறைவேற்றுவதன் மூலமாக நாங்கள் எதிர்பார்க்கின்ற விடயம் என்னவென்றால், இந்த நாட்டில் நீதி நிலைநாட்டப்பட வேண்டும்; நீதியான ஒரு தேசத்தை உருவாக்க வேண்டும்; அனைவருக்கும் சமமான முறையில் நீதியைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பதுதான். அரசாங்கம் என்ற வகையில், அதுதான் எங்களுடைய பிரதான நோக்கமாக இருக்கின்றது. எங்களுடைய கொள்கைப் பிரகடனத்திலும்கூட நாங்கள் இது பற்றி தெளிவாகக் குறிப்பிட்டு இருந்தோம்.

இன்று நான் உங்கள் முன் நின்று பேசிக்கொண்டிருப்பது, சாதாரண ஓர் அரசியலமைப்புத் திருத்தச் சட்டமூலத்தைப் பற்றி அல்ல. மாறாக, ஒரு நாட்டின் சட்டம், நீதித்துறையின் சுயாதீனம் மற்றும் மக்களின் உரிமைகளுடன் தொடர்புடைய ஒரு விடயத்தைப் பற்றி ஆகும். அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் என்பது அவ்வாறான ஒன்று என்பது எங்கள் எல்லோருக்குமே தெரியும். இந்த நாட்டில் 1978ஆம் ஆண்டில் இருந்து இன்று வரைக்கும் எமது அரசியலமைப்பு 22 திருத்தங்களுக்கு உட்படுத்தப்பட்டு இருக்கின்றது.

இதற்கு முன்னர் இருந்த 21 திருத்தங்களை நாங்கள் பார்க்கின்றபோது, அன்றைய காலத்தில் அவை அனைத்துமே ஆளும் தரப்பினருடைய அல்லது ஆளும் கட்சியினுடைய அல்லது ஜனாதிபதிமாருடைய விருப்பமாக இருந்தே தவிர, மக்களுடைய விருப்பமாக அமையவில்லை என்பது தெரிகின்றது. இந்த நாட்டின் ஆட்சியாளர்கள் தங்களுடைய விருப்பத்தின்படி செயற்பட்டுக்கொண்டு இருந்ததன் விளைவாக, நீதி தேவதை நீண்ட நாட்களாகக் கண்ணீர் விட்டுக்கொண்டு இருந்தாள். இந்த நாட்டுக்கு நீதியான ஒரு சட்டம் உருவாக்கப்படுமா? அல்லது தனக்கு நிம்மதி கிடைக்குமா என்று அவள் ஏங்கிக்கொண்டு இருந்தாள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு நாட்டின் வலிமை அதன் ஆயுதங்கள்மீது அல்ல;

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

கட்டிடங்கள்மீது அல்ல; அதனுடைய பொருளாதாரத்தில் மாத்திரமல்ல! ஒரு நாட்டில் சட்டம் என்பது அனைவருக்கும் சமமான நிலையில் இருக்கின்றபோது, அது மக்களின் நம்பிக்கையைப் பெற்றதாக மாற்றப்படுகின்றபோது நிச்சயமாக அரசியலமைப்பு ஒரு சாத்தியப்பாடான ஒன்றாக இருக்கும். அந்த வகையில், அந்நம்பிக்கையைப் பாதுகாப்பதில் நீதித்துறை வகிக்கின்ற பங்கு முக்கியமானது. அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தத்தைப் பற்றி பேசுகின்றபோது, அரசியலமைப்பில் என்ன மாற்றம் செய்யப்படப் போகின்றது? எதற்கு அம்மாற்றம் செய்யப்படப் போகின்றது?" என்ற கேள்வியை எதிர்க்கட்சியினர் தொடர்ச்சியாகக் கேட்டவண்ணம் இருக்கிறார்கள். அவர்கள் தொடர்ச்சியாக அரசியல் ரீதியாக அவதூறு ஏற்படுத்துவதைத் தவிர, வேறு எந்தவிதமான செயற்பாடுகளையும் முன்னெடுக்கவில்லை என்பது மாத்திரம் எங்களுக்கு நன்றாகத் தெரிகிறது. நாட்டில் சட்டம் இல்லாவிட்டால், குழப்பத்தைச் சந்திக்கின்ற நிலைக்கு நாட்டை இட்டுச் செல்லும். நீதியில்லாத நாடு அநீதியைச் சந்திக்கின்ற நாடாக மாறும். சட்டமும் நீதியும் இருந்தும் அவற்றின்மீது மக்களுக்கு நம்பிக்கை இல்லை என்றால், நிச்சயமாக அந்த நாட்டின் ஜனநாயகம் வேறு விதமாகச் சித்தரிக்கப்படுவதைத் தவிர்க்க முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் கடந்த 76 வருட காலத்தைத் திரும்பிப் பார்த்தால், அக்காலத்தில் கொண்டுவரப்பட்ட அனைத்துச் சட்ட மூலங்களும் ஜனநாயகத்தைக் குழிதோண்டிப் புதைக்கின்ற வகையில் அமைந்திருப்பதைக் காணலாம். நீதித்துறை சம்பந்தமாக தமிழ் மக்கள் மத்தியில் எவ்வாறான பார்வை இருக்கின்றது? தமிழ் மக்கள் என்ன சொல்கின்றார்கள்? இந்த நாட்டின் நீதித்துறைமீது தமிழ் மக்களுக்கு நம்பிக்கை இருக்கிறதா, இல்லையா? என்ற கேள்விகளைக் கேட்டால், இந்த நாட்டின் நீதித்துறைமீது தமிழ் மக்கள் நம்பிக்கை இழந்தவர்களாகவே காணப்படுகின்றார்கள்; காணப்பட்டார் கள் என்றுதான் சொல்ல வேண்டும். அதனால்தான் எங்களுக்கு விசேடமானதொரு தேவை இருக்கின்றது.

இன்றைக்கு செம்மணி மனிதப் புதைகுழி தொடர்பில் பாதிக்கப்பட்டவர்களுக்காக நீதியைக் கேட்கின்ற மக்கள் சொல்கின்றார்கள், "இந்த நாட்டில் இருக்கின்ற நீதிப் பொறிமுறைமீது எங்களுக்கு நம்பிக்கையில்லை; சர்வதேச விசாரணை வேண்டும்" என்று. காணாமல் போனவர்களின் உறவினர்களும் கூறுகின்றார்கள், "எங்களுக்கு சர்வதேசத்தின் தலையீட்டுடனான நீதி விசாரணை வேண்டும்" என்று. அப்படியானால், எங்களுடைய நாட்டில் இருக்கின்ற நீதித்துறைமீது அவர்கள் நம்பிக்கையிழந்து காணப்படு கின்றார்கள். அவ்வாறு நம்பிக்கை இழப்பதற்கான காரணிகளை நாங்கள் தேடிப் பார்க்கின்றபோது, இந்த நாட்டின் நீதித்துறையை இயக்கியவர்கள் வேறு யாருமல்லர்; ஆட்சியாளர்களே என்பது எங்கள் எல்லோருக்குமே தெரியும். அந்த ஆட்சியாளர்கள், விசேடமாக தமிழ் மக்களுக்கு அநீதி இழைத்தவர்களாவர். இந்த நாடு சுதந்திரமடைந்த காலத்திலிருந்து நாங்கள் பார்த்தோம் என்றால், அரசியல் ரீதியாகவும் சரி, வேறு விதமாகவும் சரி, சட்ட ரீதியாகவும் சரி, நீதித்துறையின் வடிவத்திலும் சரி, எல்லா வழிகளிலும் சிறுபான்மை மக்களாகிய தமிழ் மக்கள் ஒடுக்கப்பட்டவர் களாக, ஏமாற்றப்பட்டவர்களாக, நீதித்துறைமூலம் வஞ்சிக்கப்பட்டவர்களாக இருக்கின்றார்கள். மலையக மக்களை எடுத்துக் கொண்டாலும் அவ்வாறானதொரு நிலையில்தான் அவர்கள் இருக்கின்றார்கள். இவ்வாறான தொரு நீதித்துறைதான் இதுநாள் வரை எங்களுக்கு இருந்தது. நீதித்துறைமீது மக்களுக்கு நம்பிக்கை இல்லாதபோது, மக்களோடு மக்களாக இருந்து செயற்படுவதற்கு ஏதுவான ஓர் ஆட்சி இல்லாதபோது, மக்கள் இவற்றின்மீது நம்பிக்கை இழப்பது தவிர்க்க முடியாது.

இதன் காரணமாகத்தான் எங்களுடைய தேசிய மக்கள் சக்தி, தனது கொள்கைப் பிரகடனத்தில், வளமான நாடு - அழகான வாழ்க்கையை உருவாக்க வேண்டுமெனக் குறிப்பிட்டது. அதனைப் பிரதான சுலோகமாகவும் வைத்திருக்கின்றது. அந்தச் சுலோகத்தை வைத்திருக்கின்ற நாங்கள், நீதித்துறை தொடர்பாக, நீதித்துறையில் மாற்றங்களை ஏற்படுத்துவது தொடர்பாக, நீதித்துறையில் இருக்கின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வது தொடர்பாக நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமென்ற முன்மொழிவையும் முன்மொழிந்திருந்தோம். அதன் அடிப்படையில்தான், இந்த நாட்டில் வாழ்கின்ற மக்கள் - அது வடக்கா, கிழக்கா, தெற்கா, மேற்கா என்றில்லாமல் அனைத்துப் பிரதேசங்களிலும் இருக்கின்ற மக்கள் - எங்களுக்கு ஆணை வழங்கினார்கள். அவர்கள் எதனை எதிர்பார்த்தார்கள்? நான் முதலில் கூறியதுபோன்று, நீதியான தேசத்தை உருவாக்க வேண்டும் என்பதே அவர்களின் எதிர்பார்ப்பாகும். அந்த எதிர்பார்ப்பை நிறைவேற்றவேண்டிய பொறுப்பும் கடப்பாடும் எங்களுக்கு இருக்கின்றது. இலங்கையில் இருக்கின்ற மக்களுக்கு நீதி தொடர்பில் இறுதியாக இருக்கின்ற ஓர் இடம் அல்லது நம்பிக்கைக்குரிய தலம் எது என்றால், அது நீதிமன்றமாகும். எனினும், தமிழ் மக்களுக்கு நீதித்துறை தொடர்பில் பல்வேறு சந்தேகங்கள் எழுந்தவண்ணம் இருக்கின்றன. அந்தச் சந்தேகங்களைப் போக்கவேண்டிய கடப்பாடு எங்களுடைய அரசாங்கத்துக்கு இருக்கின்றது.

கடந்த இரண்டு வருடங்களை நாங்கள் திரும்பிப் பார்த்தால், இந்நாட்டின் சிறுபான்மை மக்கள்மீது எந்தவிதமான வன்முறையோ, வன்கொடுமையோ இந்த இரண்டு ஆண்டுகளிலும் நடைபெறவில்லை என்பது புரியும். இனவாதப் பிசாசுகளால் வேட்டையாடப்பட்ட நாடுதான் எமது நாடு! இனவாதம் பேசப்படாத, இனவாத ரீதியாக ஒடுக்கப்படாத வருடங்கள் என்றால், அவை இந்த இரண்டு வருடங்கள்தான். இந்த நாட்டின் தமிழ், சிங்கள, முஸ்லிம் மக்கள் மத்தியில் மீண்டும் நம்பிக்கையை ஏற்படுத்தியிருக் கின்ற வருடங்கள் என்றால், அவை இந்த இரண்டு வருடங்கள்தான். அதுமாத்திரமல்ல, இலங்கைக்கு வந்து வாழலாம்; தற்போது நீதியான நிலைமை இங்கு ஏற்படுத்தப்பட்டு இருக்கிறது. சட்டம் அனைவருக்கும் சமமாக இருக்கின்றது. எந்தவிதமான சட்டவிரோத செயற்பாடுகளிலும் ஈடுபடவில்லை என்றால், அவர்களுக்கு எந்தவிதமான பாதிப்பும் ஏற்படாது. அதனால் இலங்கையை நோக்கிப் போகலாம் என்ற நம்பிக்கை வெளிநாடுகளில் வாழுகின்ற எங்களுடைய மக்களிடத்தில் ஏற்பட்டு இருக்குமாக இருந்தால், அது இந்த இரண்டு வருடங்களில்தான்.

இதுநாள் வரை வடக்கில் பொருளாதார ரீதியான முன்னேற்றங்களாக இருந்தாலும் சரி, அபிவிருத்தி வேலைகளாக இருந்தாலும் சரி, நினைத்துக்கூட பார்க்க முடியாத நிலையே இருந்தது. இன்றைக்கு வடக்கில் பாரிய அளவிலான அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. அதன்மூலம் இன்று வடக்கில் இருக்கின்ற தமிழ் மக்கள் மத்தியில் கூடுதலான நம்பிக்கை ஏற்பட்டிருக்கிறது. வடக்கு மக்கள் நம்புகின்ற ஓர் அரசாங்கம் என்றால், அது இந்த அரசாங்கம்தான்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கு கொண்டுவரப்பட்டு இருக்கின்ற அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம் இன்று பின்நேரம் நிறைவேற்றப்பட இருக்கின்றது. இந்த நாட்டில் நீதியை நிலைநாட்டி, அனைவருக்கும் சமமான முறையில் சட்டத்தை நடைமுறைப்படுத்தி, சமத்துவம், நேர்மை, ஒழுக்கத்துடன்கூடிய நாட்டைக் கட்டியெழுப்புகின்ற பயணத்தின் அடித்தளம் இது ஆகும். இந்த நாட்டில் இருக்கின்ற மக்களுடைய விருப்பமாக இருக்கின்ற குறிப்பாக, நீதியை நேசிக்கின்றவர்களுடைய விருப்பமாக இருக்கின்ற, ஜனநாயகத்தை நேசிக்கின்றவர் களுடைய விருப்பமாக இருக்கின்ற, இந்தச் சட்டமூலத்துக்கு என்னுடைய ஆதரவைத் தெரிவித்து, விடை பெறுகின்றேன். நன்றி, வணக்கம்!

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.41]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ, හෘදය සාක්ෂියට අනුව කටයුතු කරන්නය කියලා ශ්‍රී ලංකා නීතිඥ සංගමය මේ පාර්ලිමේන්තුවේ 159දෙනාගෙන් ඉල්ලීමක් කරලා තිබෙන බව. ඉතිහාසයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දීපු ඇතැම් අවස්ථා ගැන අපි අහලා තිබෙනවා වාගේම දැකලා තිබෙනවා. නමුත් නීතිඥ සංගමය වුණත් දෙයක් ඉල්ලනකොට තිබෙන තැනකින් තමයි ඒ දේ ඉල්ලන්න ඕනෑ. ඉතින්, හෘදය සාක්ෂියක් තිබෙනවාද කියන එක අද අපට බලා ගන්න පුළුවන්. මේ රටේ ජනතාව හිතාගෙන හිටියා, ජාතික ජන බලවේගය කියන්නේ මැද පන්තිය නියෝජනය කරන, වෘත්තිකයන්ට ඇහුම්කන් දෙන කණ්ඩායමක්ය කියලා. නැහැ, ඒක එහෙම නොවෙයි. ඒ වාගේම ඒ අය මධ්‍යස්ථ මතධාරී කණ්ඩායමක්ය කියලා ජනතාව හිතාගෙන හිටියා. ඒකයි තුනෙන් දෙකක බලයක් දුන්නේ. හැබැයි, ඊයේ අගමැතිතුමියගේ කථාවෙන් එහෙම නැහැයි කියන එක එතුමිය පෙන්වා දෙනවා අපි දැක්කා. පැලවත්තේ මේ 159දෙනා වම දකුණ මාරු වෙච්ච සිග්නල් කණු ටිකක්ය කියන එක මේ වෙලාවේදී මම කියන්න ඕනෑ.

ආණ්ඩුව කියනවා, විපක්ෂය විරුද්ධ වෙන්නේ බය නිසාය කියලා. විපක්ෂය විරුද්ධ වෙන්නේ බය නිසාය කියලා ආණ්ඩුව විපක්ෂයට චෝදනා කරනවා. මම අහනවා, ත්‍රෛනිකායික මහා නාහිමිවරු මේ සංශෝධන ගෙනෙන්න එපාය කිව්වේ බය වෙලාද කියන එක. මොකටද, බය වෙන්නේ? ඒ වාගේම ශ්‍රී ලංකා කතෝලික රදගුරු සංගමය මේකට විරුද්ධ වුණා. ඇයි, බය නිසාද? ඇයි, ඒගොල්ලන් බය වෙන්නේ? ඒ වාගේම ලංකා සභාව ලිපියක් නිකුත් කළා, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න එපාය කියලා. මොකටද, බයටද? ඊළඟට, නීතිඥ සංගමය විරෝධය පළ කළා විතරක් නොවෙයි, ජනාධිපතිතුමා හම්බ වෙලා සාකච්ඡාත් කළා, මේක ගෙනෙන්න එපා කියලා. මොකද, හිරේ දමයි කියලා ඒගොල්ලන් බයයිද? ඒ වාගේම අධිකරණ සේවා සංගමය, GMOA එක ඇතුළු වෘත්තීය සමිති මේකට විරුද්ධ බව කිව්වා. ඇයි, ඒගොල්ලන් බය වෙන්නේ මොකටද? ඒගොල්ලන් බය වෙන්නේ හිරේ දමයි කියලාද? ඒ වාගේම පොදුරාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය මේකට විරුද්ධයි කිව්වා. ඇයි, බය නිසාද? ඒ වාගේම LAWASIA, ජාත්‍යන්තර විනිසුරුවන්ගේ සංගමය මේකට එපා කිව්වේ බය වෙලාද? මොකටද ඒගොල්ලන් බය වෙන්නේ? ඒ වාගේම විනිසුරුවන්ගේ හා නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු මේකට විරුද්ධයි, එපා කිව්වා. මොකද, ඒගොල්ලන් බය වුණේ, ඒ අය හිරේ දමයි කියලාද? ඊළඟට, ප්‍රංශ ජාතික නීතිඥ කවුන්සලය මොකටද, මේකට විරුද්ධ වුණේ? බය නිසාද? ඒ විතරක් නොවෙයි, ජාතික ජන බලවේගයේ නායකත්ව මණ්ඩලයේ ලාල් විජේනායක නීතිඥතුමා මේකට විරුද්ධ වුණා. ඇයි, එතුමා බය වෙලාද? මොකටද, එතුමා බය වුණේ? එහෙම නම් අපි කියන්න ඕනෑ, මේ කාටවත් තිබෙන්නේ පෞද්ගලික බයක් නොවෙයි කියන එක. මේ අයට බයක් තිබෙන්නේ, උසාවිය හැල්ලුවට ලක් කිරීම, නීතිය හැල්ලුවට ලක් කිරීම ගැන. ඒකයි බය. තමන්ගේ නඩුව තමන්ම ඇසීම කියන ඒවාටයි බය වෙන්න ඕනෑ. අද ඒක සිද්ධ වෙලා තිබෙනවා. මේ ජනතා විමුක්ති පෙරමුණ එදා - 1988-1989 කාලයේදී - කැලෑ නීතිය ක්‍රියාත්මක කළා වාගේ නැවත වතාවක් මේ රටේ නීතිය ක්‍රියාත්මක කරයි කියන බය තිබෙන්නේ. අද අග්‍ර විනිශ්චයකාරතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒකට අහු වෙලා ඉවරයි කියාත් අපි කියන්න ඕනෑ. අද මේ බය වෙලා තිබෙන්නේ විපක්ෂයවත්, අර උඩින් කිව්ව කිසි කෙනෙක්වත් නොවෙයි, ආණ්ඩුවයි බය වෙලා තිබෙන්නේ කියන එක අපි මේ වෙලාවේදී මේ රජයට මතක් කරලා දෙන්න ඕනෑ. ජනමත විචාරණයකින් ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ -නීතියේ- ප්‍රතිපාදන තිබේද්දී, සාධාරණ පෙත්සම් වග විභාගයක් නැතුව, සංවාද නොකර කඩිනමින් කරන්නේ, ආණ්ඩුව ජනමත විචාරණයකට -මැතිවරණයකට- තිබෙන බය නිසාය කියන එක මම කියන්න ඕනෑ. ජනමත විචාරණයක් තිබුණා නම් ඒක බලා ගන්න තිබුණා.

ඉස්සර වෙලා මෙතැන හිටපු ඇමතිවරයෙක් කිව්වා, ජනමත විචාරණයක් තිබුණා නම් විපක්ෂයට දුවන්න වෙනවාලු කියලා. ජනමත විචාරණයක් තියලා බලන්න තිබුණා, කවුද දුවන්නේ කියලා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට ආණ්ඩුව කිව්වා, මේක ගෙනෙන්නේ කාරණා දෙකක් නිසාය කියලා. එකක්, නඩු කඩිනමින් ඉවර කරන්න ලු. ඇයි, දැන් මේ අලුතෙන් පත් කරන විනිශ්චයකාරතුමන්ලා රෑ එළි වෙනකල් නඩු අහනවාද? මොකක්ද මේ? ඇත්තටම කරන්න ඕනෑ දේ තමයි අධිකරණවලට අවශ්‍ය යටිතල පහසුකම් ටික දෙන එක. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අඩුපාඩු තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ අඩුපාඩු තිබෙනවා. අධිකරණ පද්ධතිය ඇතුළේ අඩුපාඩු තිබෙනවා. ඒ වාගේම, පුරවන්න පුරප්පාඩු තිබෙනවා. මෙන්න මේවා නිසියාකාරව කළා නම් ජ්‍යෝෂ්ඨත්වය මත කට්ටිය ඉහළට ඒවි. මේක තමයි වෙන්න ඕනෑ. දෙවනුව ඒගොල්ලන් කියනවා, අත්දැකීම් සහිත අය රඳවා ගන්න ඕනෑ, ඒක නිසා තමයි මේ සංශෝධනය ගෙනාවේ කියලා. හැබැයි අපි කියනවා, කනගාටුයි, උසස්වීම් නොලැබම අත්දැකීම් සහිත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්. තුරෙයිරාජා මහතා විශ්‍රාම ගිහිල්ලා කියන එක. ඒ වාගේම, අත්දැකීම් සහිත අභියාචනාධිකරණ විනිසුරු රත්නප්‍රිය ගුරුසිංහ මහතා විශ්‍රාම ගිහිල්ලා. දැන් ඉහළට එන්න ඉන්න අයට, ඒ කියන්නේ ඊළඟට ඉන්න යසන්ත කෝදාගොඩ වැනි ජ්‍යෝෂ්ඨ විනිසුරුතුමන්ලාට අත්දැකීම් නැද්ද?

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඒගොල්ලන් බබ්බුද? ඒගොල්ලන් අතදරුවෝද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනවාද මේ තර්ක? හැබැයි, මෙහෙම කරන්න නොවෙයි මේ රටේ හැටඅට ලක්ෂයක් ජනතාව ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ මේ NPP රජයට තුනෙන් දෙකක බලයක් දුන්නේ කියන එක මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ.

මට මේවා ගැන කථා කරනකොට මතක් වෙනවා, අපි පුංචි කාලයේ ඉගෙන ගත්ත "සද්ධර්මරත්නාවලිය" කියන පොතේ තිබුණු කථා වස්තුවක්. ඒකේ තිබුණා, "නාගසේන වස්තුව" කියලා කථා පුවතක්. නාගසේන සාමණේර හාමුදුරුවෝ උන්වහන්සේගේ නායක හාමුදුරුවන්ගේ ඇතැම් තීන්දු "පය බරවායට පිටිකර බෙහෙත් බඳිනවා" වාගේ කියලා කියනවා ඒකේ එක තැනක සඳහන්ව තිබෙනවා. මම කියනවා, මේ ආණ්ඩුවේ සූරසේන වස්තුවත් පය බරවායට පිටිකර බෙහෙත් බැඳීමක් කියලා. එහෙම නැත්නම් මේක දිසානායකලා දිසානායකලාගේ ගේමක්ද එහෙමත් නැත්නම් හාවාට වදින්න බලාගෙන පඳුරට විද්දාද කියන එකත් අනාගතයේදී බලා ගන්න පුළුවන් වෙයි කියන එකත් මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ.

ඊළඟට, අධිකරණ ඇමතිතුමා තමන්ට ඉගෙන ගන්න පොත් ලිව්ව ගුරුතුමාට දත් තිබෙන කටින් දෙයක් කිව්වා. ඒවා ඇහුවාම දත් තිබෙන කටේයි, නැති කටේයි වෙනසක් අපිට පෙනෙන්නේ නැහැ. අජිත් පී. පෙරේරා මැතිතුමා ඒක නිවැරදි කළා, එහෙම නොකළ යුතු බවට. ජී.එල්. පීරිස් මැතිතුමාත් එක්ක අපිට දේශපාලනික වශයෙන් ගැළපෙන්නේ නැති තැන්, ප්‍රතිපත්තිමය ගැටලු තිබෙනවා. නමුත් එතුමා "විසිදෙක: ලංකාවේ අනාගතය" යන මැයෙන් "ලංකාදීප" පුවත් පතේ ලිපියක් පළ කර තිබෙනවා. ඒ ලිපිය කියවන්න. 2026.09.24 දිනැති "ලංකාදීප" පුවත් පතේ සඳහන් එම ලිපිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මේවා අනාගතයේදී වෙන්න පුළුවන් දේවල්. එම ලිපියේ සඳහන්ව තිබෙන මෙන්න මේ ටික මම කියවනවා. මගේ කථාවම මේක වුණා නම් හොඳයි. මම ඒකෙන් කොටසක් උපුටා දක්වනවා. එහි මෙසේ සඳහන් වනවා:

> "විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමෙන් ඔවුනට යම් වාසියක් සැලසෙන බව අමුතුවෙන් කිව යුතු නැත. පෙර අපරදිග නීති පද්ධතිය මූලාරම්භයේ සිටම කිසිදු වෙනසකින් තොරව කේන්ද්‍රීය සංකල්පයක් ලෙස පිළිගත් යම්කිසි මූලධර්මයක් තිබුණි. එනම් තමන්ගේ නඩුව තමන්ටම ඇසිය නොහැකිය යන මතයයි. යම් නඩු කටයුත්තකදී තමන්ට යම් වාසියක්, බැඳීමක් තිබේ නම් එය නඩුව අදාළ වාසිය ලබන පුද්ගලයා හෝ ආයතනය හෝ ඇසීම ස්වභාවික නීතියේ මූලධර්මයට සම්පූර්ණයෙන් පටහැනිය. 22 වැනි සංශෝධනය සම්බන්ධයෙන් වූ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයට වඩා ඉහළ අධිකරණය වන ජනතා අධිකරණය හමුවේ විසඳාගත යුතු බව කියා සිටියේ ඒ නිසාය."

එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "ජනතා පරමාධිපත්‍යය ක්‍රියාත්මක වන යාන්ත්‍රණය ජනමත විචාරණයයි. 22 වැනි සංශෝධනය නීතිගත කිරීමට ජනමත විචාරණයකට යොමු කිරීම නෛතික අවශ්‍යතාවක් බව අප අවධාරණය කළේ ඒ නිසාය."

උපුටා ගැනීම මම අවසන් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට තව විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මේ වෙලාවේදී මතක් වෙනවා, අපි පුංචි කාලයේ බලපු "පළිඟු මැණිකේ" කියන ටෙලි නාට්‍යය. ඒකෙත් හිටියා, "සූරසේන" කියලා කෙනෙක් "පට් පට්" ගාලා ප්‍රශ්න විසඳන. මෙතුමන්ලාත් මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ "පට් පට්" ගාලා නඩු විසඳන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ටෙලි නාට්‍යය ගැන තොරතුරුත් මට මතක් වෙනවා. ඒ ටෙලි නාට්‍යය අධ්‍යක්ෂණය කළේ ධම්ම ජාගොඩ මහත්මයා. දයාරත්න රටගෙදර එය සහාය අධ්‍යක්ෂණය කළා. සෝමවීර සේනානායකයන් එය තිර රචනය කළා. ඒක ඒ කාලයේ හරි ප්‍රසිද්ධයි. ඒකෙත් හිටියා සූරසේනලා, විජේපාලලා - අනුර කුමාර දිසානායක කියලා කෙනෙක් හිටියේ නැහැ - පොඩි අප්පුහාමිලා. ඒකේ අවසානයේ පොඩි අප්පුහාමි කෑ ගහනවා, "සූරසේනෝ, මහසෝනා එනෝ. මාව බේරාගනියෝ" කියලා. මම ප්‍රාර්ථනා කරනවා, ජනාධිපතිතුමාට එසේ නොවේවා කියලා. මොකද, අද රඟ දැක්වෙන්නෙත් "පළිඟු මැණිකේ 2." අද ඒ කථාවම තමයි මෙතැන සිද්ධ වෙන්නේ. මේ ඉන්න මහත්මයාම තමයි මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමාටත්, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් අර පොඩි අප්පුහාමිට කරපු දෙයම කළේ. ඒ නිසා මම කියනවා, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට එසේ නොවේවා කියලා. මොකද, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අස්සේ එතුමාගේ ප්‍රාර්ථනාව වෙන දෙයක්. විදින්නේ පඳුරට, වදින්නේ හාවාට කියලා කිව්වාට, මෙතුමන්ලා හාවාටමයි විදින්නේ; ඒක බලාගෙනමයි පඳුරට විදින්නේ කියන එක මම කියන්න කැමතියි. මොකද, මේ ව්‍යවස්ථා සංශෝධනය ජනතාව ඉල්ලුවෙත් නැති, ජනතාවට වැඩකුත් නැති, රටට වැඩකුත් නැති පුද්ගලයන් කිහිප දෙනෙකුගේ වැඩක් වෙනුවෙන් විතරක් කරන සංශෝධනයක්. ඒ නිසා මම මේකට විරුද්ධයි. වැටත් නියරත් ගොයම කනවා නම් ඒ පාඩුව අපිට කියන්න කෙනෙක් නැති නිසා, අපිට කියන්න සිද්ධ වෙන්නේ ස්වභාව ධර්මයටත්, විශ්වයටත් මේ නඩු විමසන්නය කියන එකයි, ඒවාට දඬුවම් කරන්නය කියන එකයි.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සම්මත කිරීමට නියමිත විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවිධ වාද විවාද අපිට ඇහුණා. ඒ වාද විවාද අතරේ විපක්ෂය ඉදිරිපත් කරපු කාරණා කිහිපයකට උත්තර දීලාම මගේ අදහස් දැක්වීම පටන් ගන්නම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරු කියන එකයි, සාවද්‍ය පරාවර්තනයයි කියන්නේ දෙකක්. බොරු කියන එක බොරු කියලාම කියන්න පුළුවන්. හැබැයි, මේ සුන්බුන් විපක්ෂය මේ ගත වෙච්ච අවුරුදු දෙකට සමාජය මත සාවද්‍ය පරාවර්තනයක් ඇති කරන්න කටයුතු කර තිබෙනවා නොයෙක් කාරණා කියමින්. අපි බලයට එන්න කලින් පරාවර්තනයක් ඇති කළා, "ජාතික ජන බලවේගය ආණ්ඩුවට බලය දෙන්න එපා. මේගොල්ලන් බලයට ආවොත් පන්සල්වලට දානය නැහැ, බෞද්ධාගමට තැනක් නැහැ. නුවර පෙරහැර නැහැ" කියලා. අපේ අගමැතිතුමියට කියන්න ඕනෑ ඔක්කෝම කිව්වා. ගරු ජනාධිපතිතුමාට කියන්න ඕනෑ ඔක්කෝම කිව්වා. ඒ දවස්වල මතු වෙමින් සිටි සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විවිධ කථා කියමින් හිටියා. ඔවුන් සාවද්‍ය පරාවර්තනයක් සමාජය මත ඇති කළා, ජාතික ජන බලවේගයට බලය දෙන්න එපා කියලා. හැබැයි, මේ ගත වෙච්ච අවුරුදු දෙක තුළ ඒ සාවද්‍ය පරාවර්තනය ඔවුන්ගේ හිස මත කඩා වට්ටලා තිබෙනවා. ඒ දේ කරන්න අපි සමත් වෙලා තිබෙනවා. ඊයේ අපි පෙන්නුම් කරලා තිබෙනවා, දේශපාලනය කරන්න ජාතික ජන බලවේගයෙන් ඉගෙන ගන්නය කියන එක. ඒ විතරක් නොවෙයි, මේ ගත වුණු අවුරුදු දෙක තුළ ජාතික ජන බලවේගය විධියට අප සමත් වෙලා තිබෙනවා; මන්ත්‍රීවරු 159 දෙනෙක් එකට හිටගෙන සමත් වෙලා තිබෙනවා, මේ රටේ පොදු ජනතාවට ලැබෙන්නේ නැති කිසිදු වරප්‍රසාදයක් ගන්නේ නැති, එවැනි වරප්‍රසාද අත්හරින පක්ෂයක් හදන්න, දේශපාලන ව්‍යාපාරයක් හදන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ බොහෝ අය මෙතැන කථා කරන්නේ ඉතා සුද්දවන්තයෝ විධියට. අපේ ගරු බිමල් රත්නායක ඇමතිතුමා උදෑසන කථාවක් කළා, විනාඩි 16ක. ඒ සම්පූර්ණ කථාව මම මෙතැන ඉඳගෙන අහගෙන හිටියා. විපක්ෂයේ අය එතුමා ප්‍රකාශ නොකළ, එතුමා හීනෙකින්වත් හිතපු නැති වචන අරගෙන මේ ගරු සභාවේ කියලා, බොරු කියන්න පටන් ගත්තා. බොරු කියලා, බොරු කරලා තවදුරටත් පව වෙන්නේ ඒ අයමයි. ඇත්තටම මෙවැනි විපක්ෂයක් සදාකාලිකව මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට සදාකාලිකව මේ පාර්ලිමේන්තුවේ බලය හොබවන්න පුළුවන් විධියේ විපක්ෂයක් ඔය තිබෙන්නේ. අපි ප්‍රාර්ථනා කරනවා, ඔය විපක්ෂයට ඔය විධියටම ඔය ආතල් එක දීගෙන ඉන්න පුළුවන් වෙන්න කියලා. අපිට පුළුවන්, අපේ කාර්යය කරගෙන යන්න.

හොඳට මතක තියා ගන්න, අපි ජනාධිපති අරමුදලේ මුදල් අවභාවිත කරපු මිනිස්සු නොවෙයි. අපි අපට තිබුණු වරප්‍රසාද අමතක කරපු මිනිස්සු. අපිට හම්බ වෙන දේවල් අමතක කරපු මිනිස්සු. අපි රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරන මිනිස්සු. ඒ නිසා විපක්ෂයේ තර්ක-විතර්ක මේ විවාදය මූලික කරගෙන ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම් විපක්ෂයේ කාර්යභාරය තේරුම් ගන්න. ඔයගොල්ලන් අපිට අපේ කාර්යය කරගෙන යන්න මාර උදව්වක් කරන්නේ. ඊයේ අපි දැක්කා විරෝධතාවක්. විරෝධතාවක් කරන විධියත් අපෙන් ඉගෙන ගන්න. විරෝධතාවක් කරන්නේ කොහොමද, බලවේග එකතු කරන්නේ කොහොමද කියලා අපෙන් ඉගෙන ගන්න. මා නියෝජනය කරන කොත්මලේ ආසනයේ සමගි ජන බලවේගයේ ආසන සංවිධායකතුමා ඊයේ ප්‍රකාශයක් කරනවා මා දැක්කා. ලජ්ජයි කියන්න, එතුමාට ඡන්දය දීපු කොත්මලේ ආසනයේ මිනිස්සු පව්! ඒ මිනිස්සු හිතන්නේවත් නැතිව ඇති මෙච්චර අමනෝඥ විධියට උත්තර දෙයි කියලා. ඇවිල්ලා voice-cutඑකක් දුන්නා, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ගෙනෙන්නේ ජනාධිපතිතුමාගේ ධුර කාලය දීර්ඝ කරන්නය කියලා. ආසන සංවිධායකතුමා එහෙම හිතනවා නම් ඊට පහළින් ඉන්න අය ගැන කවර කථාද? ඒ මිනිස්සු මෙලෝ දෙයක් දන්නේ නැහැ. එතැනට ආපු අය කිසිම දෙයක් දන්නේ නැහැ. ඇත්තටම අපිට කිසිම ආයුධයක් අවශ්‍ය නැහැ. අපිට තිබෙන එකම ආයුධය තමයි විපක්ෂ නායකතුමා සදාකාලිකව ඔහොම ඉන්න එක. ඒ ආයුධය හොඳටම ප්‍රමාණවත්, අපිට අපේ කාර්යය කරගෙන යන්න.

මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමිය කිව්වා, අධිකරණවල අඩුපාඩු තිබෙනවා ඒවා ගැන හොයා බලන්න කියලා. මෙච්චර කාලයක් බලය හෙබෙව්වේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි නම් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලයට පත් වෙලා මේ අවුරුදු දෙක තුළ ආරම්භ කළ, ජනතා අයිතියට පත් කිරීමට ආසන්නව පවතින ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. අපි රුපියල් මිලියන 1,686ක පිරිවැයක් වෙන් කර ඉදි කරන ගාල්ල අධිකරණ සංකීර්ණ ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට ආසන්නව තිබෙනවා. රුපියල් මිලියන 75ක් වෙන් කර ඉදි කරන මනම්පිටිය අධිකරණ ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කිරීමට ආසන්නව තිබෙනවා. හෙල්බඩ නව අධිකරණ ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 51.23ක් වෙන් කර තිබෙනවා. එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට ආසන්නව තිබෙනවා. ඒ වාගේම කොළඹ MC නව ගොඩනැඟිල්ල ඉදිකිරීම, වාකරේ නව අධිකරණ ගොඩනැඟිල්ල ඉදිකිරීම, පුත්තලම පෙරනිම් අධිකරණ ගොඩනැඟිල්ල ඉදිකිරීම ආදී වශයෙන් ව්‍යාපෘති රාශියක් 2026 වර්ෂයේ අපි නිම කරලා තිබෙනවා. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු දෙකක් යන්න කලින් මුදල් වියදම් කරලා අධිකරණ ගොඩනැඟිලි ඉදිකරලා, මානව සම්පත් ලබා දීලා අධිකරණවලට අවශ්‍ය පහසුකම් සපයන්න කටයුතු කරමින් ඉන්නවා.

ඊළඟට, 2027 අය වැය ඇස්තමේන්තු සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නිර්දේශ ඉදිරිපත් කර තිබෙන ව්‍යාපෘති කිහිපයකුත් තිබෙනවා. මම ඒවාත් මතක් කරන්නම්. මොකද, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමිය කිව්වා, පොදු ජනතාවට ගොඩක් දේවල් ලබා දෙන්න අපි කටයුතු කරන්නේ නැහැ කියලා. එතුමිය කථාව කරලා යන්න ගියා. හැබැයි, මම කියන්න ඕනෑ, අපේ වතු කම්කරු ජනතාවගේ දෛනික වැටුප වැඩි කළොත් පාරේ ඉඳ ගන්නවාය කියපු මන්ත්‍රීවරු තමයි දැන් මේ පොදු ජනතාවගේ දුක ගැන කථා කරන්නේ කියලා. එම නිසා මෙම මාතෘකාව ගැන මීට වඩා පුළුල් දැක්මක් සහිතව කථා කරන්න කියලා මම කියනවා.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගැන මීට වඩා හොඳ විරෝධතාවයක්, මීට වඩා හොඳ සංවාදයක් රට තුළ ඇති කරන්න විපක්ෂය සමත් වුණා නම්, ඔබතුමන්ලාට ඇහුම්කන් දෙන්න අපට තිබුණා. නමුත්, මොකක්ද කළේ? පටන් ගත්ත දවසේ ඉඳලා බොරු කිව්වා. අනුරට මේක ගේන්න බැහැ කිව්වා. අනුර මේක ගෙනාවත් මහදී හකුළා ගන්නවා කිව්වා. ඊට පසුව, තනි පුද්ගලයෙක් ඉලක්ක කර ගනිමින් එම පුද්ගලයාට පහර දෙමින් හිටියා. මේක තනි පුද්ගලයෙක් අරභයා කරපු සංශෝධනයක් නොවෙයි. මම ආපහු කියනවා, මෙම සංශෝධන පනත් කෙටුම්පත් හොඳට කියවා බලන්න කියලා. මහේස්ත්‍රාත් අධිකරණවල, දිසා අධිකරණවල, මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ සියලුම විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ වෙනවා. අපි මේක එක පුද්ගලයෙක් වෙනුවෙන් ගෙනා සංශෝධනයක් නොවෙයි. මෙය "X" හෝ "Y" කියන කවුරු හරි පුද්ගලයෙක් වෙනුවෙන් ගෙනා සංශෝධනයක් නොවෙයි. එතුමිය තමන්ගේ පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා අධිකරණයේ ස්වාධීනත්වයට, අධිකරණයේ හඬට හා අධිකරණයේ ගෞරවයටයි ඒ නිග්‍රහ කළේ. එහෙම කරන්න එතුමියට තිබෙන අයිතිය මොකක්ද? මිනිසුන්ගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

ඇවිල්ලා එහෙම කථා කරන එක ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මිනිස්සු තමන්ට ඡන්දය පාවිච්චි කරලා තිබෙන්නේ අධිකරණයේ ගරුත්වය ආරක්ෂා කරන මහජන නියෝජිතයෙක් මෙතැන ඉන්න ඕනෑ කියලා විශ්වාස කරලායි. එහෙම පත් කළ මහජන නියෝජිතයෝ අද පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා රටේ අග්‍ර විනිශ්චයකාරතුමාට ඉතාම නින්දිත විධියට නිග්‍රහ කරනවා. අපි එය හෙළා දකිනවා. ජාතික ජන බලවේගයේ මහජන නියෝජිතයෝ වන අපි එය හෙළා දකිනවා. අපි ඒ ක්‍රියාවට සම්පූර්ණයෙන් විරුද්ධයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තනි පුද්ගලයෙකුගේ පැවැත්මක් මත අපේ ආණ්ඩුවේ පැවැත්ම තීරණය වෙන්නේ නැහැ. අපේ 159දෙනා එදාත් එකට හිටියේ; අදත් එකට ඉන්නේ; හෙටත් එකට ඉන්නේ; සදාකාලිකව එකට ඉන්නේ කියන එක විපක්ෂය හොඳට මතක තබා ගන්න. එහෙම නොවුණා නම්, අපේ වරප්‍රසාද අමතක කර පනත් කෙටුම්පත් සම්මත කර ගන්න මෙච්චර ඉක්මනින් කටයුතු කරන්න අපට පුළුවන් වෙන්නේ නැහැ. මෙතුමන්ලාට කවදාකවත් එහෙම කරන්න බැහැ. ඊයේ විරෝධතාවට අඩුම තරමින් ඔය සුන්බුන් වෙච්ච පක්ෂ ටිකවත් එකතු කර ගන්න බැරි වුණා. කොහෙන්දෝ ටිකක් අහුලාගෙන පාර්ලිමේන්තු කැන්ටිමට අරගෙන ආවා. තමන්ගේ ළඟින් හිටපු සගයෝ ටික අරගෙන ආවා. අර සල්ලි වියදම් කරගෙන ගම්වලින් ආපු මිනිසුන්ට මොකක්වත් නැහැ. ඔබතුමන්ලා දේශපාලනය කරන්න, විරෝධතා කරන්න සහ තමන්ගේ දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් කර ගන්න බලවේග එකතු කර ගන්නා හැටි ජාතික ජන බලවේගයෙන් ඉගෙන ගන්න.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉතිහාසයේ පළමු වතාවට ජාතික ජන බලවේගයේ අපි සියලුදෙනා වෙන කිසිදු පක්ෂයක සහයෝගයක් නැතිව ස්ථිරසාරව සම්මත කර ගන්නවා. එවැනි හැකියාවක් නිර්මාණය කළ දේශපාලන ව්‍යාපාරයක් මේ මහ පොළොවේ ඇති කළාය කියන එකත් මතක් කරමින්, මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.00]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த உயரிய சபையில் நடைபெறுகின்ற அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் (திருத்தம்) சட்டமூலம் மற்றும் நீதித்துறை (திருத்தம்) சட்டமூலம் என்பவற்றின் இரண்டாம் மதிப்பீடு மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த அவையில் அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சம்பந்தமாக எமது ஆளும் தரப்பினரும் எதிர்த்தரப்பினரும் பல்வேறுபட்ட விடயங்களை முன்வைத்து வருகின்றார்கள். கடந்த காலத்தைப் பற்றி கதைக்காமல் இப்போதுள்ள விடயங்களைப் பற்றி பேச வேண்டும் என்று இங்கு உரையாற்றிய அதிகமான எதிர்த்தரப்பு உறுப்பினர்கள் குறிப்பிட்டார்கள். அவர்களுடைய ஆட்சிக் காலத்தில் குறிப்பாக, 1978ஆம் ஆண்டுக்குப் பின்னர் அரசியலமைப்பில் மேற்கொள்ளப்பட்ட அதிகமான திருத்தங்கள், அந்தந்தக் காலப்பகுதியில் இருந்த ஆட்சியாளர்களின் நலனைக் கருத்திற்கொண்டு, அவர்களின் பதவியைத் தக்கவைத்துக் கொள்வதற்காகவும் மற்றவர்களைப் பழிவாங்குவதற்காகவுமே மேற்கொள்ளப்பட்டன. அதைப் பற்றி மீண்டும் ஞாபகப் படுத்துகின்றபோது, அவர்கள் தற்போது அணிந்திருக்கின்ற கருப்பு ஆடைபோல, கருப்பு வரலாறுதான் இருக்கின்றது என்பதை அவர்கள் நன்கறிந்து இருக்கிறார்கள். இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தமானது ஆட்சியாளர்களின் - சனாதிபதியின், அமைச்சர்களின் - நலனைவிட, இந்த நாட்டு மக்களின் நலனை நாடி மேற்கொள்ளப்படுகின்ற ஒரு முக்கியமான திருத்தமாகும். இந்த நாட்டிலுள்ள அரசியல்வாதிகள் மாத்திரமல்ல, புத்திஜீவிகளும் பல வருட காலமாகக் குறிப்பிடுகின்ற ஒரு விடயம்தான், வழக்கு விசாரணைகளில் தாமதம் நிலவுகின்றது என்பது. "தாமதிக்கப்பட்ட நீதி மறுக்கப்பட்ட நீதிக்குச் சமம்" என்று பிரபல்யமான ஒரு கூற்று இருக்கின்றது. உண்மையிலேயே நீதி தாமதிக்கின்றபோது, அதனால் ஏற்படுகின்ற அசௌகரியங்கள் பல என்பதை நாம் அனைவரும் அறிவோம்.

எதிர்க்கட்சியினர் இன்னொரு கருத்தையும் முன்வைத்தார்கள். அதாவது, ஆளும்தரப்பினர் தமது தேர்தல் விஞ்ஞாபனத்தில் தற்போதைய அரசியல் யாப்பில் திருத்தங்களைக் கொண்டுவருவதாகக் குறிப்பிடவில்லை; மாறாக, புதியதோர் அரசியல் யாப்பைக் கொண்டு வருவதாகவே குறிப்பிட்டு இருக்கிறார்கள் என்றும் கூறினார்கள். மேலும், இன்று அரசாங்கம் அரசியலமைப் புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலத்தைக் கொண்டுவந்து இருப்பதன்மூலம் தேர்தல் விஞ்ஞாபனத்துக்கு முரணாகச் செயற்பட்டு இருக்கின்றது என்ற குற்றச்சாட்டையும் அவர்கள் முன்வைக்கின்றார்கள். நான் இந்த இடத்தில் ஒரு விடயத்தை தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன். புதிய அரசியல் யாப்பைக் கொண்டுவருகின்ற விடயத்தை எமது அரசாங்கமானது மிகக் கவனமாகவும் நிதானமாகவும் கையாண்டு வருவதுடன், அது பற்றி கலந்துரையாடியும் வருகின்றது. புதிய அரசியல் யாப்பைக் கொண்டுவருவதற்கு முன்னர், மேற்கொள்ளப் படுகின்ற இந்த அரசியலமைப்புத் திருத்தமானது, நீதித்துறை சார்ந்த விடயங்களை விஸ்தரித்துப் பலப்படுத்துகின்ற வேலைத்திட்டத்தின் ஒரு பகுதியை முன்னெடுப்பதற்கானது என்றே நான் நினைக்கின்றேன்.

அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலத்தைக் கொண்டுவரும்போது, ஏன் எதிர்க்கட்சியினர் வீதியில் இறங்கிப் போராடுகின்றார்கள்? அதில் ஈடுபட்ட சிலருக்குத் தெரியாது, ஏன் தாங்கள் இங்கு அழைக்கப்பட்டு இருக்கின்றோம் என்று. இதனை நாங்கள் நேற்றைய தினம் ஊடகங்கள்மூலம் மிகத் தெளிவாகக் கண்டோம். கடந்த காலங்களில் யாப்புத் திருத்தங்கள் மேற்கொள்ளப்பட்டபோது, அதில் உள்நோக்கங்கள் காணப்பட்டன. உள்நோக்கத்தோடு அரசியல் யாப்பைத் திருத்தியவர்கள், இன்று நாம் மக்களுடைய நலனுக்காக இந்த யாப்புத் திருத்தத்தைக்

கொண்டுவரும்போது, அதே பார்வையில் எமது அரசாங்கத்தையும் நோக்கி, பிழையாகப் பார்க்கின்ற ஒரு நிலை காணப்படுகின்றது.

இவர்கள் இந்த யாப்புத் திருத்தத்தை வைத்து மக்கள் மத்தியில் பல்வேறுபட்ட கருத்தாடல்களை ஏற்படுத்து வதற்கான முயற்சிகளை மேற்கொண்டாலும்கூட, இந்த நாட்டில் வாழுகின்ற பெரும்பாலான மக்கள் இந்த யாப்புத் திருத்தத்தைப் பற்றி மிகவும் சிறப்பான முறையில் அது சார்ந்து கதைப்பதையே நாங்கள் காண்கின்றோம். மிகச் சொற்பமானவர்களே இது சம்பந்தமான வேறு கருத்துகளை முன்வைக்கின்றார்கள். இது ஜனநாயகம் சார்ந்த ஒரு விடயமாக இருக்கின்றது. இந்த யாப்புத் திருத்தத்தினூடாக ஜனநாயகம் குழிதோண்டிப் புதைக்கப்படுவதாகச் சொல்கின்றவர்களின் ஆட்சிக் காலங்களில்தான் இந்நாட்டில் ஜனநாயகம் பல தடவை குழிதோண்டிப் புதைக்கப்பட்டது. இவர்களே இன்று இந்த யாப்பு திருத்தம் ஜனநாயகத்துக்கு எதிரானதெனச் சொல்லிக்கொண்டு இருக்கின்றார்கள்.

இந்த யாப்புத் திருத்தத்தின்மூலம் இந்த நாட்டுக்குத் தேவையான பல விடயங்கள் மேற்கொள்ளப்பட இருக்கின்றன. குறிப்பாக, நீதிமன்றங்களின் கொள்ளளவுத் திறனை அதிகரித்தல், மேன்முறையீட்டு நீதிக்கான பிராந்திய மட்ட அணுகலைச் சாத்தியமாக்குதல், நீதிபதிகளின் ஓய்வுபெறும் வயதை அதிகரிப்பதனூடாக அவர்களின் அனுபவத்தைப் பெறுதல் என்பன இந்த யாப்புத் திருத்தத்தினூடாக மேற்கொள்ளப்பட இருக்கின்றன.

அரசியலமைப்புக்கான இருபத்திரண்டாவது திருத்தத்தின் மூலம் - நீதிபதிகளின் ஓய்வுபெறும் வயதெல்லையை அதிகரிப்பதன்மூலம் - எவ்வாறு தேங்கிக் கிடக்கின்ற வழக்குகளின் விசாரணைகளைத் துரிதப்படுத்தலாம்? என்ற கேள்வியை இவர்கள் எம்மிடம் கேட்கின்றார்கள். எமது அரசாங்கம் பதவியேற்ற பின்னர், குறித்த இலக்கைக் கருத்திற்கொண்டு, நீதித்துறை சார்ந்து அதன் உட்கட்டமைப்பு சம்பந்தமான விடயங்கள் பலவற்றை மேற்கொண்டு வருகின்றது. குறிப்பாக, நீதிமன்றத் தொகுதிகளை விரிவாக்குகின்ற செயற்றிட்டத்தையும், நீதிமன்ற செயற் பாடுகளை டிஜிட்டல் மயப்படுத்துகின்ற பொறிமுறையையும், புதிய நீதிமன்றங்களை நிறுவி வழக்குகளைத் துரிதமாக விசாரிக்கின்ற செயற்பாடுகளையும், கடந்த 10 வருடங்களாக நீதித்துறையில் நிரப்பப்படாமலிருந்த பல வெற்றிடங்களை நிரப்புகின்ற நடவடிக்கைகளையும் மேற்கொண்டு வருகின்றது. மேலும், வழக்கு விசாரணை தாமதப்படுவதற்கான முக்கிய காரணிகளில் ஒன்றாகக் கருதப்படுகின்ற அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களத்தைச் சார்ந்த ஊழியர்கள் மற்றும் அதிகாரிகளின் பற்றாக்குறையை நிவர்த்திசெய்கின்ற விடயத்தையும் அரசாங்கம் மிகத் துரிதமாக மேற்கொண்டு வருகின்றது.

தற்போது, நாங்கள் டிஜிட்டல் யுகத்தை நோக்கிச் செல்கின்றோம். இணைய வழியூடாக வழக்கு விசாரணைகளை மேற்கொள்கின்ற வேலைத்திட்டத்தையும் அரசாங்கம் மேற் கொண்டு வருகின்றது. நீதித்துறை சார்ந்த உட்கட்டமைப்பு வசதிகளைத் தொடர்ந்தும் மேம்படுத்துவதற்காக எதிர் வருகின்ற வரவு செலவுத்திட்டத்திலும் அதிகளவு நிதியை ஒதுக்கத் திட்டமிட்டுள்ளோம்.

අද උදේ එක්තරා පක්ෂයක නායකයෙක් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අදහස් දක්වනවා මම දැක්කා. ඒ ගැන විතරක් මම කෙටියෙන් කියන්න ඕනෑ. එතුමා, මේක ප්‍රජාතන්ත්‍ර විරෝධීයි, අරකයි, මේකයි කියලා කිව්වා. හැබැයි, මම එතුමාට මේ කාරණය මතක් කර දෙන්න කැමැතියි. අපේ රටේ ඉතිහාසය තුළ දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත උස්සලා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත උස්සලා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් තමන්ගේ පාක්ෂිකයන්ට අත උස්සන්න අනුමැතිය දීපු අය අද ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කථා කරනවා, මර්දනය පිළිබඳව කථා කරනවා. ඒක ඉතාම ලජ්ජයි. මේ ව්‍යවස්ථා සංශෝධනය හරහා අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රය තුළ සහ අනෙකුත් ක්ෂේත්‍ර තුළ සුවිශාල වෙනස්කම් රාශියක් ඇති වෙයි කියන විශ්වාසය තිබෙනවා. එම නිසා මේ රටේ ජනතාව මේ සංශෝධනයට සම්පූර්ණයෙන් සහයෝගය ලබා දීලා, ඒක ජයග්‍රහණය කරන්න අවශ්‍ය වටපිටාව සකස් කර දෙයි කියලා අපි තුළ විශ්වාසයක් තිබෙනවා.

இறுதியாக, சவூதி அரேபியா இராச்சியத்தின் தேசிய தினத்தை முன்னிட்டு சவூதி அரேபியா அரசுக்கும் அந்த நாட்டு மக்களுக்கும் இந்தச் சந்தர்ப்பத்திலே எனது உளமார்ந்த நல்வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்வதில் நான் பெருமகிழ்ச்சியடைகின்றேன். அதேநேரம், அந்த நாட்டின் புனிதத் தலங்கள்மீதும் ஏனைய பகுதிகள்மீதும் அத்துமீறி மேற்கொள்ளப்படுகின்ற தாக்குதல்களை எந்தவொரு சந்தர்ப்பத்திலும் அனுமதிக்க முடியாது. ஒவ்வொரு நாட்டிலும் சமாதானம் நிலைத்திருக்க வேண்டும். அப்போதுதான் உலகின் சமாதானமும் நிலைபெறும். அந்தத் தாக்குதல்களை நிராகரித்தவனாக விடைபெறுகிறேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.11]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි දෙවන සංශෝධනය සහ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තුව තුළ අඛණ්ඩව ඊයේ දවසේත්, අද දවසේත් - දින දෙකක් - විවාද කරමින් තිබෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව පිහිටුවන ලද ජන වරමේ අභිලාෂ ඉටු කිරීම වෙනුවෙනුත්, අපේ රටේ සම්ප්‍රදායික අධිකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙනුත් ගෙන යන ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් තුළ අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අපේක්ෂා කරන්නේ මොකක්ද කියන කාරණය පිළිබඳව ඇති තරම් කරුණු කිව්වා. අපේ ගරු ඇමතිතුමන්ලා, ගරු මන්ත්‍රීතුමන්ලා කියපු කරුණුත් එක්ක විපක්ෂය මේකට විරුද්ධ වෙන කාරණය පිළිබඳව හරියට කරුණු කියයිද කියලා අපි බලාගෙන ඉන්නවා. මොකද, මේ ව්‍යවස්ථා සංශෝධනයේ එක අරමුණක් තමයි, විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය, එහෙම නැත්නම් විශ්‍රාම යෑමේ වයස වසර දෙකකින් දීර්ඝ කිරීම. ඒකට සමගාමීව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය කියන අධිකරණ තුන. ඒ නිසා අපට මේ අධිකරණ තුනේ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් අනිවාර්යයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න ඕනෑ.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඒ වාගේම අපේ පහළ අධිකරණ දෙක වන දිසා අධිකරණයේ සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස රාජ්‍ය සේවයේ විශ්‍රාම වයස හා සමගාමීව සංශෝධනය වෙලා තිබෙනවා. ඒ අයගේ විශ්‍රාම යැමේ වයස සහ සේවා සම්බන්ධයෙන් කාරණා තීරණ වන්නේ අධිකරණ සංවිධාන පනතෙන්. දැනට රාජ්‍ය සේවයේ නිරත සේවකයන්ගේ විශ්‍රාම යැමේ වයස හැටියට තිබෙන්නේ අවුරුදු 60යි. රාජ්‍ය සේවයේ නිරත සේවකයන්ගේ විශ්‍රාම වයස අවුරුදු 60 වෙනකොට පහළ අධිකරණ දෙකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් වෙන්නේ අවුරුදු 60යි. එහෙම නම් පහළ අධිකරණ දෙකේ - දිසා අධිකරණය සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ - විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 62 දක්වා වසර දෙකකින් වැඩි කරන්න මේ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කරන්න ඕනෑ. අපේ රටේ තිබෙන ප්‍රධාන අධිකරණ පහේම - ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය සහ මහෙස්ත්‍රාත් අධිකරණය - විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වසර දෙකකින් වැඩි කිරීම සඳහා අපි මේ සංශෝධන දෙකම කරන්න ඕනෑ. ඒ වාගේම අපි තව එකක් කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමාගේ සේවා කාලය වසර හයකට සීමා වන අතර, එහෙම නැත්නම් එතුමාට අවුරුදු 67 සම්පූර්ණ වන මොහොතේ එතුමා විශ්‍රාම යා යුතුයි කියන කාරණයත් මේක ඇතුළේ කියන්න අපි උත්සාහ කරනවා. මේ කරුණු දෙක තමයි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතත්, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතත් හරහා කරන්න අපි උත්සාහ කරන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරපු සමහර කරුණු දිහා බැලුවාම අපට මතු වන ප්‍රශ්නය මේකයි. මෙහෙම එකක් කරන්න යන ලෝකයේ පළමුවැනි රට අපේ රට වාගේ තමයි එතුමන්ලා කථා කරන්නේ. එතුමන්ලා ඒ සම්බන්ධයෙන් මහා ඝෝෂාවක් කරන්න උත්සාහ කළා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡාව කැබිනට් මණ්ඩලයෙන් අනුමත වෙලා, මේ ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ සම්බන්ධයෙන් ආපු පෙත්සම් අධිකරණයේ විභාග වන කාලය තුළත් මේ පාර්ලිමේන්තුවේ පවත්වපු හැම විවාදයකම - සංවාදයකම - ප්‍රධාන කාරණය බවට පත් වුණේ මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතයි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විපක්ෂයට දැන් විලාපයක් වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විලාපයත් මම හිතන විධියට අදින් අවසන් වෙනවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් සිදු කරන විපක්ෂයේ විලාපය අදින් අවසන් වෙනවා.

අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ සමහර රටවල අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස විතරක් නොව ඔවුන්ගේ සේවා කාලය සම්බන්ධයෙනුත් යම් තීරණ තිබෙනවා. උදාහරණයක් ලෙස කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රසීලය, ආර්ජන්ටිනාව, චිලී වාගේ රටවල ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 75යි. ඒ වාගේම ඕස්ට්‍රේලියාව, ජපානය, නවසීලන්තය වාගේ රටවල ඒ අයගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 70යි. අපේ ආසියානු කලාපයේ රටවල් වන බංග්ලාදේශයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 67යි, සිංගප්පූරුවේ අවුරුදු 68යි, මාලදිවයිනේ අවුරුදු 70යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර රටවල තිබෙන්නේ වයසටත් වඩා term එකක්; ඒ කියන්නේ, term එක තමයි තිබෙන්නේ. අපි අග්‍ර විනිශ්චයකාරවරයාගේ සේවා කාලය අවුරුදු 6ක් කරන්න හදනවා වාගේම මේ විනිශ්චයකාරවරුන්ට term එකක් තිබෙනවා. ඒ අනුව, South Africaවල අවුරුදු 12යි; බොලිවියාවේ අවුරුදු 6යි; කොලොම්බියාවේ අවුරුදු 8යි; මෙක්සිකෝවේ අවුරුදු 12යි; ස්විට්සර්ලන්තයේ අවුරුදු 6යි. ඒ වාගේම තව රටවල් තිබෙනවා, මේ දෙකම එකට එකතු කරලා තිබෙන. ජර්මනියේ තිබෙනවා, වයස අවුරුදු 68 හෝ අවුරුදු 12 වශයෙන්. ප්‍රංශයේ තිබෙනවා, වයස අවුරුදු 67 හෝ අවුරුදු 9 වශයෙන්. ඉතාලියේ තිබෙනවා, වයස අවුරුදු 70 හෝ අවුරුදු 9 වශයෙන්. මේ තිබෙන්නේ ලෝකයේ රටවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස එහෙම නැත්නම් ඒ අයගේ term එක සම්පූර්ණ වන විධිය.

හැබැයි, මේක සම්පූර්ණ කර ගැනීම සඳහා අපි මේ සාකච්ඡාවට ගන්න විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොකර හිටියා නම් වෙන්න තිබුණු අලකලංචියක් තිබෙනවා. ඒ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යැමේ වයස තීරණය වෙන්නේ 1970 ඉඳලා. 1970 ඉඳලා 1995 වෙනකන් අපේ රටේ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 55යි. එතකොට අධිකරණ සංවිධාන පනත අනුවත්, රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යැමේ වයසට සමානව පහළ අධිකරණ දෙකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 55යි. 1996 ඉඳලා විශ්‍රාම යැමේ වයස අවුරුදු 60 කරනවා. 1996 ඉඳන් අවුරුදු 60ක් කරපු රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යැමේ වයස 2022 ජනවාරි මාසයේ අවුරුදු 65 වෙනවා. රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 65 වෙනකොට 2022 ජනවාරි මාසයේ ඉඳන් දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් අවුරුදු 65 වෙනවා. Constitution එක අනුවත්, පනත අනුවත් ඒක එහෙම තමයි වෙන්න ඕනෑ. හැබැයි, මේක හඳුනා ගෙන හෝ මේ පිළිබඳව වෙච්ච සාකච්ඡාවක ප්‍රතිඵලයක් හැටියට හෝ 2022 අවුරුද්දේම සැප්තැම්බර් මාසයේ 14වැනි දා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022 නිකුත් කරනවා, 2023 ජනවාරි මාසයේ පළමුවැනි දා ඉඳන් active වෙන විධියට. ඒකෙන් නැවත රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යන වයස අවුරුදු 60ට අඩු කරනවා. එහෙම නැත්නම් ලොකු අලකලංචියක් වෙනවා. මොකද, ඒ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසට සමානව මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් වැඩි කරන නිසා. ඒ නිසා මේ ආපු ගමන් මඟේදී අපේ රටේ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස විවිධ අවස්ථාවල වෙනස් කළා. විශේෂයෙන් මේ පහළ අධිකරණ දෙකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වෙනස් වන්නේ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වයස වෙනස් වන විධියට. එහෙම වුණත් අද අපි තීරණය කරලා තිබෙනවා, පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් තව අවුරුදු දෙකකින් වැඩි කරන්න. එහෙම වැඩි කරන්න තමයි අපට ඒ පනත සංශෝධනය කරන්න වෙලා තිබෙන්නේ. මේ සංශෝධනයෙන් දිසා අධිකරණවල සහ මහෙස්ත්‍රාත් අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් අවුරුදු 62 වනවා. මේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 62 වනකොට අපි දකිනවා, විශේෂයෙන්ම Supreme Court එකේ විනිශ්චයකාරවරුන්ගේ දැන් තිබෙන විශ්‍රාම යැමේ වයස අවුරුදු 67 වන බව. Appeal Court එකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් අවුරුදු 65 වනවා. High Court එකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් අවුරුදු 63 වනවා. අපේ දිසා අධිකරණයේ සහ Magistrate's Court එකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයසත් අවුරුදු 62 දක්වා වැඩි වනවා. ඉතින් මීට වඩා මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් සිද්ධ වන අලකලංචියක් නැහැ නේ. හැබැයි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට මතක් වෙලා තිබෙනවා, සුරසේන. මේ සුරසේන ගැන කියන්න ගියාම පලිඟු මැණිකේත් මතක් වුණා. හැබැයි, පලිඟු මැණිකේලාට මතක නැහැ, ඒ සුරසේනට වෙච්ච වැඩේ. ඉතින් සුරසේන හීතිකාව තමයි මේගොල්ලන් හදාගත්තේ.

දැන් කියනවා, ජනාධිපති අනුර දිසානායකටත් දෙයියන්ගේ පිහිටයි කියලා. "මාව බේරගනියෝ" කියලා කෑ ගහන්න එතුමාටත් සිද්ධ වන බව කියනවා. ඇයි, මේ? මේ හැදිලා තිබෙන්නේ සූරසේන හීතිකාව.

දැන් අපේ රටේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ කාරණය සාකච්ඡාවට ලක් වෙලා තිබෙන්නේ. අද සමහරු මේ විවාදයට සම්බන්ධ වෙන්න එන්නේත් බන්ධනාගාරවල ඉඳන්. සමහරු ඇප අරන් ඉන්නේ. තවත් සමහරු appeal කරපු නඩුවල ඉන්නේ. සමහර අයගේ නඩු දැන් ඇහෙනවා. සමහරුන්ට ඊළඟ සතියේත් නඩු තිබෙනවා. එහෙම අයත් මෙතැන ඉන්නවා. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අධිකරණ ක්ෂේත්‍රයේ සිද්ධ වන මහා පරිවර්තන තුළ තිබෙන එක කරුණක් විතරයි විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු දෙකකින් වැඩි කරන එක; ඒක එක කරුණක් විතරයි. ඒ කරුණ වෙනුවෙන් විපක්ෂය සැහෙන වෙහෙසක් ගත්තා. ඊයේ හොඳටම නැවා, සමගි ජන බලවේගයේ කණ්ඩායමක් ඇවිල්ලා. හොඳටම නාලා උත්සාහ කළා, මේක ගැන විරෝධයක් හදන්න. හැබැයි, මේ ගැන කථා බහක් නැති වුණා. මම දැක්කා, ඊයේ ආපු අයගේ සමහර වීඩියෝ මාධ්‍යවල යනවා. ඊයේ කෑ ගහගෙන යන අය "රට අනුරට" කියලාත් කෑ ගහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇවිල්ලා තිබෙන්නේ උද්ඝෝෂණයට. නමුත් ඇත්ත එළියට එනවා. එන මිනිහාටත් තේරෙනවා, මේ කරලා තිබෙන්නේ බොරු වැඩක් කියලා. මේ විධියට ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා, නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරලා රටේ ජනතාවට අධිකරණ ක්ෂේත්‍රය ඇතුළේ, අධිකරණ පද්ධතිය ඇතුළේ තිබෙන නඩු ටික කඩිනමින් අහගන්න අවශ්‍ය පහසුකම් වැඩි කරලා, අධිකරණ සංඛ්‍යාව වැඩි කරලා, විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කරලා, සේවාවට අවශ්‍ය කරන පහසුකම් දීලා, අධිකරණ සේවාවට අවශ්‍ය සේවකයින් බඳවා ගෙන අපි මේ වැඩේ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහගෙන තව එක්කෙනෙක් කියනවා, නඩු කඩිනම් කරන්න නම් වැඩ කරන සේවකයින්ගේත් විශ්‍රාම වයස වැඩි කරන්න ඕනෑය කියලා. අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස වැඩි කරන එක සේවකයින්ගේ විශ්‍රාම වයසත් එක්ක බැඳිච්ච එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් ඇයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 65 කරලා, දිසා අධිකරණවල සහ මහේස්ත්‍රාත් අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 55 වුණේ? ඇයි, Appeal Court එකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 63ක් ලෙස තැබුවේ? ඇයි, 61 තැබුවේ, High Court එකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස? එහෙම නම් ඔක්කෝම එකට තියන්න තිබුණා නේ. 1978 ව්‍යවස්ථාව හදපු ව්‍යවස්ථා පකීර්ලා එහෙම නම් ඒ වෙලාවේ ඒක කරන්න එපායැ. නමුත් එහෙම කළේ නැහැ නේ. එහෙම නම් එහෙම කරන්න තිබුණා. ව්‍යවස්ථා විශාරදයෝ නේ, මේවා හැදුවේ. හැබැයි, එහෙම කළේ නැහැ. ඒ, ඇයි? ඒ, පහළ අධිකරණවල සිට ලබා ගන්නා අත්දැකීම් අනුව ඉදිරියට යන්න ඕනෑ නිසායි. මොකද, 250කට වැඩිය තිබෙන මහේස්ත්‍රාත් අධිකරණවලට එන විනිශ්චයකාරවරුන් ඔක්කෝම දිසා අධිකරණවලට එන්නේ නැහැ. එතැන ඉන්න ඔක්කෝම එන්නේ නැහැ, High Court එකට. High Court එකේ ඉන්න විනිශ්චයකාරවරුන් ඔක්කෝම එන්නේ නැහැ, Appeal Court එකට. Appeal Court එකේ ඉන්න අය ඔක්කෝම Supreme Court එකට එන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ පද්ධතිය ඇතුළේ මේ වයස් සීමාවන් වෙනස් වෙලා මෙම ඉහළ අධිකරණ තුන සම්බන්ධ කාරණා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළට ඇවිල්ලා තිබෙන්නේ ඇයි? අත්දැකීම්වල තිබෙන වැදගත්කම නිසායි. ඒ, අත්දැකීම්වල තිබෙන වැදගත්කම විතරක්ම නොවෙයි, මේ ක්‍රියාවලිය ඇතුළේ සියලු අධිකරණවල විනිශ්චයකාරවරුන් එකවර විශ්‍රාම යන්න ගියොත් ඉහළ අධිකරණවලට ප්‍රශ්නයක් ඇතිවන නිසායි. ඒ නිසා තමයි මේ පිළිබඳව දන්නා මිනිස්සු මේ කටයුත්ත මෙහෙම කරලා තිබෙන්නේ. අපි අද කරන්නේ මේ හැමදෙනාගේම විශ්‍රාම වයස අවුරුදු දෙකකින් වැඩි කරන එක විතරයි. හැබැයි, එහෙම ඒ අයගේ විශ්‍රාම වයස වැඩි කරන්න යනකොට සූරසේන හීතිකාව හැදිච්ච විපක්ෂයත්, විපක්ෂ නායකතුමාත් උදේ කියනවා, අධිකරණවලට ගල් ගහපු මිනිස්සු මේ උද්ඝෝෂණයට එන්න හැදුවා කියලා. ඉතින් එතුමන්ලාම ඒක දන්නවා.

මේ රටේ අධිකරණය කොහොමද පාවිච්චි කළේ, විනිශ්චයකාරවරුන් කොහොමද පාවිච්චි කළේ, අධිකරණය තමන්ගේ කටයුතුවලට මැදිහත් කරගත්තේ කොහොමද කියන ඉතිහාසය අපි දන්නවා.

හැබැයි, අපි කරන්නේ මොකක්ද? ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අපේ රටේ අධිකරණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කරන්න අවශ්‍ය ප්‍රතිසංවිධාන විශාල ප්‍රමාණයක් කරන ගමන් ඒවාට තවදුරටත් සහාය වන්න අවශ්‍ය නිසා අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු දෙකකින් වැඩි කරන එක විතරයි මේ සංශෝධනයෙන් කරන්නේ. අවශ්‍ය නම් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - අධිකරණයේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කරපු සංශෝධනය - කරන වෙලාවේ මේ ගැන හිතන්න තිබුණා. ඕනෑ නම් ඒ වෙලාවේත් මේ කටයුත්ත කරන්න තිබුණා. හැබැයි, එහෙම කළේ නැහැ. ඒ නිසා ආණ්ඩුවක් හැටියට අපි මේ වෙලාවේ හිතනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකින් තොරව ඉහළ අධිකරණ තුනේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස වැඩි කරන්න බැහැ කියලා. එහෙම නම්, අපට ඒක කරන්න වනවා. 2022දී ගහපු ඒ ගැසට් එක ක්‍රියාත්මක කළා නම් රාජ්‍ය සේවයේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 65 කළා නම්, අද මහේස්ත්‍රාත් අධිකරණවලයි, දිසා අධිකරණවලයි විනිශ්චයකාරවරුනුත් වයස අවුරුදු 65න් විශ්‍රාම යනවා; ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුනුත් වයස අවුරුදු 65න් විශ්‍රාම යනවා. ඒ නිසා මේ ක්‍රියාවලිය හදන්න ඕනෑ නැද්ද? හදන්න ඕනෑ. මේක හදන්න ගත්ත ජන වරමේ අභිලාෂයක් ඉටු කිරීම වෙනුවෙන් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වැඩ කරමින් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම වැඩ කරමින් යනකොට විපක්ෂය කෙඳිරිගානවා. කෙඳිරිගාන ගමන් කියනවා, තමන්ගේ නඩුව තමන් අහගන්න හදනවා කියලා. නැහැ, තමන්ගේ නඩුව නොවෙයි, දැන් ගොඩක් අයගේ නඩු ඇහෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමාගේ එකත් ඇහෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

දැන් ගොඩක් අයගේ නඩු ඇහෙනවා. ඔබතුමාගේ නඩුව නම් ඇහෙනවා, අපේ නඩු ඇහෙන්නේ නැතිවුණාට. මොකද, ඔබතුමාට නඩු ගොඩක් වැටිලායි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නඩු ඇහෙන අය දැන් බයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එකට ඇවිල්ලා, මෙතැන ඉඳලා, පහුවදා යම් යම් අය ඇතුළට යනකොට බයක් හිතෙනවා නේ, මටත් යන්න වෙයි කියලා. ඒ නිසා මටත් යන්න වෙයි කියලා හිතෙන අය බලනවා, කොහොම හරි මේක ඇදගන්න පුළුවන්ද කියලා. මොකද, තමන් කරපුවා දන්න අය, ජනාධිපති අරමුදලේ ඉඳන් කොල්ල කාපු අය, මහජන දේපළ කොල්ල කාපු අය, නඩු වැටිච්ච අය දන්නවා, මේ වනකොට තමන්ගේ නඩුව ඇහෙනවා කියලා. *[බාධා කිරීම්]* තමන්ගේ නඩුව ඇහෙනවා කියලා දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමන්ගේ නඩුව ඇහෙනකොට ගැරඬින්ට භූමිතෙල් ගැහුවා වාගේ දෙයක් අද විපක්ෂයට වෙලා තිබෙනවා. මොකද, නඩු ටික ඇහෙනවා. නඩු ටික ඇහිලා අවසන් වනකොට යන්න වෙනවා කියලා ඒ අය දන්නවා. ඒ නිසා තමයි සමහරුන් කලබල වෙන්නේ. එහෙම නැතුව අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු දෙකකින් වැඩි කළා කියලා කලබල වෙන්න කිසි හේතුවක් නැහැ, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඇත්ත ඒකයි. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් ඒකට කැමැතියිලු. ඔව්, ඒක තමයිලු. මේක තමයි ඇත්ත, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. හෘදය සාක්ෂිය ඇත්ත කියනවා. ඒක හරි.

මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම හරහා මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය තුළ ඇති කරන සංශෝධනවලට එක එකතුවක් අපි කරනවා. ඒ එකතුව කරන්නේ, නීතියේ ආධිපත්‍යය ස්ථාවර කරමින්, මේ රටේ ජනතාවට සමප්‍රවේශී අධිකරණ පද්ධතියක් ඇති කිරීම වෙනුවෙන්; අධිකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කරනවා වාගේම ජනතාවට අධිකරණය තුළින් ලැබෙන සේවාව කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම වෙනුවෙන්. ඒ සඳහා මේ පාර්ලිමේන්තුව විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකකට වැඩි බලයකින් සම්මත කරනවා කියන කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.28]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස ඉතිහාසයේ වැදගත් දවසක් විධියට ලියවෙන්න යන දවසක්. මොකද, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට ආවාම රටේ ජනතාව සහ විපක්ෂයේ හිටියත් කණ්ඩායමක් වශයෙන් අපිත් බලාපොරොත්තු වුණේ, මෙම ආණ්ඩුව බලයට පත්වන්න පෙර අවුරුදු ගණනක් තිස්සේ කියපු ප්‍රධාන කාරණයක් වෙච්ච විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරයි කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක කොච්චර වැදගත්ද කියනවා නම්, පසුගිය ආණ්ඩුව කාලයේදී ගරු විජිත හේරත් වත්මන් අමාත්‍යතුමා විසින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියලා. එවකට තිබුණු ප්‍රධාන, වැදගත්ම කාරණය රටට වැඩි අවශ්‍යතාවක් වූ මෙම judgesලාගේ විශ්‍රාම යැමේ කාලය වැඩි කිරීම නම් විජිත හේරත් ඇමතිතුමාට ඒ අවස්ථාවේදීම තිබුණා, judgesලාගේ කාලය වැඩි කිරීම සම්බන්ධයෙන් අලුත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න. හැබැයි, එතුමා ඉදිරිපත් කළේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධ පනත් කෙටුම්පතක්. ඒක පැත්තකින් තියලා, අද judgesලාගේ විශ්‍රාම යැමේ කාලය extend කිරීමට දීලා තිබෙන ප්‍රමුඛතාව පිළිබඳව, මේ වැඩ පිළිවෙළ පිළිබඳව විශාල සැකයක්, ප්‍රශ්න රාශියක් ගොඩ නැඟෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ආපු දවසේ - ඔබතුමන්ලා බලයට ඇවිල්ලා මේ නොවැම්බර් මාසයට අවුරුදු දෙකක් සම්පූර්ණ වෙනවා - එහෙම නැත්නම් බලයට ඇවිල්ලා මාසයකින්, දෙකකින් හෝ හයකින් මේ judgesලාගේ විශ්‍රාම යැමේ වයස දීර්ඝ කිරීමේ වැඩ පිළිවෙළ - මෙම කාර්යභාරය - ගෙනැල්ලා තිබුණා නම් ඒක සද්භාවයෙන් කරන ක්‍රියාවක් කියලා කියන්න තිබුණා. දැන් මේකේ විශේෂ වූ කාරණය මේකයි. මේ අවුරුද්දේ පසුගිය මාස කිහිපය තුළ Supreme Court එකේ Chief Justicesලා දෙදෙනෙක් ඇතුළුව හයදෙනෙක් විශ්‍රාම යනකම් ඉඳලා හත්වැනි එක්කෙනා විශ්‍රාම යැමට පෙර මෙම විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම පිළිබඳව සියලුදෙනාටම බලවත් සැකයක් ඇති වෙනවා. අපි එක judge කෙනෙකුටවත් විරුද්ධත් නැහැ, එක judge කෙනෙකුටවත් හොඳයි කියන්නේත් නැහැ. අපි, "එයා හොඳයි, මෙයා නරකයි" කියලා කියන එකක් නොවෙයි මේ තිබෙන්නේ. හයදෙනෙක් විශ්‍රාම යනකම් ඉඳලා හත්වැනි එක්කෙනාගේ ධුර කාලය අවසන් වෙනකොට මෙම සංශෝධනය ගෙනෙන්නේ ඇයි කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒක කමක් නැහැ කියමුකෝ. එහෙම වුණත් මේ සංශෝධනය ගෙනෙනකොට රටේ ජනතාවට අඩුම තරමින් සත්‍යය ප්‍රකාශ කරන්න කියලා මම මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ගරු අධිකරණ ඇමතිතුමා කියලා තිබෙනවා මම දැක්කා, ලංකාවේ මිලියනයකට judgesලා 20ක්ද කොහේද තමයි ඉන්නේ කියලා. එහෙම ප්‍රකාශයක් ගරු ඇමතිතුමා කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ තිබෙන ලක්ෂ එකොළහක් වූ නඩුවලින් - 1.1 million casesවලින් - ලක්ෂ අටකට වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ Magistrate's Courtsවල. මම කියන කාරණය හරි නේද, ගරු අධිකරණ ඇමතිතුමනි? ඒ වාගේම, දෙලක්ෂ හැටදහසක් වාගේ නඩු තිබෙන්නේ District Courtsවල. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාව උසාවි යන්නේ පෞද්ගලික අමනාපයකට, පෞද්ගලික ආරාවුලකට. සාමාන්‍ය පුරවැසියෙක් යන්නේ කොයි උසාවියටද? එක්කෝ District Court එකට, නැත්නම් Magistrate's Court එකට. පහළ උසාවිවල තමයි ඒගොල්ලන්ගේ නඩු ටික බේරන්නේ. හැබැයි, මෙම සංශෝධනය තුළින් ගරු අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ මිලියනයකට 20ක් ඉන්න judgesලාගේ ප්‍රමාණයේ කිසිම වැඩිවීමක් සිද්ධ වෙන්නේ නැහැ. මම කියපු දෙලක්ෂ හැටදහසයි, අටලක්ෂ ගණනයි, ලක්ෂ එකොළහෙන් අඩු කළාම, ඉතා සුළු නඩු ප්‍රමාණයයි Court of Appeal සහ Supreme Court එකේ - ඉහළ උසාවිවල - තිබෙන්නේ. මොකද, Court of Appealහි දමන්නේ රිට් නඩුවක්, Supreme Court එකේ දමන්නේ fundamental rights නඩුවක්. සාමාන්‍ය ජනතාව, නැත්නම් ආයතන රජයේ ක්‍රියාදාමයට විරුද්ධව නඩු දමන තැන් තමයි මේවා. ඒ තැන්වල ඉන්න judgesලාට දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ ආණ්ඩුවට තමයි පළමුවැනි වරට judgesලා දහතුන්දෙනෙක් එකවර Appeal Court එකට පත් කිරීමේ අවස්ථාව ලැබෙන්නේ. හතරදෙනෙක් promotion හම්බ වෙච්ච අය, හතරදෙනෙක්

vacancies, ඒ වාගේම අද දවසේ සංශෝධනය වන පනත තුළින් ප්‍රමාණය තව වැඩි වෙනවා. එතකොට Appeal Court එකේ විසිහතරදෙනාගෙන් දහතුන්දෙනෙක් පත් කිරීමේ හැකියාව වත්මන් ආණ්ඩුවට තිබෙනවා. අපට තේරෙන හැටියට, මේ judgesලා ආණ්ඩුවේ කාලය තුළ අලුතින් පත් කිරීම තුළින්, ආණ්ඩුවට විරුද්ධව තීන්දු තීරණ දෙන්න තිබෙන තැන් දෙක වන Court of Appeal, Supreme Court කියන උසාවිවල ඉන්න judgesලා ආණ්ඩුවට පක්ෂපාතීව ඉඳීවි, එහෙම නැත්නම් මේ judgesලා ආණ්ඩුව කියන විධියට වැඩ කරයි කියලා ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා නම්, මම හිතන විධියට මේක ආණ්ඩුව වරද්දා ගන්නා තැනක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, judgesලාගේ විශ්‍රාම යෑමේ කාලය වැඩි කිරීම, judgesලාගේ සංඛ්‍යාව වැඩි කිරීම ආදී කාරණා අලුත් ව්‍යවස්ථාවක් තුළින් ගෙනැල්ලා තිබුණා නම්, ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය වශයෙන් එම සංශෝධනයට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. මේක මේ *ad hoc* ලෙස, ඉතා හදිසියෙන් මේ කාල වකවානුව තුළ හයදෙනෙක් retire වෙලා හත්වැනි එක්කෙනා ඉන්නකොට ගෙනෙන එක පිළිබඳව තමයි මේ බලවත් සැකය තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද අපේ පක්ෂය හැම අවස්ථාවේදීම ප්‍රතිපත්තිගරුකව රට තුළ වැඩ කරපු පක්ෂයක්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟ දෙමළ ජනතාවට ඒ කාලයේදී කොච්චර අමනාපකම් තිබුණත්, එතුමියත් එක්ක සහ එතුමියගේ ආණ්ඩුවත් එක්ක කොච්චර ගැටලු තිබුණත්, පාර්ලිමේන්තුව තුළින් එතුමියගේ ප්‍රජා අයිතිය අහෝසි කරපු වෙලාවේ එතුමියට උදවු කළේ, එතුමියට පාර්ලිමේන්තුව තුළ සහයෝගය දුන්නේ, එතුමිය එදා වාහනයට පවා නැග්ගුවේ අමිර්තලිංගම් මහත්මයා ඇතුළු ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය නියෝජනය කරපු කණ්ඩායම. ඒ, මොකද? ප්‍රතිපත්තියක් වශයෙන්. එහෙම නැත්නම් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට තිබුණු ආදරයක් හෝ එතුමිය වෙනුවෙන් කරපු දෙයක් නොවෙයි, ඒක. ප්‍රතිපත්තිමය වශයෙන්, එතුමියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම වැරැදියි කියන කාරණාව මත තමයි එදා එහෙම කටයුතු කළේ. ඒ විතරක් නොවෙයි, 2018 වර්ෂයේදී වැරැදි ලෙස, හරි ක්‍රියාමාර්ග ගන්නේ නැතුව පාර්ලිමේන්තුව dissolve කරපු අවස්ථාවේදී පළමුවෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩු දැම්මේ කවුද? අපේ හිටපු නායක - ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ හිටපු නායක - සම්පන්දන් මහත්මයා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන සංශෝධන, රජය ගන්නා තීන්දු තීරණ ප්‍රතිපත්තිමය වශයෙන් වැරැදියි නම්, ඒ සෑම අවස්ථාවකදීම ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය හරි දේ කරන්න හිට ගන්නවා. ඒක නිසා තමයි, ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය මෙම විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහ අනෙකුත් සංශෝධන සියලු දෙයටම විරුද්ධව අද දවසේ මේ පාර්ලිමේන්තුව තුළ ඡන්දය ප්‍රකාශ කරන්නේ.

ඒ ඡන්දය පාවිච්චි කිරීම තුළින් අපට මේ පනත් කෙටුම්පත් පරද්දන්න බැරි වෙයි. ඒ ගැන ගැටලුවක් නැහැ. හැබැයි, ප්‍රතිපත්තිගරුක මිනිස්සු හැටියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අපිව එවපු කණ්ඩායම වෙනුවෙන් අපි පෙනී ඉඳලා තිබෙනවා කියන එක මතක තියාගෙන, ඔළුව කෙළින් තියාගෙන - හිස ඔසවාගෙන - යන්න අපට පුළුවන්කම ලැබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තව කාරණා දෙකක් මම කියන්න ඕනෑ. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ, CJsලාගේ පත් කිරීම් එක්ක සෙල්ලම් කළ, ඒවායේ වෙනස්කම් කරපු පළමුවන ජනාධිපතිතුමා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා හෝ පළමුවන ආණ්ඩුව ජාතික ජන බලවේගය ආණ්ඩුව නොවෙයි කියන එක මතක තියා ගන්න. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා නෙවිල් සමරකෝන් මහත්තයාත් එක්ක, චන්ද්‍රිකා මැතිනිය සරත් එන්. සිල්වා මහත්තයාත් එක්ක, ශිරානි බණ්ඩාරනායක මැතිනියත් එක්කත්, - ඒක මහින්ද රාජපක්ෂත් හිටපු කැබිනට් මණ්ඩලයෙන් කළ දෙයක් - කටයුතු කළ ආකාරය අපට මතකයි නේ. හැබැයි, අවසානයට මොකක්ද වුණේ? ඒ Supreme Court Judgesලාට තමන්ගේ ධුර කාලය අවසන් වෙලා යනකොට සමාජයට හරි දේ කළා කියලා හෘදය සාක්ෂියට එකඟව ගෙදර යන්න පුළුවන්කමක් තිබුණාද? ඉතින්, ඒ හරහා අපි Supreme Court Judgesලාට ප්‍රධාන වශයෙන් කියන්න කැමැති පණිවුඩය මොකක්ද? අපි දන්නවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන එක දැනට දැනගන්න තිබෙන කාරණයක්. හරි, කමක් නැහැ, විශ්‍රාම යෑමේ වයස වැඩි කළා. මේ රට පදනම් වෙලා තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් එන රටේ ජනතාවගේ පරමාධිපත්‍යයේ ප්‍රධාන කුලුනු තුන වන විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණයෙහි ස්වාධීනභාවය, separation of powers ආරක්ෂා කරගෙන මීන් ඉදිරියට වැඩ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අවසාන කාරණය මේකයි. අපි කවදාවත් කියන්නේ නැහැ, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ පනත් කෙටුම්පත් වැරදියට පාවිච්චි කරන්න යන්නේ කියලා. මේ පනත් කෙටුම්පත් සම්මත කර ගත්තත් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට හරි දේ කරන්න පුළුවන්. අද තමයි ආරම්භය. අද මේ පනත් කෙටුම්පත් සම්මත වෙනවා. එතුමාට මේ කටයුත්ත කරන්න බලය ලැබෙනවා. මීන් ඉදිරියට එතුමා කරන කටයුතු පිළිබඳව රටේ ජනතාව බලාගෙන ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පනත් කෙටුම්පත් දෙකට විරුද්ධ වන තව හේතුවක් තිබෙනවා. අද මේ ආණ්ඩුව තුනෙන් දෙකක බලය භාවිත කරලා මේවා සම්මත කර ගනීවි. හෙට විශ්‍රාම වයස අවුරුදු 67 ඉඳන් 65ට කරන්න ඕනෑ කියයිද දන්නේ නැහැ. මොකද, හෙට මේ රටේ ජනාධිපති කවුද, හෙට ආණ්ඩුව කරන්නේ කවුද කියන එක අපි දන්නේ නැහැ. එතකොට මේ රටට විශාල හානියක් වෙන්න පුළුවන්. ඒ අනුව ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය මේ පනත් කෙටුම්පත් දෙකට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන බව මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

පාර්ලිමේන්තුවට දන්වා තිබෙන්නේත්, රටට කියලා තිබෙන්නේත් පංච පුද්ගල විනිශ්චය මණ්ඩලයක් තමයි මේ තීන්දුව ලබා දුන්නේ කියායි. එතකොට එතුමා තහවුරු නොකළ කරුණුවලින් කියනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කිව්වා වාගේ එකක්. මේවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනවා. අනාගතයට එකතු වෙනවා. ඒ නිසා කරුණාකරලා තහවුරු

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නොකරන ලද කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න එපා කියලා කියන්න. මොකද, රටට ඇවිල්ලා තිබෙන්නේ පංච පුද්ගල විනිසුරු මඬුල්ලක් - පස්දෙනා - ඒකමතිකව දුන් තීන්දුවක්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කියපු එකත් සඳහන් කරන්න; අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියපු එකත් සඳහන් කරන්න. ඒවා ඉතිහාසයට ගියාට පස්සේ දෙකම කියවලා බලලා මිනිස්සු තීරණය කරයි, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

Right, thank you.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ තීන්දුවත් එක්ක තමයි අපි කටයුතු කරන්න ඕනෑකම තිබෙන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලිඛිතව දන්වලා තිබෙනවා. කොහෙන් හරි ආපු තොරතුරු එහෙම පාර්ලිමේන්තුවේ කියන්න බැහැ. එහෙම කියන්නේ කොහොමද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කැමැති නම් අයින් කරන්න. නමුත්, social mediaවල තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අධිකරණ තීන්දුවට පටහැනි දෙයක් ප්‍රකාශ කිරීම නිසා එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කටයුතු කරනවා.

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.38]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න පොඩි වෙලාවක් තිබෙන මේ වෙලාවේදී මෙහි සමස්ත සිද්ධිය ගැන යම් අදහසක් දක්වන්න මම කැමැතියි. ඇත්තටම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පුරාවටම ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා කළ වැඩේම තමයි දිගටම කරගෙන ගියේ. ඒ තමයි, බොරුව. බොරුව මත පදනම් වුණු සමාජ මතය, බොරුව මඟින්ම යළි යළිත් ගොඩනඟා ගන්න උත්සාහ කරන ව්‍යාපෘතියක් විධියට තමයි මේක මුළුමනින්ම ක්‍රියාත්මක වුණේ. මම එහෙම කියන්න හේතුව මේකයි. මේක ඇතුළේ මුලින්ම ගත්ත කාරණාව ගත්තොත්, නඩු ප්‍රමාද වීම තමයි මහජනතාව අතරට ගියපු කථාව. මොකද, මහජනතාව උසාවිවලට ගියාම නඩු ප්‍රමාදවීම නිසා සැහෙන අපහසුතාවලට පත් වෙනවා. ඒ නිසා ඉස්සෙල්ලාම නඩු ප්‍රමාදවීම කියන එක දා ගත්තාම මිනිස්සු හිතනවා, මේකෙන් අපිට මොකක් හරි සහනයක් ලැබෙයි කියලා. හැබැයි, ඒක හේතුව විධියට ගත්තත්, ඒක මාතෘකාව විධියට ගත්තත්, ඉදිරිපත් කරපු හේතු කිසිවක් කිසිම විධියකින් සාර්ථකව තහවුරු කරන්න පුළුවන් අදහසක් මේ ඉන්නා මන්ත්‍රීවරු කිසි කෙනෙකු ඉදිරිපත් කළේ නැහැ. ඒ නිසා මෙතැනින් පස්සේ කථා කරන කථිකයන්ගෙන් හෝ අප ඉල්ලනවා, විශ්‍රාම යන වයස වැඩි කිරීමෙන් නඩු ඉක්මනින් අසා ඉවර කරන්න පුළුවන් කොහොමද කියා සරලව කියන්න කියා. විශ්‍රාම වයස වැඩි කිරීමෙන් නඩුවකට ගත වෙන වේලාව අඩු කරන්න පුළුවන් ක්‍රමය සඳහන් කරන්න සෘජුව. ඒක තමයි මම හිතන විධියට මෙහි තිබෙන වැදගත්ම කොටස.

ඊළඟ කාරණාව තමයි, මේ ව්‍යවස්ථා සංශෝධනය ආවේ කොහොමද කියන එක. මේ ව්‍යවස්ථා සංශෝධනය එන්නේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවරුන්ගේ සේවය අවශ්‍යයි, අත් දැකීම් රටට අවශ්‍යයි යනුවෙන්. හැබැයි, එතැනදී මෙම ජන වරම ලබා ගැනීමේදී ඔබ මේ රටට කරපු බොරුව ආයෙත් වතාවක් හෙළි වෙනවා. එදා ජනවරම ලබා ගනිද්දී කිව්වේ වයස වැඩි අය, අත් දැකීම් තිබෙන අය අවශ්‍ය නැහැ; අත් දැකීම් කියලා දෙයක් වැඩක් නැහැ; මේක අපට කරන්න පුළුවන්; ඒ නිසා වයස අයට යතුරවත් දෙන්න එපා කියලායි. රටේ ජනතාව මුළා කරලා, බොරු කරලා ගත් ජන වරමක් පවත්වාගෙන යමින් දැන් කථා කරනවා, අත් දැකීම්වල වැදගත්කම පිළිබඳව. ඒ තුළ යළිත් වතාවක් බොරුව සමාජය ඇතුළට ඒත්තු ගන්වන්න උත්සාහ කරනවා.

ඊළඟ කාරණාව මේකයි. මේ ක්‍රියාවලිය ඇතුළේ නඩු ප්‍රමාදවීම නම් ප්‍රශ්නය, මේ නඩු සියල්ල ප්‍රමාද වුණේ මේ විනිසුරුවරුන් ඉඳිද්දීමයි. ඒ නිසා මේ විනිසුරුවරුන්ම තබාගෙන නඩු ඉක්මන් කරන්නේ කොහොමද? එහෙම නම් නඩු ප්‍රමාද වෙන්නේ විනිසුරුවරුන් ඉන්නා නිසා හෝ ඒ විනිසුරුවරුන්ගේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. මේක වෙන තාක්ෂණික ප්‍රශ්නයක්. ඒ තාක්ෂණික ප්‍රශ්න සියල්ල විසඳා ඊට පස්සේ මේ සාකච්ඡාවට ආවා නම් අපට මේක පිළිගන්න තිබුණා. හැබැයි, ඒ තාක්ෂණික ප්‍රශ්න විසඳීම වෙනුවට ආරම්භයේදීම ඉතාම සැක කටයුතු ලෙස තමන්ට ලැබුණු ජන වරම භාවිත කරලා මේ ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න හදනවා. මොකක්ද, මේ සැක කටයුතු කියලා කියන්නේ? අධිකරණ අමාත්‍යාංශය විදේශ ආධාර ඇතිව නීති ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ගැන වාර්තාවක් ඉදිරිපත් කළා, පිටු 506ක. එහි කිසිම තැනක විශ්‍රාම යන වයස වැඩි කිරීමෙන් නඩු ඉක්මනින් අහන්න පුළුවන් කියන කාරණය පිළිබඳව සඳහනක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 194 පිටුවේ ඉතාම පැහැදිලිව වාක්‍යයක් තිබෙනවා. ඒ තමයි ව්‍යවස්ථා සංශෝධනයකදී මහජනතාව සමඟ කරනු ලබන සංවාදය පිළිබඳ කාරණය. මොකක්ද, ඒකේ කියන්නේ? මහජනතාව වෙත ඉදිරිපත් කර සංවාදයකින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් සිදු කරන බව එහි සඳහන් කර තිබෙනවා. අලුත් ව්‍යවස්ථාවක් නම් ජනමත විචාරණයකටත් යන බව සඳහන් කර තිබෙනවා. අලුත් ව්‍යවස්ථාව පැත්තකින් තියමු කෝ. මේ සංශෝධනයේදී; මේ වගන්තිය වෙනස් කිරීමේදී කවර පාර්ශ්වයන් සමඟද ඔබ සංවාද කළේ? මෙහිදී නීතිඥ සංගමය පළමු වතාවට මාර්තු මාසයේදී

විශේෂයෙන්ම අධිකරණ ඇමතිවරයාගෙන් අසා සිටියා, මෙහෙම කථාවක් යනවා ඇත්තද කියා. නමුත් ඒක ප්‍රතික්ෂේප කළා. වාර හයක් විතර ගියාට පස්සේ තමයි ඇත්ත කියලා කියන්න පටන් ගත්තේ. ආරම්භයේදී ආවේ අගවිනිසුරුවරයාගේ සේවා කාලය සම්බන්ධව. හැබැයි, පසුව තමයි මේක විනිසුරුවරුන්ට ගියේ. නීතිඥ සංගමය කියන්නේ නීති ක්ෂේත්‍රයේ ඉන්න අය. ඒ අය ඇහුවාම දුන්න උත්තරය තමයි ඒ පිළිබඳව එහෙම විශේෂ දෙයක් නැහැ කියන කාරණය. අවසානයේ මේක කැබිනට් එකටත් දැම්මාට පසුව තමයි නීතිඥ සංගමය සමඟ සාකච්ඡාවක් ආරම්භ කළේ.

ඊළඟට අධිකරණ අමාත්‍යාංශ ලේකම්තුමිය එක තැනක කියනවා, අමාත්‍යාංශ මට්ටමින් මෙහෙම සාකච්ඡාවක් වුණේ නැහැ කියලා. විවේචන එල්ල වෙන්න පටන් ගත්තාට පසුව තමයි අනික් විනිසුරුවරුන් ටික මේකට එකතු කර ගත්තේ. සැක කටයුතු ලෙස මෙය සිද්ධ වනවා කියන එකට හේතු ටික තමයි මේ මම කියමින් යන්නේ. විපක්ෂ නායකවරයා ජුනි මාසයේ 23 වැනි දා පාර්ලිමේන්තුවේදී මේ ගැන ඇහුවාම අධිකරණ ඇමතිවරයා කිව්වා, මේක හිතළුවක් කියලා. ජුනි වෙද්දී හිතළුවක්; සැප්තැම්බර් මාසයේදී නීතියක්. කොහොමද මේක වෙන්නේ? මේක තමයි සැකය. මොකක්ද මේ දරන උත්සාහය? ක්ෂේත්‍රයේ ඉන්නා කිසි කෙනෙක්ගෙන් අහන්නෙත් නැහැ.

ඊළඟ කාරණාව මේකයි. විනිසුරුවරු 65දෙනෙක් ඒකමතිකව එපා කිව්වාම ඒ සංගමයට බැන්නා. නීතිඥ සංගමය එපා කිව්වාම ඒකට වෙන අර්ථ කථන දීලා ඒක ප්‍රතික්ෂේප කළා. ජාත්‍යන්තර නීති සංවිධාන කිව්ව ගමන්, ඒවා මොනවාද කියලා ඇහුවා. දිගින් දිගටම සැක උපදවන එක්තරා හේතුවක් අස්සේ තබාගෙන, බොරු මාතෘකාවක් දමාගෙන, විශේෂයෙන්ම අගවිනිසුරුවරයාගේ සේවා කාලය වැඩි කර ගන්න දරන උත්සාහයක් තමයි මේක ඇතුළේ දිගින් දිගටම පෙන්නුම් කරන්නේ. හැබැයි, ඒකට මේ වෙලාවේදී ඔබට ජන වරම තිබෙනවා. ඒ ජන වරම තිබෙන නිසා ඔබ එහෙම කියනවා.

ඊළඟට ඔබෙන් අහන්න තිබෙන කාරණාව මේකයි. ව්‍යවස්ථා සංශෝධනයක් කියන්නේ බරපතළ වැඩක්. ඒ බරපතළ වැඩේදී මොකක්ද මේ තුනෙන් දෙකක් කියලා කියන්නේ? තුනෙන් දෙකක් කියන එකේ අදහස තමයි බහුතර ජනතාවක් මේකට කැමැති වෙනවා කියන එක. ඒක තමයි තුනෙන් දෙකක් කියන එකේ අදහස. එක පක්ෂයකට තුනෙන් දෙකක් පැමිණ තිබෙන අවස්ථාවක් මේක. සාමාන්‍යයෙන් තුනෙන් දෙකක බහුතරයක් වනවිට, මෙම පාර්ලිමේන්තු ක්‍රමය තුළ පක්ෂ ගණනාවක් එකතු වෙනවා. ඒක තුළ විවිධ අදහස්වලට ඉඩ තිබෙනවා. නමුත් මේ අවස්ථාවේ තිබෙන්නේ විශේෂ තත්ත්වයක්. තනි පක්ෂයකට බලය ලැබිලා තිබෙනවා. එක්තරා දිනක - ඒක තමයි වැදගත්ම දේ - පෙරවරු 7 සිට පස්වරු 4 දක්වා ජන මනස තුළ ක්‍රියාත්මක වුණු අදහසක් තුනෙන් දෙකක බලයක් බවට පත් වෙනවා. එතැනින් පසුව පැවැත්වෙන මැතිවරණයේදීත් එම තුනෙන් දෙකේ බලය පිළිබිඹු වන්නේ නැහැ. එවැනි අවස්ථාවක මේ කාරණය ජනතාවගෙන් විමසන්නේත් නැතුව, සංවාදයකට ගෙන යන්නේත් නැතුව, ඒ ක්ෂේත්‍රයේ සිටින අයගෙන් අදහස් විමසන්නේත් නැතුව, ඔවුන් සමඟ සාකච්ඡාවකට නොගොස් ඔබ මේ කරන වැඩේ අත්තනෝමතිකයි කියන එක හැර වෙන මොකක්ද කියන්න තිබෙන්නේ? ඔබ මේක සාධාරණීකරණය කරන්නේ කොහොමද? "ජේ.ආර් 1978දී මෙහෙම කළා. මහින්ද 2012දී මෙහෙම කළා" කියමින් ඒ අය කරපු වැරැද්ද ඔබත් මේ වැඩේට යොදා ගන්නවා කියන්නේම ඔබේ යටි හිතේ තිබෙනවා, මේක ඇතුළේ කුමන හෝ වැරැද්දක් තිබෙන ගැන. ඔබ ගන්නා උදාහරණ පවා නිවැරදි උදාහරණ නොවෙයි.

ගරු ඇමතිතුමා බ්‍රිතාන්‍යය ගැන කිව්වා. බ්‍රිතාන්‍ය පාලනය ඒ රටේ සියලු පක්ෂ සමඟ අවුරුදු එකහමාරක සාකච්ඡාවක් කළා. කෝ, ඔබේ ඒ සාකච්ඡාව? ඔබට ලබිලහියේ වුවමනායි, මේ අගවිනිසුරුවරයා යටතේම මේ වැඩේ කරන්න. මෙතැන තිබෙන බරපතළම කොටස තමයි, දේශපාලනික අරමුණු වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ කරන සෙල්ලම. ඒක කුමන හෝ තැනකින් නතර කළ යුතුයි. මේක ඔබත් කරනවා; අතීතයේ සිටි අයත් කළා කියමින් ඔබ කරනවා. හැබැයි, ඔබේ ජන වරම මේ කාරණාවලට එරෙහිව ලැබුණු ජන වරමක්.

මෙන්න මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එක්තරා දිනෙක ලැබුණු තුනෙන් දෙකක බලයක් පාවිච්චි කරලා දේශපාලන ව්‍යාපෘති වෙනුවෙන් භාවිත කිරීමට දරන උත්සාහය, අනාගත පාර්ලිමේන්තුවක් යටතේ ජනතාව සමඟ කරනු ලබන සාකච්ඡාවකින් නතර කරන ක්‍රමයක් සෙවීමේ වගකීමත් අපට පැවරෙනවා කියන කාරණය තමයි අවසානයේ අපට කියන්න තිබෙන්නේ. එම නිසා හොඳින් මතක තබාගත යුතු දෙයක් තිබෙනවා. අපි දිගටම කියනවා, ඔබට ජන වරමක් තිබෙනවා; මන්ත්‍රී ධුර 159ක් තිබෙනවා, එම නිසා මේ කෙටුම්පත් සම්මත වෙනවා කියන එක. හැබැයි, මතක තබාගත යුතු දේ තමයි, මේ සම්මත වීමෙන් ජනතාව තුළ ඇති කරන අවිශ්වාසය බරපතළ ගැටලු ගෙන දෙනවා කියන එක. ඒ, මෙහෙමයි. අධිකරණයේ තීන්දුව නිවැරදියි කියලා විශ්වාස කළොත් තමයි, අධිකරණයකින් මේ ප්‍රශ්නවලට උත්තර සොයන්න උත්සාහ කරන්නේ. අපි අධිකරණය වැනි ආයතනවලට අත තබන විට යහපත් සංවාදයක් වුවමනා කරන්නේ ඒ නිසායි. නමුත්, ඔබ ඒ කිසි දෙයක් නොකර ඔබේ 159 නමැති අංකය යොදාගෙන මේ රට තුළ අලුත් තත්ත්වයක් නිර්මාණය කරන්න උත්සාහ කරනවා. ඒක වරදක් කියන එක ඔබට කියන අතරම, අපට තව දෙයක් කියන්න තිබෙනවා.

විශේෂයෙන්ම අපේ සමගි ජන බලවේගයේ සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සිටින සියලු පාක්ෂිකයන්ට කියනවා, පසුගිය මහ මැතිවරණයේ ප්‍රතිඵලයට ඔබත් වග කියන්න ඕනෑ කියලා. හේතුව තමයි, මේ 159 කියන අංකය ආවේ ඔබ එදා දවසේ ඡන්ද පොළට නොගිය නිසායි. ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත්කම සහ ඡන්ද ක්‍රමයේ වැදගත්කම අපේ පක්ෂ තේරුම් ගන්න ඕනෑ. ඒ පක්ෂයට මන්ත්‍රී ධුර 159ක් නොගොස් බහුතර බලය ගියා නම්, මේ සාකච්ඡාව මීට වඩා පුළුල් වෙනවා. නමුත් කරන්න දෙයක් නැහැ. එම නිසා මම මේ දේශපාලන ව්‍යාපාර සියල්ලේම පාක්ෂිකයන්ගෙන් ඉල්ලනවා, ඡන්දය දවසේ ඔබ ඡන්දය භාවිත කරන විට සැලකිලිමත් වෙන්න කියලා. එක දිනයක සිදු වන වෙනසකින් අවුරුදු 20ක්, 25ක්, 30ක් වෙන්න පුළුවන්, ඒ සියල්ලට බලපාන නීති සහ අණපනත් ඔබේ ජීවිතවලට බලපාන විධියට වෙනස් වෙනවා.

මේ අගවිනිසුරුවරයා රඳවා ගැනීමට දරන උත්සාහය ඇතුළේ එන ඊළඟ කථාව තමයි, එතුමාගේ නඩුව එතුමාටම අහන්න දුන්නා කියන එක. මම දැක්කා, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ඊයේ ගරු ජී.ජී. පොන්නම්බලම් මැතිතුමාට කියනවා ඒ නඩු ඇසීම සම්බන්ධව. එතුමා මෙතැනදී මතු කළ ප්‍රශ්නය තමයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ම විමසුවාම, ඒක තමන්ගේ වැඩක් පිළිබඳව තමන්ගෙන්ම ඇසීමක් වනවා කියන එක. ඔබතුමා කිව්වා, මේ වෙලාවේ ඒක හැර වෙන කරන්න දෙයක් නැහැ කියලා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120වන ව්‍යවස්ථාවේ තිබෙන වාක්‍යයක් මම ගැන කියන්න කැමැතියි. මට වඩා හොඳට ඔබ මේක දන්නවා. මම කෙටියෙන් එය කියන්නම්. එහි තිබෙනවා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

වෙනසක් කරන අවස්ථාවකදී 83වන ව්‍යවස්ථාවෙන් නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට සහ ජනමත විචාරණයක් මඟින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අදහස් කරන බවට අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක එම කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න අවශ්‍ය නැහැ" කියලා. ඔබේ කැබිනට් මණ්ඩලයට අවස්ථාව තිබුණා, මෙන්න මේ වගන්තිය ඔස්සේ ක්‍රියාත්මක වෙන්න. එහෙම වුණා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව අහන්න වෙන්නේ නැහැ. ඔබ විසින් ඒක නොකළ නිසා තමයි ඒ ප්‍රශ්නය ආවේ.

ඊළඟ එක තමයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ සියලු විනිසුරුවරුන් වාඩි වෙන්න කියන ඉල්ලීම කළේ මේ නඩුව පිළිබඳව වඩා හොඳ විනිශ්චයක් ලබා ගැනීම සඳහායි. කුමක්දෝ හේතුවකට අගවිනිසුරුවරයා ඒක කළේ නැහැ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ, අගවිනිසුරුවරයාගේ ක්‍රියාකලාපය පිළිබඳව මේ සභාව ඇතුළේ දිගින් දිගටම ප්‍රශ්න කරමින් තිබෙන අවස්ථාවක, - එතැනදී ඔබ කියන වාක්‍යය, ජ්‍යෙෂ්ඨත්වය නඩු අහන්න වැදගත් - අගවිනිසුරුවරයා ජ්‍යෙෂ්ඨත්වය භාවිත කරලා නැහැ මේ ඉතා වැදගත් නඩුව අහන්න. එහෙම නම්, මොකක්ද මේකෙන් පෙන්නුම් කරන්නේ? යළි යළිත්, සැකය! ආණ්ඩුවේ ක්‍රියා කලාපය මේ විධියට ක්‍රියාත්මක වෙද්දී, අධිකරණය තවත් පැත්තකින් ක්‍රියාත්මක වෙද්දී, මොකක්ද ඔබ අතර පවතින අන්තර් සබඳතාව කියන එක තමයි අපට මේ වෙලාවේ පෙනෙන්නට තිබෙන ගැටලුව.

ඊළඟ කාරණය මේකයි. අධිකරණය පිළිබඳව කථා කරද්දී, අපට බලපාන තවත් ප්‍රශ්න තිබෙනවා. අප මේ වෙද්දී ඉන්නේ විදේශ ආයෝජන හිඟ කාලයක. ඔබ තැනින් තැන කියන විධියට, ඔබේ දේශපාලන ව්‍යාපාරය වාමාංශික නැඹුරුවක් සහිත ව්‍යාපාරයක්. එහෙම නම් මේ වෙලාවේදී ලෝකයේ අනෙක් රටවලින් අපට ආයෝජන එන්නේ නැහැ. ලෝකයේ රටක් ආයෝජනය කරන්න යද්දී විශේෂයෙන්ම අධිකරණ පද්ධතිය පිළිබඳව බලනවා. ඒ බලන වෙලාවේදී පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමය, තමන්ගේ රටවල නීතිඥ සංගම්, අපේ රටේ අධිකරණය පිළිබඳව සැක සංකා මතු කරපු ගමන්, ආයෝජකයන් මේ රටට පැමිණීම තවතවත් දුර්වල වෙනවා. මොකක්ද ඔබ මේ වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය?

ඊයේ, ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා මතු කරපු කාරණාව ගෙන බලන්න. මේ විධියට ඔබ අත්තනෝමතික ලෙස -කිසිම කථාවක් නැහැ, අත්තනෝමතික ලෙස තමයි- තීන්දු ගන්නවා. සරලව කිව්වොත්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තේරෙන්න කිව්වොත්, එච්චරයි මේකේ කථාව. නිසාම් කාරියප්පර් මැතිතුමා කියපු කථාවට මම එන්නම්. අධිකරණය ලබා දෙන තීන්දු අනාගතයේ දවසක -සාර්ථක හෝ අසාර්ථක හෝ එහෙම නැත්නම් සාක්ෂි සහිත හෝ රහිත හෝ මොකක් හරි ක්‍රමයකට, සාධාරණ, අසාධාරණ මොකකින් හරි- ප්‍රතික්ෂේප කරලා, මේවා ඔබගේ ආණ්ඩුවට ඕනෑ තීන්දු, ඔබගේ ආණ්ඩුවේ මැදිහත්වීමෙන් ලබා දෙන තීන්දු කියන එක විත්තිකරුවන් ප්‍රකාශ කළොත්, අපට අනාගතයේදී සිද්ධ වෙනවා යළි කොමිෂන් සභා දාලා මේ පිළිබඳව සොයා බැලීමක් කරන්න. මෙන්න මේ බරපතළ ගැටලුව ඊළඟට නිර්මාණය වෙනවා.

මම ඒකට තව කැල්ලක් එකතු කරන්නම්. ඊළඟ ප්‍රශ්නය තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වගකීම් විරහිත කථා සහ ක්‍රියා කලාපය. පුළුවන් නම් ආණ්ඩුවේ ඊළඟ කථිකයන් කියන්න, මේ රටේ අනුරට කලින් හිටපු කවුරුහරි ජනාධිපති කෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ වෙනත් අධිකරණයක තීන්දු ගැන කියපු අවස්ථා තිබෙනවාද කියලා. මෙතුමා එක වෙලාවක කියනවා, "25වැනි දා අත්පුඩි ගහන්න ලැහැස්ති වෙන්න" කියලා. මම නිරන්තරයෙන්ම කියන, කුඩා මිනිසා. ඊළඟට කියනවා, "මේ නඩුවලට අදාළව අවුරුදු 25ක්වත් දෙන්න" කියලා. මෙය තමයි බලපෑම. ඊළඟට කියනවා, "මෙයා එළියේ ඉන්න ඕනෑ මිනිහෙක් නොවෙයි" කියලා. ඒ එළියේ ඉන්න ඕනෑ මිනිහා ඇතුළට ගියා. ඒක කිව්වේ අනුර. ඒක තමයි අනුර කියපු කථාව. "මෙයා එළියේ ඉන්න එපා" කිව්වා. ඒ මිනිහා ඇතුළට ගියා. ඒක තමයි ගැටලුව. දිගින් දිගටම අධිකරණයේ තීන්දුවලට ඔබ විසින් පත් කරන ලද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මැදිහත් වෙනවා කියලා සමාජයට පෙන්නුම් කරමින් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා ලොකු මිනිහෙක් වාගේ ඔබේ නායකයාට හැසිරෙන්න කියලා කියන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නවත්තන්න කියලා කියන්න. හේතුව- *[බාධා කිරීම්]* ඇයි, ඇයි? මොකක්ද මේ? මගේ වෙලාව මේ. *[බාධා කිරීම්]* මගේ වෙලාව ගන්නේ. කලබල වුණාද? *[බාධා කිරීම්]* මොකද, මොකද? කලබල වුණාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කාලය අවසන්ද? මොකද වුණේ? මගේ වෙලාව දෙන්න.

ඊළඟ කථාව තමයි,- *[බාධා කිරීම්]* මොකක්ද, මොකක්ද? මොකක්ද කියන්නේ? *[බාධා කිරීම්]* අනුර පොඩි මිනිහෙක් තමයි. අනුර පොඩි මිනිහෙක්. *[බාධා කිරීම්]* ලොකු මිනිස්සු කරන්නේ ඔය වැඩ නොවෙයි නේ. *[බාධා කිරීම්]* අනුර පොඩි මිනිහෙක්. එච්චරයි. දිගටම මම කියන්නේ ඕක. *[බාධා කිරීම්]* අනුරට මම යෝජනාවක් කරනවා. අනුර ලොකු මිනිහෙක් වුණා නම් ලාල් කාන්තට මෙතැන ඉන්න බැහැ. එයා වාමාංශික ව්‍යාපාරයක ඉඳලා, කිසිදු ධනවත්කමක් නැහැ කියලා ඉඳලා එකවරම විශාල ධනවතෙකු බවට පත් වුණේ අනුරගේ පොඩිකම නිසා. නැත්නම්

ඔබට ඉන්න බැහැ ඔතැන. *[බාධා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔය තිබෙන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔය ආරක්ෂා කරන්නේ. *[බාධා කිරීම්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු උපුල් අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලාල් කාන්ත ඇමතිතුමා.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මට අම්බුළුවාවෙන් හම්බ වුණේ. අම්බුළුවාවෙන් හම්බ වුණේ. මන්ත්‍රීතුමාට ඇහුණාද දන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු උපුල් අබේවික්‍රම මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.53]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය දෙස බැලුවාම පෙනෙනවා, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට යම් යම් අත් වැරැදීම් වෙලා තිබෙන බව. මට මතකයි, මර්වින් සිල්වා මැතිතුමා කොළඹ දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලලා ඡන්ද 2,500යි ලබා ගත්තේ. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයට ගිහින් ඡන්දය ඉල්ලුවාම ඡන්ද 150,000ක් ලබා ගත්තා. ඒ වාගේ තවත් වැරැදීමක් ගම්පහ ජනතාවට සිදු වෙලා තිබෙනවා. මොකද, ඒ වැරැදීමෙන් මේ වතාවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා ඉන්නවා.

තම ඉතිහාසය පුරා මේ පාර්ලිමේන්තු ක්‍රමය තුළත්, තමන්ගේ දේශපාලන ඉතිහාසය තුළත් අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේ භාවිතාව, එතුමාගේ දේශපාලන පරිණතභාවය එක්ක ගත්තාම අපට බලා ගන්න පුළුවන්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම සහ මේ වාගේ උපදේශකවරයෙකු එක්ක කටයුතු කිරීම හේතුවෙන් විපක්ෂ නායකතුමාට අත්වන ඉරණම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී අපට කනගාටුවට කාරණයක් තිබෙනවා. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වෙලා ගෙවී ගිය මේ අවුරුදු දෙකේ අපේ භාවිතාව තුළ අපි මෙම බලය පාවිච්චි කළේ කවර ආකාරයටද කියන එක මේ රටේ ජනතාවට නැවත නැවතත් තහවුරු කර පෙන්වා තිබෙනවා. මේ රටේ ජනතාව අප වෙත ලබා දුන් ඒ සාතිශය බලය, අප කොතරම් නිහතමානීව මේ රටේ ජනතාව වෙනුවෙන් පාවිච්චි කළා ද කියන එක නැවත නැවතත් අපි තහවුරු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර ආණ්ඩු කරපු මෙතුමන්ලා වාගේ, බලයට පත් වූ වෙලාවේ ඉඳලා තමන්ගේ බල වුවමනාවන් වෙනුවෙන්, එහෙම නැත්නම් තමන්ගේ කණ්ඩායම බලයට පත් කිරීමට කටයුතු කළ කල්ලිය වෙනුවෙන් අපි මේ බලය පාවිච්චි කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ඔබතුමා දකින්න ඇති, අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන ආ වෙලාවේත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැසිරිච්ච විධිය. විපක්ෂ නායකතුමා ඇතුළු මෙම කණ්ඩායම ඒ වෙලාවේත් විශාල කලබැගෑනියක් ඇති කරන්න හදනවා අපි දැක්කා, ඒ මඟින් අධ්‍යාපනය අසභ්‍යකරණය කරනවා කියලා. නමුත්, එවැනි කිසිදු අසභ්‍යකරණයක් නැහැ. මේ රටේ ජනතාවගේ අවාසනාවට සිටින විපක්ෂය ඇති කරපු ඒ කලබැගෑනිය නිසා අවාසනාවන්ත විධියට පසුගිය අවුරුද්දේ අපි ආරම්භ කරන්න හදපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දවසකින් හෝ ආපස්සට ගියා. ඒක අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින සියලු දෙනා දන්නවා. ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵල ඊළඟ මැතිවරණයේදී තමුන්නාන්සේලාට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළී සිටින අපේ දරුවන්ගේ දෙමව්පියන් සහ දරුවන් විසින් ලබා දෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ වාගේම, අප වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 700කින් වැඩි කරන්න ගිය වෙලාවේත් ඔය එන්සිනාලා, කුරුංගුරුංලා හැසිරිච්ච විධිය අපි දැක්කා. ඒ සම්බන්ධයෙන් ඔවුන් කථා කරපු විධිය, හැසිරිච්ච විධිය අනුව ඔවුන්ට නැවත මලෛයහම් ජනතාව අතරට යන්න බැහැ. ඒ වාගේම, අපේ ජනාධිපතිවරයා ඇතුළු අපේ ආණ්ඩුව කටයුතු කරන විධියට ඉදිරියේදී ඒගොල්ලන්ට උතුරු, නැඟෙනහිර පළාත්වලට යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාව සම්පූර්ණයෙන්ම විෂයට අනුව කථා කරන්න යොදාගන්න සූදානම් වෙලායි ආවේ. අධිකරණ ක්ෂේත්‍රයේ අප මේ ඇති කරලා තිබෙන ප්‍රතිසංස්කරණවලදී සෘජුවම බලපෑම්වලට ලක් වන

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

කණ්ඩායම් ගණනාවක් ඉන්නවා. මේ කණ්ඩායම් පිළිබඳවත් මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ මේ ප්‍රතිසංස්කරණවල ප්‍රමුඛ කණ්ඩායමක්, අප ඉලක්ක කළ කණ්ඩායමක් තමයි, නඩු කියන ජනතාව. ඒ වාගේමයි රිමාන්ඩ් බන්ධනාගාරගතව ඉන්න සැකකරුවන්, විනිශ්චයකාරවරුන්, නීතිඥවරුන්, උසාවි කාර්ය මණ්ඩල, විවිධ ආයතන වෙනුවෙන් උසාවිවල පෙනී සිටින නීති නිලධාරින්ට වාගේම නීතිපති දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසිය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළුව අධිකරණ ක්‍රියාවලියත් එක්ක සම්බන්ධ මේ වාගේ ආයතන, සංස්ථා ගණනාවකටම අප මේ කරන ප්‍රතිසංස්කරණ හරහා විශාල බලපෑමක් සිද්ධ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සාකච්ඡාව ආරම්භ කරලා අධිකරණ ක්ෂේත්‍රයේ ඇති කරපු මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය, ඒ සම්පූර්ණ project එක ඇතුළේ තිබෙන එක අවස්ථාවක් හැටියට තමයි අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ නිල කාලය - විශ්‍රාම ගත යුතු වයස දීර්ඝ කිරීම - පිළිබඳ සාකච්ඡාව එන්නේ. යටිතල පහසුකම් වර්ධනය කිරීම, කාර්ය මණ්ඩල පුළුල් කිරීම ආදි සියල්ල අපි ආරම්භ කරමින් ඉදිරියට යන අතරේ තමයි මේ ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකටත් යන්න අපට සිද්ධ වුණේ. අවාසනාවකට හෝ වාසනාවකට හෝ ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය, විශ්‍රාම යන වයස දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන අඩංගු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (5) අනුව්‍යවස්ථාවෙහි වන නිසා තමයි අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට යන්න සිදු වුණේ. අපි ඉතාම සද්භාවයෙන් මේ කටයුත්ත ආරම්භ කළාම, අවාසනාවකට වාගේ නන්නත්තාර වෙලා හිටපු විපක්ෂය -යන එනමං නැතිව හිටපු විපක්ෂය, සුන්බුන් විපක්ෂය -, මේ නීතිඥ සංගමය සහ අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමය මුල් අවස්ථාවේදීම - ආණ්ඩුව එක්ක, අධිකරණ ඇමතිවරයා එක්ක කිසිම සාකච්ඡාවක් නැතිව - ඒගොල්ලන් විසින්ම විවිධ සම්මන්ත්‍රණ පවත්වන්න, විරෝධතා ප්‍රකාශ ඉදිරිපත් කරන්න පටන් ගත්තා. ඒගොල්ලෝ මහානායක හාමුදුරුවන්ට ගිහිල්ලා කිව්වා, අපි Superior Courtsවල විනිසුරුවරුන්ගේ විතරයි විශ්‍රාම යාමේ වයස දීර්ඝ කරන්නේ කියලා. ඒකත් එක්ක යම්කිසි විරෝධයක් සමාජය තුළ නිර්මාණය වුණා. නමුත් මහානායක ස්වාමීන් වහන්සේලා මේ සම්පූර්ණ ක්‍රියාවලිය තේරුම් ගත්තාට පස්සේ නිහඬ වුණා. ඒ වාගේම තේරුම්ගන්න පුළුවන්, අවබෝධයක් තිබෙන හැම කෙනෙක්ම දැන් මේකට විරුද්ධ නැහැ. ඒ නිසා විපක්ෂය දැන් නන්නත්තාර වෙලා තිබෙනවා. ඊයේ දවසේ අපි ඒක පැහැදිලිව දැක්කා. මේ රටේ ජනතාවට ආණ්ඩුව පිළිබඳව තිබෙන පැහැදිලි විශ්වාසය හින්දා තමයි මේ කණ්ඩායම කියන කිසිදෙයකට උනන්දුවක් දක්වන්නේ නැත්තේ. ඒ වාගේම මේ බලපෑමට ලක්වෙන මේ රටේ සෑම කණ්ඩායමක්ම මේ ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් සුබවාදී බලාපොරොත්තු තබාගෙන ඉන්නවා.

අපේ ආණ්ඩුව කවරාකාරයේ ආණ්ඩුවක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපේ ආණ්ඩුව මේ ගෙවී ගිය කාලය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කිරීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන වෙනත් වරප්‍රසාද ඉවත් කිරීම සිදු කර තිබෙනවා. රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිකිරීම, මලෙයහම් ජනතාවගේ වැටුප් වැඩිකිරීම සිදු කර තිබෙනවා. මේ ආදී වශයෙන් රටේ ජනතාව පිළිබඳව ප්‍රමුඛස්ථානය ලබා දී කටයුතු කර තිබෙනවා. අපි කිසිම ක්ෂේත්‍රයක බලය පාවිච්චි කරලා නැහැ. ඊයේ විරෝධතාකරුවන්ට පාර්ලිමේන්තුවට එන්න ගේට්ටුවත් ඇරලා දුන්නා, ජනාධිපතිතුමා සහ ආරක්ෂක අංශ. අපට භය වෙන්න දෙයක් නැහැ. මේ වෙනකොට කඳුළු ගෑස් expire වෙලා තිබෙනවා. මේගොල්ලන්ට එකතු කරන්න ජනතාවක් නැහැ. මේගොල්ලෝ දැන් නන්නත්තාර වෙලා තිබෙන නිසා UN එකේ නීතිඥ සංගමයට මුවා වෙනවා, එහෙම නැත්නම් Commonwealth එකේ නීතිඥ සංගමයට මුවා වෙනවා. ඒ විධියට විවිධ ආයතනවලට මුවාවෙලා ඒ බෝඩ් අරගෙන දුවන්න හදනවා. ඒක අවාසනාවන්ත තත්ත්වයක්. මේ නිසා ඉතාම බරපතළ තත්ත්වයක් නිර්මාණය වුණා. දැන් මේගොල්ලෝ උත්සාහ ගන්නවා, අග්‍ර විනිශ්චයකාරතුමා ගැන සහ විනිශ්චය ආසනය ගැන සැක මතු කරන්න.

දයාසිරි මැතිතුමන්ලා නිදහස් අධ්‍යාපනය තුළින් අධ්‍යාපනය ලබලා විශ්වවිද්‍යාලයට ගිහිල්ලා, ඒ යුගයේ ඉඳලා මුළු ජීවිත කාලයම තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් පමණක් මෙහෙයවුවා මිසක් ජනතාව වෙනුවෙන් කිසිදු කැප කිරීමක් කළේ නැහැ. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසුව ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා එක්ක කටයුතු කළා. ඊට පස්සේ UNP එකට ගියා. ඊට පස්සේ සජබයට ගියා. ඊට පස්සේ පොහොට්ටුවට ගියා. ඒ විධියට එක එක පක්ෂවලට මාරු වුණා. ඒ වාගේම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නා. කිසිම ප්‍රතිපත්තියක් නැති, දේශපාලනයේ නන්නත්තාර වෙච්ච මිනිස්සුන්ට අද පුළුවන්කම ලැබිලා තිබෙනවා,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මම ඡන්දය දුන්නේ නැහැ කියලා. කරුණාකරලා දන්නේ නැතිව කථා කරන්න එපා මහත්තයෝ. ඔබතුමා නීතිඥයෙක් නේද? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් දැනගෙන කථා කරන්න. ඔබතුමාගේ නීතිඥකම කොහෙද තිබුණේ කියලායි මම මේ හොයන්නේ. දැනගෙන කථා කරන්න. මම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නේ නැහැ. හරිද? ඒ වාගේම මම එක එක පක්ෂවලට රිංගුවේත් නැහැ, ඔබතුමා වාගේ. ඔබතුමා පක්ෂයේ හිටියාද? ඔබතුමා හිටිය පක්ෂය මොකක්ද කියලා කියන්න. ඔබතුමාට පක්ෂයක් තිබුණාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපුල් අබේවික්‍රම මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
මුළු ජීවිත කාලය පුරාම ආත්මාර්ථකාමීභාවය වෙනුවෙන් වැඩ කරලා, -*[බාධා කිරීමක්]* අපේ සභානායකතුමා, බිමල් රත්නායක මැතිතුමා මේ රටේ නිදහස් අධ්‍යාපනය තුළින් අධ්‍යාපනය ලබා, උසස් පෙළ විභාගයෙන් ලංකාවෙන්ම තුන්වැනියා වෙලා

ඉංජිනේරු පියයට තේරී පත්වුණා. දැන් එතුමාගේ උපාධිය පිළිබඳව ප්‍රශ්න කරනවා. ලජ්ජා වෙන්න ඕනෑ. බඩ කපාගන්න ඕනෑ. මේ රටේ ජනතාව දන්නවා, තමන්ගේ මුළු ජීවිතයම, - *[බාධා කිරීමක්]* අපි ආඩම්බර වෙනවා, මේ වාගේ සභානායකවරයෙක් එක්ක වැඩකරන්න ලැබීම ගැන. පාර්ලිමේන්තු ඉතිහාසයේ මේ වාගේ සභානායකවරයෙක් හිටියාද? අපි එතුමා ගැන ආඩම්බර වෙනවා. ඔයාලගේ උපාධි, නීතිඥ වෘත්තිය හැම දෙයක්ම පාවිච්චි කළේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැම දෙයක්ම පාවිච්චි කළේ, රටේ ජනතාව වෙනුවෙන් නොවෙයි. මතක තබාගන්න, මේ ආණ්ඩුව, ජනතාවගේ ආණ්ඩුව. අපි අධිකරණයට අත තියන්නේ නැහැ. අපි මේ රටේ ජනතාවට ද්‍රෝහී වෙන්නේ නැහැ. තව අවුරුදු 5කින්, 10කින් බලන්න, අපේ ආණ්ඩුව මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාවිච්චි කරලා තිබෙන්නේ මොනවාටද කියලා. අපි ඒක භාවිතාවෙන් පෙන්වනවා.

මම හිතනවා, අපි ඒක ඔප්පු කරලා තිබෙනවා කියලා. මේ රටේ ජනතාවට අපි ආරාධනා කරනවා, මේගොල්ලන්ට වෙන දෙයත්, අපට වෙන දෙයත් බලන්න කියලා.

බොහොම ස්තුතියි

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.04]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳවත් විවාදයට ගන්නා අවස්ථාවේදී මට කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලු දෙනාම දන්නවා, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛකොටගත් මේ ආණ්ඩුව 1994 සිට, එහෙම නැත්නම් ඊට කලින් සිට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව දරපු මතයක් තිබුණා කියලා. ඒ මතය තමයි, අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්න ඕනෑය කියන මතය. එදා - 1994දී - චන්ද්‍රිකා බණ්ඩාරනායකට උදවු කළේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. 2010දී ජනරාල් ෆොන්සේකා එක්ක - අපත් එක්ක - එක වේදිකාවට නැග්ගේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. එදා - 2015දී - මෛත්‍රීපාල සිරිසේනට යහපාලන ආණ්ඩුව ගෙනෙන්න උදවු කළේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. එහෙම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කථා කරපු දේශපාලන ව්‍යාපාරයක්; "ජේ.ආර්. හදපු ඒකාධිපති ව්‍යවස්ථාව" ,"ජේ.ආර්. මරමු" කියලා පෙළපාළි ගිහිල්ලා මේ රටේ තරුණ තරුණියන් දහස් ගණනක් දංගෙඩියට කැන්දාගෙන ගිය දේශපාලන ව්‍යාපාරයක් අද වෙනකොට අර ජේ.ආර්. හදපු ඒකාධිපති ව්‍යවස්ථාව කියපු එකට සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. ලජ්ජයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේක බලාපොරොත්තු වුණේ නැහැ. තමුන්නාන්සේලාට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 159ක බහුතර බලයක් ලැබී තිබෙනවා. අපි හිතුවා, ඔබතුමන්ලා අලුත් ව්‍යවස්ථාවක් ගෙන එයි කියලා. නමුත්, අලුත් ව්‍යවස්ථාවක් ගෙනැල්ලා නැහැ. ඒ වෙනුවට විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික තර්කය විධියට ආණ්ඩුව ගෙනෙන්නේ මොකක්ද? ආණ්ඩුව කියනවා, අපි විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව වැඩි කරන්නේ නඩු ඉක්මනට අවසන් කරන්නය කියලා. ඒක තමයි ඔබතුමන්ලාගේ තර්කය. අධිකරණ ඇමතිතුමාගේ තර්කයත් ඒක තමයි. සභානායකතුමාගේ තර්කයත් ඒක තමයි. මුල සිට අග වෙනකල් හැම දෙනාගේම තර්කය ඒක තමයි. අපට කියන්න දැන්, විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව වැඩි කළාම දවසකට නඩු කීයක් අහන්න යනවාද? ඊ වෙනකල් නඩු අහනවාද? අපට ඒක කියන්නකෝ. දැන් නඩු කීයක් අහනවාද, විශ්‍රාම යන වයස වැඩි කළාම? එළි වෙනකල් නඩු අහනවාද? *[බාධා කිරීම්]* ඔව්, අන්න එහෙම කියන්න. අපි බලමු, හෙට ඉඳලා එළි වෙනකල් නඩු අහනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත කථාව ඒක නොවෙයි. ඇත්ත කථාව තමයි, අග්‍ර විනිශ්චයකාරවරයාගේ විශ්‍රාම යෑමේ කාලය දීර්ඝ කිරීම. එතුමාගේ කාලය දීර්ඝ කරන්න තමයි අවුරුදු දෙකකින් වයස් සීමාව වැඩි කළේ. ඒක තමයි ඇත්ත කථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ගෝඨාභය රාජපක්ෂත් මේක කළා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. මොකටද? බැසිල් රාජපක්ෂව පාර්ලිමේන්තුවට ගෙනෙන්න. එදා ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට එන්න බැරි වෙන්න සංශෝධනයක් අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ගෙනාවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ අර ඇමෙරිකානු පුරවැසියාව පාර්ලිමේන්තුවට ගෙනෙන්න. ඒ කියන්නේ, එක් පුද්ගලයෙක් වෙනුවෙන් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනාවා. දැන් තමුන්නාන්සේලාත් කරන්නේ ඒක නොවෙයිද? අග්‍ර විනිශ්චයකාරවරයාව තබාගන්න, එක් පුද්ගලයෙක් වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙනාවා කියලා තමුන්නාන්සේලාත් ඉතිහාසයට යනවා. මතක තබාගන්න. ඒක තමයි ඉතිහාසය. ඒක මකන්න බැහැ. ඇයි, දැන් මේකට හදිස්සි වෙන්නේ? අධිකරණය තමන්ගේ පාලනයට යටපත් කරගන්න, ඇයි මේ හදිස්සිය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී එනවා මේ රටේ සෞඛ්‍ය කප්පාදුව, අධ්‍යාපන කප්පාදුව. පාසල් වහනවා. රජයේ සේවකයින් එළියට දමනවා. රාජ්‍ය සේවය පෞද්ගලීකරණය කරනවා. *[බාධා කිරීම්]* එහෙම කරනකොට ජනතාවගේ නැඟීටීම සිදු වෙනවා. අන්න ඒ නැඟීටීම තළන්න, ඒක යටපත් කරන්න තමයි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඕනෑ කර තිබෙන්නේ. *[බාධා කිරීම්]* ඒක තමයි, අපි බලමු. අපි ඒක බලමු.

තමුන්නාන්සේලා අද ගෙනෙනවා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, හෙට ගෙනෙනවා ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත, අනිද්දාට ගෙනෙනවා ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත. ඔක්කොම පේළියට එන්නේ මොකටද? අර රුසියාවේ ස්ටාලින් හදපු රාජ්‍යය ලංකාවේත් හදන්න තමයි ඔය පේළිය එන්නේ. *[බාධා කිරීම්]* ස්ටාලිනුත් හැදුවා ඔය වාගේ රාජ්‍යයක්. ස්ටාලින් හදපු රාජ්‍යයට කියනවා, "ගෙස්ටාපෝ පොලීසිය" කියලා. ඔහු ඒ රාජ්‍යය හදලා, එක් රැයකින් නඩු අහලා 34දෙනෙකුව මැරුවා. මොකටද?

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ස්ටාලින්ට විරුද්ධව කුමන්ත්‍රණය කළා කියලා. මම මේ කාරණය මේ ආණ්ඩුවේ ඉන්න මාලිමාවේ මන්ත්‍රීවරුන්ට කියනවා. හොඳට මතක තබාගන්න, අද සම්මත කරන මේ පනතින් ඉස්සරවෙලාම නීතිය ක්‍රියාත්මක වන්නේ JVP එකට විරුද්ධ වන මාලිමාවේ මන්ත්‍රීවරුන්ට කියන එක. *[බාධා කිරීම්]* ඒ නිසා අගමැතිතුමිය පරිස්සමෙන් ඉන්න. *[බාධා කිරීමක්]* අගමැතිතුමිය පරිස්සමෙන් ඉන්න. *[බාධා කිරීමක්]* ඔබතුමිය පරිස්සමෙන් ඉන්න. *[බාධා කිරීමක්]* අපට නොවෙයි එන්නේ. අපට එන්නේ පස්සේ. *[බාධා කිරීමක්]* ඉස්සෙල්ලාම එන්නේ ඔයගොල්ලන්ට. *[බාධා කිරීමක්]* ඒක මතක තියාගන්න. අපට එන්නේ පස්සේ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙරහැර යනකොට ඔක්කෝගේම ඇස් ටික නිලංකාර වෙලා, පෙරහැර දිහා බලනවා නේ. තරගකාරී නැට්ටුක්කාරයෝ නටනකොට ඇස් ටික නිලංකාර වෙලා බලාගෙන ඉන්නවා, පෙරහැර දිහා. එහෙම පෙරහැර දිහා බලාගෙන ඉන්නකොට තමයි පොකට් එකට ගහන්නේ. ගෙදර ගිහිල්ලා බලනකොට පික්පොකට් ගහලා. අන්න ඒක තමයි දැන් මේ වෙන්නේ.

දැන් කියනවා, හොරු අල්ලනවා කියලා. හොරු අල්ලන්න මේ තිබෙන නීති ටික ප්‍රමාණවත්. අපි හදපු නීති ටික ප්‍රමාණවත්, හොරු අල්ලන්න. නමුත් හොරු අල්ලනවා කියලා මේ එන්නේ, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත්, අපේ රටේ අධිකරණයත් යටපත් කරන්න ගෙනෙන සංශෝධන. හොරු අල්ලනවාට අපි විරුද්ධ නැහැ; අපි කැමැතියි. අපි ගෙනාපු නීතියෙන් තමයි තමුන්නාන්සේලා හොරු අල්ලන්නේ. ඒකට අපි විරුද්ධ නැහැ. නමුත් හොරු අල්ලන මුවාවෙන්, මේ මොකක්ද කරන්න යන්නේ? අධිකරණයේ නිදහසත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත් යටපත් කරගන්නයි මේ යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේත්, අදත් ඇමතිවරුනුත් කිව්වා, අපි ආවාලු, නැවාලු, කෑවාලු, ගියාලු. ඊයේත් ඇමතිවරුන් ඒක කිව්වා. අදත් මේ ඇමතිතුමකු ඒක කිව්වා. ඔයගොල්ලනුත් ආවා නේ. ඔයගොල්ලන් ඇවිල්ලා මොනවාද වුණේ? ඔයගොල්ලන් ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඉතිහාසයේ ලොවෙත් නැති වෙන්න බිලක් ඇවිල්ලා තිබෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]* මොකක්ද වෙනස? *[බාධා කිරීමක්]* මොකක්ද, ඔයගොල්ලන්ගෙයි අපෙයි වෙනස? අපි පාර්සල් ගෙනියන්නේ නැහැ;

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]* වෙන වෙනසක් නැහැ. *[බාධා කිරීමක්]* ඒක තමයි වෙනස. වෙන වෙනසක් නැහැ. ඒක තමයි වෙනස. *[බාධා කිරීමක්]* ඔයගොල්ලනුත් ආවා, අපිත් ආවා, වෙනස ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ barriers ටික ඇරියා. Barriers ඔක්කෝම ඇරලා අපට යන්න කිව්වා. මේගොල්ලන් හිතාගෙන හිටියා, අපි barriers ටික කඩාගෙන - මේගොල්ලන් කිව්වා නේ, ඇවිල්ලා ගිනි තියන්න කියලා - පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගිනි තියයි කියලා. අපි එහෙම කළේ නැහැ. *[බාධා කිරීමක්]* අපි barriers කඩාගෙන ඇවිල්ලා එහෙම කළේ නැහැ. මොකද, අපි එහෙම නොකළේ? ආණ්ඩුවේ න්‍යාය පත්‍රයට වැඩ කරන්න අපි ලෑහැස්ති නැහැ. ඒ නිසා අපි ඒක පෙන්නුවා. අපි දවසක එනවා. Barriers කඩාගෙන එනවා. ඒ දවස තීරණය කරන්නේ, සමගි ජන බලවේගය බව මතක තියාගන්න. *[බාධා කිරීමක්]* ඒක තීන්දු කරන්නේ අපි. අපියි තීන්දු කරන්නේ, barriers කඩාගෙන එන එක. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාට ඕනෑ ඕනෑ විධියට අපි barriers කඩාගෙන එන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, barriers කඩපු ඉතිහාසයක් අපට තිබෙනවා. අපි තමයි "Gota, go home!" කියන සටන් පාඨය ගෙනාවේ. *[බාධා කිරීමක්]* 2022දී කොළඹට ලක්ෂ ගණනක් ගෙනැල්ලා, barriers කඩාගෙන ගිහිල්ලා, ගෝඨාභය රාජපක්ෂගේ ජනාධිපති ලේකම් කාර්යාලය වට කළේ, සමගි ජන සන්ධානය බව අපි මතක් කරන්න කැමැතියි. *[බාධා කිරීමක්]* අපි ගියාට පස්සේ තමයි අනික් ඔක්කෝම ආවේ. *[බාධා කිරීමක්]* අපි ගියාට පස්සේ තමයි අරගළය ආවේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා බැහැයි කිව්වා. ඔබතුමන්ලා එපාය කිව්වා. ඔබතුමන්ලා කිව්වා, ගෝල්ෆේස් යන්න එපාය කියලා. *[බාධා කිරීමක්]* අපි ගියා. *[බාධා කිරීමක්]* අපි ගියා. පස්සේ තමයි අරගළය ආවේ. ඒ ඔක්කෝම ආවේ පස්සේ. සමගි ජන සන්ධානය තමයි ඒ අරගළය පටන් ගත්තේ. අපි ඒකේ නායකයෝ. අපි තමයි "Gota, go home!" කියන සටන් පාඨය ගෙනාවේ. ඒ නිසා අපට barriers කඩපු ඉතිහාසයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගෝඨාභයගේ ජනාධිපති මන්දිරයට යන්න පළමුවැනි barrier එක, දෙවැනි barrier එක කඩාගෙන ගියේ අපේ පක්ෂයේ කාන්තාවක් - හිරුනිකා - බව මතක තියාගන්න. එතකොට ඔයගොල්ලන් හිටියේත් නැහැ. *[බාධා කිරීමක්]* හිරුනිකා ගියේ. *[බාධා කිරීමක්]* ඒ ඉතිහාසය මකන්න බැහැ. ඒ නිසා අපි තමුන්නාන්සේලාට මතක් කරනවා, barriers කඩන එකයි, barriers කඩාගෙන එන එකයි තීන්දු කරන දවස වැඩි ඈතක නැහැ කියලා. තමුන්නාන්සේලා කරන ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ නිසා, අධිකරණය යටපත් කිරීම, මේ රටේ ජනතාවගේ ජීවත් වීමේ අයිතිය නැති කිරීම, ජීවන බර වැඩි වීම, දරිද්‍රතාව වැඩි වීම උඩ මේ රටේ ජනතාවත් එක්ක අපි barriers කඩාගෙන යන දවසක් එනවා. එදාට අපි ඒ barriers ටික කඩාගෙන එන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.14]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේ අවසාන අවස්ථාව තමයි දැන් මේ තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු

මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි දැක්කා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව විශාල කතිකාවක් එළියේ විවිධ කණ්ඩායම් අතර ඇති වුණු ආකාරය. තනි වචනයෙන් කිව්වොත්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් බිල්ලෙක් මවලා තනිකර ඒකේ තිබෙන අදහස් විකෘති සහගත අදහස් බවට පත් කරලා ජනගත කරන්න උත්සාහ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ජවනිකාව ඊයෙන් අවසන් වුණා. මේකෙදි මට මතක් වෙන්නේ මේකයි.

ඔබතුමාත් මේ කථාව අහලා ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර මංගල යෝජනාවලට සමහර මාමලා විරුද්ධ වුණාම පොඩි ප්‍රශ්නයක් ඇතිවනවා. මාමා විරුද්ධයි, මංගල යෝජනාවට. මාමා මංගල යෝජනාවට විරුද්ධ වුණත්, පස්සේ මඟුල කෙරෙන්න යනවා. මඟුල කෙරෙන්න යනකොට මාමා කරන්නේ හෙමින් සැරේ ඒ මඟුලට සෙට් වෙන එක. මාමා ඒකට සෙට් වෙලා එතැනදී බයිට් එකට මාළු කට්ලට් එකක් එහෙම කාලා, අනෙක් අය ළඟට ගිහිල්ලා කථා කරලා, මඟුල් ගෙදර කථාවකුත් කරලා, හොඳටම බීලා, සරම නැතුව ගෙදර යනවා. ඊයේ වුණේත් මෙන්න මේ වැඩේමයි.

යම් පිරිසක් එළියේ ලොකු සද්දයක් දාන්න හැදුවා. ඒගොල්ලෝ මෙලෝ රහක් නැති සෙට් එකක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලෝ දන්නේත් නැහැ, මොකකටද මේ එන්නේ කියලා. "අනුර දිසානායකට ජයවේවා" කියලාත් ඒගොල්ලන් කියනවා. "යකෝ, මෙහෙම ප්‍රජාතන්ත්‍රවාදයක්, මාර ප්‍රජාතන්ත්‍රවාදයක්, අපට පාර්ලිමේන්තුවට 'wholesale' එකේ යන්න දීලා" කියලා කණ්ඩායමක් කෑ ගහමින් දුවගෙන එනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කථාව ඊයෙන් අවසන් වුණා. මාමා අකැමැතිව ගිය මඟුල් ගෙදර වාගේ තමයි ඒ සිද්ධිය. මෙතැනටත් ඇවිල්ලා කාලා බීලා ඒ අය ගියා. මේ ගරු සභාවේ විපක්ෂයේ වුණත් කලින් තිබ්බ සද්ද, කථා මොකුත් නැහැ. ඊට පස්සේ ඒගොල්ලන්ගේ ඒ කථාවල් සරල කරලා බොහොම උජාරුවට, බොහොම යටහත් පහත් ලෙස මේ ගරු සභාවේ කථා කරන එක විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තිබෙන සංකේතාත්මක විරෝධතාවක් ලෙස තමයි අපට පෙනෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ කථාවේ chapter closed; ඒක ඉවරයි. දැන් එළඹීලා තිබෙන්නේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අවසාන අවස්ථාවට. මේකට කුමන විරෝධතා තිබුණත්, ඒ විරෝධතා ආපස්සට හරවන්න පුළුවන් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී මම විශේෂයෙන් යම් පිරිසකට ස්තුතිවන්ත වනවා. මෙන්න මේ විකෘතිසහගත අදහස්වලට එරෙහිව සත්‍ය අදහස ජනගත කරන්න ජන වරමේ නීතිඥයෝ කටයුතු කළා. ඔවුන් හැම දිස්ත්‍රික්කයකම ඒ මතය තහවුරු කරනවා මම දැක්කා. ඒ විතරක් නොවෙයි. විදේශීය රටවලත් එහෙම කළා. එංගලන්තයේ නීතිඥ කණ්ඩායම් මේ ගැන කථා කළා. විශේෂයෙන්ම මේ ගැන තදට කථා කරපු කැනඩාවේ නීතිඥවරියක් හිටියා, නයෝමි කියලා. ඒ වාගේම මේ ගැන කථා කරපු සාලිය පීරිස් වැනි නීතිඥ මහත්වරුනුත් හිටියා. ඒ විතරක් නොවෙයි. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි සහෝදරයා වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී හිටපු ජනාධිපති නීතිඥ නයිජල් හැච් මැතිතුමා, නීතිඥ මොහාන් වීරකෝන් මැතිතුමා මේකේ තිබෙන පදනම හරියටම ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළා. ලිඛිත දේශනවල තිබුණු ඔවුන්ගේ අදහස් මේ නඩු තීන්දුවේත් ඇතුළත් වෙලා තිබෙනවා. ඒවා තමයි ඒ සම්බන්ධයෙන් තිබෙන මූලික අදහස්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ 68වැනි පිටුවේ ලස්සන වාක්‍යයක් තිබෙනවා. ඒකෙන් මෙතුමන්ලාට විද්‍යාත්මකව හොඳට කන පැලෙන උත්තරයක් දී තිබෙනවා. මොකක්ද ඒකේ තිබෙන්නේ? එහි 63වැනි පිටුව සහ 68වැනි පිටුව දෝලනය වෙනවා. එහි 63වැනි පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "The Constitution is a living document which must be able to cater to changing social needs from time to time."

ඒ කියන්නේ ඕනෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කාලානුරූපව වෙනස් විය යුතුයි කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඉහළම අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 62යි. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වනකොට ඒක අවුරුදු 63 කළා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ජේ.ආර්. ජයවර්ධන මහතා ඒක අවුරුදු 65 කළා. දශක 4කට විතර පස්සේ අපි ඒක අවුරුදු 67 කරලා තිබෙනවා. ඒක විද්‍යාත්මක නැද්ද? මේ තිබෙන දත්ත සැලකිල්ලට අරගෙන තමයි අපි එවැනි දෙයක් ඇතුළත් කරලා තිබෙන්නේ. වසන්ත සමරසිංහ ඇමතිවරයා කිව්ව නිසා මම විදේශීය උදාහරණ ටික ගැන කියන්නේ නැහැ. විදේශීය උදාහරණ ගත්තත් කැනඩාවේ ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 75යි; ඕස්ට්‍රේලියාවේ අවුරුදු 70යි; New Zealand, අවුරුදු 70යි; South Africa, අවුරුදු 70යි. මේ විධියට හැම විදේශ රටවලම මේ වයස් කාණ්ඩ ටික තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ 84වන පිටුවේ සහ තවත් ස්ථාන කිහිපයක වචනයක් තිබෙනවා, "legislative bribe" කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තවශයෙන්ම මේක තරම් නරකට පාවිච්චි කරපු වචනයක් තවත් නැහැ. මේක "විනිශ්චයකාරවරයන්ට දීපු අල්ලසක්" කියලා තමයි තිබෙන්නේ. මේක හරියටම නඩු තීන්දුවේ හත්අට තැනක පැහැදිලි කරලා තිබෙනවා, ඔවුන්ට වාහන ලබා දීම, වැටුප් වැඩි කිරීම, පාසලකට ළමයෙක් ඇතුළත් කිරීමට ඇති අයිතිවාසිකම යන ඒ සියලු අයිතිවාසිකම් bribe එකක් වෙන්නේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියානු අධිකරණයෙන් තමයි සමහර යෝජනා ඇවිල්ලා තිබෙන්නේ. අපි විධායකයෙන් මේ ටික යෝජනා කරනවා. සමහර අධිකරණවලිනුත් යෝජනා වෙලා තිබෙනවා. ඒ නිසා මේ "ව්‍යවස්ථානුකූල අල්ලස" කියන වචනය ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ 86වන පිටුවේ තිබෙනවා, "court capture" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම සරලව මම ඒ ගැන කියන්නම්. දැනටත් අසුන් ගෙන සිටින සියලුම විනිසුරුතුමන්ලාගෙන් බහුතරයක් දෙනා අපේ ආණ්ඩුවෙන් පත් කරපු උදවිය නොවෙයි. ඒ, කලින් ආණ්ඩුවල විනිශ්චයකාරවරුන්. එතකොට අපිට වඩා වාසි වෙන්නේ එවැනි විනිශ්චයකරුවන් විශ්‍රාම ගැන්වීම. නමුත්, අපි යෝජනා කරන්නේ මොකක්ද? ඒ විනිශ්චයකරුවන්ට තවත් අවුරුදු දෙකක් දීම. එහෙම නම්, ඔය තර්කය නිෂ්ඵල තර්කයක්. ඒක අපි බලාපොරොත්තු වන අරමුණ නොවෙයි. ඒ නිසා ඔය court capture කියන කථාව අපිට අදාළ වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙන්න මේ කරුණුවලට යටත්ව මම යම් සටහනක් අරගෙන ආවා, මේ ගරු සභාවට කියන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට, දෙන්න තරම් පිළිතුරක් මෙතැන ඉතිරි වෙලා නැහැ. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒවාට උත්තර දුන්නා. මතු කරන තර්කයකුත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන මෙහෙම කියන්න කැමතියි. 21 වතාවක්, මේ රටේ දේශපාලනයේ අයිතිකරුවන්

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

කියලා හිතාගෙන හිටපු පරම්පරාවක් විසින් සංශෝධනය කරන ලද මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පළමු වතාවට තමයි සාමාන්‍ය ජනතාව නියෝජනය කරන දේශපාලන පරිවර්තනයක් යටතේ සංශෝධනය කරන්නට අපි මේ උත්සාහ කරමින් ඉන්නේ. ලෙයින්, යකඩෙන් මර්දනය කරමින් ව්‍යවස්ථා සංශෝධන සම්මත කළත් දේශපාලන සංස්කෘතියක් තිබුණු, ඒ සංස්කෘතිය අත්විඳපු, ඒ නිසාම බෝනස් ජීවිත කාලයක් බුක්ති විඳින අපට අද සිද්ධ වෙලා තිබෙනවා, ඒ දේශපාලන පරවේණි උරුමක්කරුවන්ගේ අපහාසයට, උපහාසයට හා බාධාවන්ට එරෙහිව ව්‍යවස්ථා සංශෝධනයක් වෙනුවෙන් පෙනී සිටින්න. එහෙම වෙලා තිබෙන්නේ මම ඔය කියපු පරවේණි උරුමක්කාරයෝ හතර ගාතේ වැටිලා ඉන්න තත්ත්වයක් යටතේ.

පරවේණි උරුමක්කාරයන් ගැන මම මේ කියන කථාව මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ රටට 1931දී සර්වජන ඡන්ද බලය ලැබුණාට ඒ ඡන්ද බලය පාවිච්චි කරලා කවුන්සලයට ගියේ මේ රටේ පොදු ජනතාව නොවෙයි. මුලදී ඒකට එංගලන්තයේ ඉගෙන ගෙන එන්න ඕනෑ වුණා. රටේ පොදු ජනතාවට තිබුණේ ඡන්ද දවස විතරයි. අනෙක් දවස් සේරම තිබුණේ පත් වුණු නියෝජිතයන්ට. ඒ නියෝජිතයන් වුණේ හැම විටම පරවේණි උරුමක්කාරයන්ගේ නියෝජිතයන්. එක් එක් වලව් නියෝජනය කරමින්, එක් එක් පරම්පරාවන් නියෝජනය කරමින් කවුන්සලයට යන්න පුළුවන් වුණේ යම් කණ්ඩායමකට විතරයි. අන්න ඒ කණ්ඩායම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පරවේණි උරුමකරුවන් විධියට මූලිකවම හඳුනන්නේ. ඉඳලා හිටලා යම් විශේෂ පුද්ගලයෙක් නොහිටියා නොවෙයි. නමුත්, ඔවුනුත් එක්කලා පරවේණි උරුමක්කාරයන්ගේ ඩියුටිය ඒ උරුමකාරයන්ටත් වැඩිය හොඳට කළා, නැත්නම් ප්‍රතික්ෂේප කළා. ඒ ටික විතරක් කියලා නතර කළොත් මේ පරවේණි උරුමකරුවන් ගැන හරිම අදහස එන්නේ නැහැ. මේ පරවේණි උරුමකරුවන්ගේ මූලික ලක්ෂණයක් තමයි දේශපාලන නියෝජනය. දේශපාලන තනතුරු ආදිය පවුලේ බූදලයක් විධියට තබා ගැනීම. සැමියාගෙන් බිරිඳට, තාත්තාගෙන් දුවට, සමහර වෙලාවට බිරිඳගෙන් සැමියාට, මාමාගෙන් බෑණාට ආදී වශයෙන් පවුල ඇතුළේම මේ දේශපාලන තනතුරු බූදලයක් වාගේ, දේපොළක් වාගේ තියා ගන්න මේ පරවේණි උරුමක්කාරයින් දිගටම කටයුතු කළා. ඒ වාගේම මේ පරවේණි උරුමක්කාරයින් බොරුවට දෙකට බෙදිලාත් හිටියා. එක කණ්ඩායමක් ජනතාවට එපා වෙනකොට අනෙක් කණ්ඩායම හිටියා, බල හුවමාරුව කර ගන්න. පෙනුමට නයි පොළොංගු වෛරයක් තිබෙනවා වාගේයි පෙන්නුවේ. එහෙත් එක කණ්ඩායමක ලේලි කෙනෙක් හොර සල්ලි අච්චු ගහලා අහු වුණාම, අනෙක් කණ්ඩායමේ මාමා ඇවිත් අර ලේලිව බේරා ගන්නවා. එක කණ්ඩායමක "සිරිලිය" නැන්දා කෙනෙක් "මෙත් මල් පිබිදේවා" කියලා කෝටි ගණනක් යටිමඩි ගහනකොට, අනෙක් කණ්ඩායම ඒක නොදැක්කා වාගේ ඉන්නවා. එක කණ්ඩායමක බෑනා කෙනෙක් බටලන්දේදී මිනී මරලා අහු වුණාම අනෙක් පිලේ නැන්දා ඒ ගැන හෙළිදරව් කරපු කොමිෂන් සභා වාර්තාව හමස් පෙට්ටියට දා ගන්නවා. මම උදාහරණයක් ගන්නම්. මේ මගේ අතේ තිබෙන්නේ අපේ රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. කරුණාකරලා එහි 92වන ව්‍යවස්ථාව බලන්න. එය ජනාධිපති ධුරයට අදාළයි. 92 (අ) යටතේ තිබෙනවා, වයස සම්බන්ධව. 1978 ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයෙකු වීමට අවශ්‍ය වයස විධියට තිබුණු "අවුරුදු තිහක්වත් විය යුතුයි" කියන ව්‍යවස්ථාව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් යහ පාලන ආණ්ඩුව යටතේ, "අවුරුදු තිස් පහක්" කළා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ලෙස පත් වුණු ගමන් ආපහු වයස් සීමාව අවුරුදු තිහක් කළා. ඒ මොකද කියලා හොයලා බැලුවාම, රාජකීය දෛවඥයා කියා තිබෙන්නේ, ඊනියා උරුමක්කාරයන්ගේ මහ පවුලේ පොඩිම එකාට තමයි රාජ යෝගය තිබෙන්නේ කියලා. වැඩිමලා මේ හිරේ ඉන්න විධියට වැඩිමලාට නම් රාජ යෝග නැහැ කියන එක තමයි ඇත්ත කථාව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට ඒ පොඩි එකාට ජනාධිපති වෙන්න තමයි ආණ්ඩු බලය ගත්ත ගමන් ජනාධිපති වීමේ වයස තිස්පහෙන් තිහට අඩු කළේ. එතකොට ව්‍යවස්ථා සංශෝධනය ඇත්තටම කරලා තිබෙන්නේ කවුද? පාර්ලිමේන්තුවද? නැහැ. එහෙම නම් ජනාධිපතිද? නැහැ. එහෙම නම් කවුද? සුමනදාසයි, සිරිලියයි. ඔන්න මේ රටේ ව්‍යවස්ථා සංශෝධන වෙච්ච හැටි. එතකොට ජනමත විචාරණ ඉල්ලුවේත් නැහැ, උද්ඝෝෂණ සහ විරෝධතාත් නැහැ. සිරිලිය සුමනදාස ව්‍යවස්ථා සංශෝධනය හැඟීම්බරව සම්මත වුණා.

ඊළඟ එක තමයි, 92 (ඇ) අනුව්‍යවස්ථාව සංශෝධනය කිරීම. ඒකෙනුත් ධුර කාලය ගැන කියැවෙන්නේ. 1978 ව්‍යවස්ථාවේ ඉඳලාම තිබුණේ කෙනෙකුට දෙවතාවකට වඩා ජනාධිපති ධුරයේ කටයුතු කරන්න බැහැ කියලා. එය දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වෙනස් කළා, විරාත් කාලයක් මහින්දටම ජනාධිපතිකම අවශ්‍යයි කියලා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එලෙස බැහැ කියලා ආපහු වෙනස් කළා. ඒ එක අවස්ථාවකදීවත් ජනමත විචාරණයක් පැවැත්වූවාද? නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ද්විත්ව පුරවැසියෙකුට මේ රටේ ඇමති ධුර දරන්න පුළුවන්, ඡන්දය ඉල්ලන්න පුළුවන් කියලා ව්‍යවස්ථාව සංශෝධනය කරනකොටත් ඊනියා උරුමක්කාරයන්ගේ බත්බැලයෝ කාටවත් මතක් වුණේ නැහැ, ජනමත විචාරණයක් ඉල්ලන්න. ඇයි, ඒ? උරුමක්කාරයෝ නේ. කපුවා දේවාලේ මොකක්ද කළාට ගඳ නැහැ කිව්වා වාගේ සේරම හිතුණු හිතුණු විධියට කිසි ප්‍රශ්නයක් නැතුව වෙනස් කළා. ඒකට මොකද, අද අධිකරණය ගැන, නීතියේ දෙවගන ගැන තිබෙන කරුණාව බලන්න.

දේවාලය කිව්වාම තවත් සිද්ධියක් මතක් වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වෛර රළේ එක පුත්‍ර රත්නයක් දේවාලයක බස්නායක නිලමේ කෙනෙක් වුණා. ඒත්, එය දේව භක්තියට නොවෙයි. හොර හිත දරා ගන්න බැරිව, දෙවියන්ටත් ගේමක් දෙන්න හිතාගෙන. නමුත්, විහාර හා දේවාලගම් නීතියට අනුව මහ ඇමතිවරයෙකුට එහෙම තනතුරක් දරන්න බැහැ. දැන් මොකද කරන්නේ? ඒකත් රහයි, මේකත් රහයි. එකක්වත් අත්හරින්න හොඳ නැහැ. දෙකම රස කෑම. අන්තිමේදී විහාර හා දේවාලගම් පනතට රෙගුලාසියක් ගෙනාවා, "කතරගම දේවාලය හැර" කියලා. නීතියත් නැව්වා, දෙවියොත් නැව්වා. එහෙව් වෛර රළක් අද ආයෙමත් සුදු රෙදි ඇඳගෙන එනවා, අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය ගැන කථා කරන්න. ඒ මොන විහිළුවක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි දෙකක් දෙන්න.

අද නීතියේ දෙවගන කෙසේ වෙතත්, මේ වෛර රළ එදා හිටපු අග විනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මියව තනතුරින්

පහ කළේ වෙනම කමිටුවකින් නඩු අහලා. ඒ කළ අකටයුතුකම් මොකුත් මතක නැති නිසා ඊනියා උරුමක්කාර වෞර රැලයි, එහි වර්තමාන නායකයොයි අද අධිකරණය ගැන අඬන ඇඬිල්ල දැක්කාම තේරෙනවා, ඔවුන්ට කොයි තරම් අහිමි වීමක්ද වෙලා තිබෙන්නේ කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක දේශපාලන පිටියේ විතරක් නොවෙයි, අධිකරණ ක්‍රියාවලිය ඇතුළෙත් සිද්ධ වුණා. මුළු වෙරළබඩ කලාපයම මුහුදට ගහගෙන ගිහින් අපි දින 54කින් මුහුදුබඩ රේල් පීල්ල හදනකොට අවතැන් වෙච්ච ජනතාවට දෙන්න තිබුණු සල්ලි ටික වෞර රැලේ නායක මාමා හොරා කෑවා. අධිකරණයේදී ඒ මාමා නිදහස් වුණා. ඒ අවුරුද්දේම පොල් ගෙඩියක් හොරකම් කළ මහින්ද කියලා වෙන මනුස්සයෙක් මාස හයකට හිරේ ගියා. අරුම පුදුම කථාව පටන් ගන්නේ ටික දවසක් ගියාමයි. අධිකරණයේ ඉහළම කෙනා වෙච්ච අග විනිසුරු කියනවා, "අපරාදේ මම හොරාට යන්න ඇරියේ" කියලා. හේතුව මොකක්ද බැලින්නම්, අග විනිසුරුයි අර හොරයි තරහ වෙලා. යාළු නම් හොරා නිදහස්, තරහ නම් හොරා ගස්. මේවා සුරංගනා කථා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ, මේ රටේ සිද්ධ වුණු දේවල්.

පාර්ලිමේන්තුවේදී, පාර්ලිමේන්තු පාරෙදී හා අලුත්කඩේදී - හැම තැනකදීම - මේ වාගේ තවත් නහුතයක් දේවල් සිද්ධ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කියන්නේ, ඊනියා උරුමක්කාර වෞර රැල පැතිරිලා තිබුණේ ව්‍යවස්ථාදායකයත්, විධායකයත් කියන අංශ දෙකේ විතරක් නොවෙයි. අධිකරණය කියන අංශයේත් ඔවුන් පැතිරිලා හිටියා. ඉතින්, ඒ අය විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අධිකරණය බේරා ගන්න සටන් කිරීම අපි කොහොමද තේරුම් ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒක තේරුම් ගන්න තිබෙන එකම ක්‍රමය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ප්‍රශ්නයේ ඇත්ත හේතුව හඳුනා ගැනීම. ඇත්ත හේතුව තමයි, නීතිය අයිති අපටයි කියලා හිතාගෙන ඉන්න ඊනියා උරුමක්කාර වෞර රැල කලබල වීම. ජනතාව අපට ජන වරමක් දුන්නේ නැවත එම වෞර රැලට ජන වරම පාලනය කිරීමේ අයිතිය දෙන්නද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එහෙම නැහැ. අපි මේ ජන වරමේ සැබෑ අදහස තේරුම් ගත්ත මිනිස්සු. අපි එහි සැබෑ අවශ්‍යතාව තේරුම් ගත්ත මිනිස්සු. අපට බැහැ, ජන වරම shopping bagsවල දාලා එක එක්කෙනාට දෙන්න; අපට බැහැ ජන වරම ෆයිල්වල දාලා එක එක්කෙනාට දෙන්න. අපි ජන වරමට වග කියනවා. අපිත් එක්ක තරහ වෙන්න ඒකත් හේතුවක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය තමන්ටයි කියලා හිතා ගෙන ඉන්න වෞර රැළට නීතියේ ආධිපත්‍යය ගිලිහීමයි, ඒ ආධිපත්‍යය වෙනුවෙන් ඔවුන් කරපු ඉල්ලීම් අපේ රජය විසින් පිළිනොගැනීමයි කියන කාරණා දෙකම නිසා ඒ වෞර රැළ අපිත් එක්ක තරහා වීමේ ප්‍රතිඵලය විධියට තමයි විසි දෙවන ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව විරෝධය පුපුරා ගියේ. මම කියනවා,-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරමු, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අවසන් කරන්න හදන්නේ. එක දෙයක් කියලා අවසන් කරනවා. මොකක්ද ඒ දේ? මේ රටේ මිනිස්සු, මේ ගරු සභාව මතකයේ තබා ගත යුතු දින තුනක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක දිනයක් තමයි, 2024 සැප්තැම්බර් 21වන දා. එදින මේ වෞර රැළට මේ රටේ විධායකය අහිමි වුණා. 2024 නොවැම්බර් 14වැනි දා මේ රටේ වෞර රැළට අහිමි වුණා මේ රටේ පාර්ලිමේන්තුව; ව්‍යවස්ථාදායකය. අදත් ඓතිහාසික දිනයක්. මොකද, 2026 සැප්තැම්බර් 25වැනි දා මේ වෞර රැළට අධිකරණයත් අහිමි වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා ඒ දින තුන මේ වෞර රැළට තීරණාත්මක දින තුනක්. ඒ වාගේම මේ රටේ පොදු ජනතාවටත් තීරණාත්මක දින තුනක්. විධායකය, ව්‍යවස්ථාදායකය සහ දැන් අධිකරණය එහි සැබෑ උරුමකරුවන් වන ජනතාවගේ පරමාධිපත්‍යට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම හිමි වන දවස් විධියටයි මේ දවස් තුන ඉතිහාසගත වෙන්නේ. අද ඒ තෙමඟුලේ අවසන් දවස, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.30]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැස්සක් වැහැලා පෑව්වා වාගේ. කෙසේ නමුත්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විපක්ෂය වෙනුවෙන් අද දවසේ අවසාන කථාව කිරීමට සහ අදහස් දැක්වීමට ලැබීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා සහ සන්තෝෂ වෙනවා.

අපට මේ අහහරුවාදා මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අධිකරණයේ තීරණය දැන ගන්න ලැබුණා. අපි නම් තීරණය දැන ගෙන හිටියේ නැහැ. අපි බලා ගෙන හිටපු විධියට අඟහරුවාදා ඒක නිවේදනය වුණා. නමුත්, ආණ්ඩුවේ පිරිස නම් දැන ගෙන හිටියා. ඒ ගැන තැන් තැන්වල කියෙව්වා. ඒ කියෙව්වා වාගේම මේකට කිසිම ජනමත විචාරණයක අවශ්‍යතාවක් නැහැ. ඒ අනුව මේක තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරන්න පාර්ලිමේන්තුවේ විවාදයට ඉදිරිපත් කරලා තිබෙනවා. එක අතකින් කනගාටුයි. එක අතකින් සන්තෝෂ වෙනවා, ආණ්ඩුවේ කිහිපදෙනෙක් ඒක දැන ගෙන හිටපු එක ගැනත්.

විශේෂයෙන් අපේ අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මැතිතුමා ඇතුළු සියලුදෙනා මේ සංශෝධනය ගැන කථා කරද්දි කියපු එක දෙයක් තමයි, මේ සමස්ත ප්‍රතිසංස්කරණයක කොටසක් කියන එක. තව වැඩ ගොඩක් තිබෙනවා, මෙය එක කොටසක්ය කියන එක තමයි කියාගෙන ගියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කිව්වාම මට මතක් වෙන්නේ මේකයි. අපි තෑග්ගක් ඔතන්න තැගි ඔතන කොළයක් - wrapping paper එකක් - ගන්නවා. හැබැයි, කොළය වෙනස් වුණාට ඇතුළේ තිබෙන තෑග්ග වෙනස් වෙන්නේ නැහැ. එකම දේ, wrapping paper එකෙන් ඔතපු එක තමයි. අර කියන අනෙක් සියලු දේවල් මේ තෑග්ග ඔතන්න ගත්ත wrapping paper එක කියලායි මට නම් හිතන්නේ. මම පුළුවන් විධියට මේක පැහැදිලි කරන්නට උත්සාහ කරන්නම්.

දැන් මේ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය සාර්ථකව කර ගන්න ඕනෑය, නීතියේ ප්‍රමාදය නතර කරන්න ඕනෑය, හොරු අල්ලන්න ඕනෑය, මත්ද්‍රව්‍ය නවත්වන්න ඕනෑය කියන ඒවාම නේ, ඊයෙයි අදයි කියෙව්වේ. අපි එපා කියලා තිබෙනවාද? ශ්‍රී ලංකා නීතිඥ

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

සංගමය එපා කියලා තිබෙනවාද? සමගි ජන බලවේගය විධියට අපි එපා කියලා තිබෙනවාද? පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමයේ අය එපා කිව්වාද? නැහැ. ආසියානු නීතිඥ සංගමය කිව්වාද? නැහැ. මහානායක හිමිවරුනුත් එහෙම කිව්වේ නැහැ. කවුරුත් ඒකට එපා කියලා නැහැ. එම නිසා ඒකම කියවන්න එපා. මොකද, අපි ඒක කරන්න එපා කිව්වේ නැහැ. ඒක කරන්න ඕනෑ. නීතියේ ප්‍රමාදය නවත්වන්න ඕනෑ. මේ මිනිස්සු දුක් විඳිනවා, මේ රටේ අධිකරණවල නඩු ප්‍රමාදය නිසා. ඒක නැතුව නොවෙයි නේ. අපි දන්නවා නේ. නීතිඥවරු මෙතැනත් ඉන්නවා. ඒ නිසා කවුරුත් ඒකට එපා කියලා නැහැ. ඒක අනිවාර්යයෙන් කරන්න. හැබැයි, අපි ඇහුවේ එක දෙයයි. නඩු ලක්ෂ 11ක් තිබෙනවා නම්, ලක්ෂ 8ක් විතර තිබෙන්නේ පහළ අධිකරණවල නම් -මම මේ සරලව කියන්නේ තේරෙන්න - මේකෙන් ඒ නඩු ප්‍රමාදය වැළැක්වෙන්නේ කොහොමද කියන එකයි අහන්නේ. මහෙස්ත්‍රාත් අධිකරණ සංඛ්‍යාව වැඩි කළා නම්, විනිසුරුවරු සංඛ්‍යාව වැඩි කළා නම් අපට ඒක හිතා ගන්න පුළුවන්. ඒකත් කරනවාලු. හැබැයි, උඩ තැනින් තමයි පටන් අරගෙන තිබෙන්නේ. ඒක තමයි මේ කියන්නේ. ලොකු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක කොටසක් කියන එක තමයි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 මැයි 8වැනි දා මේ පාර්ලිමේන්තුවේ මම ප්‍රශ්නයක් අහලා තිබෙනවා, "ශ්‍රී ලංකා අධිකරණ පද්ධතිය තුළ විභාග වන අවුරුදු 5 සහ 10 ඉක්මවන සිවිල් නඩු ප්‍රමාණය කීයද, නඩු විභාග කර අවසන් කිරීමට පවතින ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?" කියලා. ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා මේ ප්‍රශ්නයට උත්තරයක් දීලා තිබෙනවා. අවුරුද්දකට කලින් මේක අහලා තිබෙන්නේ.

මේ උත්තරයේ කිසිම තැනක නැහැ නේ, උපරිමාධිකරණවල විනිසුරුවරයන්ගේ හෝ අනෙකුත් සියලු විනිසුරුවරයන්ගේ වයස වැඩි කරන්න අවශ්‍යයි කියලා. දැන් කියනවා නේ, මහෙස්ත්‍රාත් අධිකරණ විනිසුරුවරුන්ගේ, දිසා අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස වැඩි කිරීමත් මේ ප්‍රතිසංස්කරණ පද්ධතියේ කොටසක් කියලා. කෝ, මේකේ ඒ උත්තරය? අඩු ගාණේ ඒක ගැන එදා ඔළුවේවත් තිබුණේ නැද්ද? මේකේ තියෙනවා, "මම කෙටි උත්තරයක් දෙන්නම්; දීර්ඝ උත්තරයක් තියෙනවා. All the details are in this Answer" කියලා. මම පුස්තකාලයට ගිහිල්ලා අර detailed Answer එකත් බැලුවා. ඒකෙත් කොහේවත් නැහැ. ඉතින් එතකොට ඔළුවේවත් තිබිලා නැහැ. ඒක නිසා මට තේරෙන්නේ නැහැ.

මේකේ එතුමා කියලා තිබෙනවා කරන්න ඕනෑ වැඩ ටික. මහෙස්ත්‍රාත් අධිකරණ වැඩි කරන්න ඕනෑ ටික, කාර්ය මණ්ඩලය වැඩි කරන්න ඕනෑ ටික, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කරන්න ඕනෑ ටික ආදී වශයෙන් මේ ඔක්කෝම ලස්සනට තියෙනවා. ඒක එහෙම තියෙද්දී, හදිසියේ මේක කොහෙන්ද ආවේ? ඒකයි අපේ ප්‍රශ්නය වෙලා තියෙන්නේ. ඒ නිසා මේකේ මේ wrapping paper එකේ එක කොටසක් තමයි මහෙස්ත්‍රාත් අධිකරණවල, දිසා අධිකරණවල විනිසුරුවරුන්ගේ ධුර කාලය වැඩි කිරීම. අර අධිකරණ සේවා සංගමය රැස්වෙලා, ඒ ගොල්ලන්ගේ විරෝධතාව එනකම් ඒ මිනිස්සු ගැන මතකයක්වත් තිබුණේ නැහැ. ඇත්ත කථාව ඒකයි. එතකොට තිබුණේ උපරිමාධිකරණ විනිසුරුවරුන් කියන එක පමණයි.

And, we heard the Hon. Prime Minister, in her speech, mentioning that this Amendment is seeking to increase the tenure of judges across the board. මොකක්ද, "across the board" කියන්නේ? ඕක තමයි මම කියන wrapping paper එක. මේක wrapping paper එකෙන් ඔතලා ගෙනාවා. "Across the board" කියන එක පසුවයි ආවේ. Hon. Prime Minister, you also asked, "Why this drama only in Sri Lanka when there had been so many incidents where their tenure had been increased?" I will tell you, Hon. Prime Minister, why this drama occurred.

ඒ වාගේම දැන් කිහිප දෙනෙක් මතක් කළා නේ, ඕස්ට්‍රේලියාව ගැන, ලිබියාව ගැන, ඉතාලිය ගැන, ඇමෙරිකාව ගැන. මේ සියලු දේවල් කිව්වා. එක්සත් රාජධානිය ගැනත් කිව්වා නේ. එක්සත් රාජධානියේ මෙන්න මේ වාගේ concept paper එකක් දාලා මාස හයක් දීලා, ඒ තොරතුරු අරගෙන අවුරුදු දෙකකින් තමයි මේ වෙනස කළේ. නැතුව මේ වාගේ උඩින් පල්ලෙන් ගහෙන් ගෙඩි එන්නා වාගේ කළේ නැහැ. "Rationale for Change" දුන්නා; ඊළඟට, "Arguments for Change" ඉදිරිපත් කළා. ඊළඟට, Questionnaire එකක් තිබෙනවා. එහි තිබෙනවා, අහලා තියෙන ප්‍රශ්න ප්‍රමාණයක්. ඒවාට උත්තර දෙන්න ඕනෑ. ඒ ප්‍රමාණයක් තියෙනවා. මේකේ තියෙනවා, මේක කිරීමෙන් අධිකරණයේ විනිසුරුවරුන්ගේ මනස වෙනස් වෙයිද, හැසිරෙන විධිය වෙනස් වෙයිද, ඊළඟට මේක වෙනස් කිරීමෙන් Judiciary එක ගැන මිනිසුන්ගේ තියෙන විශ්වාසය නැති වෙයිද කියලා අහලා. එහෙම තියෙනවා. ඊළඟට, විශේෂයෙන්ම "Annex B: List of Consultees" කියලා ලැයිස්තුවක් තිබෙනවා. මේක කියවන්න. මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

මේ විශාල ලැයිස්තුවක්. මම මේකේ එකක් දෙකක් කියන්නම්. මේකේ තිබෙනවා "Black Solicitors Network" කියලා. වෙනත් ජාතීන්ගේ lawyersලාගෙන් පවා අහලා තියෙනවා. මම මේ එකක් දෙකක් කියන්නේ. ඊළඟට, Society of Asian Lawyers, The Bar Council (England and Wales), The Law Society (England and Wales), The Bar Council of Northern Ireland and The Law Society of Scotland. මේ සියලු දේ කරලයි එය කළේ. එහෙම නැතුව ඔබතුමන්ලා කරනවා වාගේ එක පාර ගහෙන් ගෙඩි එන්නා වාගේ මේ වැඩ කළේ නැහැ.

එහෙම නම් තවත් රටක් විධියට ඕස්ට්‍රේලියාව ගැන ගන්න කෝ. ඒ උදාහරණත් ගත්තා වාගේ මේ පූර්වාදර්ශත් ගන්න. 1977දී ඒ 72 වගන්තිය වෙනස් කරලා, අර විනිසුරුවරුන්ට මැරෙනකම් තිබ්බ ධුර කාලය 70ටද කොහේද අඩු කළා. හැබැයි, මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි 70ට අඩු කළේ prospectively; ඉන්න judgesලාට ඒක වලංගු වුණේ නැහැ, ඊළඟට එන judgesලාට තමයි වලංගු වුණේ. ඒ වාගේම තවත් ඉගෙන ගන්නවා නම්, ඒක කළේ Referendum එකකට ගිහිල්ලා. ජනමත විචාරණයකට ගිහිල්ලා ඒක කළේ. සියයට 80ක් ඒකට approval එක අරගෙනයි කළේ. ඒ නිසා පිටරටවල් ගැන කථා කරනවා නම්, ඒකත් කථා කරන්න. මොකද, එහෙම නැත්නම් ඒක සාධාරණ වෙන්නේ නැහැ.

ඉතින් විශේෂයෙන් කියන්න ඕනෑ, සියලු විනිසුරුවරුන්ට සමාන වයස් සීමාවක් ගෙන ඒමත් එක්සත් රාජධානියේ කථා කළා. දැන් ඇත්තටම මෙතැන කියැවුණා නේ, අර 2017දී අපේ report එකක් තිබුණා කියලා judgesලාගේ අවුරුදු ගාණ වැඩි කරන්න. හැබැයි, ඇත්තටම සිද්ධ වුණේ මොකක්ද? එක්සත් රාජධානියේ සිද්ධ වෙච්ච විධියට අවුරුදු 65 කරනවා, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේත්. එහෙම නැතුව ඉහළ දාන එක නොවෙයි. 70 කියන එක ආවේ ඇත්තටම පුහුණු කිරීමේ

***** ***පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අරමුණ වෙනුවෙන් සහ ඒ වාගේ දේවල්වලට. ඇමෙරිකාව ගැන කිව්වා. ඇමෙරිකාවේ Article III එකට අනුව Federal Judgesලා විතරයි මැරෙනකම් ඉන්නේ. එහෙම නැතුව මුළු ඇමෙරිකාවේම ඉන්න සියලු judgesලාට එහෙම එකක් නැහැ. මේක දන්නේ නැහැ වාගේ ඇවිල්ලා ඒකම, ඒකම ඒකම ඉතින් කියනවා. අනේ මම දන්නේ නැහැ, මට ඒක තේරෙන්නේ නැහැ. අපේ වටගල මැතිතුමා එහෙමත් මේ ගැන කථා කළා. රීතිය සහ ව්‍යතිරේකය කියලා නීතියේ තියෙනවා. ඒක දන්නේ නැද්ද? ඇමෙරිකාව කියන්නේ ව්‍යතිරේකී තත්ත්වයක්. ඒක හැම තැනම නැහැ. මම දැක්කා, ඊයේ අර බද්දේගම විනිසුරුවරයෙක් ගැන කිව්වා; අවුරුදු 60දී මහෙස්ත්‍රාත්වරයෙක් විශ්‍රාම ගියා කියලා කිව්වා. ගරු ඇමතිතුමනි, ඒක ව්‍යතිරේඛයක්. රීතියක් නොවෙයි. රීතියයි, ව්‍යතිරේඛයයි කියන්නේ දෙකක් කියන එක ඉතා පැහැදිලිව කියන්න අවශ්‍යයි.

ඒ වගේම මට මතක් වෙනවා, බිමල් රත්නායක ඇමතිතුමා කියපු කාරණයක්. එතුමා ඒක නිවැරැදි කරන්නත් හැදුවා. මේකෙන් දැන් බෙදීමක් ඇති වුණා කියලා එතුමාගේ කටින් කියැවුණා. මම එය ආපහු දෙපාරක් අහලා බැලුවා. එහෙම තමයි එතුමා කියන්නේ. එක්කෝ ඒක මට වැරැදිලාද දන්නේ නැහැ. මම බැලුවා, ඒක කපලා කරලාත් නැහැ. එහෙම තමයි කියන්නේ. ඒක නිසා ඔබතුමා ඒක නිවැරැදි කරනවා නම් කරන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. මිනිහෙකුට වැරැදුණාම ඒක හදාගන්නත් වෙලාවක් ලැබෙන්න එපායැ. ඒකට ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩු බලය ගන්න මේ සංශෝධනය අවශ්‍ය නැහැ කියලාත් කිව්වා. ඔව්, අපි දන්නවා, රාජ්‍ය බලය ගන්නා බවක් නේ දැන් අර 'සූර පප්පා' ද කවුද ඇමතිතුමෙක් කිය කියා යන්නේ. ඒක අපට තේරෙනවා. මේ බෙදීම ගැන අපි දන්නවා, බෙදීමක් නැහැ කියලා මෙතැනදී කියන්න හැදුවත්. ඇත්තටම, ගරු අග්‍රාමාත්‍යතුමියත් අද වනකල් මේ සම්බන්ධයෙන් කට ඇරියේ නැහැ. ඇත්ත කථාව ඒකයි. එතුමිය කියන්න හැදුවා, අද රාත්‍රි 7.00ට බලා ගන්න කියලා. ඔව් ඉතින්, ආණ්ඩුවේ මෙතැන ඉන්න කට්ටිය මේ සංශෝධනවලට පක්ෂව ඡන්දය දෙනවා තමයි. ඒක කොහොමත් අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි, මතක තියාගන්න මෙය ආරම්භයේ ඉඳලා, මෙය නිර්මාණයේ ඉඳලා ජාතික ජන බලවේගයයේ නීතිඥවරුන් විශාල පිරිසක් මෙහි පිටුපස සිටි බව. මෙහි පිටුපස හිටියා, උපුල් කුමරප්පෙරුමලා; ගල්හේන මහත්මයලා; ලාල් විජේනායක මහත්මයාලා. ලාල් විජේනායක මහත්මයා නම් එළියට ඇවිල්ලා මේ ගැන කිව්වා. අනෙක් කවුරුවත් කථා කළේ නැහැ. ඒ නිසා මේ බෙදීම අපට පේනවා. ඒක ඒ ඇමතිතුමාගේ කටින් කියැවුණා. මම ස්තුතිවන්ත වෙනවා, ඉඳලා හිටලා හරි එහෙම ඇත්තක් කියපු එක සම්බන්ධයෙන්. අද මෙතැන ඉන්න නීතිඥවරු පිරිස, පාර්ලිමේන්තුවට ආපු අය; සමහර අය මහ මැතිවරණයට තරග කරලා පැරදිච්ච අය. සමහර නීතිඥවරු ඉන්නවා, හිතා මතා පරාද කරපු අයත්. ඒක නිසා ඒ ගොල්ලන් මේවා approve කරන්නේ නැහැ. ඇත්ත කථාව ඒකයි. ඉතින් මම හිතනවා, හෘදය සාක්ෂිය අනුව කටයුතු කරනවා නම් මෙතැන ඉන්න නීතිඥවරුන්ටත් ඒ විධියට හැසිරෙන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් සැබෑ අවශ්‍යතාවක් තිබුණා නම්, අභියාචනාධිකරණයේත්, ශ්‍රේෂ්ඨාධිකරණයේත් පුරප්පාඩු 8ක් තියාගෙන මොකක්ද මේ නටපු නාඩගම? එහෙම නම් ඒකත් කරන්න තිබුණා නේ. ඉතා දක්ෂ, අත්දැකීම් ඇති විනිසුරුවරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු වෙලා තිබෙන seats 4 දිහා බල බලා ගෙදර ගියා. ඔච්චරටම අවශ්‍ය නම්, ඉතාම ඉක්මනට මේ සංශෝධනය ගෙනාවා නම්, තුරෙයිරාජා විනිසුරුතුමාට, කුමුදුනී වික්‍රමසිංහ විනිසුරුතුමියට, ප්‍රියන්ත ප්‍රනාන්දු විනිසුරුතුමාට විශ්‍රාම යන්න වෙන්නේ නැහැනේ. එහෙම නම්, ඒ ගොල්ලන්ටත් ඉන්න තිබුණා නේ. ධම්මික ගනේපොළ විනිසුරුතුමාට, රත්නප්‍රිය ගුරුසිංහ විනිසුරුතුමාට මේක බල බලා ගෙදර යන්න සිද්ධ වුණා නේ. අත්දැකීම් සහිත විනිසුරුවරුන් අවශ්‍ය නම් කරන්න තිබුණේ ඒක නේ. හැබැයි, එහෙම කළේ නැහැ. මම මේ කියන්නේ කරපු තක්කඩි වැඩේ ගැනයි. සිදු වෙච්ච දේවල් ගැන දිනත් එක්කම බැලුවා නම් මේ තක්කඩි වැඩේ ඉතාම පහසුවෙන් ඔප්පු කරන්න පුළුවන්. ඒ ගැන මම ඉතාම ඉක්මනින් කියන්නම්.

2026 ජුනි 07වන දා "The Sunday Morning" පුවත්පතේ තිබෙනවා, හර්ෂණ නානායක්කාර මැතිතුමා සමඟ කරපු සාකච්ඡාව අනුව පළ කළ "The challenge of clearing 1.1 million pending cases" කියන ලිපිය. ඒ කවදා ද? ජුනි 07. මෙච්චර article එකක් කරලාත් මේකේ කොහේවත් නැහැ අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස වැඩි කිරීම ගැන. මේකේ අනෙක් ඔක්කොම තිබෙනවා. මට ලබා දුන්නු පිළිතුරේ තිබෙන සියලුම දේවල් මේකේ තිබෙනවා. හැබැයි, මේ කියන්නේ ජුනි 07. මොකද, ජුනි 07 වෙද්දී නිදාගෙනද හිටියේ? මතක නැද්ද, දන්නේ නැද්ද? එහෙම එකක් දන්නේත් නැහැ. හැබැයි, ජුනි 09වන දා නලින්ද ජයතිස්ස ඇමතිතුමා Cabinet තීරණ දැනුම් දීමේ press conference එකේදි කියනවා, මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ කිසිදු සාකච්ඡාවක් නැහැ කියලා. මෙහෙමද මේවා කරන්නේ? මේ, තක්කඩිකම. මේ, අවශ්‍යතාව පෙන්වන විධියද? ඊළඟට, ජුනි 11. අධිකරණ ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයකට උත්තර දෙමින් නැවත කියනවා, කැබිනට් මණ්ඩලයේ, ආණ්ඩුවේ එහෙම තීරණයක් නැත කියලා. ඊළඟට, ජුනි 14වන දා කැබිනට් තීරණ දැනුම් දීමේ press conference එකේදි නැවතත් කියනවා, අවසන් තීරණයක් ගෙන නැත කියලා. එහෙම කියලා දවස් දෙකකට විතර පසුව -ජුනි 16වන දා- අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය කියනවා, "අපි එහෙම එකක් දන්නේ නැහැ" කියලා. අයේෂා ජිනසේන මැතිනිය කිව්වා, "අපි එහෙම එකක් දන්නේ නැහැ" කියලා. මෙහෙම තිබිලා එක පාරට සෝවාන් වෙලා වගේ ජූලි 27වන දා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබෙනවා.

මෙහෙමද, මේවායේ වැඩ කරන්න ඕනෑ? මෙහෙමද, අන්තර්ජාතික වශයෙන් අත්දැකීම් අරගත්තේ? ජූලි 28වැනි දා කැබිනට් මාධ්‍ය හමුවට ඇවිල්ලා හර්ෂණ නානායක්කාර මැතිතුමාත්, නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් රජයේ ස්ථාවර පැහැදිලි කරනවා. මේක මුලින්ම එනකොට කිව්වේ, වෘත්තිකයන්ගේ පිට රට යෑම, විනිසුරුවරුන් රඳවා ගැනීමේ අවශ්‍යතාව වගේ හේතු. මෙතැනදී තමයි එළියට එන්නේ, නඩු පමාව කියන එක. ඒක කියන්නේ, ජූලි 28වැනි දා. එතකල් එහෙම එකක් කිව්වේ නැහැ. එතකල් කිව්වේ, වෙන වෙන හේතු. ඒක නිසා මට කියන්න තිබෙන්නේ මේකයි. මහානායක හිමිවරුන් සමඟ කරපු "අල්ලං සෙල්ලං" කැල්ල මම කියන්නේ නැහැ, වෙලාව නැති නිසා. මොනවාටද එහෙම නැටුවේ? හැමෝම රවට්ට, රවට්ටා ඇයි එහෙම නැටුවේ?

ඊයේ විරෝධතාව ගැන ආණ්ඩුවේ හැමෝම වාගේ කථා කළා. මම ඒ හැම කථාවක්ම පාහේ අහගෙන හිටියා. ඒ කියන්නේ, ඊයේ විරෝධතාව වැදිලා තිබෙනවා බොක්කටම. [බාධා කිරීම්] ඒක තමයි අපට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජයන්තිපුර හන්දියේ barrier එක මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් එද්දීවත් ඇරලා තියන්නේ නැහැ. අපේ උපුල් නීතිඥතුමා කියනවා "අන්න එය ඇරලා තිබ්බා, ඔයාලා ආවේ නැහැ නේ" කියලා. මොකටද එය ඇරලා තිබුණේ? *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම නම්, ඇයි ආවේ?

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ආවා තමයි. මිනිස්සු එකතු වුණාම එහෙම එනවා තමයි. මම එතැන පෞද්ගලිකව හිටියා. හැබැයි මතක තියාගන්න, අපි එතැනින් මීටර් 10කට වඩා මෙහාට එන්න දුන්නේ නැහැ. ඒ මිනිස්සු ආපසු හැරිලා ගියා. ඒ නිසා හිතන්න එපා ඒ අය ඔයාලාගේ අය වාගේ මිනීමරුවෝ කියලා. පාර්ලිමේන්තුවට ගිනි තියපු, පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු, "පාර්ලිමේන්තුවට ගිහිල්ලා අල්ලා ගනිමු" කියපු අය ඔය ඉස්සරහා ඉඳගෙන සිටිද්දී, විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට අපි ආඩම්බර වෙනවා, අපට ඒ මිනිසුන්ව ආපසු හරවලා එක්කරගෙන යන්න පුළුවන් වුණු එක ගැන. අපේ පක්ෂවල නොහික්මුණු මිනිස්සු නැහැ. ඔයාලාගේ කට්ටිම කියැවුණා නේ. ඒ barriers ඇරලා තිබ්බේ මිනිස්සු ආවාම ගලක් හරි ගස්සවාගන්න නේද? යන්න මහත්තයෝ, යන්න; ඒවා හඳේ! ආස ඇති! නමුත් ඒවා සිද්ධ වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* ඒවා සිද්ධ වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා හරියටම ඒ ගැන කිව්වා. එතුමා හරියටම කිව්වා.

අපි හොඳ දේවල් සම්බන්ධයෙන් එකතු වෙලා වැඩ කරලා තිබෙනවා. 2005 වර්ෂයෙන් පසුව සිදු වූ මාධ්‍ය මර්දනයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණත්, අපේ කඳවුරත් එකතු වෙලා වැඩ කරලා තිබෙනවා. එතුමාම කිව්වා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. අපිත් එහිදී ඔබතුමන්ලාත් සමඟ එකට සිටියා නේ; එකට වැඩ කළා නේ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ආපසු හරවද්දී අපි එකට හිටියා. එදා ජනාධිපතිවරයා විනිසුරුවරුන් පත් කර ගැනීමේ බලය නැවත ගනිද්දී අපි ඔක්කොම ඒකට විරුද්ධව එකට හිටියා. ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රශ්නයේදී අපිත් පෙනී හිටියා නේ. දවස් 52 ආණ්ඩුව පිළිබඳ ප්‍රශ්නයේදීත් ඔබතුමන්ලාත්, අපිත් එකට ඉඳලා අධිකරණයටත් ගියා. ඔබතුමන්ලා මේ අත තියන්න හදන අධිකරණයම තමයි එදා නිවැරැදි තීරණයක් ලබා දීලා ඔබතුමන්ලාටත්, අපටත් ඒ සහනය ලබා දුන්නේ. ඒක නිසයි අප කියන්නේ, මේ අධිකරණයට අත තැබීම කරන්න එපා කියලා. හැබැයි, අපි නම් එහෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස හැසිරිලා නැහැ. ඔබතුමන්ලා ඔය අත දිගු කරන හැම වෙලාවකම මතක තියා ගන්න, සමඟි ජන බලවේගය ඒවාට හසු වෙන්නේ නැහැ කියන එක. ආණ්ඩුවේ කෙනෙක්ම ඒ ගැන කිව්වා, එතුමාගේ කථාවේදී. ඒක අහගෙන සිටියා නම් කාරණය මතක් වෙයි. මේ කාරණයත් මතක තියාගන්න. මේ කරන වැරැද්දත්, මේ කරන විනාශයත් මේ රටේ ප්‍රගතිශීලී කණ්ඩායම් එකතු කරගෙන ඉදිරියේදී සමඟි ජන බලවේගය රජයක් යටතේ අපි නිවැරැදි කරනවා. ඒ බව මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.46]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී අවසානයට කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමාත්, අපේ බෙදීමක් ගැන කිව්වා. ආණ්ඩු පක්ෂය තුළ කිසිම බෙදීමක් නැහැ. තව විනාඩි ගණනකින් ඔබතුමන්ලාට ඒක බලා ගන්න පුළුවන්. අපේ පැත්තෙන් විතරක් පක්ෂව ඡන්ද 158ක් ලැබෙනවා. මා හිතන්නේ ඡන්ද 158න් විතරක් නතර වෙන එකකුත් නැහැ කියලායි. ඔය පැත්තෙනුත් තව එන්න නියමිත වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දවස් 2ක් හවස 7.00 වනකල් මේ විවාදය පැවැත්වුණාට විපක්ෂය පැත්තෙන් එහෙම ලොකු කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් වුණේ නැහැ. හැබැයි, සාරය හැටියට ගත්තොත්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ විරුද්ධතාවයේ සාරය මොකක්ද? *[බාධා කිරීම්]* ඔව්, එතුමා අපේ ගරු කථානායකතුමා. එතුමා පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා. *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී ගොඩක් කරුණු කිව්වා. අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල වෙනවා කිව්වා, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය විනාශ වෙනවා කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ මුඛයට යනවා කිව්වා, නීතියේ ආධිපත්‍යය කනත්තට ගෙන යනවා කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් විනාශ වෙනවා කිව්වා. එහෙම කියලා මදි වෙලා තවත් කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදය සමූල ඝාතනයට ලක් වෙනවා කියලා.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, "Telangana Today" පුවත් පතේ සහ "The Pioneer" පුවත් පතේ ලිපි කිහිපයක්.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

"Telangana Today" dated 22nd July, 2026, states, I quote:

> "Supreme Court asks states to consider raising judges' retirement age"

"The Pioneer" dated 23rd July, 2026 states, I quote:

> "SC asks States, UTs to consider raising judicial officers' retirement age from 60 to 61 years"

ඒ කියන්නේ මොකක්ද? විපක්ෂයේ මෙතුමන්ලාට අනුව ගත්තොත්, ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණයම එහි අධිකරණ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරලා, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරලා, සමූලඝාතනය කරලා, ප්‍රජාතන්ත්‍රවාදය කනත්තට අරගෙන ගිහිල්ලා. මේ, ඉන්දියාවේ Supreme Court එක. ඉන්දියාවේ Supreme Court එක කියනවා, එහේ ප්‍රාන්ත 7ක - චට්ටිස්ගාර්හ්, කර්ණාටක, මධ්‍ය ප්‍රදේශ්, මහාරාෂ්ට්‍ර, සික්කිම්, තමිල් නාඩු සහ බටහිර බෙංගාලය - විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි කරලා දෙන්න කියලා. ඒකයි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව. හැබැයි, හොඳ වෙලාවට එහේ අඩු ගණනේ Indian National Congress එකවත් මේවාට විරුද්ධව මෙහේ වාගේ උද්ඝෝෂණ කරන්නේ නැහැ.

ඊළඟට ගරු කථානායකතුමනි, දැන් මේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි කළාම, ඒකට එරෙහිව විපක්ෂය ගොඩනඟන තර්කය මොකක්ද? අපේ ගරු සභානායකතුමාත් ඒ ගැන කිව්වා. ඔබතුමන්ලා මේ කියන්න හදන්නේ, අධිකරණ විනිශ්චයකාරවරුන්ට අල්ලසක් ලබා දීලා, අධිකරණයේ ස්වාධීනත්වය නැති කරනවා කියලායි. මේ තොරතුර මීට කලින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මා අහන්න කැමැතියි, එංගලන්තයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 75ක් වෙන්නේ, එංගලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදය, අධිකරණ ස්වාධීනත්වය සම්පූර්ණයෙන් විනාශ කරලාද කියා. කැනඩාවේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 75යි; බ්‍රසීලයේ අවුරුදු 75යි; ඕස්ට්‍රේලියාවේ අවුරුදු 70යි; නවසීලන්තයේ අවුරුදු 70යි; දකුණු අප්‍රිකාවේ අවුරුදු 70යි; ජපානයේ අවුරුදු 70යි; පිලිපීනයේ අවුරුදු 70යි; ජර්මනියේ අවුරුදු 68යි. දැන් එතකොට ඒ රටවල ප්‍රජාතන්ත්‍රවාදය සමූලඝාතනය කරලා, අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් එල්ල කරලා, නීතියේ ආධිපත්‍යය කනත්තට අරගෙන ගිහිල්ලාද තිබෙන්නේ? විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස මේ කියන සමහර රටවල අවුරුදු 4කින්, 5කින්, 6කින් වැඩි කරලා තිබෙනවා. ඒ රටවල ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් විනාශ කරලාද, ඒ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස වැඩි කරලා තිබෙන්නේ?

ගරු කථානායකතුමනි, මේ කණ්ඩායම 1940 ගණන්වල පාර්ලිමේන්තුවේ සිටියා නම් එහෙම අග්‍ර විනිශ්චයකාරතුමාගේ වැටුප තවම රුපියල් 37,500 යි. ඇයි, දන්නවාද? මෙතුමන්ලා ඒක වැඩි කරන්න දෙන්නේ නැහැ. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තිබුණු කාලයේ රුපියල් 37,500යි අගවිනිසුරුතුමාගේ වැටුප. ඔබතුමන්ලා එදා හිටියා නම් ඒ වැටුප වැඩි කරන්න දෙන්නේත් නැහැ. ඇයි ඒ? වැටුප් වැඩි කළාම එය විනිශ්චයකාරවරුන්ට දෙන අල්ලසක් ලු. ඒ කියන්නේ විශ්‍රාම යන වයස අවුරුදු 2කින් වැඩි කළාම අල්ලසක් කියලා කියන අය වැටුප් වැඩි කිරීම වාගේ දෙයකට කොහොමටවත් එකඟ වෙන්න විධියක් නැහැ නේ. මේ අය ඒ කාලයේ පාර්ලිමේන්තුවේ හිටියා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස තවම අවුරුදු 62 යි. එය අවුරුදු 62ක් වුණේ, උපතේදී අපේක්ෂිත ආයු කාලය ඒ කාලයේ අවුරුදු 55-65ත් අතර තිබුණු නිසයි. ඊට පස්සේ පළමු ජනරජ ව්‍යවස්ථාවෙන් ඒක අවුරුදු 63ක් කරන කොට අපේ උපතේදී අපේක්ෂිත ආයු කාලය අවුරුදු 65-72 යි. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් එය අවුරුදු 65ක් කරන කොට උපතේදී අපේක්ෂිත ආයු කාලය අවුරුදු 68-70 යි. දැන් ඒක 76, 77, 78 වෙලා. සාමාන්‍යයෙන් ඔබතුමන්ලා ගිහිල්ලා බැලුවොත්, ලෝකයේ ඕනෑම රටක විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි කිරීමේදී සලකා බලා තිබෙන ප්‍රධාන කරුණු 2ක් තිබෙනවා. එකක් තමයි, ඒ අත්දැකීම් සහිත, පරිණතභාවය සහිත විනිශ්චයකාරවරුන්ගේ සේවාව තවදුරටත් ලබා ගන්නා එක. දෙවැනි එක තමයි, උපතේදී අපේක්ෂිත ආයු කාලය වැඩි වෙලා තිබීම. ඒ නිසා ඒ අයගේ විශ්‍රාම යන වයස වැඩි කරන එක සාධාරණයි කියලා සලකනවා. ඔන්න ඔය හේතු දෙක තමයි, ලෝකයම පිළිගෙන තිබෙන්නේ. ඒක තමයි පදනම. මෙහේත් පදනම ඒක තමයි.

එහෙම තිබියදී අපි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න ඉතාමත් ව්‍යවස්ථානුකූල සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක් අනුගමනය කළා. මෙය, අගෝස්තු 07වන දා ගැසට් කළා; අගෝස්තු 18වන දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා; අගෝස්තු 18 ඉඳලා 31 දක්වා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීලා තිබුණා. පෙත්සම් 73ක් ඉදිරිපත් වුණා. අර කිව්වා වාගේ අන්තිම මොහොතේත්, හවස හයයි ගණනටත් පෙත්සම් ඉදිරිපත් වුණා. සැප්තැම්බර් 01 සහ 02 අධිකරණයේදී ඒවාට ඇහුම්කන් දුන්නා. සැප්තැම්බර් 22 කථානායකතුමා හැටියට ඔබතුමා ඒ තීරණය පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කළා. මේ දවස් දෙකේ, රාත්‍රි 7.00 වන කල් දෙදින විවාදයක් පැවැත්වෙනවා; එම විවාදයේදී ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්; ඊට පස්සේ ඡන්ද විමසීමක් තිබෙනවා. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය. මේක තමයි ව්‍යවස්ථානුකූල ක්‍රමය. එහෙම නැතිව, ඔබතුමන්ලා යෝජනා කරනවා වාගේ උසාවියට ගිහිල්ලා, ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ ඉන්න විනිශ්චයකාරවරුන් ඔක්කොම අයින් කරලා, මේ සංශෝධනය ව්‍යවස්ථානුකූලද නැද්ද කියලා බලන්න ක්‍රමයක් නැහැ. පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඕනෑම පනත් සංශෝධනයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ව්‍යවස්ථානුකූලද නැද්ද කියලා බලන්න තිබෙන එකම ක්‍රමය තමයි ඒ ගැන ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසන එක. ශ්‍රේෂ්ඨාධිකරණයට ඒ බලය තිබෙනවා. ඔබතුමන්ලාගේ කණ්ඩායම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කිව්වේ අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන්ලා කාටවත් ඒ පෙත්සම් විභාග කරන්නවත් අයිතියක් නැහැ කියලායි. එහෙම නම්, ඒ bench එක හදන්න ඕනෑ දැන් ඔය විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන්ද; එහෙම නැත්නම් එළියේ ඉන්න විමල් වීරවංශලා, ගම්මන්පිලලාගෙන්ද? *[බාධා කිරීමක්]* මෙතැන ඉන්න අයගේ නම් කියන්න ගියොත් නැඟිටින නිසයි මම නොකියා ඉන්නේ. මේ ගොල්ලෝ හිතාගෙන ඉන්නේ මේ ගොල්ලන්ගෙන් ඒ bench එක හදන්න ඕනෑ කියලායි. ඒක අර, ශිරානි බණ්ඩාරනායක මහත්මිය අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් එළවන්න හදපු bench එක වාගේ එකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා මෙවැනි ආකාරයේ සංශෝධනයක් ඉදිරිපත් වුණාට පසුව අනුගමනය කළ යුතු ක්‍රමවේදය ගැන. ශ්‍රේෂ්ඨාධිකරණය අනුගමනය කළේ ඒ ක්‍රමවේදයයි.

විශ්‍රාම වයස වැඩි කිරීම සඳහා අපි මෙතැනදී එක් විනිශ්චයකාරවරයෙක් තෝරා ගත්තේ නැහැ, එහෙම නැත්නම් එක කණ්ඩායමක් තෝරා ගත්තේ නැහැ, එහෙමත් නැත්නම් එක උසාවි වර්ගයක් විතරක් තෝරා ගත්තේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද දින සභාවේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අග්‍ර විනිශ්චයකාරතුමාගේ ඉඳලා මහේස්ත්‍රාත්වරුන් දක්වා 400කට අධික සියලු විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 2කින් වැඩි කරන්නයි යෝජනාව ඉදිරිපත් කරලා තීන්දුව ගත්තේ. ඒ නිසා මේක ඉතාම ප්‍රජාතන්ත්‍රවාදීව ව්‍යවස්ථානුකූලව ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා තමයි ශ්‍රේෂ්ඨාධිකරණය මේක ව්‍යවස්ථානුකූලයි කිව්වේ; පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකින් සම්මත කිරීම ප්‍රමාණවත් කියලා කිව්වේ.

පසුගිය මාස තුන ඇතුළතදී ව්‍යවස්ථා විරෝධීව කටයුතු කළේ කවුද? අධිකරණයේ ස්වාධීනත්වයට හානි වන ලෙස කටයුතු කළේ කවුද? තමුන්නාන්සේලායි. මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ඒ පෙත්සම් විභාග කරන්නවත් අයිතියක් නැහැ කියලා තමුන්නාන්සේලා කිව්වා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන, අධිකරණ පද්ධතිය ගැන අබ මල් රේණුවක ගරුත්වයක්, හැඟීමක් තිබෙනවා නම් එහෙම කියන්නේ නැහැ; එහෙම ඉල්ලීමක් කරන්නේ නැහැ. ජනමත විචාරණයකට යන්න ඕනෑ කියලාත් කිව්වා. බොහොම පැහැදිලිව ජනමත විචාරණයකට තුඩු දෙන ව්‍යවස්ථා මොනවාද කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙනවා. ඒක නොදැන නොවෙයි තමුන්නාන්සේලා එවැනි මතයක් හදන්න ගියේ.

ඊළඟට, මේකේ කූටප්‍රාප්තිය තමයි ඊයේ සිදු කළේ. තව ටිකකින් ඡන්ද විමසීම පවත්වා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරලා ගරු කථානායතුමා ඒවායේ සහතිකය සටහන් කළාට පසුව පිළිවෙළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් බවට සහ රටේ නීතිය බවට පත් වෙනවා.

ඊයේ තමන්ගේ කට්ටිය ගෙනැල්ලා, - පිරිස 1,254ක් ගෙනැල්ලා - විරෝධතාවක් පවත්වමින් විපක්ෂ නායකතුමා මොකක්ද කියන්නේ? ඒ ගොල්ලන් හදිස්සියේවත් බලයට ආවොත්, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආපසු හරවන බව කියනවා. "22 ආපසු හරවනවා. විරෝධතාවයේදී සජිත් කියයි", "විසි දෙවන සංශෝධනය අහෝසි කරනවා" යනුවෙන් වාර්තා කර තිබෙනවා. මේක කරන්නේ කොහොමද? මේක කළොත් මොකද වෙන්නේ? ඔබතුමන්ලා බලයට එන්නේ නැහැ. බලයට එන්නේ නැති නිසා මෙහෙම කිව්වාට කමක් නැහැ. හැබැයි එහෙම කරනවා නම් විනිශ්චයකාරවරුන් හැමදෙනාම විශ්‍රාම ගත යුතු වයස අවුරුදු දෙකකින් ආපස්සට ගන්න ඕනෑ. අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය 5කින් අඩු කරන්න ඕනෑ. ඊළඟට, High Courts ප්‍රමාණය 120 සිට 110 දක්වා අඩු කරන්න ඕනෑ. ඒවා කරනවා කියලාද මේ කියන්නේ? ඒවා කරන්න නිකම් බැහැ. ඒවාට ජනමත විචාරණයකුත් ඕනෑ. මේක නීතිය බවට පත් වුණාට පසුව විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගත යුතු වයස අඩු කරන්න හරි, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව අඩු කරන්න හරි යනවා නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් විතරක් නොවෙයි, ජනමත විචාරණයකුත් ඕනෑ. එහෙම නැතිව නිකම්ම මේවා අහෝසි කරන්න බැහැ. ඒවා තමයි ව්‍යවස්ථා විරෝධී වැඩ. කරනවා නම්, තමුන්නාන්සේලා කරන්න හදන්නේ එහෙමයි. ඒක කරන්න බැහැ, බලයට එන්නේ නැති නිසා. හැබැයි ඔළුවේ තිබෙන්නේ ඒ වාගේ දේවල්. අපි ව්‍යවස්ථානුකූලව, ප්‍රජාතන්ත්‍රවාදීව මේ කටයුතු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙහිදී විපක්ෂයට වෙච්ච වැඩේ බලන්න. මෙතුමන්ලා මේ තරම් අනාථභාවයට පත් වෙන්න හේතු වුණේ වෙන කිසිවක් නොවෙයි; මේකට හරිහමන් විරෝධයක් ගොඩ නහා ගන්න බැරි වීමයි. තමුන්නාන්සේලා මීට වඩා හොඳට ගොවි උද්ඝෝෂණත් කරනවා. ඔක්කෝම කැඩිලාත් ගියා එහේට මෙහේට. ඇයි ඒ? පටන් ගත්තේ කොහොමද? පටන් ගන්න කොටම බොරුවක් කිව්වා, ආණ්ඩුව මේක තනි කෙනෙක් ඉලක්ක කරගෙනයි කරන්නේ කියලා. අන්න එතැනින් තමයි පටන් ගත්තේ. තාම ඒක දිරවා ගන්න බැරිවයි ඉන්නේ. අපට කිසිම අදහසක් තිබුණේ නැහැ, තනි කෙනෙකු ඉලක්ක කරගෙන මේ ව්‍යවස්ථා සංශෝධනය කරන්න. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක තමයි කළේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒක නේ. *[බාධා කිරීම්]* තාම හිතාගෙන ඉන්නේ එහෙම නේ. හැබැයි මේ සම්මත කරන්නේ මොකක්ද? සියලුදෙනාට, මහේස්ත්‍රාත්වරුන් ඇතුළු විනිශ්චයකාරවරුන් 411දෙනාගේම විශ්‍රාම ගත යුතු වයස අවුරුදු 2කින් වැඩි කර දීමයි මේ කරන්නේ. *[බාධා කිරීම්]*

ඊට පසුව මොකක්ද කිව්වේ? *[බාධා කිරීම්]* ඒ බොරුව ඉවර වුණා. ඊට පසුව කිව්වා, උපරිමාධිකරණවලට විතරයි මේක බලපාන්නේ කියලා. කවුරු හරි ලණුවක් දුන්නා, මේක උපරිමාධිකරණවලට විතරයි බලපාන්නේ කියලා. සමහර විට ඒකට හේතු වෙන්න ඇත්තේ ව්‍යවස්ථා සංශෝධනයේදී ඒ බලපෑම උපරිමාධිකරණවලට විතරක් වන එකයි. ඒක හරි, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ට තමයි ඒ බලපෑම වන්නේ. ඊට පහළ අධිකරණවලට බලපාන්නේ අධිකරණ සංවිධාන පනත. කවුරු හරි ලණුවක් දුන්නා, මේ යන්නේ ව්‍යවස්ථා සංශෝධනය විතරයි කියලා. ඔන්න ඒක උස්සාගෙන ගියා, පොඩි කාලයක්. තවත් අර පොහොට්ටුවට සම්බන්ධ පොඩි පොඩි කෑලි ටිකක් කියාගෙන ගියා, මේකෙන් රට ෆෙඩරල්කරණය වෙනවා කියලා. ඒකත් ටික දවසක් අල්ලාගෙන ගියා.

මට මතකයි, තව කෙනෙක් පාර්ලිමේන්තුවේදී කියන්න උත්සාහ කළා, මේක සිංහල බෞද්ධ ජනතාවට විරුද්ධ වැඩක් කියලා. ඊළඟට කිව්වා, මේක මැතිවරණ කල් දමා ගන්න කරන වැඩක්, තනි පක්ෂ පාලනයකට එනවාය කියලා. එහෙම කියලා කියලා අවසානයට කියපු දේ තමයි, ආණ්ඩුව ඇතුළේ බෙදීමක් තිබෙනවා කියන එක. එහෙම කථාවකුත් කියාගෙන ආවා. ඇයි, මේ? අන්තිමට එතැනට ආවා. හැබැයි, අන්තිමට මොකක්ද පෙනුණේ? කවුද බෙදිලා තිබෙන්නේ? මේ පැත්තේ කිසිම බෙදීමක් නැහැ. තමුන්නාන්සේලා තමයි දැන් පුවක් වල්ල පොළොවේ ගැහුවා වාගේ බෙදිලා, බෙදිලා තිබෙන්නේ. ඇතුළේ කචල්. අපි ඒක හොඳටම දන්නවා. ඇතුළේ කචල් ගොඩක්. ඒක නේ, ඊයේ අර ඒකාබද්ධව කරන්න හදාගෙන හිටපු උද්ඝෝෂණයටත් සමහරුන්ට එන්න එපා කිව්වේ. හොඳ වෙලාවට යාන්තම් ජාමෙ බේරාගත්තා, එහෙම හරි කියලා.

මේවායේ එක තර්කයක් තිබුණේ නැහැ. එසේ එක තර්කයක් නොතිබෙන්න හේතු වුණේ තමුන්නාන්සේලා දේශපාලනය නොදන්නා එක නොවෙයි. මෙතැන තිබෙන්නේ තමුන්නාන්සේලාට ඇත්ත හේතුව කියාගන්න බැරි එකයි. ඔබ

විරුද්ධ වෙන ඇත්ත හේතුව කියන්න බැහැ. ඊයේ පළමු කථිකයාගෙන් ටිකක් එළියට පැන්නා. ඇත්ත හේතුව කියාගන්න බැරි වෙනකොට වෙන වෙන හේතු කිව්වා.

මමත්, හර්ෂණ නානායක්කාර ඇමතිතුමාත් මල්වතු සහ අස්ගිරි මහා නායක හිමිවරුන් හමුවෙන්න ගිය අවස්ථාවේදීත් අපට කාරණයක් තේරුම් ගියා. ඒ තමයි, මේ බොරු සෙට් එක උන්වහන්සේලාටත් කියා තිබෙනවා කියන කාරණය. තැන් තැන්වල එක එක සංවිධානවලට, ජාතික ජාත්‍යන්තර සංවිධානවලට එක එක බොරු කියලා තිබෙනවා. ඒ ඇයි? මේකට ඇත්ත දේශපාලන තර්කයක් ගොඩනහා ගන්න බැහැ. මේකට සිංහල භාෂාවේ හොඳ වචනයක් නැහැ. නමුත් මෙතැන කියන්න බැරි වචනයක් තිබෙනවා. ඒක මෙතැන කියන්න බැහැ. ඔන්න ඕකයි වුණේ තමුන්නාන්සේලාට. මේකේ ඇත්ත හේතු තබාගෙන වෙන වෙන හේතු කියන්න ගිය එකෙන් වෙච්ච වැඩක් තමයි මේ මාස තුන ඇතුළතදී සිද්ධ වුණේ. මේ මාස තුන ඇතුළතදී සිද්ධ වුණේ ඒකයි. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි ගෙනාවේ මේ රටේ ජනතාව වෙනුවෙන්. ඒකට අපට අයිතියක් තිබෙනවා. අපි 2024 ජනාධිපතිවරණයේදීත්, ඉන් පසුව මහ මැතිවරණයේදීත් මේ සම්බන්ධව මේ රටේ ජනතාවට පොරොන්දුවක් ලබා දුන්නා. අපේ ජන වරමේත් ඒක අන්තර්ගතයි. අපි කිව්වා, අධිකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කරනවා කියලා. ජනතාව ඒක බලාපොරොත්තු වුණා. අනෙක් ප්‍රතිසංස්කරණ කරනවා වාගේම මේ ගොඩගැසී තිබෙන නඩු ප්‍රමාණය ඇසීම වේගවත් කරලා ඒ කටයුතු කාර්යක්ෂම කරලා දෙන්න ජනතාව අපට ඒ ජන වරම ලබා දීලා තිබෙනවා. දැන් ගොඩක් අය අහනවා, මේකෙන් කොහොමද නඩු ඇසීම ඉක්මන් වෙන්නේ කියලා. මම මෙතැනදී උපුටා දැක්වීමක් කරන්නම්.

Paragraph 4.3 of Report No. 229 of August, 2009 submitted by Dr. Justice A.R. Lakshmanan, Chairman, Law Commission of India states, I quote:

> "We further recommend that with a view to reducing the heavy backlog of cases in the higher courts and meet the problem of finding suitable persons for appointment of judges in these courts, the retirement age for the Supreme Court and High Court Judges be raised to 70 and 65 years, respectively."

මේකෙන් කියන්නේ, විශ්‍රාම යැමේ වයස වැඩි කිරීම ඇතුළේ නඩු ක්‍රියාවලිය වේගවත් කරන්න පුළුවන්, කාර්යක්ෂම කරන්න පුළුවන් කියන එකයි. ඒක මුළු ලෝකයම පිළිඅරගෙන තිබෙනවා, තමුන්නාන්සේලාට තවම තේරුණේ නැති වුණාට. මේක අපේ ජන වරම ඇතුළේ තිබුණා. හැබැයි, අපි මේක විතරක් නොවෙයි කරන්නේ. විනිශ්චයකාරවරුන් 411දෙනෙකුගේ විශ්‍රාම යන වයස අවුරුදු 2කින් වැඩි කිරීම කියන්නේ එක කරුණක් විතරයි. ඊට අමතරව මේ වසර දෙක ඇතුළතදී යුක්තිය පිළිබඳ විශ්වාසය, අධිකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කරන්න අපි බොහෝ දේවල් කරමින් ඉන්නවා සහ කර තිබෙනවා.

උදාහරණයක් හැටියට 2025.01.01 සිට 2026.06.30 දක්වා කාලය තුළදී අපි ඉදිකරන ලද ව්‍යාපෘති ගෙන බලමු. වාකරේ නව අධිකරණ ගොඩනැගිල්ලට රුපියල් මිලියන 56යි; පුත්තලම අධිකරණ ගොඩනැගිල්ලට රුපියල් මිලියන 226යි; සමන්තුරේ අධිකරණ ගොඩනැගිල්ලට රුපියල් මිලියන 66යි; වාලච්චේනයි අධිකරණ ගොඩනැගිල්ලට රුපියල් මිලියන 320යි; කුච්චවේලි අධිකරණ ගොඩනැගිල්ලට රුපියල් මිලියන 94යි; කොළඹ MCC ගොඩනැගිල්ලට රුපියල් මිලියන 8,864යි; මඩකලපුවේ විනිසුරු බංගලාවට රුපියල් මිලියන 58යි; උපරිමාධිකරණ සංකීර්ණයේ විස්තීර්ණ ප්‍රතිසංස්කරණ සඳහා RMB මිලියන 230යි. මේ සමහර අධිකරණ සංකීර්ණ අපේ අධිකරණ ඇමතිතුමා විසින් විවෘත කර අවසන්. ඊළඟට, පූගොඩ අධිකරණ සංකීර්ණය රුපියල් මිලියන 377යි, ගාල්ල අධිකරණ සංකීර්ණය රුපියල් මිලියන 1,686යි, නිකවැරටිය අධිකරණ ගොඩනැගිල්ල රුපියල් මිලියන 177යි, මනම්පිටිය අධිකරණ ගොඩනැගිල්ල රුපියල් මිලියන 75යි ආදී හැටියට මේ ප්‍රතිසංස්කරණත් සිදු කරනවා. අධිකරණ ශාලා අලුතින් හදනවා. අධිකරණ අලුතින් ඇති කරනවා. නිලධාරින් බඳවා ගන්නවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ශක්තිමත් කරනවා. බන්ධනාගාරයේ තිබුණු ප්‍රශ්න විසඳා ඒ ආයතන ශක්තිමත් කරනවා. පොලීසියට නව බඳවා ගැනීම් කරනවා. නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කරනවා. මේ ආදී වශයෙන් සමස්ත ක්‍රියාවලිය සිදු වනවා. විමර්ශන කටයුතුවලට CID එකට, FCID එකට, Bribery Commission එකට බඳවාගැනීම් වැඩි කරලා, ඒවා කාර්යක්ෂම කරන එකත් සිද්ධ වනවා. විමර්ශන ක්‍රියාවලියත් ශක්තිමත් කර, නඩු ගොනු කරන නීතිපති දෙපාර්තමේන්තුවත් ශක්තිමත් කර, අධිකරණයටත් අවශ්‍ය පහසුකම් ලබා දෙනවා. ඒ සියල්ල කරමින් සිටින අතර ඉන් එකක් හැටියට තමයි, මේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු දෙකකින් වැඩි කරන්න අපි කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ සමස්ත ජනතාව වෙනුවෙනුයි. ඒ වාගේම ජනතාවට අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය වැඩි කරන්න. අනෙක් පැත්තෙන්, තමුන්නාන්සේලා උදව් කරන, කරේ අත දමාගෙන සිටින හොරුන්ට මෙයින් පාඩුවක් සිදු වනවා. ඒක හරි. හොරුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ජනතාව අපට බලයක් දීලා තිබෙනවා. එම බලය ක්‍රියාත්මක කිරීම සඳහා තමයි මෙම ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ. එතකොට හොරු ඉක්මනින් හිරේ ගිහිල්ලා ඉක්මනින් දඬුවම් ලැබෙනවා. තමුන්නාන්සේලා ඒකට අකැමැති වෙන්න පුළුවන්. නමුත්, ඒක තමයි ජනතාවගේ ප්‍රාර්ථනාව.

අනෙක් පැත්තෙන්, අධිකරණය කාර්යක්ෂම වීම අපේ රටට ආයෝජන ගලාගෙන ඒමටත්, කර්මාන්ත පැමිණීමටත්, ව්‍යවසායකයින් පැමිණීමටත් බලපානවා. ආයෝජකයෝ එනකොට බලනවා, අපේ රටේ අධිකරණ ක්‍රියාවලිය කොතරම් වේගවත්ව සිදු වනවාද, ඒ පිළිබඳව කොතරම් විශ්වාසයක් තිබෙනවාද කියලා. ඒවාටත් මේක බලනවා.

තමුන්නාන්සේලා පසුගිය මාස තුන ඇතුළත කළ නරකම දේ තමයි, අධිකරණ පද්ධතිය තුළ සිටින විනිශ්චයකාරවරුන්ට පෞද්ගලිකව අපහාස කිරීම. ඒ වාගේම අධිකරණ පද්ධතිය කෙරෙහි ජනතාව තුළ තිබෙන විශ්වාසය නැති කරන්න කටයුතු කළා. ඒක ඇතැම් කණ්ඩායම් නොදැනුවත්ව සහ සමහරු දැනුවත්ව කළ වැඩක්. ඒක තමයි පසුගිය මාස තුන තුළ කළේ.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අරමුණ තේරුම් ගැනීමට තමුන්නාන්සේලාට නොහැකියාවක් නැහැ. අප මේ සිදු කරන්නේ කුමක්ද කියන එක තේරුම් ගන්න තමුන්නාන්සේලාට බැරිකමක් නැහැ. හැබැයි, මා කලින් සඳහන් කළ පරිදි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇතැම් කණ්ඩායම් නොමඟ යවමින්, ඇතැම් පුද්ගලයින් නොමඟ යවමින්, තමුන්නාන්සේලා සිදු කළේ සංවිධානාත්මකව අධිකරණය සම්බන්ධයෙන් ජනතාව තුළ තිබුණු විශ්වාසය පලුදු කිරීමට උත්සාහ කිරීමයි.

YouTube ඇතුළු විවිධ සමාජ මාධ්‍ය භාවිත කරමින් අග්‍ර විනිශ්චයකාරතුමා ප්‍රමුඛ අධිකරණ විනිශ්චයකාරවරුන්ට පෞද්ගලිකව පහර ගසමින් සහ අපහාස කරමින් අධිකරණය පිළිබඳව ජනතාව තුළ තිබෙන විශ්වාසය කඩා බිඳ දැමීමටත්,

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අධිකරණයේ ස්වාධීනත්වයට බාධා කිරීමටත් තමයි ඔබ උත්සාහ කළේ. අන්න ඒක තමයි ඔබ කළ නරකම කාර්යය. ගරු කථානායකතුමනි, එම නිසා මෙම ප්‍රතිසංස්කරණ අපේ රටේ ඉදිරි සංවර්ධනය සඳහා අවශ්‍යයි. ඒ වෙනුවෙන් තමයි අපි මේ ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ.

එම නිසා අපි අවසන් වතාවටත් මේ සම්බන්ධව ඔබෙන් ඉල්ලීමක් කරනවා. මම අහගෙන සිටියා, කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් කියනවා, හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දෙන්න කියලා. මේ සියලුදෙනාම හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දෙනවා. රටේ නීතිය ශක්තිමත් කිරීමටත්, අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීමටත් හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දීමට කැමැති කවුරුන් හෝ තමුන්නාන්සේලාගේ පැත්තේ ඉන්නවා නම්, ඒ වාගේම හොරු අල්ලන එකට සහ නීතිය ක්‍රියාත්මක කිරීමට තවදුරටත් සහාය දීමට කැමැති කවුරුන් හෝ ඔය පැත්තේ ඉන්නවා නම්, මෙම සංශෝධනවලට පක්ෂව ඡන්දය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දෙවන වර කියවීම, සභාව එකඟද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි බෙදීමක් ඉල්ලා සිටිනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපිත් Division එකක් ඉල්ලනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බෙදුම් සීනුව නාද කරන්න.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell –*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත, දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකිය.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවාද? එසේ නම්, මාගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවා නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මාගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවා නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂද, විරුද්ධද?

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
විරුද්ධයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂද, විරුද්ධද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
තදින්ම විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මාගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරුන් සිටිනවාද? *[බාධා කිරීමක්]* සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අසුන්වල වාඩි වුණා නම් හොඳයි.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද?

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මෙම පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂද, විරුද්ධද?

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ ඡන්දය ප්‍රකාශ කිරීම ඩිජිටල් පුවරුවේ සටහන් වී තිබෙනවා.

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
ඔව්, දැන් තිරයේ දිස්වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසන්.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 158; විරුද්ධව 61; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 158; எதிராக 61; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 158; Noes 61; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayatissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Susil Ranasinghe | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Kumara Jayakody | Yes |
| G 025. Nihal Galappaththi | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 028. Wasantha Piyathissa | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 032. Rathna Gamage | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 038. Nalin Hewage | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 055. Arkam Ilyas | Yes |
| G 056. Aravinda Senarath | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Asoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |

| | | |
|---|---|---|
| G 063. | Lakmali Hemachandra | Yes |
| G 064. | Samanmali Gunasingha | Yes |
| G 065. | R.M. Gamini Rathnayake | Yes |
| G 066. | Manjula Suraweera Arachchi | Yes |
| G 067. | K. Ilankumaran | Yes |
| G 068. | Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. | Ajith Agalakada | Yes |
| G 070. | Sagarika Athauda | Yes |
| G 071. | Roshan Akmeemana | Yes |
| G 072. | U. P. Abeywickrama | Yes |
| G 073. | L.M. Abeywickrama | Yes |
| G 074. | M.K.M. Aslam | Yes |
| G 075. | Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. | Oshani Umanga | Yes |
| G 077. | Krishnan Kalaichelvi | Yes |
| G 078. | Upul Kithsiri | Yes |
| G 079. | Wasantha Pushpa Kumara | Yes |
| G 080. | Chaminda Lalith Kumara | Yes |
| G 081. | Sarath Kumara | Yes |
| G 082. | Nilanthi Kottahachchi | Yes |
| G 083. | M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. | Darmapriya Wijesinghe | Yes |
| G 085. | Thilanka U. Gamage | Yes |
| G 086. | Nilusha Lakmali Gamage | Yes |
| G 087. | Ajantha Gammeddage | Yes |
| G 088. | Ajith Gihan | Yes |
| G 089. | Jagath Gunawardana | Yes |
| G 090. | Aboobucker Athambawa | Yes |
| G 091. | Ruwanthilaka Jayakody | Yes |
| G 092. | Thushari Jayasingha | Yes |
| G 093. | T.K. Jayasundara | Yes |
| G 094. | Mayilvaganam Jegatheeswaran | Yes |
| G 095. | Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. | Sellaththamby Thilaganathan | Yes |
| G 097. | Sugath Wasantha de Silva | Yes |
| G 098. | Anushka Thilakarathne | Yes |
| G 099. | Chandana Thennakoon | Yes |
| G 100. | Thanura Dissanayake | Yes |
| G 101. | Dharmapriya Dissanayake | Yes |
| G 102. | Sujeewa Dissanayake | Yes |
| G 103. | Kanthasamy Prabu | Yes |
| G 104. | Susantha Kumara Nawarathna | Yes |
| G 105. | Sena Nanayakkara | Yes |
| G 106. | Aruna Panagoda | Yes |
| G 107. | Nimal Palihena | Yes |
| G 108. | Nishantha Perera | Yes |
| G 109. | Stepni Fernando | Yes |
| G 110. | Susantha Dodawatta | Yes |
| G 111. | Lal Premanath | Yes |
| G 112. | Nanda Bandara | Yes |
| G 113. | Padmasiri Bandara | Yes |
| G 114. | Ravindra Bandara | Yes |
| G 115. | Sudath Balagalla | Yes |
| G 116. | Sri Bavanandarajah | Yes |
| O 001. | Mano Ganeshan | No |
| O 002. | Kabir Hashim | No |
| O 003. | Palani Thigambaram | No |
| O 004. | Rishad Bathinudeen | No |
| O 005. | Rauff Hakeem | No |
| O 006. | R.M.Ranjith Madduma Bandara | No |
| O 007. | Gayantha Karunathilleka | No |
| O 008. | Sajith Premadasa | No |
| O 010. | M.L.A.M. Hizbullah | No |
| O 011. | Namal Rajapaksha | No |
| O 012. | Jeevan Thondaman | No |
| O 013. | Amirthanathan Adaikkalanathan | No |
| O 014. | G.G. Ponnambalam | No |
| O 015. | K. Kader Masthan | No |
| O 016. | Ramanathan Archchuna | No |
| O 017. | M.A.M. Thahir | No |
| O 018. | Dilith Jayaweera | No |
| O 019. | Sivagnanam Shritharan | No |
| O 020. | Shanakiyan Rajaputhran Rasamanickam | No |
| O 021. | Dayasiri Jayasekara | No |
| O 022. | Harsha de Silva | No |
| O 023. | Ajith P. Perera | No |
| O 024. | Sujeewa Senasinghe | No |
| O 027. | J. C. Alawathuwala | No |
| O 028. | Nalin Bandara Jayamaha | No |
| O 029. | Hector Appuhamy | No |
| O 030. | Hesha Withanage | No |
| O 031. | Kavinda Heshan Jayawardhana | No |
| O 032. | Sujith Sanjaya Perera | No |
| O 033. | S.M. Marikkar | No |
| O 034. | Imran Maharoof | No |
| O 035. | Harshana Rajakaruna | No |
| O 036. | Rohini Kumari Wijerathna | No |
| O 038. | Rohitha Abeygunawardhana | No |
| O 039. | Kaveenthiran Kodeeswaran | No |
| O 040. | Gnanamuththu Srineshan | No |
| O 041. | Chaminda Wijesiri | No |
| O 042. | Mujibur Rahman | No |
| O 043. | Waruna Liyanage | No |
| O 044. | Kins Nelson | No |
| O 045. | Rohana Bandara | No |
| O 046. | W.H.M. Dharmasena | No |
| O 048. | B. Ariyawansha | No |
| O 049. | Chamindranee Kiriella | No |
| O 050. | Chathura Galappaththi | No |
| O 051. | Chithral Fernando | No |
| O 052. | Amila Prasad | No |
| O 053. | Anuradha Jayaratne | No |
| O 054. | Chamara Sampath Dasanayake | No |
| O 055. | D.V. Chanaka | No |
| O 056. | Chanaka Madugoda | No |
| O 057. | M.S. Uthumalebbe | No |
| O 058. | Habeebu Rifan | No |
| O 059. | Kathiravelu Shanmugam Kugathasan | No |
| O 060. | Thurairasa Ravikaran | No |
| O 061. | Suranga Rathnayaka | No |
| O 062. | Jagath Vithana | No |
| O 063. | Nizam Kariapper | No |
| O 064. | N.T. Marrikkar Thahir | No |
| O 065. | E. M. Basnayaka | Yes |
| O 066. | Wijesiri Basnayake | Yes |
| O 067. | S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. | Prageeth Madhuranga | Yes |
| O 069. | Jagath Manuwarna | Yes |
| O 070. | Ruwan Mapalagama | Yes |
| O 071. | Nandana Millagala | Yes |
| O 072. | Riyas Farook | Yes |
| O 079. | Elayathamby Srinath | No |
| O 080. | Pathmanathan Sathiyalingam | No |
| O 081. | Danushka Ranganath | Yes |

| | |
|---|---|
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 086. Manoj Rajapaksha | Yes |
| O 087. Sunil Rajapaksha | Yes |
| O 088. Hasara Liyanage | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Lasith Bhashana Gamage | Yes |
| O 096. Hiruni Wijesinghe | Yes |
| O 097. Athula Welandagoda | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 099. Thilina Samarakoon | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 109. Geetha Herath | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 219 |

**Votes:**

| | |
|---|---|
| Yes | 158 |
| No | 61 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව, පක්ෂව ඡන්ද 158යි; විරුද්ධව ඡන්ද 61යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව, විරුද්ධව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 63යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දෙවන වර කියවීම පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
